(2) *If any question arises whether any matter is or is not a matter as respects which the Governor is by or under this Constitution required to act in his discretion, the decision of the Governor in his discretion shall be final and the validity of anything done by the Governor shall not be called in question in any Court on the ground that he ought or ought not have acted on his discretion. The exercise of the Governor's discretion shall be on the President's directions.*

(3) *The question whether any, and if so what, advice was tendered by the Ministers to the Governor shall not be, inquired into in any Court."*

Clause 43 of the Bill seeks to repeal Articles 154F(2) and (3).

The nexus between the President and the Governor was explained in the following manner in the majority determination of this Court in the **Thirteenth Amendment to the Constitution Bill** [Supra. at pages 31-32]:

> *"With respect to executive powers an examination of the relevant provisions of the Bill underscores the fact that in exercising their executive power, the Provincial Councils are subject to the control of the centre and are not sovereign bodies.*
>
> *Article 154 C provides that the executive power extending to the matters with respect to which a Provincial Council has power to make statutes shall be exercised by the Governor of the Province either directly or through Ministers of the Board of Ministers or through officers subordinate to him in accordance with Article 154F.*
>
> *Article 154F states that the Governor shall, in the exercise of his functions, act in accordance with such advice, except in so far as he is by or under the Constitution required to exercise his functions or any of them in his discretion.*
>
> *The Governor is appointed by the President and holds office in accordance with Article 4(b), which provides that the executive power of the People shall be exercised by the President of the Republic, during the pleasure of the President (Article 154B(2)). The Governor derives his authority from the President and exercises the executive power vested in him as a delegate of the President. It is open to the President therefore by virtue of Article 4(b) of the Constitution to give directions and monitor the Governor's exercise of this executive power vested in him. Although, he is required by Article 154F(1) to exercise his functions in accordance with the advice of the Board of Ministers, this is subject to the qualification "except in so far as he is by or under the Constitution required to exercise his functions or any of them in his discretion. Under the Constitution the Governor as a representative of the President is required to act in his discretion in accordance with the instructions and directions of the President. Article 154F(2) mandates that the Governor's discretion shall be on the President's directions and that the decision of the Governor as to what is in his*

*discretion shall be final and not be called in question in any court on the ground than he ought or ought not to have acted on his discretion.* ***So long as the President retains the power to give directions to the Governor regarding the exercise of his executive functions and the Governor is bound by such directions*** *superseding the advice of the Board of Ministers and where the failure of the Governor or Provincial Council to comply with or give effect to any directions given to the Governor or such Council by the President under Chapter XVII of the Constitution will entitle the President to hold that a situation has arisen in which the administration of the Province cannot be carried on in accordance with the provisions of the Constitution and take over the functions and powers of the Provincial Council (Article 154K and 154L) there can be no gain saying the fact that the President remains supreme or sovereign in the executive field and the Provincial Council is only a body subordinate to him".* [Emphasis added]

Mr. Fernando drew our attention to Article 154J of the Constitution which enables the President to give directions to a Governor as to the manner in which the executive power exercisable by the Governor is to be exercised once a proclamation has been made under the Public Security Ordinance and Article 154K which empowers the President to hold that a situation has arisen in which the administration of the Province cannot be carried on in accordance with the provisions of the Constitution due to the failure on the part of the Governor or any Provincial Council to comply with, or give effect to any directions given to such Governor or such Council under Chapter XVIIA of the Constitution, which remains intact.

Nevertheless, we observe that the said Articles deal with specific situations whereas in terms of Article 154F(2), the President is empowered to give directions to the Governor in all situations where the exercise of his discretion is permitted. One of the main reasons for the majority in the **Thirteenth Amendment to the Constitution Bill** determination to conclude that the executive power of the people remains with the Centre through the President is the pervasive control he exercises over the executive functions of the Governor as identified above. If Article 154F(2) is repealed as envisaged by Clause 43 of the Bill, the power of the President to give directions to the Governor regarding the

exercise of his executive functions is completely removed thereby removing the very foundation of the conclusion of the majority in the Thirteenth Amendment to the Constitution Bill. The Governor will then have to act on the advice of the Board of Ministers in terms of Article 154F(1) which is retained. The result is that the executive power of the People is alienated in so far as the Provincial Councils are concerned to the Board of Ministers. Therefore Clause 43 of the Bill is inconsistent with Articles 2 and 3 read together with Article 4(b) of the Constitution and as such may be enacted only by the special majority required by Article 84(2) and upon being approved by the People at a Referendum by virtue of Article 83.

**Clause 51 of the Bill - National Security Council**

Clause 51 of the Bill seeks *inter alia* to introduce Chapter XIX-C titled National Security Council of which the Prime Minister is to be the Chairperson. Parliament is to, by law, to provide its powers and functions. The President is not a member of the National Security Council.

In **S.C. Reference No. 2/2003**, it was held that the plenary executive power including the defence of Sri Lanka is vested and reposed in the President of the Republic of Sri Lanka and that the Minister appointed in respect of the subject of defence has to function within the purview of the plenary power thus vested and reposed in the President.

Clause 2 of the Bill seeks to amend Article 4(b) of the Constitution to provide that the executive power of the people, including the defence of Sri Lanka will be exercised by the President and the Cabinet of Ministers as provided for in the Constitution. Thus, the constitutional responsibility on the part of the President for the defence of Sri Lanka continues even after the proposed amendment albeit as a shared responsibility with the Cabinet of Ministers.

Moreover, the Bill does not seek to remove the role of the President as the Head of the State or the Commander-in-Chief of the Armed Forces as spelt out in Article 30(2) of the Constitution. It is this dual role along with the specific responsibility entrusted to the President by Article 4(b) for the defence of Sri Lanka that plays a significant role in

ensuring the inviolability of the provisions in Articles 1 and 2 of the Constitution and safeguards the independence and territorial integrity of Sri Lanka. Therefore, the principles contained in Article 30(2) in relation to the head of the State and the Commander-in-Chief is a necessary concomitant or corollary of Articles 1 and 2 of the Constitution.

Hence as long as the President continues to exercise executive power including the defence of Sri Lanka and remains as the Head of the State and the Commander-in-Chief of the Armed Forces, he must be the head of the proposed National Security Council. In the absence of such provisions, the proposed Articles 156J (1) and (2) violates Articles 1, 2 and 3 read together with Article 4(b) of the Constitution and may be enacted only by the special majority required by Article 84(2) and upon being approved by the People at a Referendum by virtue of Article 83. However, such inconsistency would cease if the proposed Article 156J(1) and 156J(2) are amended to change the composition of the proposed National Security Council and make the President the Chairperson of the proposed Council.

**SUMMARY OF THE DETERMINATION**

1. Clauses 2, 3, 4, 5, 6, 7, 8, 9, 10, 11, 12, 13, 15, 23, 24, 26, 27, 28 and 36 of the Bill contain provisions inconsistent with Article 3 read together with Article 4(b) of the Constitution and as such may be enacted only by the special majority required by Article 84(2) and upon being approved by the People at a Referendum by virtue of Article 83.

2. Clauses 2, 3 and 4 of the Bill are inconsistent with Article 3 read together with Article 4(e) of the Constitution and as such may be enacted only by the special majority required by Article 84(2) and upon being approved by the People at a Referendum by virtue of Article 83.

3. Clause 14 of the Bill as it presently stands is inconsistent with Article 3 read together with Article 4(b) and as such may be enacted only by the special majority required by Article 84(2) and upon being approved by the People at a Referendum by virtue of Article 83. However, the necessity for a Referendum will cease if the proposed Article 41A(1) provides for the President to appoint one person as a member of the Council as his nominee and if the proposed Article 41A(6) is suitably amended to remove the deeming provision set out therein.

4. Clause 19 of the Bill is inconsistent with Article 3 read together with Article 4(b) of the Constitution and as such may be enacted only by the special majority required by Article 84(2) and upon being approved by the People at a Referendum by virtue of Article 83.

5. Clause 30(a) of the Bill seeks to limit the judicial power of the People, and therefore is inconsistent with Articles 3 read together with Articles 4(c) and 4(e) of the Constitution and as such may be enacted only by the special majority required by Article 84(2) and upon being approved by the People at a Referendum by virtue of Article 83.

6. Clause 39 of the Bill in so far as it seeks to repeal Article 129(1) of the Constitution is inconsistent with Article 3 read together with Article 4(c) of the Constitution and as such may be enacted only by the special majority required by Article 84(2) and upon being approved by the People at a Referendum by virtue of Article 83.

7. Clause 43 of the Bill is inconsistent with Articles 2 and 3 read together with Article 4(b) of the Constitution and as such may be enacted only by the special majority required by Article 84(2) and upon being approved by the People at a Referendum by virtue of Article 83.

8. Clause 51 of the Bill seeks *inter alia* to introduce Chapter XIX-C titled National Security Council of which the Prime Minister is to be the Chairperson. The proposed Articles 156J (1) and 156J(2) are inconsistent with Articles 1, 2 and 3 read together with Article 4(b) of the Constitution and as such may be enacted only by

the special majority required by Article 84(2) and upon being approved by the People at a Referendum by virtue of Article 83. However, such inconsistency would cease if the proposed Articles 156J(1) and 156J(2) are amended to change the composition of the proposed National Security Council and make the President the Chairperson of the proposed Council.

We place on record our appreciation of the assistance given by the learned Solicitor-General who represented the Hon. Attorney-General, all learned President's Counsel and Counsel who appeared for the Petitioners, and the learned Counsel for the proponent of the Bill.

**JAYANTHA JAYASURIYA, PC**
**CHIEF JUSTICE**

**JANAK DE SILVA, J**
**JUDGE OF THE SUPREME COURT**

**ARJUNA OBEYESEKERE, J**
**JUDGE OF THE SUPREME COURT**

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Right.

## II

## කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2022 ජූනි 15 දින "ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන)" නමැති පනත් කෙටුම්පතෙහි මවිසින් සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon.  Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් තීන්දුවේ පිටපතක් - photocopy එකක් - අපට ලබා දෙන්න.

## III

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2022 ජූනි 21 අඟහරුවාදා, එනම් අද දින මධ්‍යාහ්න 12.00ට කාරක සභා කාමර අංක 02හිදී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද කාරණය?

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ අණ පනත් සම්බන්ධයෙන් ලබා දෙන තීන්දු කරුණාකර මව් භාෂාවෙන්, නැත්නම් රාජ්‍ය භාෂාවෙන් පාර්ලිමේන්තුවට ලබා දීමට කටයුතු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. මා කලිනුත් මේ ඉල්ලීම කළා. අණ පනත් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට දැනුම් දීමේදී සිංහල භාෂාවෙන් සහ දෙමළ භාෂාවෙන් ඒවා ලබා දීමට යුතුකමක් තිබෙනවා කියා මම හිතනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, මම ඒ බව දන්වන්නම්.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දහවැනි කාණ්ඩයේ 2022 මැයි 13 දින වනවිට රජයේ රෝහල්වල පවතින ඖෂධ හිඟය හා එම හිඟය මඟහරවා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ විගණකාධිපති විශේෂ වාර්තාවේ - III කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

- 2021 වර්ෂය සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;
- 2021 වර්ෂය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ
- 2021 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [අග්‍රාමාත්‍ය සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවට ගරු ප්‍රසන්න රණතුංග මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් නියෝග, නියමයන් සහ යෝජනා සම්මතය ඉදිරිපත් කරමි.

(i) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් වෙළඳ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 මාර්තු 10 දිනැති අංක 2270/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(ii) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2022 මැයි 18 දිනැති අංක 2280/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(iii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 මාර්තු 03 දිනැති අංක 2269/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 මාර්තු 03 දිනැති අංක 2269/56 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 මාර්තු 09 දිනැති අංක 2270/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vi) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 මාර්තු 28 දිනැති අංක 2273/01 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 අප්‍රේල් 13 දිනැති අංක 2275/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

(viii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2022 මැයි 18 දිනැති අංක 2280/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(ix) රේගු ආඥා පනතේ (235 අධිකාරය) 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධ යෝජනා සම්මතය (2022 මාර්තු 09 දිනැති අංක 2270/20 දරන අති විශේෂ ගැසට් පත්‍රය).

මෙම නියෝග, නියමයන් සහ යෝජනා සම්මතය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2021 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 66 සහ 69 වගන්ති සමඟ කියවිය යුතු, 117 වගන්තිය යටතේ ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2018 ජූලි 03 දිනැති අංක 2078/22 දරන අති විශේෂ ගැසට් පත්‍රය සහ එම ගැසට් පත්‍රයේ මුද්‍රණ දෝෂ නිවැරදි කරමින් 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 66 සහ 69 වගන්ති සමඟ කියවිය යුතු 117 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2022 ජූනි 06 දිනැති අංක 2283/05 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කරමි.

මෙම නියෝග වරාය, නාවික හා ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)

ගරු කථානායකතුමනි, 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

- 2021 වර්ෂය සඳහා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ
- 2021 වර්ෂය සඳහා ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [ගරු විදුර වික්‍රමනායක මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி, சிறைச் சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - Minister of Justice, Prison Affairs and Constitutional Reforms)

ගරු කථානායකතුමනි, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් පනත් කෙටුම්පත් සහ වාර්තා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(i) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත;

(ii) සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත;

(iii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;

(iv) 2020 වර්ෂය සඳහා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(v) 2018 වර්ෂය සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු මනූෂ නානායක්කාර මහතා (කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார - தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சர்)
(The Hon. Manusha Nanayakkara- Minister of Labour and Minister of Foreign Employment)

ගරු කථානායකතුමනි, කම්කරු හා විදේශ රැකියා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa)

ගරු කථානායකතුමනි, 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ, රසායනික පොහොර වර්ග තහනම් කරමින් නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රයක් පිළිබඳව අපේ කාරක සභාව සලකා බැලුවා.

මේ සම්බන්ධයෙන් තිබුණු ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, ග්ලයිෆොසේට් පිළිබඳ කාරණය. මේ පිළිබඳව සියලු තාක්ෂණික ආයතන සමඟ සාකච්ඡා කරන්න අපි තීන්දු කළා. අපි ඒ අය සමඟ සාකච්ඡා කළා. ඒ අනුව, පළිබෝධ නාශක තාක්ෂණික හා උපදේශක කමිටුව විසින් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද, 'ශ්‍රී ලංකාවේ වැවිලි බෝග සඳහා ග්ලයිෆොසේට් භාවිතය' සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරනවා. මෙම වාර්තාව ඔබතුමා මඟින් වැවිලි කර්මාන්ත ඇමතිතුමාට යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) කොළඹ 10, ශ්‍රී වජිරඥාන මාවත, අංක 11/1/1 යන ලිපිනයෙහි පදිංචි ජී.කේ.එන්.එම්. විජේසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) වරකාපොල, සමගි පෙදෙස, අඹගල පාර යන ලිපිනයෙහි පදිංචි එල්.පී.ආර්.එස්. විජේතුංග මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) යටියන්තොට, වී ඔය, කොටුවේගෙදර යන ලිපිනයෙහි පදිංචි එම්. විල්මට් පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) අවිස්සාවේල්ල, නාපාවල, අංක 169/1 යන ලිපිනයෙහි පදිංචි එම්.එස්. උම්මු සුහයිරා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා අවස්ථාවක් ඉල්ලා සිටියා. දැන් කථා කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලට යොමු වීමට පෙර ඔබතුමා වෙතත්, මේ සභාව වෙතත් වැදගත් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. බාධාවකින් තොරව මේ කරුණු කාරණා ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දෙන්න කියාත් මා ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමනි, අද අපි මේ සභාවේ එකට රැස් වෙලා සිටින මොහොතේ, රටේ මහ පොළොවේ දැවැන්ත ඛේදවාචකයක් නිර්මාණය වෙනවා. මේ රටේ සිටින ලක්ෂ 220ක ජනතාවගෙන් ඉමහත් බහුතර ජනතාවක් මේ වනකොට දරා ගන්න බැරි අන්ත දුකකින් පෙළෙනවා.

ජනතාවගේ අඳෝනාවට කිසිම විසඳුමක් නැහැ. පෙට්‍රල්, ඩීසල්, බූමිතෙල් පෝලිම් එමටයි. ආණ්ඩු වෙනස්වීමත් සමඟ පෝලිම් ටික වැඩි වෙලා, දරුවන්ට, අම්මලාට කිරි පිටි ටික නැහැ. වැඩ කරන ජනතාවට රස්සා ටික නැහැ. පෞද්ගලික අංශයේ කර්මාන්තශාලා වැහෙනවා. රාජ්‍ය සේවකයා අනාථයි. නාගරික, ග්‍රාමීය දුප්පත් ජනතාව, නැති බැරි ජනතාව, මධ්‍යම පන්තිය, දෛනික වේතන ලබන ජනතාව, ස්වයං රැකියාලාභීන්, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්, අපනයනකරුවන්, කම්කරුවන් අද අන්ත අසරණභාවයට පත් වෙලා සිටිනවා. මේ ජනාධිපතිවරයා, අගමැතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව අසාර්ථකයි. රටේ ජනතාවගේ දැවෙන ප්‍රශ්නවලට අද කිසිදු විසඳුමක් නැහැ. ගිරා පෝතක දේශපාලනයක් අනුගමනය කරන, රටට තිබෙන, තමන්ට තිබෙන ප්‍රශ්න දිනපතා ඉදිරිපත් කරන ගිරා පෝතක ආණ්ඩුවක් අද තිබෙන්නේ. මිනිසුන්ට මේ දුක උහුලා ගන්න බැහැ. මිනිසුන්ට මේ දුක දරා ගන්න බැහැ. වසර දෙකහමාරක් තුළ වූ අදූරදර්ශී, උද්ධච්ච, අත්තනෝමතික, ඒකාධිපති පාලනයක ප්‍රතිඵල තමයි මේ. මහා ජන වරමක් ලබාගෙන ජනධිපතිවරයා ප්‍රමුඛ පොහොට්ටු ආණ්ඩුවක් පිහිටෙව්වා. "සෞභාග්‍යයේ දැක්ම" අද ජනතාවගේ අභාග්‍යය බවට පත් වෙලා, මිනිසුන්ට කන්න නැහැ. මිනිසුන්ට ජීවත් වෙන්න නැහැ.

මිනිසුන්ට රස්සා ටික නැහැ, රෝහල්වල බෙහෙත් නැහැ, ශල්‍යකර්ම නතර කරලා, ප්‍රවාහන ක්ෂේත්‍රය අඩපණයි, පාසල් ටික වහලා, සිසු දූ දරුවන් හතළිස් තුන්ලක්ෂයක් අනාථයි, ඒ අයට ලබා දුන් දිවා ආහාරයත් කපලා, විශ්වවිද්‍යාල දරුවන් අනාථයි, වැඩ කරන ජනතාව අනාථයි, සාමාන්‍ය ජනතාව අනාථයි. ඒ ගැන කිසිම සහකම්පනයක් නොදක්වන රජයක් අද තිබෙන්නේ. ඒ වාගේම මේ ආණ්ඩුව විසින් මේ සභාව කථා සාප්පුවක් බවට පරිවර්තනය කරලා තිබෙනවා. කරන කිසිම යෝජනාවකට සාධනීය, ප්‍රගතිශීලී විසඳුම් නැහැ. වෙන මොන කථාද ගරු කථානායකතුමනි? COPE එකට ඇවිල්ලා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයා කියනවා, රටේ ජනාධිපතිවරයායි, අගමැතිවරයායි බලපෑම් කළා ලු, මේ රටේ සම්පත් විදේශීය සමාගම්වලට පාවා දෙන්න. ඊට පස්සේ එතුමා කියනවා එතුමා කම්පනයෙන්ලු, සිටියේ; අමාරුවෙන්ලු, සිටියේ. ඒ මොකද, මේ පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පතක් සම්මත කර ගන්න තිබුණු නිසා. මොනවාටද කම්පා වෙන්නේ? හොරකම් කරන්න, සාක්කුවට ඩොලර් ටික දමා ගන්න තමයි එදා 120දෙනෙක් විතර අත් ඉස්සුවේ. ගරු කථානායකතුමනි, විදුලිබල මණ්ඩලයේ හිටපු ඒ සභාපතිවරයා දැන් අයින් වෙලා. නමුත්, අපේ වරප්‍රසාද කඩ කරලා තිබෙනවා. එක්කෝ, එතුමා සත්‍ය ප්‍රකාශ කළා. ඉන්පසුව බලපෑම් කළ නිසා ඒක ඉල්ලා අස්කර ගත්තා. එහෙම නැත්නම්, අමු ටොන් පවයක් කිව්වා.

[ගරු සජිත් ප්‍රේමදා මහතා]

ගරු කථානායකතුමනි, මිනිස්සු පෝලිම්වල දුක් විඳින මොහොතේ ගැස්වලින් ගසා කනවා. ගැස්වලින් හොරා කනවා. ඩොලර්වලින් කප්පම් ගන්නවා. අපි ස්තුතිවන්ත වෙනවා ඉන්දියාවට, Indian Credit Line එකක් අපට ලබා දීම ගැන. නමුත්, crooksලා පිරිසක් ඖෂධ ගෙන්වන්නට යැයි කියලා ඒකෙනුත් හොරා කනවා. අපි ඉදිරියේදී කියන්නම් ඒ කවුද කියලා. Crooksලා පිරිසක් තමයි ඒක කරන්නේ. මන්දිරවල ඉඳගෙන තමයි ඒ කටයුතු කරන්නේ.

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුවට මේ රටේ ජනතාවගේ දුක තේරෙන්නේ නැද්ද? ඒ ප්‍රශ්නවලට විසඳුම් නැද්ද? මේ ආණ්ඩුව, මේ පාර්ලිමේන්තුව හැල්ලුවට ලක් කර තිබෙනවා.

**ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)
ඔබතුමන්ලාට ආණ්ඩුව ගන්න කිව්වා. නමුත්, ගත්තේ නැහැ නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොකක්ද? ගන්න කිව්වා, ගත්තේ නැහැ? කට වහගෙන ඉන්න. තමුන්නාන්සේ ජනමතය ගැන දන්නේත් නැහැ; ජන සම්මතවාදය ගැන දන්නේත් නැහැ. තමුන්නාන්සේට කොන්දක් තිබෙනවා නම් බහින්නකෝ මහ පාරට. අපට නම් පුළුවන් මහ පාරට බහින්න. අපට ආත්ම ගරුත්වයක් තිබෙනවා. අපි ප්‍රතිපත්තිගරුක වුණා. තනතුරු, තානාන්තරවලට අපේ ආත්ම ගරුත්වය අපි වෙන්දේසි කළේ නැහැ. අපේ ආත්ම ගරුත්වය අපි පාවා දුන්නේ නැහැ. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, මම මේ කාරණය අහන්න කැමැතියි. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඒවාට ඇහුම්කන් දෙන්නේ නැතිව ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුවට මේ රටේ ගොවියාගේ දුක තේරෙන්නේ නැද්ද? කෝ, පොහොර? කෝ මෙට්‍රික්ටොන් 65,000ක යූරියා ටික? අද වී ගොවියා බලාගෙන ඉන්නවා. මේ කන්නයේත් බොහෝ කාලයක් ගත වෙලා. ඒ වාගේම මේ රටට මත්ස්‍ය සම්පත ලබා දෙන ධීවරයාට රස්සාව කරගන්න බැහැ. ගොවිතැන අනාථයි. ගැස් ටික නැහැ. හැබැයි, ගැස්වලින් හොඳට කොමිස් ගහන්න නම් පුළුවන්.

හොඳට ගහලා තිබෙනවා. පසුගිය දවසක ලජ්ජා නැතිව ටෙන්ඩර් cancel කරලා ඩොලර් හොරා කාපු මේ ආණ්ඩුව හොර, කුපාඩි ආණ්ඩුවක්. මම මේ ආණ්ඩුවට කියනවා, මේක හොර, කුපාඩි ආණ්ඩුවක් කියලා. ඔළු ගෙඩි මාරු කර ගෙන දැන් හරියට ලොකු ලොක්කෝ වාගේ සැප විඳිනවා. නමුත්, ලක්ෂ 220ක් වන මේ රටේ ජනතාව අනාථයි. *[බාධා කිරීම්]* මේ සභාවේදී අපි ඒ අයගේ හඬ නියෝජනය කරන්න හදනකොට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කෑ ගහනවා. *[බාධා කිරීම්]*

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අද අපි මේ පාර්ලිමේන්තුවේ රැස් වෙනවා. ගරු කථානායකතුමනි, මම අහන්න කැමැතියි මේකෙන් ලක්ෂ 220ක ජනතාවට තිබෙන ඵලය මොකක්ද කියලා. මොකක්ද, ප්‍රතිඵලය? ජනතාවට ගැස් ටික ලැබෙනවාද? භූමිතෙල් ටික ලැබෙනවාද? පෙට්‍රල් ටික ලැබෙනවාද? ඩීසල් ටික ලැබෙනවාද? කිරි පිටි ටික ලැබෙනවාද? පොහොර ටික ලැබෙනවාද? ආහාරපාන ටික ලැබෙනවාද? අද ජීවන වියදම -ජීවන බර- අහස උසට නැඟලා තිබෙන්නේ. මේ දුක තේරෙන්නේ නැද්ද? මේ ආණ්ඩුවට හිතක් පපුවක් නැද්ද? සංවේදී නැද්ද? හදවත උණු වෙන්නේ නැද්ද? මේ අයට අම්මලා තාත්තලා නැද්ද? දූ දරුවෝ ගැන කැක්කුමක් නැද්ද? ගරු කථානායකතුමනි, ඒ නිසා සමගි ජන බලවේගය, සමගි ජන සන්ධානය සහ විපක්ෂයේ සියලු ප්‍රගතිශීලී කණ්ඩායම් තීන්දුවක් අරගෙන තිබෙනවා, මේ රටේ ජනතාවගේ කැක්කුම තේරෙන්නේ නැති මේ ආණ්ඩුව -මේ ගිරා පෝතක ආණ්ඩුව, බොරු කියන ආණ්ඩුව, ජනතාව රවටන ආණ්ඩුව, නාග මාණික්‍යා ඇන්දවීම් ක්‍රියාත්මක කරන ආණ්ඩුව- මේ ඇවිල්ලා කරන බොරුවට අපි සම්බන්ධ වෙන්නේ නැහැ කියලා. අපි මේ සතියේ පාර්ලිමේන්තුව වර්ජනය කරන බව මම මේ අවස්ථාවේදී කියනවා.

අපි මහ පාරේ හිට ගන්නවා ජනතාවත් එක්ක; අපි හිට ගන්නවා පොදු ජනතාවත් එක්ක. රෙද්ද, බැනියම, සරම, ෂර්ට් එක අඳින, මහ පොළොවේ පය ගහලා ජීවත්වෙන ජනතාවත් එක්ක අපි මෙතෙක් කල් හිටියා. අපි එදාත් ඒ අය සමඟ හිටියා, අදත් ඉන්නවා, ඉදිරියටත් ඉන්නවාය කියන එක මම ප්‍රකාශ කරන්න කැමතියි. ගරු කථානායකතුමනි, මට අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]*

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා කරුණාකර නිශ්ශබ්ද වෙන්න. *[බාධා කිරීම්]* ප්‍රකාශය කළා නේ.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු කථානායකතුමනි, මම විශේෂයෙන්ම ඔබතුමාගෙන්,- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න. *[බාධා කිරීම්]* ඉඳගන්න, ඔබතුමන්ලා. ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දෙන්න. අනුර දිසානායක මන්ත්‍රීතුමා, ඔබතුමා මට කලින් කිව්වේ නැහැ. *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීවරු තේරුම් ගන්න, ගරු විපක්ෂ නායකතුමා මට කලින් කියලා තමයි ඒ අවස්ථාව ඉල්ලා ගත්තේ. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා මට එවැනි දැනුම් දීමක් කරලා නැහැ. විපක්ෂ නායතුමා මට දැනුම් දීම කරලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, එතුමාටත් අවස්ථාව දෙන්න. එතුමා පක්ෂ නායකයෙක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉන්න, පොඩ්ඩක්. ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දීලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාරණාව කියන්න.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු කථානායකතුමනි, අපි මීට කලිනුත් පාර්ලිමේන්තුවේ දී මේ කාරණය මතු කළා. අද වනවිට අපේ රටේ කඩදාසි සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් තිබෙනවා. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, බලන්න, අපි පොත් විශාල ප්‍රමාණයක් මුද්‍රණය කරලා තිබෙනවා. ඒ නිසා මේවා මුද්‍රණය කරන්නේ නැතිව,-*[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, CDs හරහා මේවා එවන්න පුළුවන් නේ. ඒ නිසා මම විශේෂයෙන්ම මේ කාරණය කෙරෙහි ගරු සභාවේ අවධානය යොමු කරවන්න කැමතියි. අත්‍යවශ්‍ය සන්නිවේදන ක්‍රම භාවිත කරලා, උනන්දුවක් දක්වන මන්ත්‍රීවරුන්ට මේවා ලබා ගන්න පුළුවන්. මෙහෙම මුද්‍රණය කරපු පොත් විශාල ප්‍රමාණයක් අපේ මේස මත තබා තිබෙනවා. මේවා හැම දාම තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ කටයුත්ත කළමනාකරණය කර ගන්න වැඩ පිළිවෙළක් හදන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, දැන් කියන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ අර්බුදය මතු වෙලා මාස ගණනාවක් මේ පාර්ලිමේන්තුව රැස් වුණා. මේ පාර්ලිමේන්තුවේ සිදු වෙන විවාද, කථාබහ කිසිවක් තුළින් ජනතාවගේ ජන ජීවිතය අබමල් රෙණකින් හෝ ඉහළ ගෙන යාමට බලපෑමක් සිදුකොට නැහැ. ඒ නිසා තවදුරටත් මේ පාර්ලිමේන්තුව මේ රටේ ජනතාවගේ හඬ හෝ මේ රටේ ජනතාවගේ වුවමනා නියෝජනය නොකරන මධ්‍යස්ථානයක් බවට පත් වෙලා තිබෙනවා. අද පාර්ලිමේන්තු සභා ගර්භයේ අපි මේ විධියට රැස් වුණාට, එළියේ තිබෙන අඳෝනාව මොකක්ද? දරුවන් බෙහෙත් හිඟකම හේතුකොටගෙන රෝහල්වල මිය යන තත්ත්වයක් මතු වී තිබෙනවා. සාමාන්‍ය පුරවැසියන් තෙල් පෝලිම්වල, ගෑස් පෝලිම්වල මිය යනවා. ගොවීන් තමන්ගේ නාටු වූ කුඹුරු දෙස බලාගෙන හූල්ලමින් ජීවත් වෙනවා.

අද ඉදිකිරීම් කර්මාන්තය මුළුමනින්ම නතර කිරීමට තීරණයක් අරගෙන තිබෙනවා. ඉදිකිරීම් කර්මාන්තයේ සෘජු රැකියා ලක්ෂ 3ක්, වක්‍ර රැකියා ලක්ෂ 10කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. මේ සියල්ල අද බිඳ වැටීමකට භාජන වී තිබෙනවා. උසුලාගත නොහැකි භාණ්ඩ මිල ඉහළ යාමකට රට මුහුණ දී තිබෙනවා. ජනතාව මෙවැනි විශාල අර්බුද ගණනාවක පෙළෙමින් සිටින වෙලාවක්, මේක. මේ අර්බුදය පිළිබඳව ජනතාවගේ විරෝධය, වේදනාව පසුගිය කාලයේ දිගින් දිගටම පාර්ලිමේන්තුවේත්, පාර්ලිමේන්තුවෙන් පිටතත් විශාල උද්ඝෝෂණ මාලා හරහා දියත් වෙමින් තිබෙනවා. එය මුළුමනින්ම කේන්ද්‍රගත වෙලා තිබුණේ ජනාධිපතිවරයාට. ඒක සාධාරණයි. මොකද, ජනතාවගේ මේ ප්‍රශ්න ඉදිරිපත් කරන හැම වෙලාවකම වර්තමාන ජනාධිපතිවරයා ඒවාට ඇහුම්කන් දුන්නේ නැහැ.

"තමන් තමයි හොඳටම කරන්නේ, තමන්ට තමයි හොඳටම තේරෙන්නේ, තමන් තමයි වැඩියෙන්ම දන්නේ" වැනි උඩඟු මනෝභාවයකින් මේ ජනාධිපතිවරයා හැසිරුණා. ඒ නිසා ජනතාවගේ සාධාරණ පැන නැඟීමක් සිද්ධ වුණා. ජනතාවට කන්න නැත්නම්, ගෑස් ටික නැත්නම්, ඉන්ධන ටික නැත්නම්, දරුවාට කිරි පිටි ටික නැත්නම්, රෝහලේ බෙහෙත් ටික නැත්නම්, ගොවියාට යූරියා ටික නැත්නම්, ධීවරයාට ඉන්ධන ටික නැත්නම්, ඉදිකිරීම් කර්මාන්තය කඩා වැටිලා තිබෙනවා නම් ජනතාවගේ සාමාන්‍ය ස්වාභාවික පැන නැඟීම තමයි, මේ නායකයා මේ රටේ ජනතාවගේ වගකීම භාර ගන්න සුදුසු නොවන බව ප්‍රකාශ කිරීම. ජනතාව පෝලිම්වල මැරෙනවා නම්, දරුවන් රෝහල්වල මැරෙනවා නම්, ගොවීන් හූල්ලමින් ඉන්නවා නම් ඔවුන්ගේ පැන නැඟීම සාධාරණයි. ජනතාවගේ මූලික වගකීම තිබෙන ජනාධිපතිවරයා -නායකයා- එම වගකීම කිසි සේත්ම ඉටු නොකරන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

බවට පත්වෙලා තිබෙනවා නම්, මේ රටේ ජනතාවගේ නැඟී සිටීම තමයි එතුමාට ගෙදර යන්න කියන එක. එය සාධාරණ ඉල්ලීමක්. එය කිසිසේත්ම අසාධාරණ ඉල්ලීමක් නොවෙයි. ජනතාවගේ කැකෑරෙමින් තිබෙන වේදනාවන්ට, ජනතාවගේ බුර-බුරා නැඟෙමින් තිබෙන දුක්ඛ දෝමනස්සයන්ට පිළිතුරු ලබා දෙන්න බැරි නායකයකු මොකටද ඉන්නේ කියන යෝජනාවක් ඉදිරිපත් වුණා. ඒ නිසා ජනතාවගේ වේදනාවේ, ජනතාවගේ දුෂ්කරතාවේ, ජනතාවගේ කැකෑරෙන කෝපයේ ප්‍රකාශනය ජනාධිපතිවරයා කේන්ද්‍ර කරගෙන දියත් වුණා. හැබැයි, සිද්ධ වුණේ කුමක්ද? ඒ වෙලාවේ මහා නායක ස්වාමීන් වහන්සේලා යෝජනා මාලාවක් ඉදිරිපත් කළා. නීතිඥ සංගම් යෝජනා මාලාවක් ඉදිරිපත් කළා. දේශපාලන ව්‍යාපාර ජනාධිපතිවරයා මුණ ගැහිලා යෝජනා මාලාවක් ඉදිරිපත් කළා. සමහර යෝජනාවල අන්තර් කාලීන ආණ්ඩු ගැන කියා තිබුණා. සමහර යෝජනාවල සර්ව කාලීන ආණ්ඩු ගැන කියා තිබුණා. සමහර යෝජනාවල පාර්ලිමේන්තුවේ

[ගරු අනුර දිසානායක මහතා]

පක්ෂ නායකයන් ඉදිරිපත් කර සකස් කරන විධායක සභාවක් හරහා මේ රටේ තීන්දු තීරණ ගැනීම සඳහා අවශ්‍යා වන යෝජනා තිබුණා. මේ යෝජනා සියල්ල තිබියදී ජනාධිපතිවරයාත්, වර්තමාන අග්‍රාමාත්‍යවරයාත් හොර රහසේ අලුත් ආණ්ඩුවක් හැදුවා. ජනාධිපතිවරයා අග්‍රාමාත්‍යවරයාට එන්න කියලා, අර දින 52 කුමන්ත්‍රණය හා සමාන ලෙස, තමන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලැබී තිබෙන බලතල උපයෝගී කරගෙන රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති පුටුවේ වාඩි කෙරෙව්වා. දැන් මාස එකහමාරකට ආසන්න කාලයක් ගත වෙමින් තිබෙනවා. එතුමා අර්බුදය විසඳනවා වෙනුවට අර්බුදයේ ප්‍රකාශකයා බවට පත්වෙලා තිබෙනවා.

"කන්න නැහැ. සති දෙකකටයි ආහාර තිබෙන්නේ. වේල් දෙකක් පමණක් කන්න සිදු වෙයි. දවසකටයි තෙල් තිබෙන්නේ. රුපියල් කෝටි ලක්ෂයක් පමණ මුදල් අච්චු ගහන්න වෙයි" කියමින් එතුමා අර්බුදයේ ප්‍රකාශකයා බවට පත් වී තිබෙනවා. ඉදිරිපත් කරපු අනෙක් හැම යෝජනාවකම, අන්තර් කාලයක් තිබුණා; දිශානතියක් ඉදිරිපත් කරලා තිබුණා. මහා නායක හාමුදුරුවන් වහන්සේලා ඉදිරිපත් කර තිබුණු යෝජනාවේ, කුමක්ද කරන්නේ, කොතැනින්ද අවසන් වෙන්නේ කියලා සඳහන් තිබුණා. නීතිඥ සංගමය ඉදිරිපත් කරපු යෝජනාවේ, කුමක්ද කරන්නේ; කොතැනින්ද අවසන් වෙන්නේ කියලා තිබුණා. දේශපාලන ව්‍යාපාර විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවල, කුමක්ද කරන්නේ; කොතැනින්ද අවසන් වෙන්නේ කියලා තිබුණා. ඒ යෝජනා සියල්ල නිශ්චිත න්‍යාය පත්‍රයකට අනුව පෙළ ගස්වා, ගැට ගහලා තිබුණා. එසේ ඉදිරිපත් කර තිබියදී, ඒ කිසිවකට ඇහුම් කන් නොදී ජනාධිපතිවරයා නැවත යටිකූට්ටු කුමන්ත්‍රණයක් හරහා රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැති පුටුවේ වාඩි කරවා ගත්තා. දැන් මොකක්ද සිදු වී තිබෙන්නේ? අර්බුදය තවත් ඔඩු දුවා තිබෙනවා. ජනතාව මේ ආණ්ඩුව විශ්වාස කරනවාද? ජනතාව මේ ජනාධිපතිවරයාව විශ්වාස කරනවාද? ජනතාව මේ අගමැතිවරයාව විශ්වාස කරනවාද? ජනතාව මේ පාර්ලිමේන්තුව විශ්වාස කරනවාද? මේ ප්‍රශ්නවලින් යම් ප්‍රමාණයක් හෝ විසඳේවි කියලා ජනතාව තුළ විශ්වාසයක් ඇති කරන්න මේ ආණ්ඩුව සමත් වී තිබෙනවාද? මේ අගමැතිවරයාත්, මේ නව ඇමති මණ්ඩලයත් ඇතුළු ආණ්ඩුව ඉතා කෙටි කාලයක් ඇතුළත අසාර්ථක බවත්, මේ ප්‍රශ්නවලට විසඳුම් ලබා දීමට අපොහොසත් බවත් අද ඔප්පු කොට හමාරයි. ඒ නිසා මම හිතන්නේ නැහැ තවදුරටත් මේ පාර්ලිමේන්තුවේ කාලය කා දැමීමෙන් වැඩක් වෙයි කියලා.

තෙල් පෝලිමේ ඉන්න මිනිහාට මේ පාර්ලිමේන්තුවෙන් උත්තරයක් හම්බ වෙන්නේ නැහැ; කිරි පිටි නැති දරුවාට උත්තරයක් හම්බ වෙන්නේත් නැහැ; රෝහලේ බෙහෙත් නැතිව ඉන්න ලෙඩාට උත්තරයක් හම්බ වෙන්නේත් නැහැ; කුඹුර දිහා බලාගෙන හුල්ලමින් ඉන්න ගොවි ජනතාවට උත්තරයක් හම්බ වෙන්නේත් නැහැ. මේ අර්බුදයෙන් ගොඩ එන්නේ කෙසේද, මේ අර්බුදය කෙළවර වෙන්නේ කවදාද, ඒ සඳහා තමන්ගේ දැක්ම කුමක්ද කියලා මේ ආණ්ඩුව නිශ්චිත අදහසක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ නැතුව තවදුරටත් පවත්වාගෙන යනවාද? මේක ජනසම්මතවාදයට, ජන වරමට යටත් පාර්ලිමේන්තුවක් නොවෙයි.

ගරු කථානායකතුමනි, අද ආණ්ඩුවේ තත්ත්වය මොකක්ද? රටේම ජනතාව ජනාධිපතිවරයාට යන්න කියනවා. අගමැතිවරයා කවුද? රටේම ජනතාව පාර්ලිමේන්තුවෙන් යවපු කෙනෙකු අගමැති පුටුවේ වාඩිවෙලා ඉන්නවා. මේ ආණ්ඩුව මේ රටේ ජනසම්මතවාදය හෝ මේ රටේ ජන වරම නියෝජනය කරන ආණ්ඩුවක් නොවෙයි. ඒ නිසා මේ අර්බුදයෙන් ගොඩ එන්නේ කොහොමද, මේ අර්බුදයෙන් ගොඩ ඒම සඳහා තමන්ට තිබෙන දැක්ම මොකක්ද කියලා මේ ආණ්ඩුව ඉතා කෙටි කාලයකට න්‍යාය පත්‍රයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ නැතුව ඉබාගාතේ යන්න බැහැ. රට එකක් කියනවා, උදේට නැගිටලා තව එකක් කියනවා. අගමැතිවරයා කමිටු පත් කරනවා, ඒ කමිටුවලට සමාන කමිටු ජනාධිපතිවරයා පත් කරනවා. ජනාධිපතිවරයා සංචාරක අමාත්‍යාංශය කැඳවනවා, අගමැතිවරයාත් ඒ අමාත්‍යාංශයම කැඳවනවා. ජනාධිපතිවරයා කෘෂිකර්ම අමාත්‍යාංශය කැඳවනවා, අගමැතිවරයාත් ඒ අමාත්‍යාංශයම කැඳවනවා. මේ වාගේ විකාර රූපී බල කඳවුරු දෙකක් නිර්මාණය වෙලා, ගැටුමක් නිර්මාණය වෙලා, අරාජික තත්ත්වයක් නිර්මාණය කරලා තිබෙනවා. ජනතාවගේ කිසිම ගැටලුවකට පිළිතුරු ලබා නොදෙන පාලනයක් තවදුරටත් මේ රටේ වලංගු නැහැ. ඒ නිසා අපි බල කරලා කියන්නේ, මේ ආණ්ඩුව විසින්, නිශ්චිත ලෙස මෙම ව්‍යසනයෙන් ගොඩ ඒම සඳහා අවශ්‍යා සැලැස්ම, මාර්ග සිතියම හා කෙටි කාලීන වැඩ පිළිවෙළ මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බවයි. එසේ ඉදිරිපත් නොකර නැවත, නැවත කල් හරිමින්, මඟ හරිමින් කරන මේ උසුළු විසුළුකාරී දේශපාලනය නතර කළ යුතුයි. එවැනි යෝජනාවලියක් නිශ්චිත ලෙස මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, එය සාකච්ඡා කිරීමකින් තොරව තවදුරටත් මේ කවර හෝ විවාදයක්, කවර හෝ සාකච්ඡාවක් පැවැත්වීමෙන් කිසි ඵලක් නැහැ. ගරු කථානායකතුමනි, ඒ නිසා විපක්ෂයේ අපි සියලුදෙනා තීරණයක් අරගෙන තිබෙනවා, මේ සතියේ පාර්ලිමේන්තුව වර්ජනය කළ යුතුයි කියලා. ආණ්ඩුවට කාලයක් දෙනවා, කරුණාකර මේ අර්බුදය විසඳීම සඳහා අවශ්‍යා වන මාර්ග සිතියම, දැක්ම මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න.

ගරු කථානායකතුමනි, බොහොම ස්තුතියි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව සති ගණනාවක්- *[බාධා කිරීමක්]*

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නිමල් ලාන්සා මන්ත්‍රීතුමාට point of Order එකක් ඉදිරිපත් කරන්න තිබෙනවා ලු. එතුමාට අවස්ථාව දීලා ඉඳිමු, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවධානයට යොමු කළ යුතු කාරණාවක් තිබෙනවා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, අපේ වැඩ පිළිවෙළක් නැහැ කියලා. ගරු මන්ත්‍රීවරුනි, පසුගිය කාලය තුළ අපි තමුන්නාන්සේලා සියලුදෙනාටම ආරාධනා කළා සර්ව පාක්ෂික ආණ්ඩුවක් හදන්න එකතු වෙන්න කියලා. අපි සජබයට ආරාධනා කළා. ඒ වාගේම අනුර දිසානායක මන්ත්‍රීතුමන්ලාට ආරාධනා කළා. ඔබතුමන්ලා මොකක්ද කිව්වේ? ඔබතුමන්ලා කිව්වා, වැඩ පිළිවෙළට-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඒකේ point of Order එකක් නැහැ. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, - *[බාධා කිරීම්]*

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

ගරු කථානායකතුමනි, point of Order එකක්-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, රට තුළ අර්බුදකාරී තත්ත්වයක් තිබියදී පාර්ලිමේන්තුව මාස ගණනක් තිස්සේ රැස් වුණා. ඒ රැස් වුණු හැම දවසකම මේ ගරු සභාව කථා සාප්පුවක් බවට පත්වුණා විතරයි. දෙපැත්තේ අය කථා කරනවා පමණයි. මිනිස්සු විශ්වාස කරන්නේ, මේ පාර්ලිමේන්තුව රැස්වෙලා ප්‍රශ්න විසඳාවි කියලායි. නමුත් පාර්ලිමේන්තුව රැස්වෙලා මේක ඇතුළේ ප්‍රශ්න විසඳන්නේ නැහැ. මේක ඇත්තටම කථා කරන ස්ථානයක් බවට පත් වෙලා තිබෙනවා. මේ රටේ ජනතාව කල්පනා කරනවා පාර්ලිමේන්තුව රැස්වෙලා හැම දාම සාකච්ඡා කළත් කිසිවක් වෙන්නේ නැහැ කියලා. ඒක කරන්න ඕනෑ කැබිනට් මණ්ඩලය, ආණ්ඩුව. හැබැයි, දැන් තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. පාර්ලිමේන්තුව රැස්වෙන හැම දවසකම ලංකාවේ ඉන්න අපේ මිනිස්සු හිතන්නේ, මේ ප්‍රශ්නයට විසඳුමක් හම්බ වෙයි කියලා. ඒ නිසා, එක්කෝ මේ ප්‍රශ්නයට විසඳුමක් හොයලා ඉවර වෙලාම පාර්ලිමේන්තුව රැස් කරන්න ඕනෑ. නැත්නම් පාර්ලිමේන්තුව රැස් නොකර ඉන්න ඕනෑ.

මොකද, අප 225දෙනාටම දැන් බැණුම් අහන්න සිදු වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. නාගානන්ද කොඩිතුවක්කු මහත්මයා නීතිඥවරයෙක්. ඔහු වීඩියෝ එකක් දාලා මේ රටේ ගෑස් අර්බුදය ගැන කියනවා මම පෙරේදා දැක්කා. ඔහු කියනවා, ඩොලර් 95ට ගන්න පුළුවන් ගෑස් මෙට්‍රික් ටොන් එකක් ඩොලර් 129ට ගන්න හදනවා, එසේ ඩොලර් 129ට ගැනීම හරහා හොරකම් කරලා තිබෙනවා, මේ 225දෙනාම ඒකෙන් හොරකම් කරලා තිබෙනවා කියලා. අපි හොරකම් කරලා නැහැ. මේ මන්ත්‍රීවරු 225දෙනාම ගෑස් ගන්න මහන්සි වෙලා නැහැ. අපි ඒ සම්බන්ධයෙන් ඩීල් දාලාත් නැහැ. මේ ඩීල් එක දාලා තිබෙන්නේ කැබිනට් මණ්ඩලය. එහෙම නම්, කැබිනට් මණ්ඩලය නියෝජනය කරන අගමැතිවරයා මෙතැනට ඇවිල්ලා කියන්න ඕනෑ, ඩොලර් 95ට ගන්න තිබ්බ ගෑස් මෙට්‍රික් ටොන් එක ඩොලර් 129ට ගත්තේ ඇයි කියලා. හැබැයි දැන් ඒවා ගැන කියන්නේ නැතිව සමාජ මාධ්‍ය ඇතුළු මාධ්‍ය සියල්ලෙන්ම පහර ගහන්නේ අප 225දෙනාට. අප 225දෙනාගෙන් කවුරුවත් ටෙන්ඩර් මගඩිවලට සම්බන්ධ වෙලා නැහැ. හැබැයි, කැබිනට් මණ්ඩලයේ ඉන්න අය අපට කියලා දෙන්න ඕනෑ, ඩොලර් 95ට ගන්න තිබ්බ ගෑස් මෙට්‍රික් ටොන් එක ඩොලර් 129ට ගත්තේ ඇයි කියලා. ඒක කියන්නේ නැති නිසා අපි මෙතැන අනාථ වෙලා ඉන්නවා. ඒ සම්බන්ධයෙන් අප කාටවත් උත්තර දෙන්න විධියකුත් නැහැ. අපි දන්නේත් නැහැ, මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. හැබැයි, කියන්නේ "ඩොලර් 95ට ගන්න තිබුණු ගෑස් මෙට්‍රික් ටොන් එක ඩොලර් 129ට අරන් මුන් 225දෙනාම හොරකම් කරලා තිබෙනවා" කියලා. ඇත්තටම මේක සහගහන මහා අපරාධයක්! ඒ නිසා අපි අගමැතිතුමාට කියනවා, කරුණාකර මේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න කියලා. එහෙම නැත්නම් නිකම් බැණුම් අහන්නයි, ගුටි කන්නයි සිද්ධ වෙන්නේ මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන්ට.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. පාර්ලිමේන්තුවෙන් වැඩක් වෙන්නේ නැත්නම්, හැම දාම මේ ප්‍රශ්නය විසඳන්න හදන්නේ කථා කර කර නම්, මේ ප්‍රශ්නයට උත්තරයක් හම්බ වෙන්නේ නැත්නම් කරුණාකර මේ තෙල් පෝලිම් ටික, ගෑස් පෝලිම් ටික නැති කරන්න පුළුවන්, මේ ප්‍රශ්න ටික විසඳන්න පුළුවන් වැඩ පිළිවෙළක් ගැන අපට කියන්න. එහෙම නැත්නම් පාර්ලිමේන්තුව වසා දමා අපි නිකම් ඉඳිමු. නැත්නම් ප්‍රශ්නය හරියට හඳුනාගෙන ආණ්ඩුවට වැඩ පිළිවෙළක් ගෙනෙන්න කියන්න.

මේක සර්ව පාක්ෂික ආණ්ඩුවක් නොවෙයි. එහෙන් මෙහෙන් ඇහිඳගත්ත ආණ්ඩුවක් මේ තිබෙන්නේ. *[බාධා කිරීම්]* හදනවා නම්, නිවැරදි සර්ව පාක්ෂික ආණ්ඩුවක් හදන්න; ජාතික සභාවක් හදන්න. ජාතික සභාවෙන් අගමැතිවරයෙකු ගෙනෙන්න. *[බාධා කිරීම්]* එක එක්කෙනාගේ බලය ආරක්ෂා කරගන්න අගමැතිවරුන් පත් කරන්න අපට ඕනෑ නැහැ. ඒ නිසා කරුණාකර මේ ප්‍රශ්න විසඳීම සඳහා අවශ්‍ය වැඩ කටයුතු ටික කරන්න කියා අපි ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කියන්න, ගරු නිමල් ලාන්සා මන්ත්‍රීතුමා. ඔබතුමා කලින් ඉඳලා කථා කරන්න බලාගෙන ඉන්නවා.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

ගරු කථානායකතුමනි, මටත් සාධාරණ කාලයක් දෙන්න. මොකද, දැන් ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට ඔබතුමා සාධාරණ කාලයක් දුන්නා. අපි මේ රටේ තිබෙන අර්බුදය ගැන දන්නවා. සියලුදෙනා ඒ ගැන දන්නවා. රටේ මිනිස්සුත් ඒ ගැන දන්නවා. මේ අර්බුදයට දැන් ප්‍රධාන හේතුව විදේශ විනිමය නැති එක. මෙතැන ඉන්න නායකයෝ ටික එකතු වෙලා කියන්න, විදේශ විනිමය සොයන හැටි, ගෑස් ටික දෙන හැටි, ගෑස් ටික තෝරන හැටි. ගෑස් අර්බුදයක් තිබෙනවා නම්, පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් අද දවසේ පත් කරලා හෙට අනිද්දා වෙද්දි

[ගරු නිමල් ලාන්සා මහතා]

තීන්දුවක් ගන්න, ඒ ගෑස් අර්බුදය විසඳන්නේ කොහොමද කියන එක ගැන. වැඩි මිලකට ගෑස් අරගෙන තිබෙනවා නම්, ඒ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න. එහෙම නැතුව මෙතැනට ඇවිල්ලා එකිනෙකාට ඇඟිල්ල දිගු කරගෙන අසත්‍ය දේවල් කියලා ගියාට වැඩක් නැහැ. හෙටත් ගෑස් නැති වුණාම, හෙටත් විදුලිය නැති වුණාම, හෙටත් කිරි පිටි නැති වුණාම මිනිස්සු පාරට එනවා; මිනිස්සු කෑ ගහනවා. මිනිසුන්ගේ වේදනාව අපට තේරෙනවා. අපි හැම දාම මේ පාර්ලිමේන්තුවේ කථා කරලා යනවා පමණයි. ඔබතුමාටත් වගකීමක් තිබෙනවා, මේ රටේ තිබෙන- *[බාධා කිරීම්]* මට කථා කරන්න දෙන්න.

ගරු කථානායකතුමනි, මම පෞද්ගලිකව ගියා, සර්වපාක්ෂික ආණ්ඩුවක් හැදීම සඳහා මේ සියලු පක්ෂ එක්ක සාකච්ඡා කරන්න. ඔක්කෝම කිව්වේ මොකක්ද? "අපිට මේ අවස්ථාවේදී මේ බැරෑරුම් තත්ත්වය භාර ගන්න බැහැ" කියලායි ඒ අය කිව්වේ. අපි අනුර දිසානායක මැතිතුමා එක්කත් සාකච්ඡා කළා. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න, ගරු මන්ත්‍රීතුමා. මෙතුමා ඔබතුමාට බාධා කළේ නැහැ නේ.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
එතුමා කිව්වා, සර්වපාක්ෂික ආණ්ඩුවකට එන්නේ නැහැ කියලා. ඒ නිසා අපි පැහැදිලිව කියන්නේ, මේ ප්‍රශ්නය විසඳන්න කාට හෝ යෝජනා තිබෙනවා නම්, වැඩ පිළිවෙළක් තිබෙනවා නම් "මට වැඩ පිළිවෙළක් තිබෙනවා. මට යෝජනාවක් තිබෙනවා. මට ගෑස් මිල අඩු කරන්න පුළුවන්. මට විදුලිය අඩු මිලට දෙන්න පුළුවන්; පැය 24 ම විදුලිය දෙන්න පුළුවන්; කිරි පිටි දෙන්න පුළුවන්" කියලා බය නැතුව ඉදිරියට ඇවිල්ලා කියන්න. බොරුවට නිකම් හිස් වචන මාලාවක් කියලා මිනිසුන් නොමඟ යවන්න එපා. *[බාධා කිරීම්]* කාට හෝ වැඩ පිළිවෙළක් තිබෙනවා නම්, අප කොන්දේසි විරහිතව අත් දෙකම උස්සලා මේ පාර්ලිමේන්තුව තුළදී ඒ සියලු අයට සහයෝගය දෙන්න සූදානම්, ගරු කථානායකතුමනි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මේ ඇති වෙමින් තිබෙන සංවාදය පිළිබඳව අපේ අදහස ඉදිරිපත් කරන්න මට මඳක් අවසර දෙන්න. ගරු කථානායකතුමනි,- *[බාධා කිරීම්]* අනේ! කරුණාකර බාධා කරන්න එපා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
කථා කරන්න ඉඩ දෙන්න, එතුමාට.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ හිටපු මන්ත්‍රී කණ්ඩායමක් ලෙස අපි මීට මාස කිහිපයකට කලින් යෝජනා මාලාවක් ඉදිරිපත් කළා. අපේ පක්ෂ 11ක එකමුතුවක් තිබුණා. මේ අර්බුදය එන බව බොහෝ කලින් පුරෝකථනය කරගෙන ඒක වළක්වා ගැනීම සඳහා ආණ්ඩුව තුළ සිටින ගමන්ම අපේ ඒ පක්ෂ 11 එකමුතුව යෝජනා මාලාවක් ඉදිරිපත් කළා.

නමුත්, ඒක තුට්ටුවකට මායිම් කළේ නැහැ. උත්තරය වුණේ ඒ ඉදිරිගාමී පියවර තබපු අපව අමාත්‍ය තනතුරුවලින් නෙරපා හැරීමයි. එතැනින් තමයි, එතෙක් ඇති වෙමින් තිබූ ආර්ථික අර්බුදය දේශපාලන අර්බුදයක් බවට පරිවර්තනය වීම ආරම්භ වුණේ. ගරු කථානායකතුමනි, එතැනින් එහා වෙච්ච දේවල් ඔබතුමා දන්නවා.

ඊට පස්සේ අපේ පක්ෂ එකොළහේ එකමුතුව මොකක්ද කළේ? අපි නිකම් ඉන්නේ නැතිව අනෙක් පක්ෂත් සමඟත් කථා බහ කරමින් යම්කිසි තීරණාත්මක වැඩ පිළිවෙළක් හා සංකල්පයක් ඉදිරිපත් කළා. අපි පළමුකොටම ඉදිරිපත් කළ සංකල්පය තමයි, ජාතික සභාවක් පිහිටුවන්න කියන එක; සර්වපාක්ෂික අන්තර්කාලීන පාලනයක් පිහිටුවන්න කියන එක; ඒ ජාතික සභාව මඟින් ප්‍රධාන තීන්දු තීරණ ඔක්කෝම ගන්න කියන එක; එමඟින් යම් පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී හවුල්කාරිත්වයක් ඇතිව මේ ඉතාම අමාරු, දුෂ්කර අවධිය ක්‍රමානුකූලව පසු කරලා ස්ථාවර තත්ත්වයක් ඇති කරලා රට වහාම මහ මැතිවරණයකට යොමු කරන්න කියන එක. ඒ අතරතුර තමයි, මීට කලින් කථා කළ ලාන්සා මැතිතුමන්ලාත් පොහොට්ටුවේ මන්ත්‍රීවරුන් හැටියට ස්වාධීන කණ්ඩායමක් බවට පත් වුණේ. එතුමන්ලා එක්කත් අපි මේ ගැන සාකච්ඡා කළා. හැබැයි, අවාසනාවට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු කිහිප දෙනෙකුත්, ඒ වාගේම ලාන්සා මැතිතුමාගේ මන්ත්‍රී කණ්ඩායමේ සමහරුත් රෑට රෑට ගිහිල්ලා ජනාධිපතිවරයාට යෝජනා කළා, අගමැතිවරයා ලෙස රනිල් වික්‍රමසිංහ මහත්මයා පත් කරන්න කියලා. *[බාධා කිරීමක්]* අගමැතිවරයා ලෙස රනිල් වික්‍රමසිංහ මහත්මයා පත් කරන්න කියලා! ඒ යෝජනාව දුන්නේ ඒ ගොල්ලෝ. ඔය දැන් ඇමතිකම් අරගෙන සිටින ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයයි, ලාන්සා මන්ත්‍රීතුමාගේ කණ්ඩායමේ කිහිප දෙනෙකුයි තමයි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාව නැවතත් නොමඟ යවා මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අගමැති කරවන තැනට තල්ලු කළේ. *[බාධා කිරීම්]* අඩු ගානේ උත්තර දෙන්නවත් අද එතුමා මෙතැන නැහැ. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, හැබැයි අපි කැමැති වුණත් නැතත් රටේ පාලනයක් තිබෙන්න ඕනෑ. මොකක් හෝ පාලනයක් ඇටවුණු ගමන් අපි ඒකට තඩි බාන්න පටන් ගත්තේ නැහැ. මොකද, අපට වගකීමක් තිබෙනවා. හැබැයි, අග්‍රාමාත්‍යවරයා ඒ තනතුර භාර ගන්නවා නම් භාර ගන්න ඕනෑ, මේ රටේ දැවෙන අර්බුදයට උපාය මාර්ගික පිළියමක්, සැකැස්මක්, වැඩ පිළිවෙළක් ඇතිවයි. දැන් බලාගෙන ගියාම මෙලෝ වැඩ පිළිවෙළක් නැහැ; මෙලෝ උත්තරයක් නැහැ; මේ ප්‍රශ්නවලට දෙන උත්තර මොනවාද කියන්නේ නැහැ. අපට ප්‍රශ්න විතරක් වැඩක් නැහැ. මේ රට දැන් ප්‍රශ්නවලින් පිරිච්ච රටක්. ප්‍රශ්න වැඩි කරන්න අපට වුවමනා නැහැ. මේ ප්‍රශ්නවලින් පිරිච්ච රටට දෙන උත්තර ටික මොනවාද කියලා ඔබතුමන්ලා කියන්නේත් නැහැ. එහෙම කියන්න තරම් උත්තරයක් අතේ තිබෙන බවක් පෙනෙන්නේත් නැහැ.

මේ රටේ ව්‍යාපාරික ප්‍රජාව වාගේම මධ්‍යම පාන්තික ජන සමාජය හිතුවා, බටහිර රටවල් එක්ක බොහොම සමීප සම්බන්ධතා තිබෙනවා කියන රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැති පුටුවේ වාඩි වුණාම එතුමාගේ සාක්කු දෙකෙන් අත් දෙක එළියට ගන්න කොට ඩොලර් බිලියන හතරක්, පහක් හම්බ වෙලා තිබේවි කියලා. නමුත්, අද ඒක මායාවක්, මිථ්‍යාවක් බවට පත් වෙලා තිබෙනවා.

අද අප සියලුදෙනා ඉදිරිපිට සිටින ප්‍රධානම හතුරා තමයි, ආර්ථික අර්බුදය. ඒ ආර්ථික අර්බුදය හමුවේ වගකීම් සහගතව හැසිරෙන එක තමයි අපේ වගකීම. හැබැයි, එහි මූලික ආදර්ශය දෙන්න ඕනෑ ආණ්ඩුවයි. නමුත්, ආණ්ඩුව ඒ ආදර්ශයේ අංශු මාත්‍රයක් හෝ පෙන්නුම් කරලා නැහැ. ගරු කථානායකතුමනි, ඒ නිසා එවැනි වගකීම් විරහිත ආණ්ඩුවකින් මේ රටේ අසරණ වෙලා ඉන්න මිනිසුන්ගේ ප්‍රශ්නය විසඳෙන්නේ නැත්නම්, තෙල් පෝලිම්වල දුක් විඳින මිනිසුන්ගේ ප්‍රශ්නය විසඳෙන්නේ නැත්නම්, ගෑස් පෝලිම්වල ඉන්න මිනිසුන්ගේ ප්‍රශ්නය විසඳෙන්නේ නැත්නම් අවිධිමත් ආර්ථිකය කාබාසිනියා වෙනවා; ජීවන තත්ත්වය දවසින් දවස කඩාගෙන වැටෙනවා. මේවා ගැන සාධනීය වැඩ පිළිවෙළක් අතේ නැතිව ඔය ඇමතිකම් දරන්න තමුන්නාන්සේලාට සදාචාරාත්මක අයිතියක් නැහැ. ඔය ඇමතිකම්වලින් සත පහකට වැඩක් නැහැ. ගොවියාට පොහොර ටික දෙන්න බැරි ඇමතිකම කන්නද? දරුවන්ගේ පාසල් ටික පවත්වාගෙන යන්න බැරි අධ්‍යාපන ඇමතිකම මොකටද? මේ ප්‍රශ්නවලට මොනවාද තිබෙන උත්තර? ඉන්ධන ටික දෙන්න බැරි විදුලිබල සහ බලශක්ති ඇමතිවරයා මොකටද? ඒ අය නඩත්තු කරන්නේ මොකටද? අඩු ගානේ මේ ප්‍රශ්න ටික විසඳන මාවත, විසඳන වැඩ පිළිවෙළ සහිත කොළයක්, පොතක් අප ඉස්සරහපිට තිබෙනවාද? එහෙම සාකච්ඡාවක්වත් තිබෙනවාද? නැහැ. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ ආණ්ඩුවේ වගකීම් විරහිත මේ ගමන පිළිබඳව අපට තිබෙන පිළිකුල සහ අප්‍රසාදය එසේම තිබෙනවා. හැබැයි, එහෙමයි කියලා සමාජයෙන් 225දෙනාටම ගහයි කියන බයට නිහඬව ඉන්න අපට බැහැ. මේ සභාව තමයි අපට මෙහෙම හරි යමක් කියන්න තිබෙන තැන. මෙතැන අත් හැරලා සතියක් නිවාඩු ගන්න අපේ අදහසක් නැහැ. ඒක සුදුසුයි කියලා අපි හිතන්නේ නැහැ. මේ සතියේත් මේ තුට්ටු දෙකේ ආණ්ඩුව, හොඳටම දැන දැනම නිදාගෙන ඉන්න ආණ්ඩුව ඇහැරලා මේ රටේ ජනතාවට පිහිටක් ලබා දෙන්න ඒ අවස්ථාව පාවිච්චි කරන්න පුළුවන්ද කියන වගකීම් සහගත භූමිකාවේයි අප ඉන්නේ. ඒ බව මම තමුන්නාන්සේලාට ප්‍රකාශ කරනවා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු කථානායකතුමනි,- *[බාධා කිරීම්]*

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු කථානායකතුමනි, මම නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. *[බාධා කිරීම්]* මොකද, විමල් වීරවංශ මන්ත්‍රීතුමා මගේ නම කිව්වා. එතුමා මගේ නම කියමින් කියපු කාරණය මම නිවැරදි කරන්න ඕනෑ, ගරු මනෝ ගනේසන් මැතිතුමා.- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාගේ නම කියපු නිසා එතුමාට කථා කරන්න දෙන්න, ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට අවස්ථාව දෙන්නම් ඊළඟට.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු කථානායකතුමනි, විමල් වීරවංශ මැතිතුමා මගේ නම සඳහන් කරමින් කිව්වා, ජනාධිපතිතුමා හම්බ වෙන්න මගේ නියෝජිතයෝ ගියා කියලා. මම ගියේත් නැහැ, මගේ නියෝජිතයෝ ගිහිල්ලා රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති ධුරයට පත් කරන්න කියලා ජනාධිපතිතුමාට කිව්වෙත් නැහැ කියලා මම තමුන්නාන්සේට කියනවා. අපි හැම දාම උත්සාහ කළේ, පක්ෂ සියල්ල එක්ක එකතුවෙලා පොහොට්ටුව පක්ෂයෙන් අගමැති කෙනෙකු පත් කරන්නයි. හැබැයි, අගමැති කෙනෙකු පත් කිරීමට එක නමක් නම් කරන්න කිව්වාම නම් හතරක් නම් කළා. එතකොට ජනාධිපතිතුමා කොහොමද අගමැතිවරයෙක් පත් කරන්නේ? මේ සියලු දේවල් ගැන මා දන්නවා. ඒ නිසා මගේ කට අවුස්සා ගන්න එපා, විමල් වීරවංශ මන්ත්‍රීතුමා. සිදු වුණේ නැති දේවල් ගැන ඔබතුමා මේ ගරු සභාවට කියන්න එන්න එපා. තමුන්නාන්සේට අමු කැවිලාද දන්නේ නැහැ. මම ජනාධිපතිතුමා හමු වෙන්න ගියේත් නැහැ, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති ධුරයට පත් කරන්න කියලා ජනාධිපතිතුමාට යෝජනා කළේත් නැහැ. ඒ නිසා, කවුරු මේ රටේ අගමැති වුණත්, ජනාධිපති වුණත් කොන්දේසි විරහිතව මගේ සහයෝගය ලබා දෙනවා කියන එක මෙම ගරු සභාවට මම විවෘතව ප්‍රකාශ කරනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මෙම ගරු සභාවට මා යමක් ප්‍රකාශ කරන්නේ වගකීම් සහගතවයි. අගමැතිකමට රනිල් වික්‍රමසිංහ මැතිතුමා පත් වනවාය කියන ආරංචිය ලැබුණාට පසුව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා, කොන්දේසි සහිතව අගමැතිකමට පත්වීමට කැමැති බව විවිධ අයුරින් දන්වා තිබුණා. කලින් රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති ධුරයට පත් කරන්න කියපු අය ඊට පසුව ජනාධිපතිතුමාට කිව්වා, "සජිත් වුණත් අවුලක් නැහැ" කියලා. ජනාධිපතිවරයා ඒ වනකොට රනිල් වික්‍රමසිංහ මැතිතුමාට අගමැති ධුරයට පත් වෙන්න කියන අදහස ප්‍රකාශ කර අවසානයි. "මට ඇමතිකම එපා. ඒ ඇමතිකම නලින් ප්‍රනාන්දුට දෙන්න" කියා නිමල් ලාන්සා මන්ත්‍රීතුමා කියපු නිසා තමයි නලින් ප්‍රනාන්දුට ඇමතිකම ලබා දුන්නේ. ඒකයි එහෙම වුණේ. නලින් ප්‍රනාන්දු කියන්නේ කැබිනට් ඇමතිකමක් ගන්න තරම් ජ්‍යෙෂ්ඨත්වයක් තිබෙන මන්ත්‍රීවරයෙකු නොවෙයි මම කියන්නේ මේකයි. ඊට පසුව කථා කරලා කිව්වා, විපක්ෂ නායකතුමා අගමැති ධුරයට පත් කළොත් හොඳයි කියලා. ගරු කථානායකතුමනි, ඉන් පසුව ජනාධිපතිවරයා මෙතුමන්ලාට කිව්වා, "ඔබතුමන්ලා එක වෙලාවක රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති ධුරයට පත් කරන්න ලු. තව වෙලාවක සජිත් ප්‍රේමදාස මැතිතුමා පත් කරන්න ලු, ඔය කියන කියන ඔක්කොම මම කරන්නේ කොහොමද? මම රනිල්ට කියලා ඉවරයි" කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය ඇති. ඒ ගැන කථා කරන එක දැන් අවසන් කරන්න.

**ගරු නලින් ප්‍රනාන්දු මහතා (වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் பர்னாந்து - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. Nalin Fernando - Minister of Trade, Commerce and Food Security)
Sir, I rise to a point of Order.

[ගරු නලින් ප්‍රනාන්දු මහතා]

විමල් වීරවංශ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, මට ඇමතිකම ලබා දීම ගැන. මට ඇමතිකම ලබා දෙන්න තීන්දු කළේ ජනාධිපතිවරයා. අනෙක් කාරණය මෙයයි. ජනාධිපතිතුමා එක්ක ඒ පිළිබඳව සාකච්ඡා කළේ ඔබතුමන්ලාගේ නියෝජිතයා වන වීරාත් අලස් හිටපු ඇමතිතුමා. එතුමාත් ඇමතිකමක් ගත්තා. ඒ නිසා ඔබතුමා නිකම් අසත්‍ය කථා කියන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු කථානායකතුමනි, පොදු විපක්ෂයක් හැටියට අපි දැන් අපේ ස්ථාවරය පැහැදිලි කරලා පිටවෙලා යනවා. ඊට පසුව මේ ගැන කථා කරලා බේරා ගන්න කියන්න. ප්‍රශ්නයක් නැහැ. රට අමාරුවේ දැම්මේ කවුද, රනිල් වික්‍රමසිංහ මැතිතුමාව අමාරුවේ දැම්මේ කවුද, අමාරුවේ වැටුණේ කොහොමද කියන එක ගැන ඔබතුමන්ලා කථා කරලා තීරණයක් ගන්න, ප්‍රශ්නයක් නැහැ. අපි දැන් කථා කරලා යන්න ඕනෑ.

கௌரவ சபாநாயகர் அவர்களே, இந்த அரசாங்கம் அலங்கோலமான, கேவலமான, முட்டாள்தனமான - மடைத் தனமான ஓர் அரசாங்கம்! அதுமாத்திரமன்றி, ஓர் அயோக்கிய அரசாங்கம்! அதனால்தான் நாடு இந்த நிலைக்குச் சென்றிருக்கிறது. அதற்கு வேறு காரணம் கிடையாது.

மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்கள், தான் பிரதமர் பதவியைக் கோரவில்லை என்றும் சனாதிபதி அவர்கள்தான் தன்னை அழைத்து அந்தப் பதவியைத் தந்தார் என்றும் சொல்கிறார். ஆனால், இங்கு உரையாற்றிய கௌரவ விமல் வீரவங்ஸ அவர்கள், "அப்படியல்ல, இவர்கள்தான் ஜனாதிபதியிடம் சென்று அவருக்காகப் பரிந்துரைத்தார்கள்" என்று சொல்கிறார். பரவாயில்லை; அது வேறு விஷயம். இப்பொழுது, ஒரே விஷயத்திற்காக சனாதிபதி அவர்களும் கூட்டத்தைக் கூட்டுகிறார், பிரதமர் அவர்களும் கூட்டத்தைக் கூட்டுகிறார். அந்தக் கூட்டத்தில் துறைசார்ந்த அமைச்சர்கூட இல்லை; ஆனால், அதிகாரிகளை அழைத்துப் பேசுகிறார்கள். இது என்ன அலங்கோலம்! கௌரவ பிரதமர் ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் தற்பொழுது சபையில் இல்லை. அவர் தனது அலுவலகத்தில் இருந்துகொண்டு என்னுடைய உரையைக் கேட்டுக்கொண்டிருக்கிறாரோ தெரியவில்லை. அவர் கேட்க வேண்டுமென்று விரும்புகிறேன். அதேபோல, மேதகு சனாதிபதி அவர்களும் கேட்க வேண்டுமென்று விரும்புகிறேன். காரணம், அவர்கள் முட்டாள்தனமான முறையில் அரசாங்கத்தை நடத்திக்கொண்டிருப்பதுதான்.

எங்களுடைய கொழும்பு மாவட்டத்திலே வாழுகின்ற மக்கள் பெற்றோல் இல்லாமல், டீசல் இல்லாமல், மண்ணெண் ணெய் இல்லாமல், gas இல்லாமல் கஷ்டப்படுகிறார்கள். குறிப்பாக, கொழும்பு வடக்கு, கொழும்பு மத்தியில் தொடர்மாடி வீடுகளிலே வாழுகின்ற மக்கள் மிகவும் கஷ்டப்படுகிறார்கள். அதேபோல், மலைநாட்டில் வாழும் தோட்டத் தொழிலாளர் களும் கஷ்டப்படுகிறார்கள். ஒன்றில், மலைநாட்டில் வாழும் தோட்டத் தொழிலாளர்களின் சம்பளத்தைக் கூட்டுங்கள் அல்லது அங்கிருக்கின்ற பயிரிடப்படாத நிலங்களை அவர்களுக்கு வழங்குங்கள் என்று நான் கௌரவ பிரதமர் அவர்களுக்குச் சென்ற மாதம் 31ஆம் திகதி ஒரு கடிதம் அனுப்பினேன். பிரதமர் தலைமையில் இடம்பெற்ற இரண்டு கூட்டங்களுக்கு நாங்கள் சென்றோம். நாங்கள் பிரதமருடன் ஒத்துழைக்கவில்லை என்று கௌரவ நிமல் லான்சா அவர்கள் சொல்கிறார். ஆனால், நாங்கள் பிரதமருடன் ஒத்துழைத்திருக் கிறோம்; அவருடைய கூட்டத்துக்குச் சென்றிருக்கிறோம்; அவருடன் பேசியிருக்கிறோம். எங்களுக்கு அமைச்சுப் பதவிகள் தேவையில்லை; அவற்றை எடுப்பதற்கு நாங்கள் தயாரில்லை. நாங்கள் பிரதமருக்கு ஒத்துழைப்பு வழங்கினோம். ஆனால், இன்றுவரை ஒரு தீர்வு இல்லை. அவருடன் பேசி 20 நாட்களாகிவிட்டன. ஆனால், ஒன்றும் நடக்கவில்லை.

කෝ අර ඉඩම? වතු කම්කරු ජනතාවට දෙනවා කිව්වා නේද? දවස් 20ක් වුණා, තවම දීලා නැහැ. බොරු නේ, මේ කරන්නේ. ආපසු කවදාවත් අගමැතිතුමාගේ රැස්වීම්වලට අපි නම් යන්නේම නැහැ; යන්නේම නැහැ. මොකද, ගිහිල්ලා වැඩක් නැහැ. ඒක බොරුවක්; ප්‍රෝඩාවක්. ගිහිල්ලා වැඩක් නැහැ. අපි බලාපොරොත්තු වුණා ජනතාවට සැපක්, සෙතක් ලැබෙයි කියලා. නමුත් ලැබිලා නැහැ. බලන්න, - *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න කෝ. බලන්න, *[බාධා කිරීම්]* - ජපාන රාජ්‍යය ලංකාවට ලොකු මුදලක් දෙනවා කිව්වා. ජපානයේ තානාපතිතුමා රටින් පිට වෙලා ගියා. එතුමා නිවාඩුවකට ගියේ. නමුත් රාවයක් ඇති කළා, - *[බාධා කිරීමක්]* අද ජපන් රාජ්‍යය හිත් අමාරුවෙන් ඉන්නේ; නිපොන් රාජ්‍යය හිත් අමාරුවෙන් ඉන්නේ; නිපොන් රාජ්‍යය US Dollars 1.4 billion light rail project එකක් අපට දෙන්න හිටියා. රාජපක්ෂලා ඒක කැවා, Diplomatic crimes කළා. මේ අපි කථා කරන පාර්ලිමේන්තුව හදලා දුන්නේ ජපානය. ළඟ තිබෙන ඉස්පිරිතාලය, අපට අසනීප වුණාම යන්න තිබෙන ඉස්පිරිතාලය හදා දුන්නේත් ජපානය. Peradeniya Teaching Hospital එක හදා දුන්නේත් ජපානය. පාර්ලිමේන්තු පරිශ්‍රයට ඇතුළු වන පාර හදලා දුන්නේත් ජපානය. ජපානය තමයි 1990ට පෙර අපට උදව් කළේ. මේ අගමැතිතුමාගේ mentor තමයි ජේ.ආර්. ජයවර්ධන මහත්මයා. එතුමා නිසා තමයි ජපානය මේ රටට හැම දාම වැඩියෙන් උදව් උපකාර කළේ. ජපානය දැන් තරහා වෙලා ඉන්නේ. Diplomatic crimes කර තිබෙනවා. රාජපක්ෂලා මේ රටට කරපු අපරාධය, - *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please wind up now.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මේ රටට අපරාධ කරලා තිබෙනවා. *[බාධා කිරීම්]* ඒ අපරාධයේ ප්‍රතිඵල තමයි ඇවිල්ලා තිබෙන්නේ. අද ජපාන රාජ්‍යය අමනාප වෙලා ඉන්නේ; තරහා වෙලා ඉන්නේ. ඒ, අපට උදව් කරපු රාජ්‍යයක්. මේ තරම් අපට උදව් කරපු වෙන රාජ්‍යයක් තිබෙනවාද? දැන් අපි හිඟා කන රටක් වෙලා. එක්කෝ ඉන්දියාවට දෙන්න ඕනෑ, නැත්නම් ජපානයට දෙන්න ඕනෑ. අපි හිඟා කන රාජ්‍යයක් වෙලා.*[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු කථානායකතුමනි, - *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is enough. - *[Interruption.]* I have given you enough time, Hon. Member. There is no time.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු කථානායකතුමනි, - *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is enough! You said what you have to say. I have given you enough time. - *[Interruption.]* Hon. Member, you took ten minutes.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කළ යුතු කාරණයක් ගැනයි මම මේ විශේෂයෙන්ම කියන්නේ.

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, පූජ්‍ය අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ කථා කරමින් සිටින්නේ. *[බාධා කිරීම්]* බාධා කරන්න එපා.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැතිවරයා විධියට පත් කළාම අපි යම්කිසි ආකාරයක,-*[බාධා කිරීම්]* තත්ත්වයකට පත් වුණා. හැබැයි, එතුමා ප්‍රමුඛ ආණ්ඩුවට යම්කිසි එකඟතාවක් තිබුණා. මොකක්ද, ඒ එකඟතාව? එතුමා කිව්වා, සර්ව පාක්ෂික ආණ්ඩුවක් හැටියට මේ ආණ්ඩුව පවත්වාගෙන යන බව. ගරු කථානායකතුමනි, අපි ජාත්‍යන්තරයෙන් මුදල් ගන්නවා නම්, ලෝකයාගේ පිළිගැනීමට ලක්වීමට අවශ්‍ය නම්, මා මේ අවස්ථාවේදී කියනවා, අනිවාර්යයෙන්ම මේක සර්ව පාක්ෂික ආණ්ඩුවක් විය යුතු බව. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට ඇමතිකම් දීලා තිබෙන්නේ ඒ පක්ෂයේ එකඟතාව අනුව නොවෙයි. *[බාධා කිරීමක්]* මම දන්නා හැටියටයි මේ කියන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මතය මම දන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ මතය වෙනම කියන්න කෝ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. මගේ කථාවෙන් පස්සේ ඔබතුමාට ඕනෑ එකක් කියා ගන්න.

ගරු කථානායකතුමනි, අද රටේ තිබෙන තත්ත්වය ගැන අපි කියන්න ඕනෑ. අලුත් අගමැතිතුමා ප්‍රමුඛ මේ ආණ්ඩුව බලයට පත්වෙලා දැන් මාසයකට වැඩියි. මේ කාලය තුළ පෙට්‍රල් පෝලිම් අඩුවෙලා තිබෙනවාද? ඩීසල් පෝලිම් අඩුවෙලා තිබෙනවාද? ගෑස් තිබෙනවාද? අඩුම ගණනේ මාස 3කින් හෝ 4කින් හෝ විකල්ප විසඳුමක් එනවා කියා සාකච්ඡාවක්වත් තිබෙනවාද? ඒ නිසා මේක ප්‍රජාතන්ත්‍ර විරෝධී ආණ්ඩුවක්. මේ ආණ්ඩුවට ජාත්‍යන්තරයෙන් කිසිම සහායක් ලබා ගන්න බැහැ. එක් පාර්ශ්වයකින්ම ගන්නේ නැතිව පොදුවේ ඕනෑම රටකින් අපි තෙල් ලබා ගත යුතුයි. අපට අවශ්‍ය නම් රුසියාවෙන් තෙල්, ගෑස් සහ පොහොර ලබා ගැනීමට ඉඩකඩ තිබුණා. ඒ ගැන සාකච්ඡාවක් කළ යුතුද, නැද්ද? සර්ව පාක්ෂික නියෝජිත මණ්ඩලයක් සමඟ එකඟතාවකට ආ යුතුද, නැද්ද? මේ කියන කිසිම කාරණයක් ගැන මේ ආණ්ඩුව තුළ කිසිම සාකච්ඡාවක් නැහැ. ඒ නිසා ශීලාචාරව මේ ආණ්ඩුව පවත්වාගෙන යෑමට නොහැකි බව අපට පේනවා. මක් නිසාද කියනවා නම්, මේ ආණ්ඩුව පවත්වාගෙන යන්න නම් මිනිසුන්ගේ අවම ප්‍රශ්නවත් විසඳිලා තිබෙන්න ඕනෑ, ගරු කථානායකතුමනි. ඒ කිසිවක් විසඳා ගන්න බැරි තත්ත්වයකට අද මේ ආණ්ඩුව පත්වෙලා තිබෙනවා. ඒ නිසා මේ පාර්ලිමේන්තුව පවත්වාගෙන යෑමේ අර්බුදයක් තිබෙනවා. ගරු කථානායකතුමනි, සර්ව පාක්ෂික ආණ්ඩුවක එකඟතාවෙන් තොරව, මේ පාර්ලිමේන්තුව පවත්වාගෙන යෑමේ අර්බුදයක් තිබෙන බවයි අපි ඔබතුමාට කියන්නේ. ඒක ඔබතුමා විසඳිය යුතුයි. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමා, ඉක්මනින් කියන්න.

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාට මේ දේ කියන්න ඕනෑ. වතුකරයේ ජනතාව අද ඉන්නේ බඩගින්නේ. ඒ අයට අද ගෑසුත් නැහැ, විදුලියත් නැහැ, පඩිත් නැහැ, මොකුත්ම නැහැ. ඒක නිසා මේ පාර්ලිමේන්තුව කැඳවන එකේ තේරුමක් නැහැ. පාර්ලිමේන්තුව කැඳවන්න යන වියදම අපට දෙන්න. අපි ඒක අරගෙන වතුකරයට ගිහිල්ලා ඒ ජනතාවට කන්න දෙන්නම්. අවුරුදු 200ක් මේ රටට ඩොලර් ගෙනා ජනතාවක් තමයි, වතුකරයේ ජනතාව. අපට "Ceylon Tea" නාමය දීපු ජනතාව අද ඉන්නේ බඩගින්නේ. ඔවුන්ට ලාම්පුතෙල් නැහැ, ලයිට් නැහැ, ගෑස් නැහැ. කිසි දෙයක් නැහැ. ඉස්කෝලත් වහලා. මෙවැනි තත්ත්වයක් යටතේ අපට මේ පාර්ලිමේන්තුව පවත්වන්න අවශ්‍ය නැහැ. පාර්ලිමේන්තුව පවත්වන්න අද වැයවන මුදල් වතුකරයේ ජනතාව ඇතුළු බඩගින්නේ ඉන්න ජනතාවට කන්න දෙන්න වියදම් කරන්න. ඒ ඉල්ලීම කරමින් අපි සභාවෙන් එළියට යනවා.

බොහොම ස්තුතියි.

***[මෙම අවස්ථාවේදී විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු පිරිසක් සභා ගර්භයෙන් පිටව ගියහ.]***

*[இச்சந்தர்ப்பத்தில் எதிர்க்கட்சி உறுப்பினர்கள் சிலர் சபாமண்டபத்திலிருந்து வெளியேறினர்.]*

*[At this stage, some Members of the Opposition walked out of the Chamber.]*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -10/2022- (1), ගරු ගයන්ත කරුණාතිලක මහතා.

ඔබතුමා ප්‍රශ්නය අහනවාද? ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා, ඔබතුමා ප්‍රශ්නය අහනවාද, නැත්නම් ඔය යනවාද? එතුමා සභා ගර්භයෙන් පිටව යනවා.

ප්‍රශ්න අංක 2 -42/2022- (1), ගරු බුද්ධික පතිරණ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -255/2022- (1), ගරු හේෂා විතානගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -575/2022- (1), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ වෘත්තීය ගැටලු: විසඳුම්
## சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர்களின் தொழில் ரீதியான பிரச்சினைகள்: தீர்வுகள்
## PROFESSIONAL ISSUES OF SAMURDHI DEVELOPMENT OFFICERS: SOLUTIONS

1028/2022

**5. ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වන විට සමෘද්ධි ප්‍රතිලාභය ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට සේවය කරනු ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සමෘද්ධි සංවර්ධන නිලධාරින් විසින් විශාල සේවාවක් ඉටු කරනු ලබන බව දන්නේද;

(iv) සමෘද්ධි සංවර්ධන නිලධාරින්ට පවතින වෘත්තීයමය ගැටලු හඳුනාගෙන තිබේද;

(v) එම වෘත්තීයමය ගැටලු විසඳීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

(vi) නොඑසේ නම්, එම ගැටලු විසඳනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්,ඒ මන්ද?

மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுப்படுத்துகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் சமுர்த்தி அனுகூலம் பெறுகின்ற குடும்பங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) தற்போது சேவையிலுள்ள சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) மேற்படி சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர்களால் பாரிய சேவை ஆற்றப்படுவதை அறிவாரா என்பதையும்;

(iv) சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர்கள் எதிர்கொண்டுள்ள தொழில் ரீதியான பிரச்சினைகள் இனங்காணப்பட்டுள்ளனவா என்பதையும்;

(v) மேற்படி தொழில் ரீதியான பிரச்சினைகளைத் தீர்க்க இன்றளவில் எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(vi) இன்றேல், மேற்படி தொழில் ரீதியான பிரச்சினைகள் தீர்க்கப்படும் விதம் யாதென்பதையும்;

அவர் தெரிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Women, Child Affairs and Social Empowerment:

(a) Will he state -

(i) the number of families who receive the Samurdhi benefit by now;

(ii) the number of Samurdhi Development Officers serving at present;

(iii) whether he is aware of the fact that an immense service is rendered by those Samurdhi Development Officers;

(iv) whether the professional issues of the Samurdhi Development Officers have been identified;

(v) the measures taken by now to address those professional issues; and

(vi) if not, how those issues would be addressed?

(b) If anot, why?

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මිලියන 1.7යි.

(ii) නිලධාරින් 20,538යි.

(iii) ඔව්.

(iv) ඔව්.

(v) අදාළ වෘත්තීය ගැටලු විසඳීම සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ග ගෙන ඇත.

- දිවිනැගුම පනතේ 44 (ඉ) iii වගන්තිය යටතේ 2014.01.03 දින සිට සේවයට බැඳී ඇති නිලධාරින්ගේ මූලික වැටුප 2014.01.02 දිනට ලැබූ අදාළ වැටුප් පරිමාණයේ තමන් සිටි ශ්‍රේණියේ ආරම්භක වැටුප ලබා දීමට අදාළව අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 03ක් ඉදිරිපත් කර ප්‍රතික්ෂේප වී ඇති අතර, නැවතත් අමාත්‍ය

මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම සඳහා ගරු මුදල් අමාත්‍යතුමා හා ජාතික වැටුප් කොමිෂන් සභාව සමඟ ඉදිරියේදී සාකච්ඡා කිරීමට නියමිතව ඇත.

- සමෘද්ධි සංවර්ධන නිලධාරින් සඳහා MN 3 වැටුප් කාණ්ඩය ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කර ඇත.
- සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ නියාමක හා පුහුණු සේවා කාලයන් මුල් පත්වීම් සේවා කාලයට එකතු කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.
- සමෘද්ධි සංවර්ධන නිලධාරින් හා සෙසු නිලධාරින් අතර පවතින වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා නව ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සකස් කිරීමට අදාළව පත් කර ඇති ජාතික වැටුප් කොමිෂන් සභා කමිටුව වෙත සවිස්තර වාර්තාවක් 2022.01.08 දිනැතිව යොමු කර ඇත.
- මුල් සේවා ලෙස මනාපය ප්‍රකාශ කර ඇති නිලධාරින් විසින් ලබා ගෙන ඇති සේවක අර්ථසාධක අරමුදලේ සියයට 60ක රජයේ දායකත්වය ආපසු රජයට අයකර ගැනීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.

(vi) ඉහත පිළිතුර අනුව අදළ නොවේ.

(ආ) අදාළ නොවේ.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු කථානායකතුමනි, මම ගරු අමාත්‍යතුමාගෙන් අතුරු ප්‍රශ්න දෙකක් අහන්න කැමැතියි. සමෘද්ධි සංවර්ධන නිලධාරින් පසුගිය කොවිඩ් වසංගත කාලයේ විශාල සේවාවක් කළා. ඒ වසංගතය වෙලාවේ අපේ රටේ ජනතාව ඒ වයිරසයෙන් බේරා ගැනීමට සහ අභිංසක ජනතාවට රුපියල් 5,000ක දීමනාව බෙදා දීමේ අභියෝගාත්මක වැඩ පිළිවෙළ වැනි සියලු කටයුතු ඔවුන් ක්‍රියාත්මක කරගෙන ගියා. මේ අය සැහෙන කාලයක් තිස්සේ තම වෘත්තීය ගැටලු ගැනත් නොයෙක් ඉල්ලීම් ඉදිරිපත් කළා. මේ වෙනකොට එයින් යම් ප්‍රමාණයක් විසඳා දෙන්නත් කටයුතු කර තිබෙනවා. අපි එය අගය කරන්න ඕනෑ.

ගරු අමාත්‍යතුමනි, කළුතර දිස්ත්‍රික්කයේ සමෘද්ධි සංවර්ධන නිලධාරියකු ගන්න මූලික වැටුප සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ සමෘද්ධි සංවර්ධන නිලධාරියකු ගන්න මූලික වැටුප අතර වෙනසක් දැන් තිබෙනවා. මේ දෙදෙනාම සමාන සේවා කාලයක් ඇති අය. සාමාන්‍යයෙන් එහෙම වෙන්න බැහැ. ලංකාවේ කොහේ හිටියත්, එකම සේවා කාලයක් ඇති නිලධාරින්ගේ මූලික වැටුප සමාන වෙන්න ඕනෑ. මම මේ කියන්නේ විශේෂ දීමනා හැර, මූලික වැටුප ගැන. මේ ප්‍රශ්නය ගැන අවධානය යොමු කර එය නිවැරදි කරන්න පියවර ගන්නවාද කියා මම මුලින්ම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කිව්ව ආකාරයට, කොවිඩ් වසංගතය වෙලාවේ සමෘද්ධි සංවර්ධන නිලධාරින් තමන්ගේ ජීවිතය පවා පරදුවට තබා කටයුතු කළා. ඒ අය සම්බන්ධයෙන් ධනාත්මකව කටයුතු කිරීමේ වගකීමක් රජය හැටියට අපට තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කරපු කාරණය ගැන දැනට මුදල් අමාත්‍යවරයා වශයෙනුත් කටයුතු කරන ගරු අගමැතිතුමා එක්ක සාකච්ඡා කරලා, ඉදිරියේදී පියවර ගැනීමට අපි කටයුතු කරන්නම්.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු කථානායකතුමනි, මම මේ වෙලාවේ විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, අතිගරු ජනාධිපතිතුමාටත්, මුදල් අමාත්‍යතුමා ඇතුළු ඒ කාර්ය මණ්ඩලයේ සියලුදෙනාටත්. විශාල අපහසුතා රාශියක් මධ්‍යයේ තමයි අපේ ගම් ප්‍රදේශවල ජනතාව ජීවත් වෙන්නේ. මේ වෙනකොට ලෝක බැංකු ආධාර වැඩසටහන යටතේ රුපියල් 5,000ක දීමනාවක් එවැනි පවුල්වලට ලබා දෙනවා. ඒ අනුව, වාර තුනක් රුපියල් 5,000 බැගින් ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, මේ වෙනකොට ඒ ආධාරය ලබා දෙන්නේ සමෘද්ධි ප්‍රතිලාභීන්ට සහ පොරොත්තු ලේඛනයේ ඉන්න අයට විතරයි. නමුත්, මේ ආර්ථික තත්ත්වයත් එක්ක විවිධ ස්වයං රැකියා කළ අයට ඒ ස්වයං රැකියා අහිමි වෙලා තිබෙන බව අපි දන්නවා. ගරු ඇමතිතුමනි, එම නිසා පසුගිය කොවිඩ් වසංගතය වෙලාවේ රුපියල් 5,000ක දීමනාව බෙදපු ඒ කණ්ඩායමටම මේ දීමනාවත් ලබා දෙන්න කටයුතු කරන්න පුළුවන් නම්, එය විශාල සහනයක් වෙයි.

කෙසේ වෙතත්, මේකත් විශාල සහනයක්. ගරු ඇමතිතුමනි, මම සඳහන් කළ අනික් කණ්ඩායමටත් මෙම දීමනාව ලබා දෙන්න පුළුවන් ක්‍රමවේදයක් සකස් කිරීමට අවධානය යොමු කරනවාද කියා මා විශේෂයෙන්ම අහන්න කැමැතියි.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු කාරණාව පිළිබඳව මේ වනවිටත් රජයේ අවධානය යොමු වී තිබෙනවා. එම දීමනාව පොරොත්තු ලේඛනයේ සිටින අයට ලබා දීමට හා එම පොරොත්තු ලේඛනයේ නොමැති, ඊට වඩා සුදුසුකම් තිබෙන අය ඉන්නවාද කියා සොයා බැලීම සඳහා කටයුතු කිරීම සම්බන්ධයෙන් එදා කැබිනට් මණ්ඩලයේදීත් සාකච්ඡා වුණා. මුදල් අමාත්‍යතුමා වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවධානය මේ පිළිබඳව යොමු කරන්න අපි කටයුතු කරනවා.

## ජාතික නිවාස සංවර්ධන අධිකාරිය: ඉදිකර ඇති නිවාස / ලබාදුන් අරමුදල්, ණය

தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபை: நிர்மாணிக்கப்பட்ட வீடுகள்/ வழங்கப்பட்ட நிதிகள், கடன்கள்

NATIONAL HOUSING DEVELOPMENT AUTHORITY: HOUSES CONSTRUCTED/ FUNDS, LOANS GRANTED

1180/2022

**6. ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ මුළු පවුල් සංඛ්‍යාව අතරින් ස්ථිර නිවාස නොමැති පවුල් සංඛ්‍යාව;

(ii) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ස්ථාපිත කරන ලද දිනයේ සිට එම අධිකාරිය විසින් මේ දක්වා ඉදිකර ඇති, ආධාර ලබා දී ඇති සහ ණය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

[ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා]

(iii) වර්ෂ 2015 සිට 2019 දක්වා එම අධිකාරිය විසින් ඉදිකර ඇති සහ ආධාර ලබා දී ඇති නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(iv) එම කාලය තුළ ඉදිකරන ලද නිවාස ව්‍යාපෘති විවෘත කිරීමේදී, එහි ප්‍රචාරක වියදම් සඳහා වැය කරන ලද මුදල;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள மொத்தக் குடும்பங்களில் நிரந்தர வீடற்ற குடும்பங்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபை தாபிக்கப்பட்ட நாளிலிருந்து மேற்படி அதிகார சபையினால் இதுவரை நிர்மாணிக்கப்பட்டுள்ள, உதவிகள் வழங்கப்பட்டுள்ள மற்றும் கடன் வழங்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனையென்பதையும்;

(iii) 2015ஆம் ஆண்டு தொடக்கம் 2019ஆம் ஆண்டு வரை மேற்படி அதிகாரசபையினால் நிர்மாணிக்கப்பட்டுள்ள மற்றும் உதவிகள் அளிக்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனையென்பதையும்;

(iv) மேற்படி காலப்பகுதியில் நிர்மாணிக்கப்பட்டுள்ள வீடமைப்புத் திட்டங்களைத் திறந்துவைக்கும் போது, அதன் பிரசார நடவடிக்கைகளுக்காகச் செலவிடப்பட்ட தொகை எவ்வளவென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development and Housing :

(a) Will he state -

(i) the number of homeless families among the Sri Lankan population; and

(ii) the number of houses that were constructed, the number of houses for which financial grants were given and the number of houses for which loans were given by the National Housing Development Authority since its establishment to date, separately;

(iii) the number of houses that were constructed and the number of houses for which financial grants were given by the said Authority during the years 2015 to 2019, separately; and

(iv) the amount that was spent for publicity activities in inaugurating the housing projects that were constructed during the above-mentioned period?

(b) If not, why?

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2,458,772යි.

(නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් 2016 වර්ෂයේදී දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරු මඟින් දීප ව්‍යාප්තව දියත් කරන ලද නිවාස අවශ්‍යතා පිළිබඳ සමීක්ෂණය මඟින් ශ්‍රී ලංකාව තුළ ස්ථිර නිවාස නොමැති පවුල් 2,458,772ක් සිටින බව හඳුනාගෙන ඇත. මෙහිදී ස්ථිර නිවාස නොමැති පවුල් ලෙස තාවකාලික (පාදම හා බිත්ති තාවකාලිකව ඉදිකර ඇති) නිවාසවල පදිංචි පවුල්, පොල්අතු සෙවිලි කළ නිවාස, තහඩු සෙවිලි කළ නිවාස, කපරාරු කළ යුතු නිවාස හා අඩක් ඉදිකළ නිවාසවල පදිංචි පවුල්, නිවාස ඉදිකිරීමට ඉඩමක් නැති -නිවාස නැති පවුල්, නිවාස ඉදිකිරීමට ඉඩමක් ඇති- නිවාස නැති පවුල් හා කුලියට/බද්දට ස්ථිර පදිංචියට පැමිණෙන පවුල් සලකනු ලැබේ.)

(ii) ආධාර ලබා දී ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව - 329,627යි.

ණය ලබා දී ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව - 982,317යි.

සෘජු ඉදිකිරීම් යටතේ ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව - 26,561යි.

ගරු කථානායකතුමනි, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ලබා දී ඇති තොරතුරු පදනම් කරගෙන තමයි මේ උත්තර ලබා දෙන්නේ.

(iii) ඉදිකර ඇති මුළු නිවාස සංඛ්‍යාව - 65,167යි.

එයින් ආධාර ලබා දී ඉදිකළ නිවාස සංඛ්‍යාව - 13,251යි.

(ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ලබා දී ඇති තොරතුරු අනුව)

(iv) රුපියල් 432,453,931.77යි.

මෙම ව්‍යාපෘතිය විවෘත කිරීමේදී ප්‍රචාරක වියදම් හැටියට තමයි එම මුදල් ප්‍රමාණය වැය වී තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මෙම තොරතුරු ලබා දී තිබෙන්නේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින්.

(ආ) ඉදිරිපත් කරන ලද ප්‍රශ්න සඳහා පිළිතුරු ලබා දී ඇති බැවින් අදාළ නොවේ.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
ගරු කථානායකතුමනි, මීට කලින් අසන ලද සමෘද්ධියට අදාළ ප්‍රශ්නයටත් ගරු ඇමතිතුමා පිළිතුරු ලබා දුන් නිසා, ඒ කාරණයත් එක්ක එකතු කරලාම මම පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්.

ගරු ඇමතිතුමනි, ඉන්දියානු ආධාර යටතේ ලැබුණු සහල් දිළිඳු අයට බෙදා දීම, ඒ වාගේම රුපියල් 5,000ක ආධාර මුදල පවුල් ලක්ෂ 33කට විතර බෙදා දීම ආදී කටයුතු මේ දවස්වල

සමෘද්ධි නිලධාරින් විසින් කරනවා. බොහෝ දෙනෙකු මේ දිනවල ක්ෂේත්‍රයේ පවතින අත්‍යවශ්‍ය රාජකාරි පවා ප්‍රතික්ෂේප කරද්දී සමෘද්ධි නිලධාරින් මේ කටයුතු සිදු කරනවා. ඒ අවස්ථාවලදී මේ නිලධාරින්ටත් රාජ්‍ය සේවකයන්ට තිබෙන ප්‍රශ්නය තමයි තිබෙන්නේ. මේ දිනවල රාජ්‍ය සේවකයන්ට නම් දින කිහිපයක් වැඩට එන්න එපා කියා තිබෙනවා. හැබැයි, සමෘද්ධි නිලධාරින් ගිහිල්ලා ජනතාව එක්ක වැඩ නොකළොත් පවුල් ලක්ෂ 33ක් පමණ වන ඒ දුප්පත්, අහිංසක මිනිසුන්ට කන්න-බොන්න නැතිව ජීවත් වෙන්න බැරි තත්ත්වයක් උදා වෙනවා. ඒ නිසා රජයේ සේවකයන්ට ඉන්ධන ලබා ගැනීමට තිබෙන වැඩ පිළිවෙළ තුළ ඒ අයටත් ඉන්ධන ලබා ගැනීමේදී යම් පහසුකමක් සලසන්න කටයුතු කරනවාද, ඒ සම්බන්ධව ඔබතුමන්ලා වැඩ පිළිවෙළක් හදනවාද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමා එක්ක සාකච්ඡා කිරීමෙන් අනතුරුව මා ඒ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්නම්.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
ගරු ඇමතිතුමනි, ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට උත්තර දෙනකොට ඔබතුමා කිව්වා, සමෘද්ධි නිලධාරින්ගේ ගැටලුව විසඳීම සම්බන්ධයෙන්. එතැන කාරණා දෙකක් තිබෙනවා. කොවිඩ්-19 වසංගතය වෙලාවේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදලින් රුපියල් බිලියන 50කට වැඩි ප්‍රමාණයක් ජනතාවට ජීවත් වෙන්න, එදිනෙදා කටයුතු කර ගන්න බෙදුවා. ඒ මුදල ණයක් විධියට ගත්තේ. හැබැයි, මේ වන විටත් ඒ මුදල ලබා දීලා නැහැ. ඉතාම සුළු කොටසක් තමයි ලබා දීලා තිබෙන්නේ. ඒක සමෘද්ධි බැංකුවට විශාල ගැටලුවක්. ඒ නිසා ඒ මුදල ලබා දෙන්න කටයුතු කරන්න පුළුවන් වන්නේ කොයි කාලයේදීද කියලා මං දැන ගන්න කැමැතියි. මොකද, ජනතාව විශාල විරෝධයක් දක්වනවා ඒ නිසා ඔවුන්ට පාඩුවක් වෙනවා කියලා.

දෙවන කාරණාව මේකයි, ගරු ඇමතිතුමනි. සමෘද්ධි නිලධාරින්ගේ ප්‍රශ්න රාශියක් විසඳා ගන්න පුළුවන් වුණත් යම් ප්‍රමාණයක් -ඉතාම බරපතළ ප්‍රශ්න ටිකක්- තිබෙනවා. ඒ පිළිබඳ Cabinet Papers හතරක් ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත් තවමත් විසඳිලා නැහැ. ඔබතුමා කැබිනට් මණ්ඩලයේ ඉන්න නිසා ඒ ප්‍රශ්න ඉදිරි මාසයක-දෙකක කාලය ඇතුළත විසඳන්න ක්‍රියා කරන්න පුළුවන්ද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්න කඩිනමින් විසඳිය යුතුයි කියා මා හිතනවා. මේවා අවුරුදු ගණනක් තිස්සේ ඇදුණු ප්‍රශ්න. මා හිතන විධියට මේ අතුරු ප්‍රශ්නය කලින් ප්‍රශ්නයටයි අදාළ වන්නේ. මේ කාරණයත් ගරු අගමැතිතුමාගේ අවධානයට යොමු කරන්න කටයුතු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 -1195/2022- (2), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## චුන්නාකම් තැපැල් කාර්යාලය සහ තැපැල් ස්ථානාධිපති නිල නිවස ඉදිකිරීම: අවසන් නොකිරීම

சுன்னாகம் தபால் அலுவலகம் மற்றும் தபால் அதிபரின் உத்தியோகபூர்வ இல்ல நிர்மாணம்: நிறைவுசெய்யப்படாமை

CONSTRUCTION OF CHUNNAKAM POST OFFICE AND POST MASTER'S QUARTERS: NON-COMPLETION

3290/2022

**8. ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**
(மாண்புமிகு தருமலிங்கம் சித்தார்த்தன்)
(The Hon. Dharmalingam Sithadthan)
ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) චුන්නාකම් තැපැල් කාර්යාලය සහ තැපැල් ස්ථානාධිපති නිල නිවස ඉදිකිරීමේ කටයුතු අවසන් කර ඇති බව එවකට යාපනය දිස්ත්‍රික් ලේකම් විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට දන්වා තිබුණද, එම ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැති බවත්;

(ii) ඊට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය දෝෂ සහිත බව ජාතික විගණන කාර්යාලය විසින් පෙන්වා දී ඇති බවත්;

(iii) ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමෙන් ඉහත ව්‍යාපෘතිය නවතා දමන බව වත්මන් දිස්ත්‍රික් ලේකම් විසින් කොන්ත්‍රාත්කරු වෙත දන්වා තිබුණ ද එය නිවැරදි නොවන බවත්;

(iv) ඉහත ඉදිකිරීම් අවසන් නොකිරීම හේතුවෙන් සිදු වූ පාඩුව, අත්තිකාරම් මුදලෙන් අඩු නොකළ මුදල හා ප්‍රමාදය සඳහා අය කළ යුතු දඩ මුදලෙන් කොටසක් පමණක් අය කිරීම සම්බන්ධයෙන් කිසිදු වාර්තාවක් නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර කවරේද;

(ii) නොඑසේ නම්, ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

(iii) සැලසුම් කළ පරිදි ඉහත ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சுன்னாகம் தபால் அலுவலகம் மற்றும் தபால் அதிபரின் உத்தியோகபூர்வ இல்லத்தை நிர்மாணிக்கும் பணிகளை நிறைவு செய்துள்ள தாக அப்போதைய யாழ்பாண மாவட்டச் செயலாளர் அமைச்சின் செயலாளருக்கு அறிவித்துள்ள போதிலும் அந்நிர்மாணப் பணிகள் நிறைவு செய்யப்படவில்லை என்பதை யும்;

(ii) அதற்குரிய பெறுகைச் செயன்முறையானது குறைபாடுகளைக் கொண்டுள்ளதெனத் தேசியக் கணக்காய்வு அலுவலகத்தினால் சுட்டிக்காட்டப் பட்டுள்ளது என்பதையும்;

[ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා]

(iii) போதியளவு ஒதுக்கீடுகள் இல்லாமையின் காரணமாக மேற்குறிப்பிட்ட கருத்திட்டத்தை நிறுத்தப்போவதாகத் தற்போதைய மாவட்டச் செயலாளரால் ஒப்பந்தக்காரருக்குத் தெரிவிக்கப் பட்டுள்ள போதிலும் அது தவறானது என்பதை யும்;

(iv) மேற்குறிப்பிட்ட நிர்மாணப் பணிகளை நிறைவு செய்யாததன் காரணமாக ஏற்பட்ட இழப்பீடு, முற்பணக் கொடுப்பனவில் கழிக்கப்படாத தொகை மற்றும் தாமதத்திற்காக அறவிடப்பட வேண்டிய தண்டப் பணத்தின் ஒரு பகுதி மாத்திரம் அறவிடப்பட்டமை என்பன தொடர்பில் எவ்வித அறிக்கைகளும் இல்லை என்பதையும்;

அவர் அறிவாரா ?

(ஆ) (i) இது தொடர்பாக மேற்கொள்ளப்பட்ட நடவடிக் கைகள் யாவை என்பதையும்;

(ii) இன்றேல், எதிர்காலத்தில் மேற்கொள்ளப் படவுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) திட்டமிட்டவாறு மேற்குறிப்பிட்ட கருத்திட்டத் தின் நிர்மாணப் பணிகள் நிறைவு செய்யப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா ?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Mass Media:

(a) Is he aware that-

(i) the construction activities of the Chunnakam Post Office and the Post Master's quarters have not been completed though the then District Secretary of Jaffna had informed the Secretary to the Ministry that the said construction work is complete;

(ii) the National Audit Office has pointed out that the procument process relating to that is erroneous,

(iii) even though the present District Secretary has informed the contractor that the above project would be stopped due to lack of funds, it is not correct; and

(iv) there is no report on the loss incurred owing to the non-completion of the above construction, the amount that was not deducted from the advance and on charging only a portion of the fine to be charged for the delay?

(b) Will he inform this House -

(i) the steps taken in this regard;

(ii) if not, the steps to be taken in the future; and

(iii) whether the construction work of the above project would be completed as planned;

(c) If not, why?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) චුන්නාකම් තැපැල් කාර්යාලය සහ නව ගොඩනැඟිල්ල ඉදිකිරීම් වැඩ යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සෘජු අධීක්ෂණය යටතේ සිදු කර ඇති අතර, එවකට ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන ලබා දී තිබේ. යාපනය දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා ඇති පරිදි මධ්‍යම රජයේ ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවේ මූලික ඇස්තමේන්තුව අනුව රුපියල් මිලියන 26.5ක් වූ මෙම ඉදිකිරීම් කටයුත්තට අදාළව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා අත්පොතට අනුකූලව ප්‍රසම්පාදනය සිදු කර ඇත.

ඒ අනුව 2019.06.19 වැනි දින ටෙන්ඩර් කැඳවා ඇති අතර, 2019.07.29 වැනි දින M/S Abeishan Construction සමාගමට රුපියල් මිලියන 16.88ක (වැට් රහිත) ටෙන්ඩරය ප්‍රදානය කර ඇත. කෙසේ වුවද, අක්-මුදල් අග්‍රිමය නොලැබීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීමේදී ප්‍රමාදවීම් සිදු වී ඇති අතර, එම ප්‍රමාදය හේතුවෙන් දෙපාර්ශ්වයේම එකඟත්වය මත ගොඩනැඟිල්ලේ වැඩ සම්පූර්ණ කිරීමකින් තොරව කොන්ත්‍රාත්තුව අවසන් කර ඇත. දැනට මෙම ගොඩනැඟිල්ල තැපැල් දෙපාර්තමේන්තුවට භාර දීමට කටයුතු කර ඇති අතර, ඉතිරි වැඩ නිම කළ යුතුව පවතී. ඒ සඳහා රුපියල් මිලියන 7.8ක ඇස්තමේන්තුවක් යටතේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට තැපැල්පති එකඟ වී ඇත.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අත්පොතට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇති බව යාපනය දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා ඇත. ඒ අනුව, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා අත්පොතට අනුකූලව කටයුතු සිදු කර ඇති බවත්, ලංසුකරුවන් 4දෙනෙක් විසින් ලංසු ලියවිලි ලබා ගැනීමට කටයුතු කර ඇති අතර, ඉන් ලංසුකරුවන් දෙදෙනෙක් පමණක් ලංසු ඉදිරිපත් කර තිබෙන බවත්, 2019.07.14 දිනැති ප්‍රසම්පාදන කමිටු අනුමැතිය පරිදි 2019.07.29 දින M/S Abeishan Construction සමාගමට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති බවත්, යාපනය දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා ඇත.

(iii) කොන්ත්‍රාත්තුවේ ප්‍රධාන කටයුතු අවසන් කර, කොන්ත්‍රාත්කරු විසින් ගෙවීම් කටයුතු සඳහා බිල්පත් 2019 වසරේදී ඉදිරිපත් කර තිබුණද, එම වසරේදී ගෙවීම් කළ යුතුව තිබූ බිල්පත් සඳහා අක් -මුදල් ප්‍රමාද වී ලැබීම හේතුවෙන් අදාළ ගෙවීම් කටයුතු ප්‍රමාද වී ඇති බවත්, මෙලෙස ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් දෙපාර්ශ්වයම එකඟ වී කොන්ත්‍රාත් කටයුතු අවසන් කරන ලද බවත් යාපනය දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා ඇත.

(iv) එකඟ වූ කොන්ත්‍රාත් වටිනාකම අනුව ද්‍රවශීල හානිය ලෙස රුපියල් මිලියන 1.6ක් අයකර ඇති බව යාපනය දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා ඇත. මෙම ඉදිකිරීම් කටයුත්තට අදාළව වැඩිදුර තොරතුරු අවශ්‍ය වන්නේ නම්, ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් විමසීම වඩාත් සුදුසුය.

(ආ) (i) මෙම ගොඩනැඟිල්ල දැනට තැපැල් දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති අතර, ඉදිරියේදී තැපැල් දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මඟින් ගොඩනැඟිල්ලේ ඉතිරි වැඩ නිම කිරීමට තැපැල්පති එකඟ ඇත.

(ii) අදාළ නොවේ.

(iii) ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා අවශ්‍ය ඉදිකිරීම් කටයුතු තැපැල් දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මඟින් සිදු කිරීමට තැපැල්පති එකඟ වී ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**
(மாண்புமிகு தருமலிங்கம் சித்தார்த்தன்)
(The Hon. Dharmalingam Sithadthan)

Sir, actually, I put forward this Question to the Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government because the whole episode involves the former GA, Mr. Vedanayagam, and the present GA, Mr. Mahesan. Both of them have done a lot of wrong things there. I certainly can prove it, but that is not the point I am making. I want to know whether this building will be finished or not because even the Hon. Minister, in his reply, said that it has not been finished, but still, it had been handed over to the Department of Posts. I checked with the Department of Posts and they say that they need another Rs. 1 million to finish the work. Before finishing the work, the former GA and the present GA have informed that the work is finished and they had released the contractor also. That is the problem. How can they do that? Also, there are a number of buildings there half finished, but those GAs in the Jaffna District had released the contractors, saying that the work is finished. That is the point I want to make, Sir. Actually, this Question was first directed to the Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government, but, inadvertently, because of the involvement of the Post Office, they must have directed it to you, Hon. Minister. But, actually, this matter is for the Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government because he is the one who has to take an action on that. So, this is not just about the building, but also to find out what exactly happened during the contract period.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

The Hon. Dinesh Gunawardena will give you an answer.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

With your permission, Sir, may I say this. Hon. Member, as per the Question that you have raised in relation to Chunnakam Post Office and its development programme, are you saying that it is only a matter of Rs. 1 million to complete the work? Is that what you said just now, Hon. Member?

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**
(மாண்புமிகு தருமலிங்கம் சித்தார்த்தன்)
(The Hon. Dharmalingam Sithadthan)

Yes.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Hon. Member, by whom were you told that?

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**
(மாண்புமிகு தருமலிங்கம் சித்தார்த்தன்)
(The Hon. Dharmalingam Sithadthan)

By the Department of Posts.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

If it is a job of Rs. 1 million, we will somehow be able to complete it. Anyhow, the Jaffna Post Office is an important place. We have discussed about the Jaffna Post Office and also regarding the Chunnakam Post Office, we will follow up with the Hon. Minister. I assure you that we will give a solution to this problem.

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**
(மாண்புமிகு தருமலிங்கம் சித்தார்த்தன்)
(The Hon. Dharmalingam Sithadthan)

Not only regarding the building, but also make sure that you find out what exactly happened during that period.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

The necessary inquiry, I think, is taking place and the Auditor-General has made his comments in his Report on this matter. So, it is up to the GA now and we will also take it up at the public administration forum.

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**
(மாண்புமிகு தருமலிங்கம் சித்தார்த்தன்)
(The Hon. Dharmalingam Sithadthan)

Thank you very much.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Question No. 9 - 3292/2022 - (1), the Hon. Imran Maharoof - *[Not in the Chamber.]*

Question No. 10 - 3336/2022 - (1), the Hon. Ali Sabri Raheem - *[Not in the Chamber.]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 1 -10/2022- (1), ගරු ගයන්ත කරුණාතිලක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -42/2022- (1), ගරු බුද්ධික පතිරණ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -255/2022- (1), ගරු හේෂා විතානගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -575/2022- (1), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 7 -1195/2022- (2), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 9 -3292/2022- (1), ගරු ඉම්රාන් මහරූෆ් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 -3336/2022- (1), ගරු අලි සබ්රි රහීම් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Member

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු කථානායකතුමනි, විපක්ෂය තම තමන්ටම චෝදනා කරමින් මේ සභාවෙන් යන්න ගියා. කෙසේ වෙතත්, මේ අවස්ථාවේ මම අපේ ගරු කංචන විජේසේකර අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම පොදු ප්‍රවාහන සේවයේ වෘත්තීය සංගම් සියල්ල සමඟ සාකච්ඡා කර, අත්‍යවශ්‍ය සේවාවලට වාගේම පොදු ප්‍රවාහනය සඳහාත් අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය ලබා දීම සඳහා වැඩ පිළිවෙළක් හදන්න එතුමා එකඟ වුණා. මේ වෙනකොටත් එය ක්‍රියාත්මක වෙනවා.

ගරු කථානායකතුමනි, මට තවත් ඉල්ලීමක් කරන්න ඕනෑ. ගරු අග්‍රාමාත්‍යතුමා තමයි මුදල් අමාත්‍යවරයා ලෙසත් කටයුතු කරන්නේ. එතුමා මේ වෙලාවේ ගරු සභාවේ නොසිටියත් මම මේ කාරණය කියන්න ඕනෑ. ගරු කථානායකතුමනි, පොදු ප්‍රවාහනයේ නිරත වෙන ව්‍යවසායකයන් ලීසිං ගෙවා ගන්න විධියක් නැතිව මේ වෙනකොට දැඩි අර්බුදයකට මුහුණ පා සිටින බව අපි දන්නවා. පවතින ඉන්ධන හිඟය නිසා ඒ අයට පසුගිය මාසයක එකහමාරක කාල සීමාව තුළ තමන්ගේ ව්‍යාපාරය හරිහැටි කර ගෙන යන්නත් බැරි වුණා. දැන් ගරු කංචන විජේසේකර අමාත්‍යතුමාගේ මැදිහත් වීම මත ඒ අයට යම් සහනයක් ලබා දෙන්න, එහෙම නැත්නම් යම් ක්‍රමවේදයක් යටතේ ඒ අයට අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය ලබා දෙන්න කටයුතු කරනවා වාගේම, මුදල් අමාත්‍යවරයා විධියට ගරු අග්‍රාමාත්‍යවරයාගෙනුත් මම ඉල්ලීමක් කරනවා, වෘත්තීය සමිති, ලීසිං සමාගම් සමඟ සාකච්ඡා පවත්වා ඒ අයටත් යම්කිසි සහනයක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා.

ගරු කථානායකතුමනි, මහනුවර, වත්තේගම ප්‍රදේශයේදී "සීසර්ලා" ඇවිල්ලා ලීසිං කරපු වාහනයක් ගෙනියන්න හදනකොට එක තරුණයෙක් ජීවිතක්ෂයට පත් වෙලා තිබෙන බව පසුගිය දිනයේ අපි මාධ්‍ය මඟින් දැක්කා. ඒ නිසා මෙය තවත් ඉදිරියට වර්ධනය වෙන්න කලින්, මුදල් අමාත්‍යවරයා විධියට ගරු අග්‍රාමාත්‍යතුමා මැදිහත් වෙලා අදාළ ආයතන සමඟ සාකච්ඡා කර, ඉන්ධන සැපයීමේ ක්‍රමවේදය යථා තත්ත්වයට පත් වනතුරු ඒ අයට යම්කිසි සහනයක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. පොදු ප්‍රවාහන සේවයේ ඒකාබද්ධ මෙහෙයුම් මධ්‍යස්ථානය සහ සියලුම වෘත්තීය සමිති සාමාජිකයන් වෙනුවෙන් ගරු කංචන විජේසේකර අමාත්‍යතුමාට නැවත වතාවක් අපේ ස්තුතිය, ප්‍රණාමය පුද කරනවා.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද කාරණය, ගරු මන්ත්‍රීතුමා?

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)

ගරු කථානායකතුමනි, රටේ ජනතාව විශාල පීඩනයකට පත් වෙලා තිබෙන මෙවන් මොහොතක මම මේ කියන්නට උත්සාහ කරන කාරණයත් විශේෂ එකක්. ඒ සඳහා මට කෙටි වෙලාවක් ලබා දෙන්න.

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9වන ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා, "බුද්ධාගමට පුමුඛස්ථානය දෙන්න. බුද්ධ ශාසනය ආරක්ෂා කර පෝෂණය කිරීම රජයේ වගකීමක්" කියලා.

ඒ වාගේම තමයි, අපි සිංහල බෞද්ධයන් හැටියට අන් ආගම්වල අයගේත් අයිතිවාසිකම් කඩ කරන්නේ නැතිව ඒ අයිතිවාසිකම් සියල්ල ඔවුන්ට ලබා දීලා තිබෙනවා. අපේ රට බෞද්ධ රටක් වුණාට මේ රටේ මොන තරම් හින්දු කෝවිල් තිබෙනවාද? මොන තරම් මුස්ලිම් පල්ලි තිබෙනවාද? මොන තරම් කතෝලික පල්ලි තිබෙනවාද? අපි එහෙම කළාට, උතුරේ සමහර බෙදුම්වාදී දේශපාලන නායකයෝ බුද්ධ ශාසනයට නියමිත ගෞරවය ලබා දෙන්නේ නැහැ. අපි දන්නවා, මීට මාස කිහිපයකට පෙර උතුරේ එක්තරා ප්‍රධාන අමාත්‍යවරයෙක් නාගදීපයේ බුදු පිළිමයක් ඉදිකරන එකට සම්පූර්ණයෙන්ම විරුද්ධත්වය පළ කළ බව. ඒ වාගේ, උතුරු ප්‍රදේශයේ දිගින් දිගටම කෙනෙහිලිකම් සිදු වෙනවා. ගරු කථානායකතුමනි, මීට සතියකට පෙර මුලතිව් ප්‍රදේශයේ පිහිටි ඓතිහාසික කුරුන්දාශෝක චෛත්‍යයේ ධාතු නිදන් කරන්නට යනකොට ද්‍රවිඩ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුන් දෙදෙනෙක් මැරයන් පිරිසක් සමඟ ඇවිල්ලා ඒ කටයුත්ත සම්පූර්ණයෙන්ම කඩාකප්පල් කළා. මේ බෞද්ධ රටේ ශාසනය පෝෂණය කරන්නට දෙන්නේ නැත්නම්, දෙමළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සහභාගි වෙලා ඒ කටයුත්ත කඩාකප්පල් කරන්නට නායකත්වය දෙනවා නම්, ඒක ඔබතුමාගේ අවධානයට යොමු කළ යුතුයි කියා තමයි මා සිතන්නේ.

ගරු කථානායකතුමනි, මා ප්‍රකාශ කළ කුරුන්දාශෝක මහා චෛත්‍යය වසර 2,000ක් පමණ පැරණියි. ඒ වාගේම තමයි, ක්‍රි.ව. 100දී පමණ බල්ලායනාග රජතුමා තමයි මේ චෛත්‍යය ඉදිකර තිබෙන්නේ. ඊට පසු ක්‍රි.ව. 571දී පමණ පළමුවැනි අග්බෝ රජු විසින් මෙය පිළිසකර කර තිබෙනවා. ඊට පසු අපි කවුරුත් දන්නා මහා විජයබාහු රජු ක්‍රි.ව. 1055දී පමණ නැවත වරක් මේ චෛත්‍යය පිළිසකර කළාය කියා මහා වංශයේ සඳහන් වෙලා තිබෙනවා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් 2021 ජනවාරි මාසයේ මේ චෛත්‍යයේ කැනීම් ආරම්භ කළා. ඒ කැනීම්වලදී ඉතා වටිනා බෞද්ධ පුරාවස්තු රැසක් මේ චෛත්‍යයෙන් මතු වුණා. කබොක්වලින් හදපු ලංකාවේ ප්‍රථම පද්මාකාර චෛත්‍යය තමයි මේ කුරුන්දාශෝක චෛත්‍යය.

ඊට පස්සේ මේ ස්ථානය සම්බන්ධව මුලතිව් අධිකරණයෙන් නියෝගයක් ලැබුණු බව අපි දන්නවා. ඒ අධිකරණ නියෝගය

අනුව මේ ස්ථානය පුරාවිද්‍යා ස්ථානයක් ලෙස අධිකරණය පිළිගෙන තිබෙනවා. ඒ අනුව, එම ස්ථානය සංරක්ෂණය කරන්නට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අවසර දීලා තිබෙනවා. ඒ වාගේම තමයි, ඕනෑම සංවර්ධන ව්‍යාපෘතියක් අදාළ දෙපාර්තමේන්තු බලධාරීන් දැනුවත් කර සිදු කරන්නත් අවසර ලබා දී තිබෙනවා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ අවශ්‍ය කරන සියලු පුද්ගලයන් දැනුවත් කරලා, 100නමකට අධික මහා සංඝ රත්නයටත් ආරාධනා කරලා, මේ චෛත්‍යයේ නිදන් වස්තු තැන්පත් කරන අවස්ථාවට ගියාම, ද්‍රවිඩ ජාතික සන්ධානයේ සෙල්වරාජා කජේන්ද්‍රන් සහ නෝගරාදලිංගම් කියන මන්ත්‍රීවරු දෙදෙනා මැරයන් සමඟ ඇවිල්ලා ඒ සංඝයා වහන්සේලාට මලක්වත් පූජා කරන්නට ඉඩ දුන්නේ නැහැ, ගරු කථානායකතුමනි. ඔවුන් මැරයන් ලෙස ගෙනා පිරිස ගමේ අය නොවෙයි. යාපනය, මන්නාරම සහ කිලිනොච්චියේ පිරිසක් තමයි ඒ ගෙනාවේ. මේ කටයුත්ත සඳහා රජයේ මුදල් භාවිත කළේ නැහැ. බෞද්ධාලෝක පදනමේ සභාපති ජගත් සුමතිපාල මැතිතුමාගේ පෞද්ගලික මුදලින් තමයි ඒ සම්පූර්ණ වියදම දැරුවේ.

ගරු කථානායකතුමනි, මා අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ, දැනට රටේ පවතින ප්‍රශ්න හමුවේ, ඒවාට මුවා වෙලා ද්‍රවිඩ සන්ධානයේ මන්ත්‍රීවරු ශාසනයට සහ මහා සංඝ රත්නයට කළ අපහාසය අපි තදින්ම හෙළා දකිනවා. අපි දන්නවා, එදා මේ බෞද්ධ රටේ ගෝනගල ගමේ සිංහලයන් 54 දෙනෙක් මරලා, බඩදරු අම්මලාගේ බඩ කපලා කිරි කැටියා එළියට අරගෙන මාළු කපනවා වාගේ කපද්දිත් කොළඹ වීදි දිගේ හින්දු චේල් කරත්තය ගියා. ද්‍රවිඩ සන්ධානය කියන්නේ ප්‍රභාකරන්ගේ දේශපාලන පක්ෂය. ප්‍රභාකරන් සිංහලයන්ව පෙති පෙති කපන කොටත්, අපි ඔවුන්ගේ අයිතිවාසිකම් රැක්කා. ඉතින්, තමුන්නාන්සේලා ලජ්ජා වෙන්න ඕනෑ, මේ වාගේ අවස්ථාවක දී අහිංසකව ගිය මහනායක අනුනායක හිමිවරුන්ට මලක්වත් පූජා කරන්න දෙන්නේ නැතිව යවපු එක ගැන. තමුන්නාන්සේලා අපේ සිංහල බෞද්ධයන්ගේ ඉවසීම සහ අනුකම්පාව නිවටකමක් ලෙස හිතන්න එපා. ඒ ඉවසීමෙත් සීමාවක් තිබෙන බව දැන ගන්න ඕනෑ කියන එකත් මේ අවස්ථාවේ දී මම මතක් කරනවා.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
### குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்
### CODE OF CRIMINAL PROCEDURE (AMENDMENT) BILL

"1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා විසිනි.***

***2022 ජූලි 04වන සඳුදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர் மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2022 யூலை 04, திங்கட்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.*

*Presented by the Hon. (Dr.) Wijeyadasa Rajapakshe, Minister of Justice, Prison Affairs and Constitutional Reforms; to be read a Second time upon*

*Monday, 04th July, 2022 and to be printed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් පිළිගැන්වීම. න්‍යාය පත්‍රයේ යෝජනා අංක 2,3,4. ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දිනට නියමිත ප්‍රධාන වැඩ කටයුතු. න්‍යාය පත්‍රයේ යෝජනා අංක 1 සිට 3 දක්වා ඉදිරිපත් කිරීම.

## සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
## குடியியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்
## CIVIL PROCEDURE CODE (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ]*

*Resolved:*

*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Wijeyadasa Rajapakshe]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
[THE HON. SPEAKER *in the Chair.]*

***1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1 ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- (101 වන අධිකාරයට 154අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම)
## வாசகம் 2.- (101ஆம் அத்தியாயத்துக்கு 154அ என்னும் புதிய பிரிவை உட்புகுத்துதல்)
CLAUSE 2.- *(Insertion of new section 154A into Chapter 101)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"2 වන පිටුවේ, 12 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'අන්තර් කාලීන විධිවිධාන 3.මේ පනතේ 2 වන වගන්තියේ සහ සාක්ෂි ආඥා පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මෙම පනත ක්‍රියාත්මක වන දිනයේ දී විභාග වෙමින් පවත්නා යම් නඩුවක හෝ අභියාචනයක -

(අ) (i) විරුද්ධ පාර්ශ්වය, සාක්ෂියේදී ඉදිරිපත් කරනු ලබන ඔප්පුව හෝ ලේඛනය සාක්ෂි ලෙස භාර ගැනීමට විරුද්ධ නොවන්නේ නම් හෝ විරුද්ධ වී නොමැති නම්; හෝ

(ii) විරුද්ධ පාර්ශ්වය, සාක්ෂියේ දී ඉදිරිපත් කරනු ලබන ඔප්පුව හෝ ලේඛනය සාක්ෂි ලෙස භාර ගැනීමට විරුද්ධ වී ඇති මුත්, නඩුවක් අවසාන කරනු ලබන අවස්ථාවේ දී සාක්ෂි ලෙස එම ලේඛනය කියවනු ලබන විට විරුද්ධ වී නොමැති නම්, තවදුරටත් වූ ඔප්පු කිරීමකින් තොරව, අධිකරණය විසින් එම ඔප්පුව හෝ ලේඛනය සාක්ෂි ලෙස පිළිගනු ලැබිය යුතු ය;

(ආ) විරුද්ධ පාර්ශ්වය, සාක්ෂි ලෙස ඔප්පුවක් හෝ ලේඛනයක් භාර ගැනීමට විරුද්ධ වන්නේ නම් හෝ විරුද්ධ වී ඇති නම්, එම ඔප්පුවේ හෝ ලේඛනයේ ලියා අත්සන් කිරීම හෝ නිර්ව්‍යාජභාවය සම්බන්ධයෙන් සිදුකර ඇති විරෝධතාවල භරය සැලකිල්ලට ගනිමින් අධිකරණය විසින් එවැනි ඔප්පුවක් හෝ ලේඛනයක් පිළිබඳ විධිමත් ඔප්පු කිරීමක් අවස්ථාවෝචිත පරිදි අවශ්‍ය වන්නේ ද හෝ අවශ්‍ය වූයේ ද යන්න තීරණය කරනු ලැබිය හැකි ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

***3 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*3ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 3 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
## குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்
## CODE OF CRIMINAL PROCEDURE (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Wijeyadasa Rajapakshe.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
[THE HON. SPEAKER *in the Chair.]*

***1 සිට 4 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 4ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 4 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendments.*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறை வேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු කථානායකතුමනි, කාලීන අවශ්‍යතාව අනුව, අද දින ගරු සභාවට ඉදිරිපත් කළ සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත සහ අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත විවාදයකින් තොරව සම්මත කර ගැනීමට සියලු පක්ෂ නායකයන්ගේ එකඟත්වය අනුව සහයෝගය ලබා දුන් සියලුදෙනාට මගේ ගෞරවය සහ ස්තුතිය පුද කරනවා. ඒත් එක්කම, මේ සම්බන්ධව මගේ අදහස් දැක්වීමට මා ඔබතුමාගෙන් ගෞරවයෙන් අවසර පතනවා, ගරු කථානායකතුමනි.

අද දිනයේ පාර්ලිමේන්තුවේ සිදු වූ ක්‍රියාදාමයත්, පසුගිය මාස කිහිපය තුළ මේ පාර්ලිමේන්තුව තුළ සිදු වෙමින් පැවති දේවලුත් සම්බන්ධව මේ රටේ ජනතාවට විශාල ප්‍රහේලිකාවක් තිබෙනවා, විසඳා ගන්න. මෙය එක දිනකදී, එක මොහොතකදී ඇති වුණු දෙයක් නොවෙයි, පසුගිය අවුරුදු දෙකක, දෙකහමාරක කාලය තුළම අපි දැකපු දෙයක්.

ගරු කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති, මේ රටේ ජනතාව උද්ඝෝෂණය කරන්න පාරට බහින්න කලින් අප්‍රේල් මාසයේ 4 වැනි දා මම ඔබතුමාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 74 වන ව්‍යවස්ථාව යටතේ යෝජනාවක් භාර දුන්නා. ඒ යෝජනාවෙන් මම කිව්වේ, දැන් රටේ මතුවෙලා තිබෙන ප්‍රශ්න ගැන කටයුතු කිරීම සඳහා මීට වඩා වැඩි වගකීමක් ඇති මහජන නියෝජිතයෝ විධියට, අන්තර්කාලීන සර්ව පාක්ෂික ආණ්ඩුවක් ස්ථාපනය කරන්න ඕනෑ කියන කාරණයයි. ඔබතුමාට මතක ඇති, මමත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරයෙක් වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයෙන් තේරී පත් වුණාට, පසුගිය කාලය පුරාම ආණ්ඩුව ඇතුළේ ඉඳගෙන මම විපක්ෂයේ කාර්ය භාරයත් ඉෂ්ට කර තිබෙන බව. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු වෙලාවේ අපි ලොකු උත්සාහයක් දැරුවා ඒක වළක්වා ගන්න. මොකද, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් අපි ඇති කරපු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ එමගින් අහිමි වුණොත් මේ රටේ පාර්ලිමේන්තුවේ ප්‍රජාතන්ත්‍රවාදී පැවැත්ම පිළිබඳව අපට සැකයක් තිබුණු නිසා. ඒ වෙලාවේ මම විතරක් නොවෙයි දැන් මෙතැන ඉන්න, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා ඇතුළු අපේ සහෝදර මන්ත්‍රී කණ්ඩායමක් -විසිදෙනෙක්- අතිගරු ජනාධිපතිතුමාටත්, හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් ඒ පිළිබඳව ඉල්ලීම් දහයක් ඉදිරිපත් කළා.

අපි ඉදිරිපත් කරපු ඒ ඉල්ලීම් දහයෙන් අපිට පුළුවන්කම ලැබුණා, කරුණු හතක් සම්බන්ධව එකඟතාවකට එන්න. ඒ අනුව අපි යම් ජයග්‍රහණයක් ඒ කරුණු හත මත ලබා ගත්තා. ඒ වාගේම තවත් කරුණු දෙකක් සම්බන්ධව මධ්‍යස්ථ තැනකට ඇවිල්ලා අපට එකඟතාවකට එන්න පුළුවන්කම ලැබුණා. නමුත්, දහවැනි කරුණ වෙනුවෙන් අපි ලොකු සටනක් කළත්, අපට ඒ සම්බන්ධව එකඟතාව ලබා ගන්න බැරි වුණා. ඒ, ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ ප්‍රශ්නය. නමුත් අපි යම් එකඟතාවක් ඇතිව, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳ බලාපොරොත්තු දල්වාගෙන ඒ සංශෝධන පනත් කෙටුම්පතට අපේ ඡන්දය ලබා දෙන්න කටයුතු කළා, තුනෙන් දෙකක ඡන්දය අවශ්‍ය නිසා. නමුත් මේ රටේ තිබුණු තත්ත්වය එක්ක පැවැති නොයෙකුත් විවිධාකාර ප්‍රශ්නත් එක්ක එවැනි අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත වුණේ නැහැ. නමුත්, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව ජාත්‍යන්තරය ප්‍රශ්න කරන ආකාරය, අපට සහයෝගය ලබා දීම පිළිබඳව ප්‍රශ්න කරන ආකරය අපි කල් ඇතිව දැක්කා. මීට පෙරත් අපට ඒ අත්දැකීම් තිබුණා. ගරු කථානායකතුමා ඇතුළු මේ පාර්ලිමේන්තුවේ ඉන්න අපේ ගරු මන්ත්‍රීතුමන්ලා එය දන්නවා. කාලයක්, අපට යුරෝපා සංගමය ලබා දුන් GSP සහනය අහිමි කරලා තිබුණා. ඒ වාගේම යුරෝපීය වෙළෙඳ පොළට අපේ මාළු අපනයනය කිරීම තහනම් කරලා තිබුණා. ඒ වාගේ වකවානුවක් තිබුණේ. ඒවා නැවත ලබා ගන්න, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැවත වතාවක් ස්ථාපිත කරන්න ඕනෑ කියන පදනම ඇතිව තමයි 2015දී මේ රටේ ජනතාව විශාල වෙනසකට මඟ පෑදුවේ. ඒ අනුව තමයි ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පොදු අපේක්ෂකයා විධියට ඉදිරිපත්වෙලා මේ රටේ ජනාධිපතිවරයා බවට පත් වුණේ.

ඉන් පස්සේ 2015 අප්‍රේල් මාසයේ 28 වැනි දා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරගෙන, එදා ගරු මංගල සමරවීර මැතිතුමා ඇතුළු අපි ජිනීවා මානව හිමිකම් කොමිසමට ගිහිල්ලා විදේශීය සංවිධාන හා විදේශීය රාජ්‍ය සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. අපි මේ රට තුළ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ඇති කර, නීතියේ ආධිපත්‍යය ඇති රටක් නිර්මාණය කරනවා කියලා පොරොන්දුවෙලා නොයෙකුත් අයිතිවාසිකම් නැවත ලබා ගත්තා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් ඒවා ඉවත් කිරීම තුළ අපි දැක්කා යම්කිසි අර්බුදකාරී තත්ත්වයකට මේ රට අරගෙන යනවා කියලා. ඒ අර්බුදය අපි දැක්කා. විශේෂයෙන්ම බදු සහනය ලබා දෙන කොට, ඒ වාගේම පොහොර ප්‍රතිපත්තිය අනුගමනය කරන කොට, මේ අර්බුදය ඇති වන බව අපි දැක්කා. මේ සභාවේ ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලාට මතක ඇති, ගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ, දෙසැම්බර් මාසයේ මා විවිධ නාළිකාවල කළ හැම සජීවී සාකච්ඡාවකදීම කිව්වා, 2022 අප්‍රේල් මාසය වන කොට අපේ රටේ ආර්ථිකය ගෙන යන්න බැහැ, අපි ලොකු ආර්ථික අර්බුදයකට මුහුණ දෙනවා, ඒ වාගේම අපි ලොකු දේශපාලන අර්බුදයකට යනවා, අප්‍රේල් මාසය වන කොට ජනතාවගේ

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

අත්‍යවශ්‍ය භාණ්ඩවල හිඟතාවක් ඇති වනවා, මේ රටේ ජනතාව පාරට බහින්න ඉඩ තිබෙනවා, ජනතාව රෞද්‍ර වනවා; ප්‍රචණ්ඩ වනවා, අපට පාර්ලිමේන්තුව පවා පවත්වාගෙන යන්න බැරි තත්ත්වයකට පත් වනවා කියලා. මම එදා -ගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ හා දෙසැම්බර් මාසයේ- කිව්ව වචනම තමයි අදත් මේ කිව්වේ.

ගරු කථානායකතුමනි, අපි ඒක කල් තියා දැකපු නිසා මම තමුන්නාන්සේට ඉදිරිපත් කළා, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 74වැනි ව්‍යවස්ථාව යටතේ යෝජනා සම්මතයක්. ඒ යෝජනා සම්මතය ගැන සාකච්ඡාව යන අතරතුර තමයි මේ රටේ ජනතාව මහ පාරට බැස්සේ. ඔය අවස්ථාවේදීයි, ආණ්ඩුවට ගෙදර යන්න කියලා, ජනාධිපතිතුමාට ගෙදර යන්න කියලා පෙළපාළි යන්න පටන් ගත්තේ. මේ තත්ත්වය කල් තියා දැකපු නිසා ඒ යෝජනා සම්මතය ඉදිරිපත් කරලා විතරක් අපි නතර වුණේ නැහැ.

ගරු කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති, පොහොට්ටුවේ මන්ත්‍රීවරයකු විධියට තේරී පත් වුණත්, මා 2021 අප්‍රේල් මාසයේ ඉඳලා ස්වාධීන මන්ත්‍රීවරයකු විධියට මේ සභාවේ කටයුතු කළ බව. විශේෂයෙන්ම කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත් කෙටුම්පත ගෙන ආ අවස්ථාවේ ඉඳලා ඇති වුණු මත ගැටුම් එක්ක මා ස්වාධීන මන්ත්‍රීවරයකු විධියට සිටිද්දී පාර්ලිමේන්තුව තුළ ගැටලුකාරී තත්ත්වයන් ඇති වනකොට තවත් මන්ත්‍රීවරු 30දෙනෙක් ස්වාධීන මන්ත්‍රීවරුන් බවට පත් වුණා. ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ප්‍රමුඛ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, අනෙකුත් දේශපාලන පක්ෂ, සන්ධානය තුළ සිටි ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා, ගරු විමල් වීරවංශ මැතිතුමා ඇතුළුව මන්ත්‍රීවරු 30දෙනෙකුගේ කණ්ඩායමක් මේ පාර්ලිමේන්තුවේ ස්වාධීන වනකොට මමත් එක්ක ඒ සංඛ්‍යාව 31දෙනෙක් බවට පත් වුණා. ඊට පසුව, ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා, ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා ආදි තව 10දෙනෙකුගේ කණ්ඩායමක් පාර්ලිමේන්තුව තුළ ස්වාධීන වනකොට අපේ ස්වාධීන කණ්ඩායම 41දෙනෙක් බවට පත් වුණා. ජනතාව අපට මොන තරම් දෝෂාරෝපණය කළත්, අවලාද කළත් ඒ 41 කණ්ඩායම විධියට අපි නිකම් හිටියේ නැහැ. අපි මාසයක් පුරා වෙහෙසුණා. මේ කාරණය මේ රටේ ජනතාවට කිව්වේ නැත්නම් මේ පිළිබඳව විශාල වැරැදි ආකල්පයක් ඇති වෙනවා. ඒ මාසය පුරාවට අපි ජනාධිපතිතුමාත් එක්ක සාකච්ඡා කළා; එවකට හිටපු ගරු අගමැතිතුමාත් එක්ක සාකච්ඡා කළා. හැබැයි, අප ප්‍රමුඛතාව දුන්නේ ඒ සාකච්ඡාවලට නොවෙයි. අප ප්‍රමුඛතාව දුන්නේ විපක්ෂයත් එක්ක කරපු සාකච්ඡාවලට. 41දෙනාගේ කණ්ඩායම විධියට අපි ගරු විපක්ෂ නායකතුමාත්, එතුමාගේ කණ්ඩායමත් එක්ක දිගින් දිගට සාකච්ඡා කරලා ඉල්ලීමක් කළා. ඒ වන කොට ආණ්ඩුව යම්කිසි ආකාරයකින් කඩා වැටිලා තිබුණා; අසාර්ථක වෙලා තිබුණා. හැබැයි අපේ 41දෙනාගේ කණ්ඩායමට -අපට- ආණ්ඩුවක් ගෙන යන්න පුළුවන්කම තිබුණා. ඒ 41දෙනාගේ කණ්ඩායම තවත් දින කිහිපයක් යනකොට 53ක කණ්ඩායමක් බවට පත් වුණා. 53 කණ්ඩායම විධියට අපි සාකච්ඡා කළා, ගරු විපක්ෂ නායකතුමා සහ එම කණ්ඩායමත් එක්ක. අපි එතුමාගෙන් ඉල්ලීමක් කළා. "අපිට ආණ්ඩුව හදන්න පුළුවන්. හැබැයි අපි ආණ්ඩුව හැදුවාට සුජාතභාවය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. පොදුජන පෙරමුණෙන් කැඩිච්ච කොටසක් විධියටයි අපි ආණ්ඩුව හදන්නේ. ඒ නිසා මේ අර්බුදකාරී අවස්ථාවේ මේ ප්‍රශ්නයට මැදිහත් වෙන්න සුජාතමය අයිතියක් තිබෙනවා" කියලා අපි කිව්වා. අපි ගරු විපක්ෂ නායකතුමාට කිව්වා, "අගමැතිකමත්, ආණ්ඩුවත් භාර ගන්න" කියලා. අපි ඒක නිකම් නොවෙයි කිව්වේ. අප ගිහිල්ලා අතිගරු ජනාධිපතිතුමා එක්ක දින ගණනාවක් සාකච්ඡා කරලායි එහෙම කිව්වේ. අපේ ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාත්, ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් දැන් මේ ගරු සභාවේ ඉන්නවා. එතුමන්ලා ඒකට සාක්ෂි. අපි ගිහිල්ලා අතිගරු ජනාධිපතිතුමා එක්ක දිගින් දිගට සාකච්ඡා කරලා ඉල්ලීමක් කළා, "මේ ප්‍රශ්න විසඳන්න සාමූහිකව කෙටි කාලයකට අන්තර්කාලීන ආණ්ඩුවක් හදමු. ඒ සඳහා අග්‍රාමාත්‍ය ධුරය ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාට භාර දෙන්න. මේ ආණ්ඩුව නිර්මාණය කරන්න විපක්ෂයට භාර දෙන්න" කියලා. අපි අතිගරු ජනාධිපතිතුමාගෙන් ඒ ඉල්ලීම කළා විතරක් නොවෙයි, එතුමා අපිත් එක්ක ඒකට එකඟ වුණා. ඒ එකඟතාව මත අපි ඇවිල්ලා විපක්ෂයෙන් ඉල්ලීමක් කළා, "දැන් ආණ්ඩුව භාරගන්න" කියලා. හැබැයි විපක්ෂය ආණ්ඩුව භාර ගත්තේ නැහැ. ඒ අය "බැහැ" කිව්වා. ඊළඟට අපේ 53දෙනාගේ කණ්ඩායම වෙනුවෙන් අපි යෝජනාවක් කළා, "ප්‍රධාන විපක්ෂය සමඟ අපි 53දෙනාගේ කණ්ඩායම එකතු වෙන්න ලෑස්තියි. රට වෙනුවෙන් මේ අර්බුදයෙන් ජනතාව බේරා ගැනීම සඳහා අපි ඕනෑම කැපවීමක් කරනවා. ප්‍රධාන විපක්ෂයත් අපිත් එකතු වෙලා ආණ්ඩුවක් හදමු" කියලා. ඒ යෝජනාවත් ගරු විපක්ෂ නායකතුමා ප්‍රතික්ෂේප කළා. ඒ වෙලාවේ තමයි අපි කිව්වේ, "එහෙම නම් විපක්ෂයෙන් දෙන යෝජනා කරුණාකර අපට ඉදිරිපත් කරන්න" කියලා. ඒවා සුදුසු දේවල් නම් ඒවාට සහයෝගය ලබා දෙන්න අපට පුළුවන් කියන තත්ත්වයට අපි අපේ කණ්ඩායම ගෙන ආවා.

ගරු කථානායකතුමනි, ඒ අනුව විපක්ෂයෙන් අපට ඉදිරිපත් කළ පළමුවැනි යෝජනාව තමයි, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න ඕනෑ කියන එක. අපි ඒ ගැන ප්‍රශ්න කළා. අපි කිව්වා, "විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම පිළිබඳව අපට ගැටලුවක් නැහැ. හැබැයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඒකට ක්‍රමවේදයක් තිබෙනවා. ඒ දෙය අපට විපක්ෂයේ ඉඳගෙන කරන්න බැහැ. එහෙම නම් අපි ආණ්ඩුව අරගෙන ඒක කරමු. අපි ආණ්ඩුව ගත්තත් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න අපට බැහැ. තුනෙන් දෙකක බලයක් අරගෙන ජනමත විචාරණයකිනුත් අනුමැතිය ලබා ගන්න ඕනෑ. මේ ආර්ථික කඩා වැටීමත් එක්ක ජනමත විචාරණයක් පවත්වන්න තරම් අද මේ රටේ හොඳ වාතාවරණයක් නැහැ" කියලා. ඒ නිසා අපි පළමුවැනි යෝජනාවට එකඟ වුණේ නැහැ.

අප පළමුවැනි යෝජනාවට එකඟ නොවුණු නිසා ගරු විපක්ෂ නායකතුමා දෙවැනි යෝජනාව ඉදිරිපත් කළා, විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න ඕනෑ කියලා. ගරු කථානායකතුමනි, ඒ වෙලාවේදීත් අප ප්‍රශ්න කළා, "විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන එකේ ප්‍රශ්නයක් නැහැ. ආණ්ඩුවට විරුද්ධව ඡන්දය පාවිච්චි කරන එකේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි, රටේ ජනාධිපතිවරයා විපක්ෂයට ආණ්ඩුව භාර ගන්න කියලා ආරාධනා කර තිබෙන වෙලාවේ විශ්වාස භංග යෝජනාවක් ගෙන ඒමේ ප්‍රතිඵලය මොකක්ද?" කියලා. ආණ්ඩුවට ගෙදර යන්න දෙයක් නැහැ. ජනාධිපතිතුමා කියා තිබෙනවා, ආණ්ඩුව භාර ගන්න කියලා. නමුත්, ආණ්ඩුව භාර ගන්නේ නැතිව පාර්ලිමේන්තුවට විශ්වාස භංග යෝජනාවක් ගෙන ඒම කිසිම ප්‍රතිඵලයක් නැති ක්‍රියාවක් නිසා අපි ඒ කාරණය පහදා දුන්නා.

ගරු කථානායකතුමනි, ඒ පාර්ශ්වයෙන් ඉදිරිපත් කළ තුන්වන විකල්පය තමයි, පාර්ලිමේන්තු මැතිවරණයක් පවත්වන්න ඕනෑ කියන එක. ඒකටත් අපි එකඟයි, ගරු කථානායකතුමනි. ඒ බව අපි පැවසුවා. හැබැයි, මහ මැතිවරණයක් පවත්වන්න තරම් සුදුසු වාතාවරණයක් රටේ තිබෙන්න ඕනෑ. ජනතාව අත්‍යවශ්‍ය දේවල් නැතිව පෝලිම්වල ඉන්න යුගයක -කාල වකවානුවක- පාර්ලිමේන්තු මැතිවරණයක් පවත්වන්න කියලා මේ රටේ කවුරුවත් ඉල්ලන්නේ නැහැ. ඒ නිසා අපි සියලුදෙනා එකතු වෙලා වර්තමානයේ රටේ පවතින ආර්ථික ප්‍රශ්න යම් මට්ටමකට නිරාකරණය කරගෙන සුදුසු පරිසරය නිර්මාණය වුණාම

පාර්ලිමේන්තු මැතිවරණයකට යන්න අප එකඟයි කියන කාරණය අපි සඳහන් කළා. ගරු කථානායකතුමනි, ඒකටත් එකඟ නොවුණු තැන අපි කණ්ඩායමක් විධියට ගිහිල්ලා අතිගරු ජනාධිපතිතුමාට කිව්වා, "විපක්ෂය අගමැතිකම භාර ගන්නේ නැහැ. විපක්ෂය ආණ්ඩුව භාර ගන්නේ නැහැ. එහෙම නම්, අගමැතිකම බාර ගන්නා කෙනෙකුට -සුදුසු කෙනෙකුට- ඔබතුමා අගමැතිකම බාර දෙන්න. ඒ කවුරු වුණත් ඒ අගමැතිවරයාට අපේ කණ්ඩායමේ සහාය ලබා දෙනවා" කියලා. අපි එසේ ප්‍රකාශ කළා. ඒ අනුව අතිගරු ජනාධිපතිතුමා, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැතිවරයා විධියට පත් කළා. ප්‍රධාන විපක්ෂය ඇතුළු සියලු පක්ෂ, -විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය- නිවේදනයකුත් නිකුත් කරමින් විපක්ෂයේ ඉඳගෙන මේ ආණ්ඩුව ගෙන යන්න එතුමාට සහයෝගය ලබා දෙනවා කියන කාරණය ප්‍රකාශ කළා. ගරු කථානායකතුමනි, ඒ අනුව ගරු අග්‍රාමාත්‍යවරයා එම තනතුර බාරගෙන මේ වන විට මාසයකුත් දවස් 10ක් පමණ ගත වී තිබෙනවා. ඒ කාල සීමාව තුළ එතුමා විශාල උත්සාහයක් දැරූ බව අපි දන්නවා.

විශේෂයෙන්ම විදේශ විනිමය ප්‍රශ්නය අද අපට තිබෙන බරපතළ, උග්‍ර ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය පසුගිය දවස්වල තවත් උග්‍ර වුණා. මේ අවුරුද්ද ආරම්භයේදී දවසකට 5,000ක් විතර ලංකාවට ආ සංචාරකයන් ප්‍රමාණය මේ වනකොට 800කට වාගේ අඩු වෙලා තිබෙනවා. ඉන්ධන ප්‍රශ්නය උග්‍ර වීම වාගේම මහ පාරේ තිබෙන සටන් ව්‍යාපාර නිසා බොහෝ සංචාරකයන් ශ්‍රී ලංකාවට එන්න මැළිකමක් දක්වා තිබෙනවා. ඒ ප්‍රශ්නය ඔඩු දුවලා තිබෙන නිසා තමයි මේ තත්ත්වය අද උදා වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මම මේ කාරණා ඉදිරිපත් කළේ හේතුවක් ඇතිවයි. විපක්ෂයේ සමහර ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් දක්වද්දී සමහර ඇමතිවරුන්ට චෝදනා කළා, 'ඇමතිකම් ඕනෑ නිසා, එහෙම නැත්නම් බලයේ එල්ලී ඉන්න ඕනෑ නිසා ඇමති ධුර ලබා ගත්තා' කියලා.

මෙය ජාතික වශයෙන් අර්බුදයකට මුහුණ දීපු අවස්ථාවක්, ගරු කථානායකතුමනි. අපි කවුරුවත් ඇමතිකම් දැරීමේ අවශ්‍යතාවට, ආසාවට, දොළ දුකක් සංසිඳවා ගන්නට මේ තනතුරු භාර ගත්තේ නැහැ. මේ අවස්ථාවේදී අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් දේශපාලනික වශයෙන් මේ රට විශාල ප්‍රතිසංස්කරණයකට යන්න ඕනෑ කියන මතය දරනවා.

ඒ සඳහා අවශ්‍ය සහාය ලබා දෙන ලෙස මටත් ආරාධනා කළ නිසා තමයි මං අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ධුරය භාර ගත්තේ.

ගරු කථානායකතුමනි, "විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කන්නද?" කියලා සමහර වෙලාවට විපක්ෂයත්, මේ රටේ විද්වතුන් කියන අයත් මාධ්‍යයෙන් අහනවා මා දැකලා තිබෙනවා. අපි ඒ කථාව ගැන කනගාටු වනවා. අද මේ ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා අවශ්‍ය මූලික පදනම දැමීමට තිබෙන එකම විසඳුම තමයි, විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිතයන්, ඇමෙරිකා එක්සත් ජනපදයේ නියෝජිතයන් වාගේම යුරෝපා සංගමයේ නියෝජිතයන් එක්ක කථා කරනකොට ඔවුන් අපෙන් අහනවා, ඔබතුමන්ලාගේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍යය කෝ කියලා. මේ රටේ නීතියේ ආධිපත්‍යය, ප්‍රජාතන්ත්‍රවාදය හදන්න කියා ඔවුන් අපට කියනවා.

පසුගිය මාසයක කාලය පුරාවට මේ රටේ පාර්ලිමේන්තුව නියෝජනය කළ සියලු දේශපාලන පක්ෂ නායකයන් එක්ක අපි දිගින් දිගටම සාකච්ඡා කළා. පාර්ලිමේන්තුව නියෝජනය නොකරන සියලු දේශපාලන පක්ෂ නායකයන් එක්කත් අපි සාකච්ඡා කළා. ඒ වාගේම අපේ රටත් එක්ක මිත්‍ර සම්බන්ධතා තිබෙන සියලුම රාජ්‍යවල රාජ්‍ය තාන්ත්‍රිකයන්, අතිගෞරවනීය මහානායක හිමිපාණන් වහන්සේලා ප්‍රමුඛ ආගමික උතුමාණන් වහන්සේලා, වෘත්තීය සමිති වාගේම සිවිල් සංවිධාන එක්කත් සාකච්ඡා කරලා අපි මේ සියලු දෙනාගේම අදහස් ලබා ගත්තා. ඒ අනුව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබුණු ආකෘතියට සැහෙන දුරට ගැළපෙන ආකාරයේ සංශෝධනයක් ඉදිරිපත් කරන්න සියලුදෙනාගේ එකඟතාව ප්‍රකාශ වුණා. ඒ අනුව තමයි විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත අපි සකස් කර තිබෙන්නේ. අපි කරන්නේ ප්‍රායෝගිකව කළ හැකි දේවල් කියා විශ්වාස කරනවා. මිරිඟුව පසුපස දුවගෙන යන කණ්ඩායමක් බවට පත් වෙන්න අපට කිසිම වුවමනාවක් නැහැ. ඒ නිසා ජනමත විචාරණයකින් තොරව මේ පාර්ලිමේන්තුවෙන් අනුමත කර ගත හැකි ආකාරයට අපි විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කෙටුම්පත් කරලා තිබෙනවා. ඊයේ දිනයේ දී අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එය අනුමත කර ගත්තා. ඒ වෙනුවෙන් සහාය දුන්, අදහස් දැක්වූ, විවේචන ඉදිරිපත් කළ සියලුදෙනාටම මේ අවස්ථාවේ දී මගේ ස්තුතිය පුද කරනවා.

ගරු කථානායකතුමනි, අපි සකස් කරපු විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, මේ රටේ දැවෙන ප්‍රශ්න විසඳීමට ආරම්භයක් ලෙස ගත හැකි එකම උත්තරය බවට පත් වෙලා තිබෙනවා. මම එහෙම කියන්නේ හේතුවක් ඇතිවයි, ගරු කථානායකතුමනි. අද දිනයේ දී ඔබතුමා විපක්ෂය ඉදිරිපත් කරපු විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දීපු නිගමනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා විසින් තමයි ඉදිරිපත් කළේ. ගරු කථානායකතුමනි, ඔබතුමා අද උදේ ගරු සභාවට කියපු කරුණු උකහා ගත්තාම පෙනෙනවා, එම විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතේ ප්‍රධාන වශයෙන් විෂයයන් අටක් සම්බන්ධයෙන් සංශෝධන තිබෙන බව. එම පනත් කෙටුම්පතේ 2වැනි වගන්තියේ ඉඳලා 39වැනි වගන්තිය දක්වා වූ වගන්තිවලින් යෝජනා කරලා තිබෙන්නේ විධායක ජනාධිපතිතුමාගේ බලය අත්හැරීම හෝ එම බලය අගමැතිතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයට මාරු කිරීම කියන කාරණයයි. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය පැහැදිලිව කියා තිබෙනවා, එම සංශෝධනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 2වැනි ව්‍යවස්ථාවට සහ 4 (ආ) අනු ව්‍යවස්ථාවට අනනුකූල නිසා ඊට ජනමත විචාරණයකින් අනුමැතිය ලබා ගත යුතුයි කියලා.

දෙවැනි කාරණය මෙයයි, ගරු කථානායකතුමනි. එම පනත් කෙටුම්පතේ 2,3,4 වගන්ති යටතේ සඳහන් වෙන්නේ ජනාධිපතිවරයා විසින් ගනු ලබන සෑම තීන්දුවක්ම අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත පමණක් ගත යුතුයි කියන සංශෝධනය. ඒ සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණය පැහැදිලිව කියා තිබෙනවා, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3වන ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 4 (ආ) අනු ව්‍යවස්ථාවට පටහැනියි, ඒ නිසා එයටත් ජනමත විචාරණයකින් අනුමැතිය ලබා ගත යුතුයි කියලා.

ගරු කථානායකතුමනි, තුන්වන කාරණය මේකයි. එම පනත් කෙටුම්පතේ 14 වන වගන්තිය යටතේ යෝජනා කරලා තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් පාර්ලිමේන්තුව තුළ ස්ථාපිත කරන්න ඕනෑ, හැබැයි ඒකට ජනාධිපතිවරයාගේ නියෝජිතයෙක් ඇතුළත් කිරීම තහනම් කරන්න, නැත්නම් ඒක වළක්වන්න කියලා. ජනාධිපතිවරයාගේ නියෝජිතයා නැතිව

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

ව්‍යවස්ථා සභාවක් නිර්මාණය කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 4 (ආ) අනු ව්‍යවස්ථාවට පටහැනියි, ඒ නිසා එයට ජනමත විචාරණයකින් අනුමැතිය ලබාගත යුතුයි කියා ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කර තිබෙනවා.

හතරවන කාරණය, පනත් කෙටුම්පතේ 19 වන වගන්තිය ගැනයි. ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාවේ තිබෙන බලතල අහෝසි කරන්න කියලා එමඟින් යෝජනා කරලා තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණය ඒ පිළිබඳත් තීන්දුව දීලා තිබෙනවා, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 4 (ආ) අනු ව්‍යවස්ථාවට පටහැනියි, ඒ නිසා ජනමත විචාරණයකින් සම්මත වෙන්නේ නැතිව මෙවැනි සංශෝධනයක් කරන්න බැහැ කියලා.

ගරු කථානායකතුමනි, පස්වන කාරණය මේකයි. පනත් කෙටුම්පතේ 30 වන වගන්තියේ කියනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වන ව්‍යවස්ථාවේ (13) අනු ව්‍යවස්ථාව අහෝසි කරන්න කියලා. ඒ අනු ව්‍යවස්ථාවෙන් දීලා තිබෙන බලය තමයි යම්කිසි දේශපාලන පක්ෂයක් නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් තමන්ගේ දේශපාලන පක්ෂයෙන් අසාධාරණ ලෙස ඉවත් කෙරුවොත්, නෙරපනු ලැබුවහොත් ඔහුගේ මන්ත්‍රී ධුරය අහිමිවීම වැළැක්වීම පිණිස ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරලා එහි නීත්‍යානුකූලභාවය පිළිබඳ නිගමනයක් ඉල්ලන්න තිබෙන අයිතිය. මන්ත්‍රීවරුන්ට තිබෙන ඒ අයිතිය අහිමි කිරීම විපක්ෂය ඉදිරිපත් කරපු යෝජනාවේ තිබෙනවා. ඒ කාරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 4 (ඇ) සහ 4 (ඉ) අනු ව්‍යවස්ථාවන්ට අනනුකූල නිසා ඒකටත් ජනමත විචාරණයක අවශ්‍යතාව ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දී තිබෙනවා.

හය වන කාරණය, එම පනත් කෙටුම්පතේ 39 වගන්තිය පිළිබඳවයි. පනත් කෙටුම්පතේ 39 වන වගන්තියෙන් කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 129 වන ව්‍යවස්ථාව යටතේ තිබෙන invocation of consultative jurisdiction කියන එක. රටේ යම් වැදගත් කාරණයක් සම්බන්ධව අධිකරණයේ මතය විමසීම සඳහා ජනාධිපතිවරයාට තිබෙන බලය අහෝසි කරන්න කියන එකයි මේ යෝජනාවේ තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව අනුව කියැවෙන්නේ, ඒ සඳහාත් ජනමත විචාරණයකින් අනුමතිය ලබාගත්තොත් මිසක්, පාර්ලිමේන්තුවට එය සම්මත කරන්න, නීතියක් බවට පත් කරන්න බලයක් නැහැ කියන එකයි.

ගරු කථානායකතුමනි, හත්වන කාරණය පනත් කෙටුම්පතේ 43 වන වගන්තිය පිළිබඳවයි. එම පනත් කෙටුම්පතේ 43 වගන්තිය මඟින් යෝජනා කරලා තිබෙනවා, ජනාධිපතිවරයාට පළාත් සභා සම්බන්ධව ක්‍රියාත්මක කිරීමට තිබෙන බලතල අහෝසි කරන්න කියලා. මේක දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ආ ප්‍රතිපාදනයක්. එහිදී, පළාත් සභා පාලනය සම්පූර්ණයෙන් ජනාධිපතිවරයාගෙන් ඉවත් කරන්න කියන යෝජනාව සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ නිගමනය වන්නේ, එයත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 2 සහ 3 ව්‍යවස්ථා සමඟ කියවිය යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (ඇ) අනු ව්‍යවස්ථාවට අනනුකූලයි, ඒ නිසා ඒකත් ජනමත විචාරණයකින් සම්මත කර ගත යුතුයි කියන එකයි.

ගරු කථානායකතුමනි, ඊළඟ කාරණය තමයි පනත් කෙටුම්පතේ 51 වන වගන්තිය. ඒ තමයි ජාතික ආරක්ෂක කවුන්සලය පිළිබඳ කාරණය; ජාතික ආරක්ෂක කවුන්සලය ස්ථාපනය කොට පවත්වාගෙන යා යුතුයි, ඒකට ජනාධිපතිවරයා සහභාගි නොවිය යුතුයි, අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පමණක් එය කළ යුතුයි කියන ප්‍රතිපාදනය. ඒ සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ නිගමනය වන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1, 2 සහ 3 වන ව්‍යවස්ථා සමඟ කියවිය යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (ඇ) අනු ව්‍යවස්ථාවට මේක අනනුකූලයි, ඒ අනුව ජනමත විචාරණයකින් සම්මත කිරීමකින් තොරව මෙය නීතියක් බවට පත් කරන්න බැහැ කියන එකයි.

ගරු කථානායකතුමනි, මම කෙටි වේලාවක් ඔබතුමාගෙන් ඉල්ලා ගත්තේ මේ කාරණය ජාතික වශයෙන් වැදගත් නිසා. ගරු කථානායකතුමනි, විපක්ෂය ඉදිරිපත් කරපු පනත් කෙටුම්පතේ කිසිදු වගන්තියක් ජනමත විචාරණයකින් තොරව පාර්ලිමේන්තුවෙන් සම්මත කරන්න බැරි බවට ශ්‍රේෂ්ඨාධිකරණය මේ අවස්ථාවේ නිගමනයක් දීලා තිබෙනවා.

එහෙම නම්, අපි ඉදිරිපත් කරපු විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අවශ්‍යතාව මේ රටේ ජනතාව පක්ෂ භේදයකින් තොරව පිළිගන්නවා. අද විපක්ෂයට පිළිගන්න සිද්ධ වුණා, ඔවුන් ගෙනාපු පනත් කෙටුම්පතේ එක අකුරක්, එක වචනයක් ප්‍රායෝගිකව මේ පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්න බැහැ කියලා. එහෙම නම්, කළ හැකි දේ අපි ආණ්ඩුවක් විධියට ගෙනැල්ලා තිබෙනවා. අපි ගෙනෙන විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සහයෝගය දෙන බවත් මේ වන විට සමහර අය ප්‍රකාශ කරලා තිබෙනවා. අපි ජනමත විචාරණයකින් තොරව සම්මත කළ හැකි සියලු දේවල් මෙම ව්‍යවස්ථා සංශෝධනයට ඇතුළත් කරලා තිබෙනවා. ඒත්, ඒක අවසාන වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නිගමනය වෙන්න ඕනෑ. ඒ නිගමනයට යටත්ව කළ හැකි දේ සහ කළ යුතු දේ අපි සිදු කළ යුතුයි. අද රට වැටී තිබෙන තත්ත්වයෙන් ගොඩ ගැනීම සඳහා ගත හැකි මූලික පියවර වශයෙන් මේ කටයුත්තට සහයෝගය ලබා දීම මේ රටේ විපක්ෂය විතරක් නොවෙයි, සෑම පුරවැසියකුගේම යුතුකමක් සහ වගකීමක් කියන කාරණය මතක් කර දෙමින්, මට කාලය ලබා දුන් ඔබතුමාට ස්තුතිය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහින්ද අමරවීර ඇමතිතුමා.

**ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම අමාත්‍ය සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் அமைச்சரும் வனசீவராசிகள் மற்றும் வனவளங்கள் பாதுகாப்பு அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera- Minister of Agriculture and Minister of Wildlife and Forest Resources Conservation)

ගරු කථානායකතුමනි, විජයදාස රාජපක්ෂ ඇමතිතුමා ඉතාම එලදායි අදහස් කීපයක් ඉදිරිපත් කළා. අද උදේ පාර්ලිමේන්තුවේ ඇතිවූ තත්ත්වය පිළිබඳව ඔබතුමාගේත්, රටේත් අවධානය යොමු කිරීමේ වැදගත්කමක් තිබෙනවා. අද විපක්ෂය පාර්ලිමේන්තුවේදී විවිධ අදහස් රාශියක් ඉදිරිපත් කළා. විමල් වීරවංශ මැතිතුමාගේ කථාවේදී කිව්වා, රනිල් වික්‍රමසිංහ මහත්මයා අග්‍රාමාත්‍ය ධුරයට පත් කරන්න කියලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අමාත්‍ය ධුර ගත් කණ්ඩායම ඇතුළු කණ්ඩායමක් ගිහිල්ලා ජනාධිපතිතුමාට යෝජනා කළා කියලා, මම ඒ සම්බන්ධයෙන් යමක් කියන්න කැමැතියි, ගරු කථානායකතුමනි. මොකද, මේ තත්ත්වය පිළිබඳව ඔබතුමාත් හොඳටම දන්නවා. එදා පාර්ලිමේන්තුවේ යම් අර්බුදකාරී තත්ත්වයක් නිර්මාණය වුණා. ඒ අර්බුදකාරී තත්ත්වය නිර්මාණය වුණාට පස්සේ, ආණ්ඩුව නියෝජනය කරන ශ්‍රී ලංකා

පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරු කණ්ඩායමක් ස්වාධීන වුණා. ඒ අනුව, ආණ්ඩුව නියෝජනය කරපු පක්ෂ 10ක විතර මන්ත්‍රීවරු කණ්ඩායමක් ස්වාධීන වෙලා ආණ්ඩුවෙන් එළියේ හිටියා. ඊට පසු ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට අපි සාකච්ඡා කරලා තීන්දුවක් ගත්තා, අපේ කණ්ඩායම ආණ්ඩුවෙන් ස්වාධීන වෙන්න ඕනෑ කියලා. පක්ෂය ගත් එම තීන්දුව අනුව කැබිනට් මණ්ඩලය නියෝජනය කළ මමත්, නිමල් සිරිපාල මැතිතුමාත්, අපේ රාජ්‍ය අමාත්‍යවරුත් ආණ්ඩුවෙන් එළියට ඇවිල්ලා ස්වාධීන කණ්ඩායමක් විධියට හිටියා. ඒ කණ්ඩායම විවිධ අවස්ථාවල පක්ෂ 10 කණ්ඩායමත් එක්ක විවිධ සාකච්ඡා පැවැත්වූවා. ඒ සාකච්ඡාවලින් වැඩි ප්‍රමාණයක් පැවැත්වූයේ ටිරාන් අලස් මැතිතුමාගේ කාර්යාලයේදී. ඒ පැවැත්වූ සාකච්ඡාවල තොරතුරු සහ යෝජනා එතුමා හරහා වරින් වර ජනාධිපතිතුමාට ඉදිරිපත් කළා. ඉන් අනතුරුව ඒ සාකච්ඡාවල ප්‍රතිඵලයක් විධියට අප කාගේත් එකඟතාව අනුව සර්ව පාක්ෂික ආණ්ඩුවක් බිහිවෙන්න ඕනෑ කියන මතයේ අපි හිටියා. සර්ව පාක්ෂික ආණ්ඩුවක් බිහිවෙන්න ඕනෑය කියන මතයේ ඉඳිමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපි වෙනම සාකච්ඡා පැවැත්වූවා. ඒ විතරක් නොවෙයි. අපි මේ පිළිබඳව අනෙක් පක්ෂ සියල්ල සමඟත් සාකච්ඡා කළ යුතුයි කියන මතයට පැමිණියා. ඒ අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කණ්ඩායම ගිහිල්ලා විපක්ෂ නායකතුමා සමඟ සාකච්ඡා කළා. අවස්ථා ගණනාවක් එතුමා සමඟ සාකච්ඡා කරලා අපි කිව්වා, "මේ ආණ්ඩුව බාර ගන්න, අග්‍රාමාත්‍ය ධුරය බාර ගන්න. ඒකට අපි කණ්ඩායමක් විධියට සහයෝගය ලබා දෙනවා" කියලා. ඒ වාගේම, ජනාධිපතිතුමාත් විපක්ෂ නායකතුමාට ප්‍රසිද්ධියේ ආරාධනා කළා, ආණ්ඩුව බාර ගන්න කියලා. හිටපු අග්‍රාමාත්‍යතුමා ඉවත් වුණාට පස්සේත් ජනාධිපතිතුමා ඒ ආරාධනය කළා. ඉන් අනතුරුව අපි දිගටම කථා කළා, මේ තනතුරුවලට ගන්නේ කවුද කියන එක සම්බන්ධයෙන්. අපේ කණ්ඩායම අනුර කුමාර දිසානායක මැතිතුමා එක්කත් සාකච්ඡා කළා. ඒ වාගේම, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කණ්ඩායම ගිහිල්ලා මනෝ ගනේසන් මැතිතුමා, රවුෆ් හකීම් මැතිතුමා, රිසාඩ් බදියුදීන් මැතිතුමා ඇතුළු පක්ෂ නායකයන් එක්කත් වෙන වෙනම සාකච්ඡා කළා, සර්ව පාක්ෂික ආණ්ඩුවක් නිර්මාණය කිරීම සඳහා එකතු වෙන්න කියලා. අවසාන වශයෙන් බොහෝ පාර්ශ්ව විසින් විපක්ෂ නායකතුමාගෙන් ඉල්ලීම් ගණනාවක් කළා, අග්‍රාමාත්‍ය ධුරය බාර ගන්න කියලා. ජනාධිපතිතුමාත් ඉල්ලීම් කළා; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් ඉල්ලීම් කළා; ඒ වාගේම අනෙක් කණ්ඩායම් ඉල්ලීම් කළා. මේ සියලුදෙනා එතුමාගෙන් ඉල්ලා සිටියේ අග්‍රාමාත්‍ය ධුරය බාර ගන්න කියලායි. නමුත්, එතුමා ඒක ප්‍රතික්ෂේප කළා. ඒ වෙනුවෙන් එතුමා විවිධ කොන්දේසි ඉදිරිපත් කළා. මම දිගින් දිගටම මේ සම්බන්ධයෙන් කථා කරන්නේ නැහැ, ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා බොහෝ කරුණු කාරණා කියපු නිසා.

මම මේ කාරණාව දැන් කියන්නේ විමල් වීරවංශ මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන අප සම්බන්ධයෙන් කළ යම් යම් ප්‍රකාශ නිසා. එතුමා කියා සිටියා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අග්‍රාමාත්‍ය ධුරයට පත් කළ යුතුයි කියා අපි ගිහින් ජනාධිපතිතුමාට යෝජනා කළා කියලා.

අපි කිසිම වෙලාවක ඒ යෝජනාව ඉදිරිපත් කළේ නැහැ කියන එක මම වගකීමෙන් ප්‍රකාශ කරනවා, ගරු කථානායකතුමනි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මහින්ද අමරවීර ඇමතිතුමා මගේ නම සඳහන් කරපු නිසායි මම මේක කියන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා එහෙම කිව්වේ නැහැ කියලා දැන් කියනවා. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අපට කියපු දේ තමයි මම ඒ කිව්වේ. එහෙම නම්, එතුමා අසත්‍ය ප්‍රකාශ කරනවා ඇති. ඒක ගිහිල්ලා එතුමාගෙන් අහන්න. ඔබතුමාගේ නම කිව්වා, නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාගේ නමත් කිව්වා. ඒ විධියට මම කලින් කියපු අයගේ නම් එතුමා කිව්වා. ඒ ගොල්ලන් තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයා පත් කරන්න කියලා විටින් විට යෝජනා කරන්නේ කියලා කිව්වා. ඒක කිව්වේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා. ඒක අසත්‍යයක් නම්, ඒක කිව්වේ මම නොවෙයි, තමුන්නාන්සේගේ ජනාධිපතිතුමා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔබතුමා ඔය කියන කථාව පිළිබඳව ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගෙන් අපි ඇහුවා. එතුමා ඉතාම පැහැදිලිව මට කිව්වා, "ඔබතුමා කොයි වෙලාවකවත් එහෙම කිව්වේ නැහැ. ඔබතුමා කියපු එක නමක් අග්‍රාමාත්‍ය ධුරයට තිබෙනවා. ඒ තමයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නම් කළ නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා" කියලා. ඒක තමයි එතුමා කිව්වේ. අපි රනිල් වික්‍රමසිංහ මහත්මයාගෙන් අයින් වුණේ, 2018දී. අපට එතුමා යටතේ දිගටම ඇමතිකම් කරගෙන යන්න තිබුණා. 2018දී තමයි සන්ධානයේ ලේකම්වරයා විධියට මම ලියුමක් දුන්නේ. ඒ වෙලාවේ එහෙම ලියුමක් දුන්නේ නැත්නම්, එහෙමම ආණ්ඩුව කරගෙන යන්නත් තිබුණා. හැබැයි, මම සන්ධානයේ ලේකම්වරයා විධියට ලියුමක් දුන්නා, "අපි යහ පාලන ආණ්ඩුවේ ඉන්නේ නැහැ. අපි ජාතික ආණ්ඩුවෙන් අයින් වෙනවා" කියලා. ඊට පස්සේ තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමා අග්‍රාමාත්‍ය ධුරයට පත් වෙලා ඒ ආණ්ඩුව කරගෙන යන්න ගිහිල්ලා ගැටලු නිර්මාණය වුණේ. අපට ඊට පස්සේත් ගිහිල්ලා ආණ්ඩුවේ ඉන්න තිබුණා. අපට කථා කළා, ඒ ආණ්ඩුවේ අමාත්‍ය ධුර ගන්න. අපට එහෙම අමාත්‍ය ධුර ගන්න ඕනෑකමක් තිබුණේ නැහැ. අපි ඇමති ධුර අරගෙන වංචා, දූෂණ කළේත් නැහැ. අපි හරියට ඇමතිකම් කළා. අපි භාර ගත්තු හැම වගකීමක්ම ඉෂ්ට කළා. ඒ බව මට වගකීමෙන් කියන්න පුළුවන්.

ඒ වෙලාවේ රනිල් වික්‍රමසිංහ මහත්මයා අයින් කරන්න කටයුතු කරපු අය විධියට අපට නැවත එතුමාට ආරාධනා කරන්න අවශ්‍ය වුණේ නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්මයා පාර්ලිමේන්තුවේ සභා ගර්භයෙන් එළියේ ඉඳගෙන බොහෝ පිරිසක් එක්ක කථා කළා. ඔබතුමන්ලා සියලුදෙනා එක්ක සාකච්ඡා කළා. අපි ගිහිල්ලා වෙනම එතුමා හමු වුණේ නැහැ. අපි ගිහිල්ලා ජනාධිපතිතුමා හම්බ වුණු එකම අවස්ථාවක් තිබෙනවා. ඔය පත් කිරීම කරපු දවසේ උදේ පක්ෂ නායක රැස්වීමක් තිබුණා. ඒ පක්ෂ නායක රැස්වීමට නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමායි, මමයි ගියා. එදාත් අපි විපක්ෂ නායකතුමාට කිව්වා, අගමැතිකම භාර ගන්න කියලා. ඒ කණ්ඩායමට අපි කිව්වා, ආණ්ඩුව භාර ගන්න කියලා. ඒ කවුරුත් කිව්වා, "බැහැ" කියලා. එදා උණුසුම් විවාදයකුත් ඇති වුණා, "විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා, මහින්ද රාජපක්ෂ මැතිතුමා පරද්දන එක තමයි අපේ වගකීම" කියලා එදා ඔවුන් කිව්වා. අපි කිව්වා, "විශ්වාස භංග යෝජනාව ගේන්න ඕනෑ නැහැ. මහින්ද රාජපක්ෂ මැතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාව ගේන්නේ එතුමා අගමැති ධුරයෙන් අයින් කරන්න නේ, දැන් මොනවාටද විශ්වාස භංගයක්? විශ්වාස භංග යෝජනාවක් ගේන්න ඕනෑ නැහැ. දැන් ජනාධිපතිතුමා ආරාධනා කරලා තිබෙනවා නේ, ඇවිත් අගමැති ධුරය භාර ගන්න" කියලා. ඒක අපි කිව්වා. නමුත්, ඒක ප්‍රතික්ෂේප කළා. ඒ රැස්වීම ඉවර වුණාට පස්සේ ජනාධිපතිතුමා නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාට කථා කරලා කිව්වා, ඇවිල්ලා කරුණු වගයක් ඉදිරිපත් කරන්න කියලා. අපි මහට යනකොට message එක ඇවිල්ලා ඉවරයි, "රනිල් වික්‍රමසිංහ මහත්මයා අග්‍රාමාත්‍ය ධුරයේ දිවුරුම් දෙන්න සූදානම්" කියලා. අපි නම් කිසිම තැනකදී එවැනි යෝජනාවක් ඉදිරිපත්

[ගරු මහින්ද අමරවීර මහතා]

කළේ නැහැ. මම වගකීමෙන් ඒක කියනවා. කට තිබුණු පළියට බොරුවට එක එක්කෙනාගේ නම් කියන්න එපා. දහ සැරයක්, විසි සැරයක්, එහෙම නැත්නම් හැම වෙලාවේම එකම බොරුව කිව්වාම ඒක ඇත්ත කියලා හිතනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මම ගරු කෘෂිකර්ම ඇමතිතුමාගෙන් මේ කාරණය අහනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට කියන්න පුළුවන්ද, නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා කිසිම අවස්ථාවක රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ නම අග්‍රාමාත්‍ය තනතුරට යෝජනා නොකළාය කියලා?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
එතුමා ඒකට උත්තර දේවි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ඇයි, ඔබතුමාට ඒකට උත්තර දෙන්න බැරි?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා දැන් උත්තර දෙනවා. ඔබතුමා අහගෙන ඉන්න කෝ. මම ඉන්න වෙලාවක නම් එතුමා එහෙම කියලා නැහැ. එතුමා එහෙම කිව්වාද කියලා එතුමාගෙන්ම අහන්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Ports, Shipping and Aviation)
කිසිම අවස්ථාවක මම එතුමාගේ නම යෝජනා කරලා නැහැ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා කිව්වා නේද, උත්තරය? නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා මම ඉදිරියේ එහෙම දෙයක් නොකියපු නිසා තමයි මම එතුමාට උත්තරයක් දෙන්න කියලා කිව්වේ. අපි දෙන්නාම එවැන්නක් කිව්වේ නැහැ. මට කියන්න බැහැ නේ, අනෙක් එක්කෙනා කිව්වාද, නැද්ද කියලා. ඔබතුමා කියන්නේ මොනවාද කියලා අපි දන්නේ නැහැ නේ. ඔබතුමන්ලා උදේ කියපු එක හවසට වෙනස් කරනවා. මේවායේ ඇති වෙන්න බොරු කියලා තිබෙනවා. මට එහෙම කියන්න ඕනෑකමක් නැහැ. අපි හැම වෙලාවේම යමක් කරපු කට්ටිය. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, දැන් එතුමා පත් වෙලා ඉවරයි නේ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
අපි නිවැරදි තීන්දු ගත්තු කට්ටිය. අපි කිසි වෙලාවක වැරදි තීන්දුවක් අරගෙන නැහැ. ඒ වාගේම එතුමා කිව්වා, පොහොර සිද්ධියක් ගැනත්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, දැන් අගමැතිතුමා පත් වෙලා ඉවරයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මම අහන්නේ තව එක ප්‍රශ්නයයි. මම වැඩිය ප්‍රශ්න අහන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඇමතිකම ගත්තේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ගිය විධිමත් යෝජනාවක් අනුවද, නැත්නම් ඒක ඔබතුමාට වෙනම හම්බ වෙච්ච එකක්ද?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඒ ගැන වෙනම කථා කරමු. *[බාධා කිරීමක්]* අපේ පක්ෂයත් කඩාකප්පල් කරන්න බලාපොරොත්තු වෙන මේ වාගේ කණ්ඩායම් ඉන්නවා, ගරු කථානායකතුමනි.

මේ ගොල්ල පසුගිය කාලයේම කළේ ඒක. පක්ෂ කැඩුවා, ආණ්ඩු කැඩුවා. 2015දී මහින්ද රාජපක්ෂ මහත්මයා පරද්දන්න එතුමා තමයි ගිහින් කිව්වේ ආර්ථික ඝාතකයෝ ඉන්නවා, මේ ආණ්ඩුවට යන්න බැහැ කියලා. පළමුවෙනි වෙඩි මුරය තිබ්බේ එතුමා. ජාත්‍යන්තරය තරහ කෙරෙව්වා UN එක ඉස්සරහා උපවාස කරලා. මේ රට හුදකලා කරලා, මේ රට අසරණ කළේ කවුද කියලා මේ රටේ ජනතාව දන්නවා. ගරු කථානායකතුමනි, නමුත් අපි හැම වෙලාවකම භාර ගත්ත ඇමතිකම් හරියට කළා. කොතැනක හරි වැරැද්දක් තිබෙනවා නම්, වංචාවක්, දූෂණයක් තිබෙනවා නම් හෙට හරි ඔප්පු කරලා පෙන්වන්න. අපි අවංකව ඒ කටයුතු කළා, වගකීමක් භාර ගත්තා නම් ඒක ඉෂ්ට කළා.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithreepala Sirisena)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, හිටපු ජනාධිපතිතුමා.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithreepala Sirisena)
ගරු කථානායකතුමනි, මටත් කාරණයක් කියන්න තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු විධියට අපි දැනගන්නට සතුටුයි, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අග්‍රාමාත්‍ය ධුරයට යෝජනා

කළේ කවුද, ආණ්ඩුවෙන්මද, ගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාද කියලා. ඒ පක්ෂයෙන් ඡන්දයෙන් පත් වෙච්ච එක මන්ත්‍රී ධුරයක්වත් නැතිව එතුමා කොහොමද මේ රටේ අගමැති වුණේ කියලා දැන ගන්නට පුළුවන් නම් හොඳයි.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, විමල් වීරවංශ මැතිතුමා කිව්වා, පොහොර ටික දෙන්න බැරි කෘෂිකර්ම ඇමති කියලා. ඒ විධියට බොහොම ලොකු බලාපොරොත්තුවක් තියා ගන්න ඇති, මේක භාරගෙන මම ඇන ගනියි කියලා. ගරු කථානායකතුමනි, මම ඇවිල්ලා සති දෙකයි. පොහොර ගේන්න බැරිව තිබුණේ, යල කන්නයටත් පොහොර නැතිව තිබුණේ. මාස් කන්නයට පොහොර ගේන්නේ කොහොමද කියන එක තමයි මම ගිය පළමුවෙනි සාකච්ඡාවේදීම අපේ නිලධාරීන් ඇහුවේ. නමුත් මම අද කියන්න කැමැතියි ලබන මාසයේ 06වෙනි දා වෙනකොට මේ යල කන්නයට, -මුල් අයට බැරි වුණත්- පොහොර මෙට්‍රික්ටොන් 65,000ක් මේ රටට එනවා. ඒ වාගේම මාස් කන්නයට අවශ්‍ය සියලු පොහොර ආනයනය කරන්න අපි මේ වෙනකොටත් මුදල් ප්‍රතිපාදන වෙන් කරගෙන හමාරයි. අපි භාර ගත්ත වගකීම් අපි හරියට ඉෂ්ට කරනවා. ඒ ගැන කලබල වෙන්න ඕනෑ නැහැ.

ඒ වාගේම තමයි, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධනය පිළිබඳත්. ඒකට "විසිඑක" කියනවා, "විසිදෙක" කියනවා. විසිඑක්වන සංශෝධනය විධියට යෝජනාවක් විපක්ෂය ඉදිරිපත් කළා. වැඩක් වුණේ නැහැ, ඒ ඔක්කොම අසාර්ථක වුණා. හැබැයි, අපි සංශෝධන යෝජනාවක් ඉදිරිපත් කළා. මේ කැබිනට් මණ්ඩලයේ අපි සිටි නිසා තමයි අපට පුළුවන්කම ලැබුණේ ඒ පිළිබඳව කථා කරලා මේ රටේ ජනතාව ඉල්ලපු ඒ සංශෝධනය ගේන්න. මේකත් ගෙන එන්නේ නැහැ කියලා ගොඩක් අය කිව්වා, ඒක වෙන්නේ නැහැ කිව්වා, ඒක ප්‍රමාද වෙනවා කිව්වා, ඒක අත්හැරෙනවා කිව්වා. නමුත් ඒ සංශෝධනය ගෙන ඒමත් අපි ලබපු ජයග්‍රහණයක්.

මම කෘෂිකර්ම අමාත්‍යවරයා විධියට භාර ගත්ත වගකීම තමයි, මේ රටේ ආහාර නිෂ්පාදනය වැඩි කරන වගකීම. ඒ වගකීම භාරගෙන සහලින් ස්වයං පෝෂිත යුගයක් නැවතත් මේ රටේ ආරම්භ කරන්න අවශ්‍ය පියවර අපි දැනටමත් අරගෙන තිබෙනවාය කියන කාරණය සඳහන් කරමින්, මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගෙවිඳු කුමාරතුංග මැතිතුමා.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ගරු කථානායකතුමනි, ඔබතුමා අද ප්‍රකාශයට පත් කළා ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනතට අත්සන යොදා එය නීතිය බවට පත් කළ බව. ඒ පනත් කෙටුම්පත පිළිබඳ විවාදයේදී ඉදිරිපත් වුණු ප්‍රධානම කාරණයක් තමයි විදුලිබල ඉංජිනේරුවෝ ත්‍රස්තවාදී ක්‍රියාවල නිරත වෙනවාය කියන එක. කංචන විජේසේකර ඇමතිතුමා දැන් සභාවේ හිටියා නම් හොඳයි. එදා විපක්ෂයේ පළමු කථාව කරනකොටම ගරු ඇමතිතුමා බාධා කරලා කිව්වා, විදුලිබල ඉංජිනේරු මාෆියාව විසින් රන්දෙණිගල සහ රන්ටැඹේ ජලාශවල වාන් දොරටු විවෘත කරලා නිරපරාදේ ජලය අපතේ යවනවා කියලා. මේ ගරු පාර්ලිමේන්තුවේදී ඒ කාරණය ප්‍රකාශයට පත් වුණු නිසා පහුවෙනි දා සෑම පුවත් පතකම ප්‍රධාන සිරස්තලය ලෙස මුල් පිටුවේ ඒ කාරණය පළ වෙලා තිබුණා. මේ සම්බන්ධයෙන් අපි කළ සොයා බැලීමේදී දැන ගන්නට ලැබුණේ, මිනිපේ වම් ඉවුරට ජලය සපයන මහවැලි අධිකාරිය, විදුලිබල මණ්ඩලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය කියන මේ සියලු ආයතනවල නියෝජිතයන් සිටින ජල කළමනාකරණ කමිටුවෙන් ගත්ත තීන්දුවක් අනුව ඒ ජලය නිකුත් කරලා තිබෙන බවයි. ඒ නිසා අපි දැනගන්න කැමැතියි, එදා මේ පාර්ලිමේන්තුව දැනුවත්ව නොමඟ යැව්වාද, ඒ සම්බන්ධව පරීක්ෂණයක් කෙරුණාද, මීට මැදිහත් වූ කවුරුන් හෝ විදුලිබල ඉංජිනේරුවෙකු අත්අඩංගුවට අරගෙන තිබෙනවාද, එහෙමත් නැත්නම් කාගේ හරි වැඩ තහනම් කරලා තිබෙනවාද කියලා.

ගරු කථානායකතුමනි, මේක අපි දකින්නේ අපේ වරප්‍රසාද උල්ලංඝනය කිරීමක් කියලා. එදා දැනුවත්ව පාර්ලිමේන්තුව නොමඟ යැව්වාද? *[බාධා කිරීමක්]* හරි, ගරු ඇමතිතුමා ඔබතුමා පිළිතුරු දෙන්න. එහෙම නැතිව ඒක අත්වැරදීමක් නම් මේ වෙනකොට ඒ සම්බන්ධයෙන් අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද? අඩුම තරමින් කාගේ හෝ වැඩ තහනම් කරලාවත් තිබෙනවාද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)
ගරු කථානායකතුමනි, මම එදා කළ ප්‍රකාශය ඊට පසු දවසේ නිවැරදි කළා. ගරු මන්ත්‍රීතුමා ඒ වෙලාවේ පාර්ලිමේන්තුවේදී අහගෙන ඉන්න නැතිව ඇති.

පළමුවැනි දවසේ මම කිව්වේ වාන් දොරටු විවෘත කරලා ජලය නිකුත්වෙන්න ඉඩ තබා තිබුණා කියලායි. නමුත් අපි වාරිමාර්ග ඉංජිනේරුවන් එක්ක සාකච්ඡා කළා. එතකොට වාරිමාර්ග ඉංජිනේරුවන් අප දැනුවත් කළා, මහවැලි අධිකාරියේ සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කටයුතුවලට මේ බලාගාරවල ජලය නිකුත් කරන බවට. විශේෂයෙන්ම කෘෂිකාර්මික කටයුතුවලට, වාරිමාර්ග කටයුතුවලට සහ ජල සම්පාදන කටයුතුවලට මේ ජලය නිකුත් කරන්න සැලසුම් කර තිබුණ බව ඔවුන් සඳහන් කළා. ඒ නිසා ජලය නිකුත් කරන බවත් එසේ නිකුත් කරන ජලය, ජලවිදුලි උත්පාදනයට පාවිච්චි කරන බවත් ඔවුන් සඳහන් කළා. ඒ නිසා ඒක වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගෙන් වූ වැරැද්දක් නොවෙයි කියන එක මම පාර්ලිමේන්තුවේදී ඊළඟ දවසේ මතක් කළා.

නමුත්, බරපතළ වැරැද්දක් වෙලා තිබෙනවා. එසේ නිකුත් වූ ජලය පාවිච්චි කරන්න තිබුණා, විදුලි උත්පාදනයට. ඒ නිකුත් වූ ජලය විදුලි උත්පාදනයට පාවිච්චි නොකර, ඒ ජලය ටර්බයින් එක හරහා යවන්නේ නැතුව ගලාගෙන යෑමට ඉඩ දීම නිසා එතැන වරදක් වෙලා තිබෙනවා. මේ වනවිට ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වනවා. දැනට තිබෙන්නේ මූලික පරීක්ෂණ අවස්ථාව. සම්පූර්ණ වාර්තාව නැති නිසා මට ඒ ගැන සවිස්තරාත්මක වාර්තාවක් දෙන්න බැහැ, ගරු කථානායකතුමනි. නමුත් මූලික පරීක්ෂණවලදී කියැවෙන විධියට එසේ ජලවිදුලිය උත්පාදනය කරන්න තිබුණු අවස්ථාවේ දැවිතෙල් සහ ඩීසල් බලාගාරවලින් තමයි විදුලිය උත්පාදනය කර තිබෙන්නේ.

වර්තමාන සභාපතිතුමා මට කියපු ආකාරයට ජලය භාවිතයෙන් විදුලිය උත්පාදනය කරන්න තිබුණු ඒ වේලාවේ,

[ගරු කංචන විජේසේකර මහතා]

සාමාන්‍යයෙන් පැයකට රුපියල් මිලියන 400ක පමණ වියදමක් දරා තිබෙනවා, විදුලි උත්පාදනය කිරීමට. ඒ නිසා එතැනදී විශාල වැරැද්දක්, බරපතළ වැරැද්දක් කරලා තිබෙනවා. දැනට මේ පිළිබඳ පරීක්ෂණ පවත්වනවා. හැබැයි, මටත් මේ සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මමත්, ලේකම්තුමාත් කියා තිබෙනවා, මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන්න කියලා. හැබැයි, තවම සාමාන්‍යාධිකාරිවරයා ඒ පරීක්ෂණයට අවශ්‍ය කටයුතු මන්දගාමීවයි සිද්ධ කරන්නේ කියන එක තමයි සභාපතිවරයා දැනට මට වාර්තා කරලා තිබෙන්නේ. ඒ නිසා සභාපතිවරයාට මම උපදෙස් ලබා දීලා තිබෙනවා, මේ පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දන්වන්න කියන කාරණය සහ ලැබෙන මූලික තොරතුරු අනුව වැඩ කටයුතු කරන්න ඕනෑ කොහොමද කියලා. ඒ පිළිබඳව ජනාධිපතිතුමාත් දැනුවත් කරලා තිබෙනවා.

මම නම් ඉල්ලීම කළේ මේ පරීක්ෂණය පවත්වන තුරු, ඒ අංශ භාරව හිටපු අය තාවකාලිකව එතැනින් ඉවත් කරලා ඒ කටයුත්ත කරන්න කියලායි. හැබැයි, අවාසනාවකට විදුලිබල මණ්ඩලය තුළ ඒක තවම සිද්ධ වෙලා නැහැ. මොකද, ඒ සම්පූර්ණ පරිපාලන බලය තිබෙන්නේ විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයාට. ඒ තනතුර අපි දේශපාලන වශයෙන් කරන පත්කිරීමක් නොවෙයි. ඒ නිසා මාත් විශ්වාස කරනවා, මේ පරීක්ෂණය කෙරෙන්න නම්, විශේෂයෙන්ම ලක්ෂපාන, රන්දෙණිගල, රන්ටැඹේ සහ System Control Centre එකේ සහයෝගය අවශ්‍ය බව. මොකද, අර බලාගාරවල ඉන්න අයට උපදෙස් ලැබිය යුත්තේ System Control Centre එකෙන්. දැනට System Control Centre එක භාරව ඉන්නා පුද්ගලයා මේ වෘත්තීය සමිතියේ සමලේකම්වරයා, ඉංජිනේරු සංගමයේ සමලේකම්වරයා. ඉතින් වෘත්තීය සමිතියක සමලේකම්වරයෙක් System Control Centre එකේ ප්‍රධානියා හැටියට ඉන්න එකත් බරපතළ වැරැද්දක්. මම සභාපතිතුමාට කිව්වා, මොන දේශපාලන පක්ෂයේ වුණත් කමක් නැහැ, මොන වෘත්තීය සමිතියේ වුණත් කමක් නැහැ, හැබැයි, අපේ රටටම විදුලිය උත්පාදනය කරන, විදුලිය පිළිබඳව තීන්දු-තීරණ ගන්නා System Control Centre එක, එක්තරා වෘත්තීය සමිතියක හස්තයක් යටතේ තිබෙන්න ඕනෑ නැහැ කියලා. ඕනෑ තරම් වෙනත් ඉංජිනේරුවන් සිටිනවා, ඒකට දමන්න පුළුවන්. හැබැයි, තවම තිබෙන ප්‍රශ්නය තමයි මේ ගැන අභ්‍යන්තර පරීක්ෂණයක් සිද්ධ වෙලා නැති එක. නමුත් මම ලබන සතිය වෙනකොට ඒ සම්බන්ධ සවිස්තරාත්මක වාර්තාවක් දෙන්නම්, සභාපතිතුමාගෙන් ඒ තොරතුරු ලැබුණාට පස්සේ.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඇමතිතුමා හැටියට අඩු ගණනේ තවම දන්නේ නැද්ද, මේ තීන්දුව ගත්ත ජල කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා විදුලි ඉංජිනේරුවෙක් නොවෙයි, සිවිල් ඉංජිනේරුවරයෙක් කියන එක? ඔවුන් කියන ආකාරයට නම් රහස් පොලීසියෙන් ඇවිල්ලා ඔවුන්ගෙන් ප්‍රශ්න කරලා තිබෙනවා. හරිද? ඔබතුමා ඒකත් දන්නේ නැද්ද දන්නේ නැහැ. රහස් පොලීසියට ඔවුන් ලබා දුන් කට උත්තරය මත තවදුරටත් ක්‍රියා කරන්න බැරි නිසා ඒ කාරණය එතැනින් නතර වෙලා තිබෙනවා කියන එක තමයි ඒ ඉංජිනේරුවන්ගේ අදහස. ඒ කමිටුවේ සභාපතිත්වය දරන්නේ විදුලි ඉංජිනේරුවෙක් නොවෙයි. එහි සභාපතිත්වය දරන්නේ සිවිල් ඉංජිනේරුවරයෙක්. කිසියම් කටයුත්තක් නිසා එදා විදුලි බලය නිෂ්පාදනය කිරීමේ හැකියාවක් තිබිලා නැහැ. ඉහත කී ආයතන සියල්ලේම අනුමැතිය ඇතිව ඔවුන් ඒ ගැනත් කථා කරලා ගොවීන්ට ජලය දීමේ අවශ්‍යතාව තිබුණු නිසා විදුලි බලය නිෂ්පාදනය කරන්න බැරි වුණත් ජලය නිකුත් කළාය කියන එක ඔවුන් පැහැදිලිව කියනවා. ඔබතුමා ඒ සම්බන්ධයෙන් දැනුවත් නැත්නම් ඒක ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු කථානායකතුමනි, මම දැනුවත්ද, නැද්ද කියන එක නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මේක අවබෝධ කර ගැනීමට නොහැකිවීම ගැන මම කනගාටු වෙනවා. ඔබතුමා හැම දාම මේ පාර්ලිමේන්තුව තුළ කරන කථාවලින් තේරෙන්නේ මේ පාර්ලිමේන්තුවට ඔබතුමාගේ තිබෙන සුදුසුකම් පිළිබඳවයි. ඇත්තටම අවබෝධ කර ගැනීමට ඔබතුමාට තිබෙන හැකියාව පිළිබඳවයි. මේ පරීක්ෂණ කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දුන්නාට, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුද්ගලයන්ගෙන් ප්‍රශ්න අහලා ඔවුන් අත්අඩංගුවට ගන්න බැහැ. ඒ නිසා තමයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අපෙන් ඉල්ලා තිබෙන්නේ අභ්‍යන්තර පරීක්ෂණයක් කරන්න කියලා. අභ්‍යන්තර පරීක්ෂණයක් කරලා ජල කළමනාකරණ කමිටුවෙන් දීලා තිබෙන තීන්දුව අනුව ක්‍රියාත්මක වුණේ නැත්තේ ඇයි කියන එක පිළිබඳ තොරතුරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දෙන්න කියලා තිබෙනවා.

එහෙම දුන්නාට පසුව තමයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කවුරු හරි අත්අඩංගුවට ගන්න හෝ මේ පිළිබඳව පරීක්ෂණ කරන්න හෝ පුළුවන්කම තිබෙන්නේ. මේ වන විට ඒ පියවර ක්‍රියාත්මක වෙනවා. හැබැයි, සාමාන්‍යයෙන් උදාසනට කියන්නේ නැහැ, ජල විදුලියට මෙන්න මෙහෙම පාවිච්චි කරනවා, ගන්න කියලා. ඒක සැලසුමක් අනුව තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඊට පෙර ඒ ගැන විදුලිබල මණ්ඩලය ඇතුළු සියලුදෙනා දැනුවත් කරනවා. හැබැයි, ජල විදුලිය උත්පාදනය කිරීම සඳහා ජලය පාවිච්චි කරන්න ඕනෑ තරම් අවස්ථාව තිබියදී ජලය පාවිච්චි නොකර ඒ ජලය අනෙකුත් කටයුතුවලට මුදා හැරීමට ඉඩ දීම තමයි බරපතළ ප්‍රශ්නය බවට පත් වෙලා තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් අපි අභ්‍යන්තර පරීක්ෂණයක් කරනවා. ඇමතිවරයා හැටියට මට ඒ අභ්‍යන්තර පරීක්ෂණය කරන්න පුළුවන්කමක් නැහැ. මා හිතනවා, ඔබතුමා ඒක දන්නවා ඇති කියලා. ඒක, මට මැදිහත් වෙන්න පුළුවන් කාරණාවක් නොවෙයි.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු කථානායකතුමනි, ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා කිව්වා, ජලය මුදා හැරීම සිදු වෙද්දී යම් කිසි කාරණාවක් නිසා විදුලි බලය උත්පාදනය කරන්න බැරි වුණා වාගේ කථාවක්. හංගලා කථා කරන්න දෙයක් නැහැ නේ. එදා තිබුණේ වර්ජනයක්. කඩාකප්පල්කාරී ක්‍රියාවක් එදා වුණේ. කඩාකප්පල්කාරී ක්‍රියාවක් ලෙස තමයි වතුර ටික යැව්වේ. ඒවා හංගාගෙන මෙතැන කථා කරලා වැඩක් නැහැ නේ. ඇත්ත කථා කරන්න එපා යැ. මන්ත්‍රීවරු විධියට අපි පෙනී ඉන්න ඕනෑ රටේ මිනිස්සු වෙනුවෙන්; රටේ මුදල් වෙනුවෙන්. පැයකට රුපියල් මිලියන හාරසියයක් විනාශ වුණා නම්, ඒ වෙලාවේ ඒ කඩාකප්පල්කාරී ක්‍රියාව කළ වෘත්තිය සමිති වෙනුවෙන් පෙනී සිටින්න එපා කියලා අපි සියලු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. ඒ අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්න. සාමාන්‍යාධිකාරිවරයා නීතිය ක්‍රියාත්මක කරන්න මැළි වෙනවා නම්, පාර්ලිමේන්තුවට හෝ කැඳවලා ඒ අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්න අපි හැමෝම එකතු වෙන්න ඕනෑ. මේ රටේ මුදල් තමයි ඒ විනාශ කළේ. *[බාධා කිරීමක්]*

## කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත
## கைத்தொழிற் பிணக்குகள் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்
## INDUSTRIAL DISPUTES (SPECIAL PROVISIONS) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[අ.භා. 12.20]

**ගරු මනුෂ නානායක්කාර මහතා (කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார - தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சர்)
(The Hon. Manusha Nanayakkara- Minister of Labour and Minister of Foreign Employment)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, මේ රටේ කම්කරු නීති අණපනත් යටතේ ගොනු කරලා, සියල්ල ඉදිරිපත් කරලා තිබෙද්දී මහෙස්ත්‍රාත් අධිකරණ හරහා තමයි ඒ කටයුතු සිදු වන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමා කථා කරලා අවසන් වුණාට පසුව ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

එහිදී සිදු වන ප්‍රමාදයන් වළක්වා ගැනීමට අද මේ විධිවිධානය හරහා හැකි වෙනවා. ගරු කථානායකතුමනි, අද වන විට නඩු 16,000කට අධික සංඛ්‍යාවක් මහෙස්ත්‍රාත් අධිකරණවල හිර වෙලා තිබෙනවා. ඒ නිසා අපේ ශ්‍රමිකයන්ට -කම්කරුවන්ට- ඒ අයගේ ප්‍රතිලාභ, වන්දි ලබා ගැනීම්වලදී බරපතළ ප්‍රමාද සිදු වෙනවා. අන්න ඒ ප්‍රමාදය වළක්වා ගැනීමට තමයි අද මේ නීතිය ගෙනෙන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ගෙවිඳු කුමාරතුංග මැතිතුමා, ඔබතුමාට අවස්ථාව දෙන්නම්. පොඩ්ඩක් ඉන්න.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

මහෙස්ත්‍රාත් අධිකරණවල පවතින බලය සමගාමී ලෙස කම්කරු විනිශ්චය සභාවලටත් ලබා දීම තමයි මේ හරහා සිදු කර තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් උපදේශක කාරක සභාවත්, ආණ්ඩු පක්ෂ මන්ත්‍රී කණ්ඩායමත් සාකච්ඡා කර තිබෙනවා. ඒ වාගේම මේ සඳහා නීතිමය කටයුතු සියල්ල සූදානම් කරලා තිබෙනවා. හිටපු කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා මේ කාරණය දීර්ඝ සංවාදයකට -සාකච්ඡාවකට- බඳුන් කරලා තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ. පනත් කෙටුම්පත පිළිබඳව කරුණු කාරණා ඉදිරිපත් කිරීම ඉස්සරහට තියාගෙන මුලින්ම අද දවසේ දේශපාලන කාරණාව පිළිබඳව වචනයක් කථා කළ යුතුයි කියා මා හිතුවා, ගරු කථානායකතුමනි.

විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහත්මයා අද මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ කාර්ය භාරය ඉෂ්ට කිරීම පැත්තකින් තියලා සභාවෙන් නැගිටලා ගියා. ඇයි, අද එක පාරටම යන්න හිතුණේ? මෙච්චර දවස් පාර්ලිමේන්තුව තිබුණා නේ. ඇයි, අද එක පාරට එතුමාට යන්න හිතුණේ? "විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්න බැහැ" කියලා පොළොවේ හැපුණා. "අපි ගියාට ඕක කරන්න බැහැ" කිව්වා. "ඔය කරන්නේ බොරුවක්" කිව්වා. හැමදාම කිව්වා, "මේ කරන්නේ බොරුවක්" කියලා. දැන් නැවත වතාවක් ආණ්ඩුවේ එකඟතාව ඇතිව, ජනාධිපතිවරයාගේ එකඟතාව ඇතිව විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරලා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබුණාටත් වඩා යම් යම් සංශෝධන ඇතුළත් කරලා, තව තවත් සමබරවීම් ඇති වෙලා, නැවතත් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ කරුණු කාරණා පැත්තට ගිහිල්ලා තිබෙනවා. කොමිෂන් සභා ටික නැවත වතාවක් බල සම්පන්න වෙලා තිබෙනවා. ඒ වාගේ කාරණා රාශියක් සිදු වෙලා තිබෙනවා. ඒ රටක් ලබපු ජයග්‍රහණ. ජයග්‍රහණ ලබනකොට, ඒ ජයග්‍රහණ බලාගෙන ඉන්න බැරි වනකොට, ඔන්න ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු කාරණා කිහිපයක් ඉදිරිපත් කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! පස්වරු 12.30ට පක්ෂ නායක රැස්වීම පවත්වන්න තීන්දු කරලා තිබෙනවා. එම නිසා, මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] *took the Chair.*

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට මේ පිළිබඳව විරෝධතා ගොනු කළා. එතැනදී මෙම සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. අද ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා පැහැදිලිව සඳහන් කළා, එතුමන්ලා ඉදිරිපත් කරපු කාරණා 8ම ජනමත විචාරණයකට යා යුතු කාරණා කියලා. ජනමත විචාරණයකට තුඩු දෙන කාරණා විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් ඉදිරිපත් කරන්න සමගි ජන බලවේගයේ අපේ කණ්ඩායම සිතීම පිළිබඳව ඇත්තටම මට ලජ්ජයි. මොකද, සමගි ජන බලවේගය ගොඩ නඟන්න; සමගි ජන බලවේගය කියලා පක්ෂයක් නිර්මාණය කරන්න අපි පූර්ණ දායකත්වය ලබා දුන්නා; රට ඇතුළේ ඒ පක්ෂය ගැන ජන මතයක් හදන්න අපි හයිය දුන්නා. හැබැයි, අධිකරණයට ගිහිල්ලා අඩුම තරමින් ජනමත විචාරණයකට තුඩු නොදෙන මට්ටමේ කරුණු ටිකක්වත් ඉදිරිපත් කර ගන්නට බැරි තරමට එතුමන්ලා ළඳ බොළඳ වීම පිළිබඳව අපි කනගාටු වෙනවා. ඒ ඇති වුණු ලජ්ජාව නිසා තමයි අද සියලුදෙනා එකතු වෙලා කිව්වේ, "අපි නැඟිටලා යනවා" කියලා. සමගි ජන බලවේගය නැඟිටලා යනවා කිව්වා,

[ගරු මනුෂ නානායක්කාර මහතා]

අනෙක් පක්ෂ නැඟිටලා යනවා කිව්වා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු කණ්ඩායම නම් ඉන්නවා. අපි බොහොම සතුටු වෙනවා, එතුමන්ලා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කිරීම ගැන. මොකද, පාර්ලිමේන්තුවේ ඉඳලා කථා කළොත් තමයි තමන්ට පැවරිලා තිබෙන යුතුකම ඉෂ්ට කරන්න පුළුවන් වෙන්නේ; මන්ත්‍රීවරුන්ට පැවරිලා තිබෙන යුතුකම පාර්ලිමේන්තුව ඇතුළේ කරන්න පුළුවන් වෙන්නේ. ඒක නොකර, අද මේ අය පාර්ලිමේන්තුවෙන් එළියට ගියේ විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේන්න බැහැ, බැහැ කියලා. අද ඒ විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට නැවත සංශෝධනයක් විධියට අපට පනත් කෙටුම්පතක් ගෙනෙන්න පුළුවන් වුණු එක, ඒ ලජ්ජාව වහගන්න තමයි ඔවුන් එළියට ගියේ කියන එක මම පැහැදිලිව කියනවා.

අද මේ සභාව තුළදී සර්ව පාක්ෂික ආණ්ඩු ගැන කථා කළා. මම කියන්න කැමැතියි, 2022 පෙබරවාරි මාසයේ විතර තමයි මම මුලින්ම මේ පාර්ලිමේන්තුවේ සර්ව පාක්ෂික ආණ්ඩුවක අවශ්‍යතාව ගැන කථා කළේ. අපි කථා කරලා කිව්වා, ඉදිරියේදී ගොඩනැඟෙන තත්ත්වයත් එක්ක රටේ ආර්ථික තත්ත්වය ඉතාම බරපතළ තැනකට යනවා, ආහාර සුරක්ෂිතතාව පිළිබඳ බරපතළ ප්‍රශ්නයකට රට මුහුණ දෙනවා, මේ වෙලාවේ පාට, පක්ෂ භේද බලන එක නොවෙයි කරන්න ඕනෑ, අපේ දේශපාලන අනාගතය ගැන බලන එක නොවෙයි කරන්න ඕනෑ, අපි සියලුදෙනා එකට එකතුවෙලා සර්ව පාක්ෂික ආණ්ඩුවක් හදලා මේ රටේ ප්‍රශ්න ටික විසඳගන්න ඕනෑ කියලා. අපේ මිනිසුන්ගේ ජීවිත ආරක්ෂා කරන්න ඕනෑ නිසා, අපේ දරුවන්ට හෙට දවසේ මේ රට ඉතුරු කරන්න ඕනෑ නිසා තමයි අපි ඒ තැනට එකතු වෙන්න ඕනෑ කියලා කිව්වේ. ඒ මතවාදයට අපේ පක්ෂයේ බොහෝ දෙනෙක් එකතු වුණා. පසුව හරින් ප්‍රනාන්දු මන්ත්‍රීවරයාත් ඇවිල්ලා කිව්වා, මේ සඳහා එකතු වෙන්න බැරි නම්, අපේ අයට නායකත්වය ගන්න බැරි නම්, සජිත් ප්‍රේමදාස මහත්මයාට ඒ නායකත්වය ගන්න බැරි නම්, ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාට ඒ නායකත්වය ගන්න කියලා. අපට මතකයි, අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා එහෙම කිව්වා. ඇයි එහෙම කිව්වේ? නායකත්වය ගන්න කවුරුවත් කැමැති නැති නිසායි එහෙම කිව්වේ. "අපි විපක්ෂයේ නායකයෝ, නායකයෝ" කියාගෙන සිටියත්, නායකත්වය ගන්න කාටවත් කොන්දක් තිබුණේ නැහැ. මොකද වුණේ? හැමෝම දන්නවා අද අපට ඩොලර් පිළිබඳව තිබෙන ප්‍රශ්නය; හැමෝම දන්නවා ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් ඇති වන ප්‍රශ්නය; හැමෝම දන්නවා රටේ තිබෙන ආර්ථික කඩා වැටීම ගැන. කොහොමද, එක පාරටම සල්ලි හොයා ගන්නේ, කොහොමද ඩීසල් ටික දෙන්නේ, කොහොමද පෙට්‍රල් ටික දෙන්නේ, කොහොමද ගෑස් ටික දෙන්නේ, කොහොමද බෙහෙත් ටික දෙන්නේ කියන ප්‍රශ්න තිබෙන බව මේ සෑම දේශපාලන නායකයෙක්ම දන්නවා. ඒවා කරන්න අමාරුයි කියලා මේ අය දන්නවා. ඒක අමාරුයි කියලා දන්න නිසා තමයි කවුරුවත් මේකට කර ගහන්න කැමති වුණේ නැත්තේ. අපි, සමගි ජන බලවේගයේ අය විපක්ෂ නායක කාර්යාලයේ මාස ගණනක් කථා කළා; රෑ එළිවෙනකල් කථා කළා, උදේ ඉඳලා හවස් වෙනකල් කථා කළා මේ ගැන. රැස්වීම්වලදී පැය තුන, හතර කථා කළා. අපි වේදනාවෙන් කථා කළා, රටේ මිනිස්සු පිළිබඳව අල්ප මාත්‍ර හැඟීමක් තිබෙනවා නම් මේ වෙලාවේ එකට එකතු වෙන්න කියලා. *[බාධා කිරීමක්]*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අද දවසේ දිවා ආහාර විවේක කාලය ලබා නොගෙන සභාවේ කටයුතු පවත්වාගෙන යන්න කියා මා ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

අද දින දිවා ආහාර විවේක කාලය නොමැතිව විවාදයේ කටයුතු අඛණ්ඩව සිදු කිරීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

අපි ඒ අයට ඉල්ලීම් කළා, එකට එකතු වෙන්න කියලා. අපි කරන්න පුළුවන් හැම විධියටම ඉල්ලීම් කළා. අපි තරහා වෙලා එළියට ගියා. මේ වෙලාවේ කොහොම හරි එකතු වෙන්න ඕනෑ කියලා කිව්වා. අපි කිව්වා, අපි ස්වාධීන වෙනවා කියලා. අපි තර්ජනය කළා. අපි කිව්වා, අපි බැහැලා එළියට යනවා කියලා. එහෙම කිව්වාම ඊට පහුවදා උදේ "හරි, අපි ලියුමක් යවන්නම්" කියලා කරුණු රාශියක් දාලා, ඒවාට කැමැති නම් එකඟතාව පළ කරනවා කියලා ජනාධිපතිවරයාට පළමුවැනි ලියුම යැව්වා. අපි මතක් කරන්න ඕනෑ, ඒ වෙලාවේ නීතිඥ සංගමය යෝජනාවලියක් ඉදිරිපත් කළා. ඒ වාගේම මහා නායක හාමුදුරුවරු යෝජනාවලියක් ඉදිරිපත් කළා. ඊට කලින්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු පක්ෂ 11 කණ්ඩායම සහ අපි එකතුවෙලා පොදු ලියවිල්ලක් සකස් කළා. ඒ ලියවිල්ලේ තිබුණු කරුණු කාරණා සම්බන්ධයෙන් ඒකමතික තීරණයකට එන්න අපට ඕනෑ වුණා.

හැබැයි, සමගි ජන බලවේගයේ නායකයා විධියට සජිත් ප්‍රේමදාස මහත්මයා ඒ හැම අවස්ථාවක්ම මඟ හැරියා. එහෙම මඟ හැරලා ඉන්නකොට ඔය කියන විධියටම ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා අවස්ථා ගණනාවකදීම එතුමාට ආරාධනා කළා, මේ රටේ අගමැතිකම භාර ගන්න; සර්ව පාක්ෂිකව එකතුවෙලා ආණ්ඩුව හදන්න එන්න කියලා. නමුත්, අර "නොකෙරෙන වෙදකමට කෝඳුරු තෙල් හත් පට්ටයයි තව පොඩ්ඩකුයි ඕනෑ" කියනවා වාගේ මොනවා හරි හේතු කියමින් ඒක කල් ඇරියා. එහෙම කල් අරිමින් ඉන්නකොට අන්තිමට අපි ගිහිල්ලා දැනුවත් කළා. "හෙට වෙනකොට රනිල් වික්‍රමසිංහ මහත්මයා දිවුරුම් දෙන්න සූදානමක් තිබෙනවා කියලා ආරංචියි, අද හවස 5.30ට යනවා, මොකද කියන්නේ, දැන්වත් අගමැති ධුරය භාර ගන්නවාද?" කියලා. ඔන්න, එතකොට ටිකක් කලබල වුණා. කලබල වෙලා නැවත රැස්වීමක් කැඳවා ඒ පිළිබඳව සාකච්ඡා කළා. ඒකත් තීන්දුවකින් තොරව අවසන් වුණා. අපි කියපු දේ එතුමා පිළිගත්තේ නැහැ.

ඊළඟට පහුවෙනිදා උදේ 11.00ට මුණ ගැහෙන්න කියා තීන්දු කළ නිසා අපි ආවා. ඒ එනකොට රනිල් වික්‍රමසිංහ මහත්මයා හවස දිවුරුම් දෙනවා කියන ආරංචිය ඇවිල්ලා, ජනාධිපතිවරයාට යවන්න කඩිමුඩියේ ලියුමක් සකස් කරනවා, අගමැතිකම භාර ගන්න සූදානම් කියලා. ඒ වෙනකොට අර කොන්දේසි පස්සට ගිහිල්ලායි තිබුණේ. ඒ වෙලාවේ ජනාධිපති ලේකම්, ගාමිණී සෙනරත් මහත්මයාට මම කිව්වා, "අපේ ලියුම එනවා, පොඩ්ඩක් ඉන්න. ඔක නතර කර ගන්න පුළුවන්ද බලන්න" කියලා. ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට කථා කර කිව්වා, "ඔන්න, දැන් සජිත් ප්‍රේමදාස මහත්මයා එකඟයි. අපි මේ වැඩේ කරමු" කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත් මම කථා කළා. සියලුදෙනාට කථා කර කිව්වා, "සජිත් ප්‍රේමදාස මහත්මයා අගමැති ධුරය භාර ගන්න එකඟයි, අපි හැමෝම

එකතුවෙලා මේ වැඩේ කරමු" කියලා. හැබැයි, ඒ ලියුම යවන්න සූදානම් වුණේ රනිල් වික්‍රමසිංහ මහත්මයා අරෙහේ දිවුරුම් දීමට වේලාව හදලා තීන්දු කළාට පසුවයි. ඇයි එහෙම වුණේ? "මේක භාර ගන්නේ නැහැ, භාර ගන්නේ නැහැ" කිව්ව නිසායි. භාර ගන්න බයයි. මොකද ඒක භාර ගන්න හයියක් තිබුණේ නැහැ. භාර ගන්න බැරුව ඉඳලා රනිල් වික්‍රමසිංහ මහත්මයා ඒක භාර ගන්නකොට තමයි "ටක්" ගාලා පැනලා කිව්වේ, "මම භාර ගන්නම්" කියලා. එතකොට ජනාධිපතිවරයා තීන්දුව අරගෙන ඉවරයි.

අපි මේ පාර්ලිමේන්තුව ඇතුළේ කථා කරනවා, රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැති ධුරයට කොහොමද පත් වුණේ, කවුද යෝජනා කළේ කියලා. ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනයි. විපක්ෂ නායකතුමාට කිව්වා භාර ගන්න කියලා. එතුමා භාර ගන්නේ නැති වෙනකොට, අනුර කුමාර දිසානායක මහත්මයාට කිව්වා. එතුමාත් භාර ගන්නේ නැති වෙනකොට, කවුරුත් මේක භාර ගන්න අකැමැති වෙනකොට කවුරු හෝ කෙනෙක් ඒකට බෙල්ල තිබ්බා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක දුවන කෝච්චියට පැන්නා වාගේ වැඩක්; දැක දැක මරු වැල පැගුවා වාගේ වැඩක්. ගෑස් ගේන්න අමාරුයි කියලා දන්නවා. තෙල් ටික දෙන්න අමාරුයි කියලා දන්නවා. රට default වෙලා තිබෙන්නේ කියලා දන්නවා. ණය ගෙවන්න බැහැ කියලා නිල වශයෙන් ප්‍රකාශයට පත් කරලා ඉවරයි. Soft default එකක් නොවෙයි, hard default එකක් වෙලා ඉවරයි. ඒ නිසා මේ දේවල් ගේන්න බැහැ කියලා අපි දන්නවා. එහෙම තිබියදී තමයි මේ තීන්දුව ගත්තේ.

අනික, පාර්ලිමේන්තුවේ බහුතරය ඇතැයි අභිමතය තිබෙන කෙනකු, හැඟෙන කෙනකු, අග්‍රාමාත්‍යවරයා හැටියට පත් කිරීමට ජනාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය පැවරිලා තිබෙනවා. ඒ අනුව ජනාධිපතිවරයා විසින් ඒ පත් කිරීම කරනවා. ඒකට කවුරුවත් යෝජනා කරන්න ඕනෑ නැහැ. කවුරුවත් රැට රැට ගිහිල්ලා අදහස්, යෝජනා ඉදිරිපත් කරන්න ඕනෑ නැහැ. ඒ අනුව ජනාධිපතිවරයා විසින් අගමැතිවරයා පත් කළා. එක්කෙනාද ඉන්නේ, දහ දෙනාද ඉන්නේ, කී දෙනාද ඉන්නේ කියන එක වැදගත් නැහැ. කොන්ද කෙළින් තබාගෙන ගත්ත ඒ නිර්භීත තීන්දුවට අපි ගරු කරන්න ඕනෑ. අපි මේ අවුරුද්දේ මුල ඉඳලාම දරපු මතය අනුව මේ රටේ තිබෙන ප්‍රශ්න විසඳන්න නම්, අපේ පක්ෂ, පාට අමතක කරලා, දේශපාලන මතවාද අමතක කරලා, තරහ-මරහ අමතක කරලා එකට ඇවිල්ලා රටේ මිනිස්සු වෙනුවෙන් එකතු වෙන්න ඕනෑ කියන තීන්දුව ගත් නිසා තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයා ඇතුළු කැබිනට් මණ්ඩලයට එකතු වෙන්න අපි තීරණය කළේ.

අපේ පක්ෂය ඇතුළේත් බොහෝ දෙනෙකු එදා මෙන්ම මේ වන විටත් කථා කරනවා, "මේ වෙලාවේ තීන්දුව ගත යුතුව තිබුණා, අපි ආණ්ඩුව ගත යුතුව තිබුණා" කියලා. හැබැයි, නායකත්වයට ඒක ගන්න තිබිච්ච අපහසුතාව, ඒකට තිබිච්ච බය අපි දැක්කා. දැන් එතුමා කියනවා "මට හිරිකිතයක් තිබෙනවා, මට ලජ්ජාවක් තිබෙනවා, සක්විති රජකම දෙනවා කිව්වත් ඔය විධියට මම ගන්නේ නැහැ" කියලා. එතුමා සක්විති රජකම ඉල්ලුවා. මට ජනාධිපතිකම දෙන්න කියලා එතුමා ඉල්ලුවා. මට අගමැතිකම දෙන්න කියලා එතුමා ලියුමක් ලිව්වා. හැබැයි, හම්බ වුණේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැන වැඩිදුරටත් කථා කථා කරන්න මම සූදානම් නැහැ. අපි සමගි ජන බලවේගයෙන් ඉවත්ව ස්වාධීන වෙලා මේ කථා ඉදිරිපත් කරන්නේ මේ රටේ මිනිස්සු වෙනුවෙන් කෙළින් හිටගත්තු නිසායි.

අපි දන්නවා ඩීසල් ප්‍රශ්නය විසඳන්න අමාරුයි කියලා. අපි දන්නවා ගෑස් ප්‍රශ්නය විසඳන්න අමාරුයි කියලා. ඒවාට කෙටි කාලීන විසඳුම් ලැබෙන්නේ නැහැ කියලා අපි දන්නවා. මෙවැනි තත්ත්වයක් තුළ, "සති දෙකෙන් විසඳන්න ඕනෑ, රනිල්ට ජාත්‍යන්තර සම්බන්ධතා තිබෙනවා, රනිල්ට ලෝකය සලකනවා, එහෙම කියලා නේද ආවේ, කෝ දැන් කළාද" කියලා කවුරු හෝ අහනවා නම්, ඒක දේශපාලන කුපාඩිකම, කුහකකම කියන එකත් පැහැදිලි කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ භාර ගත්තේ අමාරු තැනක්. මේ අමාරු තැන විසඳා ගන්න කාලයක් යනවා. කංචන විජේසේකර අමාත්‍යවරයාත් දැඩි පරිශ්‍රමයක් දරනවා, මේ ප්‍රශ්නය විසඳන්න.

ඒ වාගේම මුළු කැබිනට් මණ්ඩලයම එකතු වෙලා මේ ප්‍රශ්නය විසඳාගන්න දැවැන්ත උත්සාහයක් දරනවා. කවුරුවත් කල් මරමින්, වෙලාව බල බලා ඉන්නේ නැහැ. හැබැයි, මේ වැඩ කරද්දී රාජ්‍ය නිලධාරින් දක්වන සහයෝගය පිළිබඳව අපට බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. රාජ්‍ය නිලධාරින් තවමත් එහෙන් මෙහෙන් කකුලෙන් අදිමින් කටයුතු කරනවා. ඒ රාජ්‍ය නිලධාරින්ට තමන්ගේ සැප පහසුකම් ඒ විධියට ලැබෙනවා. ඒ අයට වාහනය තිබෙනවා, ඩීසල් ටික තිබෙනවා. ඒ අය තීන්දු තීරණ ගනිද්දී, මේ රටේ මිනිස්සු තැළෙන, පෑගෙන, පොඩි වෙන ප්‍රශ්නය ගැන කල්පනා කරන්නේ නැහැ. මොකද, වැඩි වෙලාවක් මිනිස්සු පෝලිම්වල ඉඳලා, රට අරාජික තත්ත්වයකට පත් වුණොත් ගහන්නේ දේශපාලනඥයන්ට. නිලධාරින්ට ගහන්නේ නැහැ. හැබැයි, නිලධාරින් අදටත් කකුලෙන් අදිමින් කටයුතු කරනවා. LCs විවෘත කරන්න බැංකුවට ගියාම ඇති වන ප්‍රශ්න, ඩොලර් ටිකක් අරගන්න එහාට මෙහාට ගියාම ඇති වන ප්‍රශ්න තමයි බරපතළ ප්‍රශ්න වෙලා තිබෙන්නේ. මේවා ජනතාව තේරුම් ගන්න ඕනෑ. දේශපාලනඥයන්ට විතරක් ඇඟිල්ල දිගු කළාට වැඩක් නැහැ. මේ වෙලාවේ නිලධාරින්ගේ සහයෝගයත් ලැබෙන්න ඕනෑ. හැබැයි, ලබන සුමානය වෙනකොට යම්කිසි ආකාරයකට මේ තත්ත්වය යථා තත්ත්වයට පත් කරගෙන, කෙටි කාලීනව යම් මට්ටමකට පත් කරගෙන, ඊට පසු මධ්‍ය කාලීනව තවත් ටිකක් විසඳාගන්න පුළුවන් සැලැස්මක් ඇතිව තමයි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ.

අපේ මන්ත්‍රීවරයෙක් ඇහුවා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැතිකම භාරගන්නකොට එතුමාට සැලැස්මක් තිබුණාද කියලා. දෙකොන පත්තු වෙමින් තිබුණු විලක්කුවක් භාරගන්නකොට සැලසුම් ගැන කල්පනා කරන්න වෙලාවක් නැහැ නේ. ඉස්සෙල්ලාම මිනිසුන්ගේ ජීවිත බේරා ගන්නයි ඕනෑකම තිබුණේ. ඒ නිසා තමයි එතුමා ඒ තීරණයට ආවේ. එතැන ඉඳලා එතුමා දැන් පියවරෙන් පියවර හදාගෙන යනවා. සැලසුම් තිබෙනවා. එක් පැත්තකින්, දේශපාලන විසඳුම් සඳහා සැලසුම් ක්‍රියාත්මක වෙනවා. අනික් පැත්තෙන්, ආර්ථික විසඳුම් සඳහා සැලසුම් ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා නේ දැනට සති තුනක, හතරක කාලයක සිට රට යම් තරමින් යථා තත්ත්වයට පත් කරගන්න පුළුවන් වුණේ. දැන් තිබෙන ප්‍රශ්නය මොකක්ද? තෙල් ප්‍රශ්නය තිබෙනවා. ඒක කවුරුවත් නැහැ කියන්නේ නැහැ. ඒ වාගේම ගෑස් ප්‍රශ්නය තිබෙනවා; ඖෂධ ප්‍රශ්නය තිබෙනවා. මේ මූලික ප්‍රශ්න ටික තිබෙනවා. හැබැයි, ආයතන ටික යම්තාක් දුරකට පණ ගැන්විලා, නැඟිටලා ආවා. නමුත්, පාසල් පවත්වන්න විධියක් නැහැ. දැන් අහනවා, පාසල් පවත්වන්න බැරි නම්, අධ්‍යාපන ඇමතිවරයෙක් මොකටද කියලා. තෙල් ටික දෙන්න බැරි නම්, බලශක්ති ඇමතිවරයෙක් මොකටද කියලා අහනවා. මේ සියල්ල එකිනෙකට බැඳිලා තිබෙන්නේ. මේක පුරුක් විධියට එකිනෙකට බැඳුණු ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය කොනක ඉඳලා ලිහන්න ඕනෑ. මේ ප්‍රශ්නය එකවර ලිහන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. ඒකට අපි හැමෝටම ඉවසීම තිබෙන්න ඕනෑ. අපි හැමෝම එකට එකතු වෙලා මේ රටේ මිනිස්සු වෙනුවෙන් ඉවසීමෙන් වැඩ කටයුතු කරන්න ඕනෑ. එහෙම නැතිව දේශපාලන වාසි ගන්න බලාගෙන වැඩ කටයුතු කළොත් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ.

[ගරු මනුෂ නානායක්කාර මහතා]

තෙල් පෝලිම්වල ඉන්න මිනිස්සු කුලප්පු කරන්න දැන් බයිසිකල්වලින් වෙනම කණ්ඩායමක් එනවා. එහෙම එන්නේ ගමේ කට්ටිය නොවෙයි. වෙනම කණ්ඩායමක් ඇවිල්ලා තෙල් පෝලිම්වල ඉන්න මිනිස්සු පොඩ්ඩක් කුලප්පු කරලා යනවා. ඒ අය තැනින් තැනට යනවා. මෙහෙම මිනිස්සු කුලප්පු කරලා, නැවත වතාවක් රට ඇතුළේ ප්‍රශ්නයක් ඇති වුණොත්, මේ මිනිස්සු ගහ මරාගන්න පටන් ගත්තොත් රට බරපතළ තත්ත්වයකට යනවා. ඒක කරන්න සමහර දේශපාලනඥයන්ට අවශ්‍යයි. සමහර දේශපාලනඥයෝ බලාගෙන ඉන්නවා රට අරාජික තත්ත්වයකට පත් වෙනකල්. ඒ තත්ත්වය නිර්මාණය කරන්න උල්පන්දම් දෙනවා.

මේ වෙලාවේ රට යම් තැනකට ගෙන එන්න නම්, අඩු තරමින් කෙටි කාලීනව මාස තුනක කාලයක් සහ අර්ධකාලීනව මාස හයක කාලයක් වශයෙන් යම් කාලරාමුවක් ලබා දෙන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ සිටින සියලුදෙනාම ඒ සඳහා සහයෝගය ලබා දෙන්න ඕනෑ. අද රටේ මිනිස්සු බලාපොරොත්තු තබාගෙන සිටිනවා යම්කිසි වෙලාවක රට මේ ප්‍රශ්නවලින් ගොඩ එයි කියලා. මේ ප්‍රශ්නවලින් රටට ගොඩ එන්න පුළුවන් කියලා මිනිස්සු බලාපොරොත්තු සහගතව ඉන්නවා. ඒ මිනිසුන්ට තිබෙන බලාපොරොත්තුව නැති කරන්න එපා. කර්මාන්ත ක්ෂේත්‍රය කඩාගෙන වැටිලා තිබෙනවා. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවෝ විනාශ වෙලා. ඒ මිනිස්සු බලාගෙන ඉන්නවා හෙට අනිද්දා හෝ රට ගොඩ එයි කියලා. දරුවෝ බලාගෙන ඉන්නවා, හරියාකාරව අධ්‍යාපන කටයුතු කරගෙන යන්න අවස්ථාව ලැබෙනතුරු. විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ බලාගෙන ඉන්නවා, තමන්ගේ අධ්‍යාපන කටයුතු ටික හරියට කරගන්න, රට සාමකාමී වෙනකල්, රට යථා තත්ත්වයට පත් වෙනකල්. හැබැයි, රට විනාශ වී අරාජික තත්ත්වයකට පත් වෙනකල් යම් යම් දේශපාලනඥයෝ බලාගෙන ඉන්නවා නම්, අන්න ඒ දේශපාලනඥයෝ දිහා ජනතාව බොහොම පැහැදිලිව බලාගෙනයි ඉන්නේ කියන එකත් මම කියනවා. රට නැවතත් අමාරු තැනකට ගෙනයන්න හදනවා නම්, රට තුළ නැවතත් ඇඳිරි නීති පනවන තත්ත්වයක් ඇති කරන්න හදනවා නම්, සාමාන්‍ය ජන ජීවිතය පවත්වාගෙන යන්න බැරි තැනට නැවතත් මේ රට පත් කරන්න හදනවා නම්, අන්න ඒ අය කෙරෙහි අවධානය යොමු කරන්න කියා මම කියනවා.

මිනිසුන්ට ඕනෑ කරන්නේ සාමකාමීව ජීවත් වෙන්නයි. දැන් සමහරු අහනවා, "තමුන්නාන්සේලා ඇවිල්ලා හොරු ඇල්ලුවාද? අරවා කළාද? මේවා කළාද?" කියලා. ඉස්සෙල්ලාම කරන්න ඕනෑ මිනිස්සු ජීවත් කරවන එකයි. ඉස්සෙල්ලාම මිනිස්සු ජීවත් වෙන්න ඕනෑ. මිනිසුන්ගේ ජීවිත ආරක්ෂාවයි වැදගත් වෙන්නේ. මිනිසුන්ට අවශ්‍ය ඖෂධ ටික ලබා දෙන්න ඕනෑ. අපි දන්නේ නැහැ, ඖෂධ නැතිව රෝහල්වල කොපමණ රෝගීන් සංඛ්‍යාවක් මැරෙනවාද කියලා. ඒක බරපතළ ප්‍රශ්නයක්. අපි දන්නේ නැහැ, දෙවේල, තුන්වේල තියා එක් වේලක්වත් කන්නේ නැති මිනිස්සු කොයි තරම් ප්‍රමාණයක් ඉන්නවාද කියලා. එහෙම මිනිස්සු ඉන්නවා. එහෙම නම්, ඒ අය වෙනුවෙන් නොවෙයිද අපි මේ වෙලාවේ වැඩ කටයුතු කරන්න ඕනෑ? ඒක නොවෙයිද, අපේ ප්‍රමුඛතාව වෙන්න ඕනෑ? මේ වෙලාවේ ප්‍රමුඛතාව හඳුනා ගැනීමයි වැදගත් වන්නේ.

කම්කරු අමාත්‍යාංශය විධියට අපි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ, කම්කරුවන් ආරක්ෂා කරන ගමන්ම, ව්‍යවසායකයාත් ආරක්ෂා කර ගන්නයි; සේවා යෝජකයාත් ආරක්ෂා කරගන්නයි. අපට ඒකට බැඳීමක් තිබෙනවා.

බොහෝ වෙලාවට මේ රටට විදේශ ආයෝජකයන් එන්නේ නැත්තේ මේ රටේ කම්කරු අණ පනත්වල තිබෙන දැඩි නීති රීති නිසා. ඒවා යල් පැනපු පරණ නීති. ඒවා වෙනස් කරන්න ඕනෑ. අලුත් ආයෝජකයන්ට අපේ රටට එන්න ඉඩ හදන්න ඕනෑ. විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළව අපි නව නීති රීති ගෙනාවා; අවශ්‍ය වෙනස්කම් සිදු කළා. සවුදි අරාබිය සහ අනෙකුත් රටවල ගෘහ සේවය සඳහා යන අයට පනවා තිබූ වයස අවුරුදු 25යි කියන සීමාව අපි වයස අවුරුදු 21 දක්වා අඩු කළා. ඇයි එහෙම අඩු කළේ? මේ බොරු නීති දැමීම හරහා විදේශීය වශයෙන්, රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් අපට බලපෑම් එනවා; අනෙක් අතට, බොහෝ කාන්තාවන් මේ රට දාලා අනීතික වශයෙන් පිට රටවලට යනවා. ඒ අය ගැන කිසිදු තොරතුරක් නැහැ. ඒ අය ගැන වාර්තා වෙන්නේ නැහැ. ඒ අය ලියා පදිංචි වෙන්නේ නැහැ. ඒ අය පිට රට යනකොට අඩුම ගණනේ ලියා පදිංචි වෙලා ගියොත්, කොහේද ගියේ, මොනවාද කරන්නේ කියා සොයා බලා උදව්වක් හෝ කරන්න අපට පුළුවන්. ඒ නිසා තමයි අපි විවිධ නීති අවම කිරීම පවා සිදු කරලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තවත් මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා, ගරු අමාත්‍යතුමනි.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
මම ඉක්මනින් අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඩොලර් නැතිකම තමයි දැන් රටේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නය. ඒක තේ, මූලික ප්‍රශ්නය. ඒ ඩොලර් ප්‍රශ්නය විසඳා ගන්න, ලෝකයේ විසිරී සිටින අපේ විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ගෙන් අපි ඉල්ලා සිටියා, "අපට මේ වෙලාවේ ඩොලර් ටිකක් එවන්න" කියලා. අපි ඔවුන්ට ස්තුතිවන්ත වෙනවා. අද අප පෙට්‍රල් ටිකක් හෝ ගහන්නේ, අද අපට ඩීසල් ටිකක් ලැබෙන්නේ, ගෑස් ටිකක් ලැබෙන්නේ අපේ විදෙස්ගත ශ්‍රමිකයන් ඒ වෙනුවෙන් දායකත්වය දී තිබෙන නිසා. ඔවුන් පසුගිය මාසයට ඇමෙරිකානු ඩොලර් මිලියන 305ක් එවලා තිබෙනවා. ඒක එක මාසයක් ඇතුළත සියයට 54ක වැඩිවීමක්. අපේ විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ට, අපේ විදෙස්ගත ශ්‍රමිකයන්ට අපි ස්තුතිවන්ත වෙනවා. ඔබේ මුදල් නිවැරැදි මාර්ගයෙන් තමන්ගේ ගෙදරට එවපු නිසා තමයි අද මේ රටේ මිනිසුන් පෝලිම්වල ගිහින් හෝ යම් තරමකට හරි තෙල් ටිකක් ගහ ගන්නේ. ඔබ එවන ඩොලර් ප්‍රමාණය තවත් ටිකක් වැඩි කළොත් ඒ පෝලිම් නැති කරගන්න පුළුවන්. විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් වන ඔබ තව ටිකක් වැඩියෙන් ලංකාවට සල්ලි එව්වොත්, මේ රටට අවශ්‍ය බෙහෙත් ටික ගෙනෙන්න පුළුවන්. මේ රටේ බදු මුදල්වලින් ඉගෙන ගෙන -මේ රටේ අධ්‍යාපනය ලබා - පිටරටවලට ගිහින් ජීවත් වන අපේ ලාංකිකයන්ට අපි ආරාධනා කරනවා, "මෙය, අපේ රටේ මිනිස්සු බොහොම අපහසුතාවට පත් වෙලා ඉන්න මොහොතක් වන නිසා අපේ රටට ඩොලර් එවන්න" කියලා. ඕස්ට්‍රේලියාවේ බැංකු තමන්ගේ බැංකු හරහා ශ්‍රී ලාංකිකයන් මුදල් යවන විට අය කරන ගාස්තුව ඉවත් කර තිබෙනවා, ලංකාවට මුදල් එවන්න උදව් කරන්න. එහෙම නම්, අපි ඒ රටවල ජීවත් වන මිනිසුන්ට කියනවා, "අපේ රට වෙනුවෙන් උදව් කරන්න" කියලා. හැබැයි, අපි මෙහෙම කියන කොට තවත් කට්ටියක් කියනවා, "ලංකාවට ඩොලර් එවන්න එපා. අරයා යනකල් එවන්න එපා. එව්වොත් හොරකම් කරනවා. ඔය එවන්නේ හොරකම් කරන්න. එවන්න එපා, ඩොලර් එකක්වත්." කියලා. ඒ අය එහෙම කියනවා. මම අහනවා, ලජ්ජා නැද්ද කියලා. මෙහේ මිනිස්සු පෝලිම්වල මැරෙන්නේ ඩොලර් නැති නිසා.

බෙහෙත් නැතිව මිනිස්සු මැරෙන්නේ බෙහෙත් ගන්න ඩොලර් නැති නිසා. ඒ එවන්න හදන ඩොලර් ටික එවන්න එපා කියන්නේ හදවතක් නැති මිනිසුන් නේද, ඔවුන් කොච්චර කුහකයන්ද කියා කල්පනා කරන්න ඕනෑ. වෙනත් වචනවලින් කියනවා නම්, ඔවුන් කුහකයෝ!

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මේ රටේ මිනිසුන්ගේ ජීවිත ආරක්ෂා කරන්න වෙනදා සාමාන්‍ය පරිදි එවපු ඩොලර් ටික නැවත වතාවක් බැංකු හරහා එවන්න. එහෙම වුණොත් මේ රටේ මිනිසුන්ට ජීවත් වෙන්න පුළුවන්. සමහර අය කියනවා, "අරයා හොරකම් කරයි. මෙයා හොරකම් කරයි" කියලා. තමන් මුදල් එවන්නේ තමන්ගේ නෝනාගේ බැංකු ගිණුමට නම්, තමන්ගේ දරුවාගේ බැංකු ගිණුමට නම්, තමන්ගේම ගිණුමකට නම් වෙනත් කාටවත් හොරකම් කරන්න බැහැ. ඉදිරියේදී අපි බලාපොරොත්තු වෙනවා, ඔබ මේ රටට එවපු මුදල්වලින් කොයි කොයි විධියටද වියදම් කළේ කියා සවිස්තර වියදම් වාර්තාවක් මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය හරහා ඉදිරිපත් කරන්න. ඒ මුදල් වැරැදිලාවත් අනවශ්‍ය දෙයකට, හොරකමකට යොදවන්න අප ඉඩ දෙන්නේ නැහැ කියන කාරණාවත් මම මේ වෙලාවේ සඳහන් කරනවා. ලංකාවට නිවැරැදි මාර්ගවලින් බැංකු හරහා මුදල් එවලා අපේ රටේ මිනිසුන්ට තව දශමයක් හෝ ජීවත් වෙන්න හයිය දීපු සියලු විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ට අපි මේ වෙලාවේ ස්තුතිවන්ත වෙනවා.

කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සකස් කරන්න වෙහෙස මහන්සි වෙච්ච අපේ හිටපු අමාත්‍යතුමාට, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට, ඒ වාගේම කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ නිලධාරි මණ්ඩලයට, පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට මේ වෙලාවේ මගේ ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[පි.ප. 12.42]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய இந்த விவாதத்தின்போது மிக முக்கியமான ஒரு விடயத்தைப் பதிவு செய்ய விரும்புகின்றேன். 2022.06.18ஆம் திகதி முல்லைத்தீவு மாவட்ட நிர்வாக எல்லைக்குட்பட்ட விசுவமடு எரிபொருள் நிரப்பு நிலையத்தில் எரிபொருளுக்காக நீண்ட வரிசையில் காத்திருந்த மக்களுக்கு அது வழங்கப்படாத நிலையில், இரவு 7.30 மணியளவில் வரிசையில் காத்திருந்தவர்களுள் ஒருவரான மனநலம் குன்றிய ஒரு பொதுமகன் அங்கிருந்தவர்களோடு முரண்பட்டபோது, அவ்விடத்திற்கு வருகைதந்த விசுவமடு 572ஆவது படைப்பிரிவைச் சேர்ந்த இராணுவத்தினர் குறித்த பொதுமகனைத் தமது முகாமுக்கு இழுத்துச்சென்று, அவரைப் பொல்லுகளாலும் ஆயுத முனைகளாலும் பலமாகத் தாக்கி இரத்தக் காயங்களை ஏற்படுத்தியிருந்தனர். இதனை அவதானித்த அதே பிரதேசத்தைச் சேர்ந்த இளைஞர்கள், இராணுவக் காவலரணுக்கு அருகே சென்று குறித்த பொதுமகனைத் தாக்கியமைக்கான காரணத்தைக் கேட்ட போது, இராணுவத்தினர் அவர்களையும் அச்சுறுத்தி வெளி யேற்றியுள்ளனர்.

அதன்பின்பு இரு கனரக வாகனங்களில் பொல்லு களோடும், கூரிய ஆயுதங்களோடும் அழைத்து வரப்பட்ட பெரும் எண்ணிக்கையிலான இராணுவத்தினர் எரிபொருளுக் காக வரிசையிலே காத்திருந்த பெண்கள், முதியவர்கள் மற்றும் இச்சம்பவத்தோடு எவ்விதத் தொடர்புமற்று அவ்வீதியால் சென்றவர்கள் உட்பட நூற்றுக்கணக்கான பொதுமக்களை மிக மோசமாகத் தாக்கியுள்ளனர். இதன்போது முல்லைத்தீவு, விசுவமடு மேற்கைச் சேர்ந்த 43 வயதுடைய திரு. செல்வராசா சிறிகாந்தன், நாதன்திட்ட கிராம அபிவிருத்திச் சங்கத்தின் தலைவரான கிளிநொச்சி, புன்னைநீராவி, நாதன்திட்டத்தைச் சேர்ந்த 37 வயதுடைய திரு. மயில்வாகனம் ஜெகதீஸ்வரன், கிளிநொச்சி, புன்னைநீராவி, நாதன்திட்டத்தைச் சேர்ந்த 25 வயதுடைய திரு. சசிக்குமார் விதுசன், முல்லைத்தீவு, உடையார்கட்டு வடக்கைச் சேர்ந்த 36 வயதுடைய திரு. ஜெகதீஸ் நடராசா, உழவனூர், சுண்டிக்குளம் வீதியைச் சேர்ந்த 43 வயதுடைய திரு. மலையாண்டி ஜினோகரன் ஆகிய ஐவருடன் யாழ்ப்பாணத்திலிருந்து வருகைதந்த பிறிதொருவரு மாக மொத்தம் ஆறுபேர் இராணுவத்தினரின் தாக்குதல்களால் பலத்த காயங்களுக்குள்ளாகி கிளிநொச்சி மற்றும் முல்லைத்தீவு மாவட்ட வைத்தியசாலைகளில் ஆபத்தான நிலையில் அனுமதிக்கப்பட்டுள்ளனர். இவர்களுள் மலையாண்டி ஜினோகரன் என்பவர் ஒரு முன்னாள் போராளியாவார். அவருக்கு ஏற்கனவே ஒரு கால் இல்லை; மற்றைய காலும் செயற்றிறன் குன்றிய நிலையிலே இருக்கிறது.

இவ்வாறு தாக்குதலுக்குள்ளான அந்த ஆறுபேரில் நால்வர் கிளிநொச்சி மாவட்டப் பொது வைத்தியசாலையிலும், இருவர் முல்லைத்தீவு மாவட்ட வைத்தியசாலையிலும் கைவிலங்கிடப் பட்ட நிலையில் அனுமதிக்கப்பட்டு, பொலிசாரின் கண்காணிப்பின்கீழ் சிகிச்சைபெற்று வருகின்றனர். தமது அன்றாடப் பயன்பாட்டுக்கும் சிறுபோகப் பயிர்ச்செய்கைக் காலமான இக்காலத்தில் தமது தொழில்சார் பயன்பாட்டுக்கும் எரிபொருளைப் பெறுவதற்காக நாள் முழுவதும் காத்திருந்த அப்பாவிப் பொதுமக்கள்மீது காரணமற்று இராணுவத்தினர் காட்டுமிராண்டித்தனமாகத் தாக்குதலை மேற்கொண்டுள் ளமை அப்பகுதி மக்களிடையே பாரிய அதிருப்தியையும் அதியுச்சக் கோபத்தையும் ஏற்படுத்தியுள்ளது.

இதன் தொடர்ச்சியாக, அதிகளவான பொதுமக்களின் பயன்பாட்டிலுள்ள பிரமந்தனாறு பிரதான வீதியில் மூன்று இடங்களிலும் விசுவமடுச் சந்தியிலும் சம்பவம் நடைபெற்ற இராணுவக் காவலரண் முகாமுக்கு அருகிலும் ஆயுதம் தரித்த இராணுவத்தினர் அதிகளவில் குவிக்கப்பட்டு, மக்களை அச்சுறுத்தும் பாங்கிலான கண்காணிப்பு நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு வருகின்றமை அந்தப் பகுதி மக்களின் இயல்பு வாழ்வைப் பாதிப்பதாக அமைந்துள்ளது. எனவே, சமூக வன்முறைக்கு வழிகோலும் வகையிலும் மனிதாபி மானமற்ற முறையிலும் இராணுவத்தினரால் மேற்கொள்ளப் பட்ட இத்தாக்குதல் சம்பவத்தில் பாதிக்கப்பட்டவர்களுக்கு உடனடியாக நீதியைப் பெற்றுக்கொடுப்பதற்கும் பொதுப் பயன்பாட்டு இடங்களில் இராணுவத் தலையீடுகளைத் தவிர்ப்பதற்கும் துரித நடவடிக்கை மேற்கொள்ள ஆவன செய்யுமாறு இந்த உயர்ந்த சபையினூடாக இந்த நாட்டின் சனாதிபதியையும் சம்பந்தப்பட்ட அமைச்சரையும் நான் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, தற்பொழுது Galle Faceஇல் ஒரு போராட்டம் நடைபெறுகின்றது. அதேபோல், தென்பகுதியிலும் சிங்கள இளைஞர்கள் போராட்டங்களை நடத்துகிறார்கள். அவர்கள் பொலிசாருடைய அரண்களைத் தள்ளியும் இராணுவத்தினரைத் தள்ளியும் தங்களுடைய

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

ஜனநாயக ரீதியான போராட்டங்களை முன்னெடுக்கிறார்கள். நாடு முழுவதும் எரிபொருளுக்காக மக்கள் தெருக்களிலே காத்திருக்கிறார்கள். நேற்றிரவு யாழ்ப்பாணத்திலிருந்து கொழும்புக்கு வரும்போது, நான் ஒரு விடயத்தை அவ தானித்தேன். அதாவது, திருவிழாபோல பெண்கள், ஆண்கள், சிறுவர்கள் என அதிகளவான மக்கள் எரிபொருளுக்காக வீதிகளில் காத்திருந்ததை அவதானித்தேன். அவர்கள் 3-4 நாட்களாக எரிபொருளுக்காகக் காத்திருக்கிறார்கள். இந்த நாடு எந்தத் திசை நோக்கிப் போய்க்கொண்டிருக்கின்றது என்பது யாருக்கும் தெரியாது.

அந்த மக்களைப் போன்று, விசுவமடுப் பிரதேசத்திலும் விவசாயிகள் கூட்டுறவுச் சங்கத்தினுடைய எரிபொருள் நிரப்பு நிலையத்தில் அவர்கள் எரிபொருளுக்காகக் காத்திருந்தார்கள். ஏதுமறியாத, மனநலம் குன்றிய, abnormalஆன அந்த இளைஞனை இராணுவம் கொண்டுசென்று தாக்கினால், அது பற்றி யாராவது கேட்பது நியாயம் தானே? அவ்வாறு கேட்க முடியாதா? கடந்த 18ஆம் திகதி இரவு 10.30 மணியளவில் நான் அந்த இடத்துக்குச் சென்றேன். அங்கு இராணுவத்தினர் பொல்லுகளைப் பின்னால் மறைத்து வைத்துக்கொண்டு நின்றார்கள். மண்வெட்டிப் பிடிபோன்ற பெரிய பொல்லு களோடு இராணுவத்தினர் குவிக்கப்பட்டிருந்தனர். அத்துடன், பொலிசாரும் குவிக்கப்பட்டிருந்தனர். கைதுசெய்யப்பட்ட இளைஞர்கள் இராணுவக் காவலரணுக்குள் மறைத்து வைக்கப்பட்டிருந்தார்கள். நான் அவர்கள் பற்றி பொலிசாரிடம் கேட்டபோது, "இராணுவத்தினர் அவர்களை எங்களிடம் ஒப்படைப்பார்கள். அதன் பின்னர் நாங்கள் அவர்களை நீதிமன்றத்தில் முன்னிலைப்படுத்துவோம்" என்றார்கள். ஆனால், இராணுவத்தினரால் தாக்கப்பட்டு, கைகள் முறிக்கப்பட்டு, உடல் ரீதியான காயங்கள் ஏற்படுத்தப்பட்ட பின்னர் அவர்கள் பொலிசாரிடம் அதற்கு அடுத்தநாள் ஒப்படைக்கப்பட்டார்கள். அதற்குப் பின்னர் அவர்கள் முல்லைத்தீவு - மாஞ்சோலை மற்றும் கிளிநொச்சி வைத்திய சாலைகளிலே கைகளுக்கு விலங்கிடப்பட்ட நிலையில் அனுமதிக்கப்பட்டிருக்கிறார்கள். எவ்வளவு கொடூரமான சம்பவம் இந்த நாட்டிலே நடைபெறுகிறது! இங்கே நீங்கள் எரிபொருள் பற்றிப் பேசுகிறீர்கள்.

எனக்கு முன்பு பேசிய கௌரவ அமைச்சர் மனுஷ நாணாயக்கார அவர்கள்கூட, "இந்த நாட்டிலே மக்கள் பொருட்களுக்காக வரிசையிலே நிற்கிறார்கள். அவர்களுக்கு ஆயிரம் பிரச்சினைகள் இருக்கின்றன. ஆட்சியை மாற்ற வில்லை; ஆனால், நாங்கள் பல நல்ல சந்தர்ப்பங்களைத் தவறவிட்டுவிட்டோம்" என்று சொன்னார். இன்னுமோர் இனத்தைச் சேர்ந்த இதே நாட்டுப் பிரஜைகள் சிங்கள இராணுவத்தினரால், சிங்களப் பொலிசாரால் காட்டு மிராண்டித்தனமாக, அகோரமாகத் தாக்கப்பட்டிருக்கிறார்கள். அங்கு சென்று பார்த்தபோது, அந்த விசுவமடுச் சந்தியானது போர் நடந்த ஒரு களமாகவே எனக்குத் தென்பட்டது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த நாடு யாருக்குரியது? இந்த நாட்டில் யார் சட்டத்தைக் கையிலே வைத்திருக்கிறார்கள்? யார் சட்டத்தின்படி நடக்கத் தயாராக இருக்கிறார்கள்? இந்த நாட்டிலே இருக்கின்ற நீதியும் நியாயமும் இதுதான் என்று உங்களால் குறிப்பிட்டுச் சொல்ல முடியுமா? சிங்கள மக்களுக்கு ஒரு விதமாகவும், தமிழ் மக்களுக்கு இன்னுமொரு விதமாகவும், முஸ்லிம்களுக்கு வேறொரு விதமாகவுமே இந்த நாட்டில் சட்டம் நடைமுறைப் படுத்தப்படுகிறது. சிங்கள இளைஞர்கள் போராடினால், நீங்கள் அவர்களை உங்களுடைய பிள்ளைகளாக அல்லது நாட்டின் பிரஜைகளாகப் பார்க்கின்றீர்கள். இங்கு முன்னாள் பிரதம அமைச்சர் மஹிந்த ராஜபக்ஷ அவர்கள்கூட இருக்கிறார். தயவுசெய்து, நீங்கள் இதனைச் செவிமடுங்கள்! நீங்கள் இந்த நாட்டிலே 30 ஆண்டுகள் நடத்திய யுத்தத்தால் ஓர் இனம் பாதிக்கப்பட்டது; அழிக்கப்பட்டது. அந்த யுத்தத்துக்காக ஆயுத தளபாடங்களைக் கொள்வனவு செய்வதற்கு நீங்கள் பட்ட கடன்கள் இன்றைக்கு இந்த நாட்டைப் படுகுழியிலே தள்ளியிருக்கிறது. இந்த நாட்டினுடைய யதார்த்த நிலை பற்றி நீங்கள் இன்னும் சிந்திக்கவில்லையா? இந்த நாட்டிலே யிருக்கின்ற களச்சூழலைப் புரிந்துகொள்ளவில்லையா? தெற்கிலே மக்கள் எரிவாயுவுக்காக வரிசையிலே நிற்கிறார்கள்; எரிபொருளுக்காக வரிசையிலே நிற்கிறார்கள்; உணவுக்காக வரிசையிலே நிற்கிறார்கள். ஆனால், வடக்கில் எரிபொருளுக் காக வரிசையில் நின்றவர்கள்மீது இராணுவம் அடாவடியாகத் தாக்குதல் நடத்தியிருக்கிறது. ஒரு திறந்தவெளிச் சிறைச்சாலை போன்று வடக்கு, கிழக்கிலே இராணுவத்தினர் குவிக்கப்பட்டு, அவர்களால் அங்குள்ள காணிகள் அபகரிக்கப்பட்டு, அவர்களுடைய கட்டுப்பாட்டுக்குள் தமிழ் மக்கள் அடக்கி வைக்கப்பட்டிருக்கிறார்கள் என்பதற்கு இது சிறியதோர் உதாரணமாகும்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, வலிகாமம் வடக்கிலே 70 சதவீதமான நிலம் இன்னும் இராணுவத்தினரின் வசம்தான் இருக்கிறது. இந்த நிலையில், நாட்டில் உற்பத்தி களை அதிகரிக்க வேண்டுமென்று நீங்கள் சொல்கி றார்கள். வெற்றிலை, மரக்கறி மற்றும் மரமுந்திரிகை போன்ற செய்கை களுக்குப் பெயர்போன வலிகாமம் வடக்குப் பிரதேசம் இன்னும் விடுவிக்கப்படாமல் இராணுவத்தினரின் கட்டுப் பாட்டுக்குள்ளேயே இருக்கின்றது. அங்கு இராணுவத் தினரால்தான் தோட்டங்கள் செய்யப்படுகின்றன. ஆனால், அவை பொதுமக்களுடைய காணிகளாகும். இன்று இந்த நாட்டில் பெரும் பெரும்பாலானோரால் என்ன சொல்லப் படுகிறது? தரிசு நிலங்களில் உற்பத்திகளை மேற்கொண்டு, நாட்டின் பொருளாதாரத்தை மேம்படுத்துங்கள் என்றல்லவா சொல்லப்படுகிறது. யதார்த்த நிலையைச் சரியான முறையில் உருவாக்காமல், மதவாத, இனவாதச் சிந்தனைகளோடும் ஓர் இனம்மீதான காழ்ப்புணர்ச்சியோடும் நீங்கள் நடந்து கொண்டிருக்கும் வரை, உங்களால் இந்த நாட்டிலே நீதியை நிலைநாட்ட முடியாதென்பதை நான் இந்த இடத்திலே பதிவுசெய்ய விரும்புகிறேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, விசுவமடு சம்பவத்தில் தாக்கப்பட்டவர்களுக்கு நீதி வேண்டும். புன்னைநீராவி RDSஇன் தலைவரான ஜெகதீஸ்வரனின் கையை இராணுவத்தினர் அடித்து முறித்திருக்கிறார்கள். இன்று அவர் PoP போடப்பட்ட நிலையில் கிளிநொச்சி வைத்தியசாலையிலே சிகிச்சைபெற்று வருகிறார். அதேபோல, இன்னுமோர் இளைஞனுடைய கையும் அடித்து முறிக்கப் பட்டிருக்கிறது. நேற்று நான் அவர்களை வைத்தியசாலைக்குச் சென்று பார்த்தேன். இந்த மண்ணிலே இராணுவ அராஜகம் - இராணுவத்தினுடைய கெடுபிடி - பாரியளவில் நடை பெறுகிறது. இந்த நாட்டைப் பற்றிச் சிந்திக்கின்ற அமெரிக்கா, இந்தியா மற்றும் ஐரோப்பிய நாடுகள் இராணுவத்தினரால் தமிழ் மக்கள்மீது மேற்கொள்ளப்படுகின்ற வன்முறைகளையும், அடாத்து நடவடிக்கைகளையும் கவனத்தில் எடுக்க வேண்டு மென நான் இந்தச் சபையினூ டாகக் கேட்டுக்கொள்ள விரும்புகிறேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கடந்த வாரம் நடைபெற்ற இன்னுமொரு முக்கிய விடயத்தையும் நான் இந்த

இடத்திலே குறிப்பிட வேண்டும். தமிழ் மக்கள் பரம்பரை பரம்பரையாக ஆதிசிவனை வழிபட்டு வந்த முல்லைத்தீவு மாவட்டத்தின் குருந்தூர்மலை எனும் இடத்திலுள்ள சைவ சமயத்தினரின் வணக்கஸ்தலம் அமைந்துள்ள இடத்திலே, ஏதுமறியாத அப்பாவிச் சிங்கள மக்கள் அழைத்துவரப்பட்டு நூற்றுக்கணக்கான இராணுவத்தினரதும் பொலிசாரினதும் கடற்படையினரதும் பாதுகாப்போடு புத்தபகவானுடைய சிலையை நிறுவ பௌத்த பிக்குகள் முற்பட்டார்கள். கருணை, காருண்யம், அன்பு, சகோதரத்துவம் பற்றிக் கற்பித்த புத்தபகவானை யுத்தத்தின் வடிவமாக, ஆக்கிரமிப்பின் வடிவமாக இன்னுமோர் இனத்தின் நிலங்களை ஆக்கிரமிக்கும் நோக்கத்தோடு அங்கு அவருடைய சிலையை நிறுவ முற்பட்ட பொழுது, முல்லைத்தீவு மாவட்டத்தைச் சேர்ந்த மற்றும் ஏனைய மாவட்டங்களிலிருந்து வருகைதந்த தமிழர்கள் அதற்கெதிராக ஒரு போராட்டத்தை நடாத்தி, அச்செயற் பாட்டைத் தடுத்திருக்கிறார்கள். இதுவொரு மோசமான காரியமாகத் தெரியவில்லையா? ஏற்கெனவே, நீதிமன்றத்தால் பிறப்பிக்கப்பட்ட தடை உத்தரவும் இருக்கிறது. அதாவது, அந்த இடத்தில் குறித்த இரண்டு மதத்தைச் சார்ந்தவர்களும் கட்டுமானப் பணிகள் எதனையும் செய்யக்கூடாது என்று முல்லைத்தீவு நீதிமன்றம் உத்தரவிட்டிருக்கிறது. அந்த நீதிமன்றத் தடை உத்தரவையும் மீறி, பௌத்த பிக்குகள் பொலிசாரின் உதவியோடு அங்கு புத்தபகவானுடைய சிலையை நிறுவ முடியுமா? அப்படியென்றால், நீதிமன்றம் யாருடைய பக்கம் இருக்கிறது? நீதிமன்றத்தினுடைய உத்தரவை மீறிச் செயற்பட யார் இவர்களுக்கு அனுமதி கொடுத்தார்கள்? உங்களுடைய ஆட்சிக்காலத்திலே சிலவேளை நீதிமன்றத் தீர்ப்புக்கள் செல்லாக்காசாக இருக்கலாம்! அதனால்தான் ஐந்தாண்டுகள் சிறைத் தண்டனை விதிக்கப்பட்ட ஒருவர் அமைச்சராக இருக்கிறார். அதேவேளை, அரசாங்கத்தை விமர்சித்தவர் சிறையிலே இருக்கிறார். அவ்வாறானதொரு களச்சூழலில் நீதிமன்றம் விதித்த தடை உத்தரைவை மீறி, அந்த மக்கள் வாழ்ந்த பிரதேசத்தில் புத்தபகவானுடைய சிலையை அரசாங்கம் நிறுவ முற்படுகின்ற தென்றால், இங்கு நீதிமன்றத்தின் உத்தரவு மதிக்கப் பட்டிருக்கிறதா?

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த நாட்டுக் கென ஒரு பாராளுமன்றம் அமைக்கப்பட்டு, அதில் சட்டங்கள் இயற்றப்பட்டு, அச்சட்டங்களின் அடிப்படையில் நீதி மன்றங்கள் கட்டளைகளைப் பிறப்பித்தால், அவற்றை நிறைவேற்ற முடியாத ஓர் அராஜக நாடாக இந்த நாடு தென்படவில்லையா? நீதிமன்றக் கட்டளையை பௌத்த பிக்குமார் மீற முடியுமா? முல்லைத்தீவு நீராவியடிப் பிள்ளையார் ஆலயத்திலுள்ள பிள்ளையாரை சைவ சமயத்தினர் காலங்காலமாக, வரலாற்று ரீதியாக, தொன்மமாக வழிபட்டு வந்த நிலையில், அவ்வாலய வளாகத்திலே வலுக்கட்டாயமாக புத்தர் சிலையை வைத்தார்கள். அந்த இடத்தை ஆக்கிரமித்த பௌத்த பிக்கு புற்றுநோயால் இறந்தபோது, நீதிமன்றக் கட்டளையையும் மீறி அவரின் உடலை அந்த இடத்திலேயே வெளிப்படையாக தகனஞ் செய்தார்கள். நீதிமன்றத்தை அவமதித்து அந்தச் செயற்பாட்டைச் செய்த பௌத்த பிக்குமாருக்கு இன்று நீதிமன்றம் என்ன தண்டனையை வழங்கியிருக்கிறது? அதேபோன்று, திருகோணமலையில் காணாமல் போன ஐந்து மாணவர்கள் தொடர்பில் இன்றுவரை நீதிமன்றத்தால் எதுவும் செய்ய முடியவில்லை. அந்தச் சம்பவம் தொடர்பில் சர்வதேசம் நியாயம் கேட்கிறது. அதேநேரம், இங்கு நீதிமன்றத் தடை உத்தரவை மீறிச் செயற்படுகிறார்கள். இது இந்த நாட்டுக்கு வெட்கமான விடயமாக இல்லையா? ஒவ்வொரு சிங்களப் பொதுமகனும் வெட்கப்பட வேண்டிய ஒரு விடயமாக இது இல்லையா? இது உங்களுக்கு கேவலமான ஒரு நடவடிக்கையாகத் தெரியவில்லையா? இது நீதிமன்றத்தை மதிக்காத ஒரு நாடென்றால், எப்படி நீங்கள் இந்த நாட்டிலே நீதியை நிலைநாட்ட முடியும்? எப்படி இனங்களுக்கிடையில் சகோதரத்துவத்தை உருவாக்குவீர்கள்? எப்படி நீங்கள் இந்த நாட்டிலுள்ள மற்றைய இனங்களுடன் சகிப்புத் தன்மையுடன் வாழமுடியும்? ஒவ்வொரு சிங்களத் தலைவனும் இதைப் பற்றிச் சிந்தித்துப் பாருங்கள்!

சற்று யோசித்துப் பாருங்கள்! மிருசுவில் படுகொலையுடன் சம்பந்தப்பட்டவருக்கு சனாதிபதி அவர்கள் பொது மன்னிப் பளித்திருக்கிறார். நீதிமன்ற உத்தரவை மீறி நீராவியடிப் பிள்ளையார் ஆலய வளாகத்தில் பௌத்த பிக்கு ஒருவரின் உடல் தகனம் செய்யப்பட்டிருக்கிறது. அதே பௌத்த பிக்கு எற்கெனவே குற்றவாளியாக்கப்பட்ட நிலையில், மைத்திரிபால சிறிசேன அவர்கள் சனாதிபதியாக இருந்தபொழுது அவருக்குப் பொதுமன்னிப்பளித்திருக்கிறார். ஆனால், தமிழ் அரசியல் கைதிகள் இன்றும் சிறையிலே வாடிக்கொண்டிருக் கிறார்கள். காணாமலாக்கப்பட்டவர்களுடைய அம்மாமார் தெருக்களிலே போராடிக்கொண்டிருக்கிறார்கள். நீங்கள் குருந்தூர் மலைப் பகுதியில் தமிழர்களுக்கு அநியாயம் செய்கின்றீர்கள். அந்த வகையில், இங்கு ஓர் இனம் திட்டமிட்டு மத ரீதியாக, இன ரீதியாக அழிக்கப்பட்டுக் கொண்டிருக்கிறது. நீங்கள் செய்த கர்ம வினைகள் உங்களை வாழவிடாதென்று நான் ஏற்கெனவே இந்தச் சபையிலே பதிவுசெய்திருந்தேன். கர்ம வினை பற்றி பௌத்த மதத்திலும் சொல்லப்பட்டிருக்கிறது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! ஒருவர் தான் செய்த பாவங்களுக்காக நரகத்திற்குச் சென்றால், அங்கு என்னென்ன தண்டனைகள் வழங்கப்படும் என்று பௌத்த மதம்தான் சொல்கிறது; நான் சொல்லவில்லை! அதாவது, கொதிக்கும் எண்ணெய்த் தாச்சியில் போடப்படுவார்; கழுமரத்திலே ஏற்றப்படுவார்; முள்மரத்திலே ஏற்றப்படுவார் என்று ஒவ்வொரு பாவத்துக்குமான தண்டனையை பௌத்த மதம் கூறுகிறது. அந்தத் தண்டனைகளைச் சித்தரிக்கும் வகையிலான படங்களை அநுராதபுரத்திலுள்ள விகாரை யொன்றில் வரைந்து வைத்திருக்கிறார்கள். இது தெரிந்துமா சிங்களத் தலைவர்கள் இவ்வாறான அநியாயங்களைச் செய்கிறார்கள்? இது தெரிந்துமா பௌத்த பிக்குமார் இவ்வாறான அநியாயங்களைச் செய்கிறார்கள்? சிந்தித்துப் பாருங்கள்! நீங்கள் செய்கின்றவற்றின் கர்ம வினைகள் இந்த நாட்டை நிம்மதியாக இருக்கவிடாது. அதனால், இந்த நாடு சீரடைய முடியாது. இப்பொழுதும் நீங்கள் சீரழிவின் பாதையிலே இருக்கிறீர்கள். இந்த நாட்டில் நீதியையும் நியாயத்தையும் நிலைநாட்ட நீதிமன்றங்களுடைய உத்தரவு களையாவது மதிக்க வேண்டுமென இந்தச் சபை கட்டளையிட வேண்டும் என்பதைத்தான் நான் இந்த இடத்திலே வலியுறுத்திக் கேட்கிறேன். அந்தவகையில், விசுவமடுவிலே இளைஞர்கள் உட்பட மக்களுக்கு நடந்த அநீதிக்கு நீதி வேண்டும். குருந்தூர் மலையிலே நடைபெறுகின்ற அநியாயங்கள் தொடர்பில் நீதி வேண்டும். அங்கு 400 ஏக்கர் நிலத்தைப் பறிப்பதற்குத் திட்டமிடுகிறார்கள். அந்தச் செயற்பாட்டை நிறுத்தி, அம்மக்களுக்கு நீதி கிடைக்க வழியேற்படுத்த வேண்டுமென மீண்டும் வலியுறுத்தி, எனது உரையை நிறைவுசெய்கிறேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Ports, Shipping and Aviation)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කම්කරු නීති අණ පනත් යටතේ ගොනු කරන ලද නඩු කඩිනමින් විසඳීම සඳහා සමගාමී අධිකරණ බලයක් මහෙස්ත්‍රාත් උසාවිවල සිට කම්කරු විනිශ්චය සභා සඳහා ලබා දීමට අද දින මෙම ගරු සභාවට ඉදිරිපත් කර ඇති-

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සරත් වීරසේකර මැතිතුමා.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමාගේ කියපු කාරණයට පිළිතුරක් දෙන්න.

අපේ මේ බෞද්ධ රටේ පැරණි චෛත්‍යයක් ප්‍රතිසංස්කරණය කරන්න අධිකරණ නියෝගයක් අවශ්‍ය නැහැ. ඒක තමයි, පළමුවැනි කරුණ. දෙවැනි කරුණ, ඒ අධිකරණ නියෝගයේ තිබෙන්නේ නව ඉදිකිරීම් කරන්න එපා කියා පමණයි. මෙතැනදී කරන්නේ ප්‍රතිසංස්කරණය කිරීමක්. ඒ වාගේම වසර 2,000ක් පැරණි චෛත්‍යයක නටබුන් මතු වෙද්දී, එතැනට ත්‍රිශූලයක් ගහලා එතැන කෝවිලක් තිබුණා කිව්වාට කවුරුවත් ඒක පිළිගන්නේ නැහැ. ඒ වාගේම මේ සාමකාමී ප්‍රදේශයේ -ඒ ගමේ- සිටි දෙමළ ජනතාව මේකට සහභාගි වෙලා නැහැ. ඔබතුමන්ලා යාපනය, මන්නාරම, කිලිනොච්චිය වැනි ප්‍රදේශවලින් මැරයෝ ගෙනැත් තමයි ඒක නැවැත්වූයේ. ඔබතුමන්ලා ලජ්ජා වෙන්න ඕනෑ, මහානායක හිමිවරු සහ අනුනායක හිමිවරු එතැනට ආවාම මලක්වත් පූජා කරන්න ඉඩ නොදීම ගැන. මොකද, මෙතෙක් අපේ ඒ අයිතිවාසිකම අපි රකින හින්දා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා, මොකක්ද රීති ප්‍රශ්නය?

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, முன்னாள் அமைச்சராகிய

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ஒரு பெரிய குண்டர்! பல தமிழ் இளைஞர்கள் கொல்லப்படுவ தற்குக் காரணமானவர்.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

மேற்பார்வையின்கீழ்தான் இந்த நாட்டில் மிகப்பெரிய அநியாயங்கள் நடைபெற்றன. அங்கே 'ஆதிசிவன்' என்கின்ற ஒரு சிவன் கோயில் இருந்தது. அதனை அழித்துவிட்டு புத்தவிகாரை கட்டுவதாகச் சொல்கின்ற குண்டர்களின் தலைவரே

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

அங்கு தமிழ்க் குண்டர்கள் யாரும் வரவில்லை. அங்கே தமிழ்ப் பாராளுமன்ற உறுப்பினர்களும் மக்களும்தான் இருந்தார்கள். இவ்வாறான அறிவிலிகள் -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

[අ.භා. 12.57]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ගරු සභාවට ඉදිරිපත් කර ඇති කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම ඉතාම සන්තෝෂ වෙනවා. මීට පෙර, මම කම්කරු අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ වකවානුවේ වසරක පමණ කාල සීමාවක් තුළ වෘත්තීය සමිති, නීතිඥවරු සහ අනෙකුත් කණ්ඩායම් සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා, විශේෂයෙන්ම කම්කරු ජනතාවගේ පැත්තෙන් ඔවුන්ගේ නඩුකර ඉතා ඉක්මනින් අවසන් කිරීම සඳහා සිදුවිය යුතු අත්‍යවශ්‍ය කාර්යයක් හැටියට හඳුනාගෙන තමයි මේ නීතිය සකස් කළේ. ඒ නීතිය සකස් කිරීමේදී අපි සැලකිල්ලට ගත්තා, කම්කරු නඩු 16,000ක් පමණ. ඒ කියන්නේ සාමාන්‍යයෙන් සේවය අවසන් කිරීමේ නඩු නොවෙයි. සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල්, ඒ වාගේම පාරිතෝෂික දීමනා වැනි කම්කරුවන්ට අය විය යුතු මුදල් සම්බන්ධයෙන් පනත් රාශියක් තිබෙනවා. ඒ පනත්වලට අදාළ මුදල් අය කර ගැනීමට කම්කරු නිලධාරින් අධිකරණයට ඇවිත් සහතිකයක් - certificate එකක් - file කරන්න ඕනෑ. ඒ මිස එතැන නඩු ඇසීමක් වෙන්නේ නැහැ. එම සහතිකය file කළාට පසු ඒ සහතිකය අභියෝගයට ලක් කරන්න - challenge කරන්න - පුළුවන්කමක් නැහැ. මෙතැන තිබෙන්නේ a process of recovery; ඒ කියන්නේ මෙතැන තිබෙන්නේ මුදල් අය කර ගැනීමේ ක්‍රමවේදයක් පමණයි. නමුත්, මෙවැනි නඩු 16,000ක් පමණ මහෙස්ත්‍රාත් අධිකරණවල ගොඩ ගැහිලා තිබෙනවා. මේ රටේ තිබෙන නීති පද්ධතිය තුළ, මහෙස්ත්‍රාත් අධිකරණවල වෙනත් විවිධ ආකාරයේ නඩු විශාල ප්‍රමාණයකුත් තිබෙන බව අපි දන්නවා. ඒ අතරට මේ නඩු 16,000ත් ගියාට පස්සේ, මේ නඩුවලට උසාවියෙන් ලැබෙන්නේ දීර්ඝ නඩු දිනයක්. පළමුවැනි නඩු දිනය අද කියලා ගත්තොත්, ඊළඟ නඩු දිනය ලැබෙන්නේ තව මාස හතරකින්, පහකින්. ඒ නිසා මම කල්පනා කළා, මේ පිළිබඳව අපට ගත හැකි ඉක්මන් ක්‍රියා මාර්ගයක් ගැන.

අපට මහෙස්ත්‍රාත්වරු ප්‍රමාණය වැඩි කරන්න බැහැ, දැන් තිබෙන මූල්‍යමය තත්ත්වය අනුව. අධිකරණ ශාලා ප්‍රමාණය තවත් වැඩි කරන්නත් බැහැ. මොකද, දැනටත් යම් ප්‍රමාණයක් වැඩි කරලා තිබෙන නිසා. විශේෂයෙන්ම කම්කරු විනිශ්චය සභා පිළිබඳව අපි කරන ලද සංගණනයේදී, අපි කරන ලද විශ්ලේෂණයේදී දැන ගත් කාරණයක් තමයි, කම්කරු විනිශ්චය සභා බොහොමයක් underutilized කියන එක. ඒ කියන්නේ සමහර කම්කරු විනිශ්චය සභා දවල් 11.30, 12.00 වෙනකොට එදිනට නියමිත නඩු ප්‍රමාණය අවසන් කරනවා.

සියලුම කම්කරු විනිශ්චය සභාවල තිබෙන්නේ සීමාසහිත නඩු ප්‍රමාණයක්. ඒ නිසා මීට පෙර අධිකරණ සේවා කොමිසම විසින් කම්කරු විනිශ්චය සභාවලට යම් ආකාරයක සමගාමී අධිකරණ බලයක් ලබා දීලා තිබුණා, circular එකක් මඟින්. නමුත්, අවුරුද්දක පමණ කාලයක් එය ක්‍රියාත්මක කළාට පස්සේ ඒ බලය ඉවත් කර ගත්තා. ඒ ඉවත් කර ගැනීම පිළිබඳව මා නම් සතුටට පත් වුණේ නැහැ. ඒ නිසා මා කල්පනා කළා, මේ නඩුකර ඇසීම සඳහා කම්කරු විනිශ්චය සභාවලට නීත්‍යානුකූලවම සමගාමී අධිකරණ බලයක් දිය යුතුයි කියලා. කම්කරු විනිශ්චය සභාවලට අපි සමගාමී අධිකරණ බලයක් දුන්නේ ඇයි? ලංකාවේ හැම තැනම මහෙස්ත්‍රාත් අධිකරණ තිබුණත්, කම්කරු විනිශ්චය සභා තිබුණේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ බලය තනිකරම කම්කරු විනිශ්චය සභාවලට දුන්නොත්, බොහෝ අයට -සේවායෝජකයන්, සේවකයන් ඇතුළු සියලුදෙනාට- අපහසුතා ඇති වනවා. ඒ නිසා අවශ්‍ය තැන්වලට යොදවන්න හැකි විධියට ඒ බලය එහෙමම මහෙස්ත්‍රාත් අධිකරණවල තබාගෙන, අනික් තැන්වලදී මේ කියන ආකාරයට කම්කරු විනිශ්චය සභාවලට ඒ බලය ලබා දෙන්න ඕනෑ. ඒ අධිකරණ බලය තිබෙන කාලයේදී කම්කරු විනිශ්චය සභාවල සභාපතිවරු විසින් ඉතා විශිෂ්ට වූ සේවයක් ඉටු කර මේ නඩුකර ඉක්මනින් අවසන් කිරීමේ වැඩ කටයුත්ත ඉෂ්ට කර තිබෙනවා කියන කාරණය මේ අවස්ථාවේදී මා ගෞරවයෙන් සිහිපත් කරනවා.

මෙවරත් මේ නීතිය ගෙනාවාම නොයෙකුත් බාධක ඇති වුණා. මේ සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිසම එක්ක අපට සාකච්ඡා කරන්න සිද්ධ වුණා. හිටපු අධිකරණ අමාත්‍ය අලි සබ්රි මැතිතුමාට මා විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, එතුමා පාලමක් හැටියට ඉදිමින් අධිකරණ සේවා කොමිෂන් සභාව සමඟත් මේ පිළිබඳව කරුණු හුවමාරු කරගෙන, මේ පනත් කෙටුම්පත තුළින් මේ ආකාරයෙන් සමගාමී අධිකරණ බලය ලබා දීමට කටයුතු කිරීම ගැන.

මේ රටේ තිබෙන දෙයක් තමයි, කෙනෙකුට තිබෙන බලය ටිකක් අයින් කරනවාට, අඩු කරනවාට, වෙනස් කරනවාට, තව කෙනෙකුට දෙනවාට කැමැත්තක් නොදැක්වීම. මේ නඩු ඉක්මනින් අවසන් කිරීම තමයි ජනතා අපේක්ෂාව; ජනතාවගේ වුවමනාව. ඒ නිසා ඒ පිළිබඳව නීතියක් ගෙනැවිත් ඒ අපේක්ෂාව ඉෂ්ට කිරීම තමයි ජනතා නියෝජිතයන් වශයෙන් අප විසින් කළ යුත්තේ. ජනතාව අප පාර්ලිමේන්තුවට පත් කර එවා තිබෙන්නේ, නීති පද්ධතියේ මෙවැනි අඩු පාඩු තිබෙනවා නම්, ඒ අඩු පාඩු ගැන සොයා බලා ඒ සඳහා ප්‍රායෝගික වූ ක්‍රියා මාර්ගයක් යෝජනා කිරීමටයි. ඒ නිසා මේ පනත් කෙටුම්පත තුළින් අපි ප්‍රායෝගික ක්‍රියා මාර්ගයක් යෝජනා කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක කාරණයක් පිළිබඳව මා කනගාටු වෙනවා. මම දැන් කියන්නේ, Workmen's Compensation Ordinance එක ගැන. අද කම්කරු වන්දි කොමසාරිස්වරියක් ඉන්නවා. ඒ කම්කරු වන්දි කොමසාරිස්වරිය typewriter එකක් තබාගෙන ලංකාව වටේම තිබෙන නඩු අහන්න යනවා. ඒ බලයත් කම්කරු විනිශ්චය සභාවලට දෙන්න තමයි මා ඉල්ලා සිටියේ. නමුත්, ශ්‍රේෂ්ඨාධිකරණයේදී යම් යම් ප්‍රශ්න මතු කරලා ඒ කාරණය ඉවත් කරන්න කියලා අපෙන් ඉල්ලා සිටියා. මේ පනත් කෙටුම්පත ප්‍රමාද කරන්න බැරි නිසා මා කිව්වා, ඒ ගැන අපි තර්ක - argue - කරන්නේ නැතිව, ඒ කාරණය අයින් කරලා හෝ මේ කටයුත්ත කරමු කියලා. පලංචියකින් වැටිලා කෙනෙකු මැරුණා නම්, ඒ වාගේම යන්ත්‍රයකට අහුවෙලා කෙනෙකුගේ අතක් කැපුණා නම්, එලෙස අසරණභාවයට පත්වන අය වෙනුවෙන් කම්කරු වන්දි ආඥා පනත යටතේත් යම් යම් නීති-රීති ගෙන එන්න නව කම්කරු ඇමතිවරයාට සිදු වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර අයගේ නඩුවලට අවුරුදු 4ක්, අවුරුදු 5ක් ගතවෙලා තිබෙනවා. මොකද, එක කම්කරු වන්දි කොමසාරිස්තුමියයි ඉන්නේ. ඒ නිසා මේ කටයුතු පුළුල් කරන ක්‍රියා මාර්ගයක් අරගෙන ජනතාවට ඉක්මනින් සහන සලසා දීලා, වැඩ කරන ජනතාවට යුක්තිය හා සාධාරණය ඉටු කිරීම සඳහා අපි කටයුතු කරන්න ඕනෑ.

අද නීතිඥයන් බොහෝදෙනෙක් කම්කරු විනිශ්චය සභා නඩුවලට පෙනී සිටිනවා. ඒ වාගේම නීතිඥයන් නොවන කම්කරු නියෝජිතයන්ට, වෘත්තීය සමිති නායකයන්ට පවා තමන්ගේ කම්කරුවා වෙනුවෙන් කම්කරු විනිශ්චය සභා ඉදිරියේ පෙනී සිටීමට අවසරය දෙන පනතක් මා කම්කරු ඇමතිවරයා වශයෙන් සිටි කාලයේදී සකස් කළා. ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක හිටපු ඇමතිතුමාගේ කාලයේ ඒ අයිතිය තිබුණා. මම නැවතත් එය ගෙන ඒමට කටයුතු කර තිබෙනවා. අපේ මනුෂ නානායක්කාර මැතිතුමා ඉදිරියේදී ඒ පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගනීවි.

Domestic inquiries ගත්තාම අපි දන්නවා, රජයේ යම් කෙනෙක් interdict කළා නම්, මාස හයක් ඇතුළත inquiry එකක් තියන්න ඕනෑ බව. නැත්නම් ඔහු reinstate කරන්න ඕනෑ. නමුත් මේ තත්ත්වය අපේ පෞද්ගලික අංශයේ නැහැ. මා කම්කරු අමාත්‍යාංශයෙන් එනකොට ඒ ප්‍රතිලාභයත් ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු සකස් කරලා ඉවර වෙලා තිබුණේ. කම්කරුවකුගේ සේවය අවසන් කිරීම පිළිබඳව කම්කරු විනිශ්චය සභාවෙන් හෝ කම්කරු නිලධාරියෙක් මේ පනත් යටතේ නියෝගයක් දුන්නාම, හාම්පුතුන් අභියාචනාධිකරණයෙන්, එහෙම නැත්නම් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් රිට් ආඥාවක් ලබා ගන්නවා. ඊට පස්සේ ඒ නඩුව deep freezer එකේ දැම්මා වාගේ තමයි. අවුරුදු 4ක්, 5ක් යනතුරු කම්කරුවාට සහනයක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මම විශේෂ විධිවිධාන පනතක් ගෙනාවා, එවැනි අභියාචනයක් කරනවා නම්, රිට් ආඥාවකට යනවා නම් අනිවාර්යයෙන්ම ඒ අවශ්‍ය මුදල උසාවියේ තැන්පත් කරලා තමයි රිට් ආඥාව සඳහා යන්න ඕනෑය කියලා. එතකොට මේ නඩු ප්‍රමාණය විශාල වශයෙන් අඩු වෙනවා. නඩු ප්‍රමාද කිරීම වළක්වනවා. ඒ නිසා ඒකත් කම්කරුවන්ට ඉතා හිතදායී, සුවදායී සුවිශේෂ වූ නීතියක්. මා විසින් කරන ලද ඒ කාර්යන් සියල්ලේ ඉතුරු වැඩ ටික අපේ නව කම්කරු අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් ඉදිරියට ගෙන යැමට කටයුතු කිරීම පිළිබඳව මා ස්තුතිවන්ත වෙනවා. කම්කරු නායකයන් විසින් මා සමඟ කරන ලද සාකච්ඡා පරිදි ඔවුන්ට ලබාදෙන ප්‍රතිලාභ යථාර්ථයක් බවට පත් කිරීමට අපට හැකිවීම ගැන මා සතුටු වෙනවා.

අද දවස ඉතා වැදගත් දවසක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඊයේ කැබිනට් මණ්ඩලයේදී විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, එනම් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කරලා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බලගන්වලා පාර්ලිමේන්තුවට වැඩි බලයක් ලබාදෙන, ඒ වාගේම ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තුවට එන්න බැරි වෙන ආකාරයට අගුළු දාපු ඒ සංශෝධනයට කැබිනට් මණ්ඩලය එකඟ වෙලා තිබෙනවා. ඒක මේ රටේ ජනතාවගේ සුවිශේෂී වූ ඉල්ලීමක්. අපි මේ රජයේ

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

ඇමතිකම් ගත්තේ මෙන්න මේ වාගේ ජනතාවට අවශ්‍ය වැඩ කටයුතු සඳහා සහයෝගය ලබා දෙන්නයි. මේ රටේ ජනතාව බලාගෙන හිටියා මේ සංශෝධනය කවදාද එන්නේ කියලා. දැනුවත්ව හෝ නොදැනුවත්ව සජබය - සමගි ජන බලවේගය- වැරදි පාරක ගියා. ඔවුන් කිව්වා, විධායක ජනාධිපති ධුරයම අහෝසි කරන්න ඕනෑ කියලා. ඒකට කැමති අයත් ඇති. අකමැති අයත් ඇති. ඒ ගැන අපට ප්‍රශ්නයක් නැහැ. නමුත් අද කථානායකතුමා කියවන ලද ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් තීරණයේ පැහැදිලිව කියා තිබෙනවා, ඒ කියන කාරණා සියල්ලටම ජනමත විචාරණයක් අවශ්‍යයි කියලා. මැතිවරණයක් තියාගන්න බැරුව ඉන්න මේ අවස්ථාවේදී පුළුවන්ද ජනමත විචාරණ තියන්න? ඒ නිසා සියලුදෙනාගේම සහයෝගයෙන් මේ පාර්ලිමේන්තුව වඩාත් ශක්තිමත් කිරීම සඳහා, අන්තර්ජාතික විශ්වාසය දිනා ගැනීම සඳහා, අන්තර්ජාතික සහයෝගය ලබා ගැනීම සඳහා මේ විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපට ඉතා අවශ්‍ය වෙනවා. සමහරු අහනවා, ව්‍යවස්ථාව කන්නද කියලා. කන්න නොවෙයි. අපට අවශ්‍ය ආධාර ටික ලබාගන්න, මේ රට වඩාත් ප්‍රජාතන්ත්‍රීකරණය කිරීම සඳහා වූ නියම මාවතට ඇතුළු වෙන්නට නම් මේ විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බෙහෙවින් ඉවහල් වෙනවා. ඒ නිසා කැබිනට් මණ්ඩලය ඊයේ ගන්නා ලද ඒ තීරණය මත මේ පාර්ලිමේන්තු සභා ගර්භය තුළ අපට අහිමි වී ගිය පාර්ලිමේන්තු බලයෙන් කොටසක් ඉදිරියේදී නැවත ලබා ගැනීමට අවස්ථාව සැලසෙනවා.

විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වශයෙන් අපි වැඩ කටයුතු රාශියකට දායකත්වයක් දුන්නා, මේ සංශෝධනය ගෙන ඒම සඳහා. සමහර අය කියනවා, පිටත ඉඳලා සහයෝගය දෙන්න ඕනෑ කියලා. පිටත ඉඳලා තල්ලුවක් දෙනවාට වඩා ඇතුළේ ඉඳගෙන තල්ලුවක් දුන්නාම තමයි, ශක්තිමත්ව මේ වැඩ කටයුතු කරගන්න පුළුවන් වෙන්නේ. ඒක නිකම් අර 'වැලමිටෙන් අල්ලනවා' වාගේ දෙයක්. එහෙම නොවෙයි විය යුත්තේ. අපි සද්භාවයෙන් මේ රජයට එකතු වුණේ ජාතික කර්තව්‍යයක් ඉටු කිරීම සඳහා මිස, පටු දේශපාලන වාසි තකා නොවෙයි. පටු දේශපාලන වාසි බලාගෙන විවිධ සිහින ලෝක තුළ ජීවත් වෙන්න නොවෙයි. මේ රටේ ජනතාවට යථාර්ථවාදීව සේවය කිරීම සඳහා අපේ නිපුණතා තුළින්, අපේ අත්දැකීම් තුළින් යම් ආකාරයකින් දායක වෙන්න ඕනෑ. මේ රට අරාජික තත්ත්වයට පත් වෙලා තිබෙන මේ අවස්ථාවේ ඒ අරාජිකත්වයෙන් ගොඩ ගැනීම සඳහා පටු දේශපාලන කරුණුවලින් ඉවත් වෙලා අපට යම් හයියක් දෙන්න පුළුවන් නම්, ඒක තමයි මේ වෙලාවේ අපි කළ යුත්තේ. ඒ බවත් ප්‍රකාශ කරමින් මට අවස්ථාව ලබාදීම පිළිබඳ ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා. *[සභා ගර්භය තුළ නැත.]*

ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා.

[ப.ப. 1.13]

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! இன்றைய விவாதத்தில் கலந்துகொண்டு சில முக்கிய விடயங்களைக் கூற விரும்புகிறேன். இலங்கையில் பாரிய பொருளாதார நெருக்கடி ஏற்பட்டு, மக்கள் உணவுப் பொருட்களுக்காகவும் எரி பொருளுக்காகவும் எரிவாயுவுக்காகவும் வீதிகளில் வரிசையில் நிற்கின்ற இந்த நேரத்தில், முல்லைத்தீவு மாவட்டத்திலுள்ள குருந்தூர் மலையில் புத்தர் சிலையை நிறுவுவதற்கு கல்கமுவே சந்தபோதி தேரர் அவர்கள் முற்படுகின்றார். அவருடன் சேர்ந்து இங்குள்ள சில அரசியல்வாதிகளும் செயற்பட்டுக் கொண்டிருக்கிறார்கள்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 1932ஆம் ஆண்டு குருந்தூர் மலைப் பகுதியின் 78 ஏக்கர் நிலப்பரப்பு தொல்லியல் இடமென தொல்பொருள் திணைக்களத்தால் Gazette பண்ணப் பட்டிருக்கிறது. அப்போது அதில் "பௌத்த விகாரை" என்று எந்தவிதத்திலும் குறிப்பிடப்பட்டிருக்கவில்லை. தமிழீழ விடுதலைப் புலிகளின் காலத்தில் அந்தப் பகுதி முற்றுமுழுதாக அவர்களின் கட்டுப்பாட்டுக்குள்ளேயே இருந்தது. எனினும், அவர்கள் எந்தவித சேதமும் விளைவிக்காமல் அத்தொல்லியல் இடத்தைப் பராமரித்து வந்தார்கள். 2019ஆம் ஆண்டு ஆட்சி மாற்றம் ஏற்பட்ட பிற்பாடு, 2020ஆம் ஆண்டு மிகக் கொடூரமான இன அழிப்புச் சிந்தனையின் வெளிப்பாடாக அந்த தொல்லியல் இடத்தை "குருந்தூர் தேவ விகாரை" எனக் குறிப்பிட்டு, தற்போது அங்கு புத்தபகவானுடைய சிலையை நிறுவுவதற்கு முயற்சி செய்துவருகிறார்கள்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நான் உட்பட 13 பாராளுமன்ற உறுப்பினர்கள் இந்த விடயம் தொடர்பாக சம்பந்தப்பட்ட அமைச்சர் கௌரவ விதுற விக்கிரமநாயக்க அவர்களைச் சந்தித்துக் கதைத்தோம். அதன்பிற்பாடு, நான் பல தடவை அவரைத் தனிப்பட்ட ரீதியிலும் சந்தித்துக் கதைத்திருக்கிறேன். அது தொல்லியல் சார்ந்த ஓர் இடம் எனவும் அதுதொடர்பான ஆய்வு நடவடிக்கைகள் இடம் பெறுவதாகவும் அவர் பாராளுமன்றத்தில் குறிப்பிட்டிருக் கிறார். தற்போது அங்கு என்ன நடக்கிறது? புத்த பகவானுடைய சிலையை வைப்பதற்கு முயற்சி செய்கிறார்கள். குருந்தூர் மலைப் பகுதியில் பௌத்தர்களோ, சிங்கள மக்களோ இல்லாத நிலையில், அங்கு புத்தபகவானுடைய சிலையை நிறுவமுற்படுவதன் நோக்கம் என்ன? அங்கு சிங்கள மக்கள் குடியிருந்திருக்கிறார்கள் என்று காண்பித்து, எதிர்காலத்தில் அங்கு சிங்களக் குடியேற்றங்களைச் செய்வதற்குத்தான் இந்த முயற்சி எடுக்கப்பட்டுக்கொண்டிருக்கிறது. குறித்த 78 ஏக்கருக்கு அப்பாலுள்ள காணிகளில் தண்ணிமுறிப்புக் கிராமத்தைச் சேர்ந்த மக்கள் விவசாயம் செய்து வருகின்றார்கள். அவர்கள் விவசாயம் செய்துவருகின்ற 360 ஏக்கர் காணியைத் தொல்லியல் திணைக்களத்திற்குச் சுவீகரிப்பதற்காக அத்திணைக்களத்தினுடைய பணிப்பாளர் நாயகம் பொதுநிர்வாக அமைச்சினுடைய செயலாளருக்குக் கடிதம் அனுப்பிருக்கிறார். அதனடிப்படையில், பொதுநிர்வாக அமைச்சினுடைய செயலாளர் அந்தக் காணியைச் சுவீகரிக்கும் படி முல்லைத்தீவு மாவட்டச் செயலாளருக்குக் கடிதம் அனுப்பியிருக்கிறார்.

1956-1957ஆம் ஆண்டு காலப்பகுதியில் அந்த மக்களுக்குப் பிரதேச செயலகத்தினால் annual permit வழங்கப் பட்டிருக்கிறது. தற்பொழுதுகூட, ஒருசிலர் அதனை வைத்திருக் கிறார்கள். அவர்கள் அந்தக் காணியில் விவசாயம் செய்கிறார்கள். விவசாயம் செய்யவேண்டும் என்று அரசாங்கம் கூறுகின்றது. அது சிங்கள மக்களுக்கு மட்டுமா? என நான் கேட்க விரும்புகின்றேன். கடந்த வருடம் எங்களுடைய மக்கள் விவசாயம் செய்துவந்த காணிகளில் விவசாயம் செய்யவிடாது தடுத்திருக்கிறார்கள். நான் அந்த இடத்திற்குப் பல தடவை சென்றிருக்கிறேன். குறிப்பாக, கல்கமுவே சந்தபோதி தேரருடைய முழுமையான தலையீடு காரணமாக தொல்லியல்

திணைக்களத்தின் பணிப்பாளர் நாயகம், சம்பந்தப்பட்ட விடயத்துக்குப் பொறுப்பான அமைச்சர் உட்பட சனாதிபதி செயலகத்தினுடைய செயலாளர்கள் அந்த இடத்தைக் கைப்பற்றும் நோக்கத்துடனேயே செயற்படுகிறார்கள்.

இலங்கையின் தற்போதைய பொருளாதார நெருக்கடியைத் தீர்ப்பதற்கு சர்வதேச நாணய நிதியம் கடன் வழங்க வேண்டும், உலக நாடுகள் கடன் வழங்க வேண்டும், இந்தியா உதவி செய்ய வேண்டும் என்று அரசாங்கம் பொதுமக்கள் ஊடாகக் கோரிக்கைகளை முன்வைத்து வருகின்றது. ஆனால், இலங்கையில் ஓர் இனம் மொழி சார்ந்து, மதம் சார்ந்து கண்முன்னே மிகக் கொடூரமாக அழிக்கப்பட்டுக் கொண்டிருக்கிறது. இது சர்வதேச நாடுகளுக்குத் தெரியாதா? எங்களுடைய இனம், கலாசாரம் என்பன அழிக்கப்பட்டுக் கொண்டிருக்கின்ற அதேவேளை, எங்களுடைய நிலங்களைப் பறிப்பதற்கான திட்டமிட்ட செயற்பாடுகளும் நடைபெற்றுக் கொண்டிருக்கின்றன என்பதை இந்தியா உட்பட இலங்கைக்கு உதவி செய்கின்ற அனைத்து நாடுகளுக்கும் நான் இச்சபை யினூடாகத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். தற்பொழுது, இலங்கை எதிர்நோக்கியுள்ள நெருக்கடியான சூழ்நிலையிலும், இப்படியான இன அழிப்பு நடவடிக்கையைச் செய்வதற்கு எப்படி மனம் வரும்?

நான் கடந்த பாராளுமன்ற அமர்வின்போது கௌரவ அமைச்சர் விதுர விக்கிரமநாயக்க அவர்களிடம் கூறியிருந் தேன், "நீங்கள் இவ்விடயம் தொடர்பில் யாரிடமும் கதைக்க வேண்டாம். முதலில் அங்குள்ள கல்கமுவே சந்தபோதி தேரர் அவர்களிடம் கதையுங்கள்" என்று. அது மக்களுடைய காணி; அவர்கள் விவசாயம் செய்த காணி! நான் அங்கு விவசாயம் செய்த மக்களை முல்லைத்தீவிலிருந்து அழைத்துவந்து, அமைச்சருடைய அலுவலகத்தில் அமைச்சரை நேரடியாகச் சந்திக்க வைத்தேன். அதன்போது அவர், தான் அங்குவந்து உரிய தீர்வைப் பெற்றுத் தருவதாகக் கூறினார். பின்பு அவர், எரிபொருள் தட்டுப்பாடு காரணமாகத் தன்னால் அங்கு வரமுடியாதென்று கூறியிருந்தார். எனவே, அங்கு விவசாயம் செய்த மக்களை விவசாயம் செய்ய விடுங்கள் என்றும் அங்கு பௌத்த மதத்தைத் திணிப்பதற்காகத் தொல்பொருள் திணைக்களத்தைப் பயன்படுத்தாது, தொல்பொருள் சார்ந்த விடயங்களுக்குப் பயன்படுத்துங்கள் என்றும் நான் முன்னாள் பிரதமர் ரட்ணசிறி விக்கிரமநாயக்க அவர்களுடைய மகனான கௌரவ விதுர விக்கிரமநாயக்க அவர்களை மிகவும் பணிவாகக் கேட்டுக்கொள்கிறேன்.

அதேநேரத்தில், "கோட்டா கோ கம" போராட்டக்காரர்கள் ஏன் குருந்தூர் மலையில் இடம்பெறுகின்ற இந்த மத ரீதியான, இன ரீதியான அழிப்பைக் கண்டுகொள்ளவில்லை? அவர்களுடைய போராட்டத்தின் நோக்கம் வெறுமனே எரிபொருள் பிரச்சினைக்கும் உணவுத் தட்டுப்பாட்டுக்கும் தீர்வு காண்பது மட்டுமா? என நான் கேட்க விரும்புகிறேன். "ஓர் இனத்தை அழித்துவிட்டோம்" என்ற வைராக்கியத்தில் விவசாய நிலங்களை உள்ளடக்கிய தமிழர்களுடைய பூர்வீகப் பிரதேசங்களில் ஒன்றான குருந்தூர் மலையில் புத்தபகவானின் சிலையைக் கொண்டுவந்து அடாவடியாக நிறுவ முற்படுகிறார்கள். இந்தச் செயற்பாட்டை நான் வன்மையாகக் கண்டிப்பதோடு, அச்செயற்பாட்டை நிறுத்துமாறு தயவுடன் கேட்டுக்கொள்கிறேன். அங்கு மக்களால் விவசாயம் செய்ய முடியவில்லை. அங்கிருக்கின்ற இராணுவம், வன இலாகா என அனைத்துக்கும் அந்த பௌத்த மதகுருதான் கட்டளை யிடுகிறார். அவருடைய கட்டுப்பாட்டின்கீழ்தான் அந்தப் பிரதேசத்தில் இருக்கின்ற அத்தனை அரச திணைக்களங்களும் இருக்கின்றன. நான் ஏற்கெனவே குறிப்பிட்ட 360 ஏக்கர் காணியைச் சுவீகரித்துத் தரும்படி அவர் சனாதிபதி செயலகத்துக்கு ஒரு கடிதம் எழுதியிருக்கிறார். அது மக்களு டைய காணி! தண்ணிமுறிப்புக் கிராமத்திலிருந்து மக்கள் இடம்பெயர்ந்த பின்னரும் அவர்களுடைய பெயர்கள் வாக்காளர் இடாப்பில் இருக்கின்றன. அவர்கள் மீளக்குடி யேறாவிட்டாலும், அங்கு விவசாயம் செய்து கொண்டிருக் கிறார்கள். இவ்வளவு நெருக்கடியான சூழ்நிலையிலும், அம்மக்களுடைய விவசாயக் காணிகளைப் பறிப்பதற்காக மிகவும் கீழ்த்தரமான செயற்பாட்டை இவர்கள் செய்து கொண்டிருக்கிறார்கள். சனாதிபதி அவர்களுக்கு எல்லா விடயங்களும் தெரியும்!

இலங்கையில் பௌத்த மதகுருமாரை எதிர்த்தால், அவர்களின் செயற்பாடுகளைக் கண்டித்தால் ஆட்சிக் கதிரையில் தொடர்ந்து இருக்க முடியாது என்ற ஓர் எழுதப்படாத சட்டம் இருக்கிறது. அந்த அடிப்படையில், ஆட்சியாளர்களுடைய முழுமையான ஆசீர்வாதத்தோடுதான் இந்தச் செயற்பாடு நடைபெற்றுக்கொண்டிருக்கிறது. இதற் கெல்லாம் அப்பால், தங்களைத் 'தமிழர்கள்' என்று சொல்லிக் கொள்பவர்கள் இந்தச் செயற்பாடுகளைப் பார்த்துக்கொண்டு அமைச்சர்களாக இருக்கின்ற அதேவேளை, அரசாங்கம் செய்கின்ற எல்லாச் செயற்பாடுகளையும் ஏற்றுக்கொள்கின்ற ஒரு கீழ்த்தரமான செயற்பாட்டைச் செய்து கொண்டிருக் கிறார்கள். அதனையிட்டு நாங்கள் வெட்கப்பட வேண்டியவர் களாக இருக்கிறோம். ஆகவே, சனாதிபதி அவர்களும் தொல்பொருள் விடயத்துடன் சம்பந்தப்பட்ட அமைச்சரும் இதில் உடனடியாகத் தலையிட்டு, இதற்குரிய தீர்வைப் பெற்றுக் கொடுக்க வேண்டும். மேலும், ஓர் இனத்தை அழிக்கின்ற, மொழியை அழிக்கின்ற, கலாசாரத்தை அழிக்கின்ற, மதத்தை அழிக்கின்ற இப்படியான இனரீதியான செயற்பாடுகளை இலங்கைக்கு உதவி செய்து கொண்டிருக்கின்ற, உதவி செய்யப்போகின்ற நாடுகளும் நிறுவனங்களும் கருத்திலேகொள்ள வேண்டும் என்பது என்னுடைய கருத்தாக இருக்கிறது. ஆகையால், இந்தச் செயற்பாட்டை உடனடியாக நிறுத்த வேண்டும்.

அடுத்து, இரண்டு தினங்களுக்கு முன்னர் முல்லைத்தீவு மாவட்டத்தின் விசுவமடுவிலுள்ள எரிபொருள் நிரப்பு நிலையத்தில் நடந்த இராணுவத்தினரின் அடாவடிகள் தொடர்பாகக் குறிப்பிட விரும்புகிறேன். இலங்கை இராணுவம் சிங்கள மக்களைப் பார்க்கின்ற விதம் வேறு, தமிழ் மக்களைப் பார்க்கின்ற விதம் வேறு என்பதற்கு மேற்குறித்த எரிபொருள் நிரப்பு நிலையத்தில் இடம்பெற்ற சம்பவம் ஓர் எடுத்துக் காட்டாக இருக்கிறது. பாராளுமன்றத்திற்கு முன்பாகவும், Galle Faceஇலும், தென்பகுதியின் பல இடங்களிலும் இளைஞர்கள் போராட்டங்களைச் செய்தார்கள். அதன்போது, அவர்கள் வீதித் தடைகளைத் தள்ளிக்கொண்டு சென்றார்கள். எனினும், இராணுவம் அவர்கள்மீது இப்படியான தாக்குதலை மேற்கொள்ளவில்லை. ஏனென்றால், அவர்கள் சிங்களவர்கள்! ஆனால், விசுவமடு எரிபொருள் நிரப்பு நிலையத்தில் மனநலம் குன்றிய ஒருவர்மீது இராணுவத்தினர் வன்மமாகத் தாக்குதலை மேற்கொண்டார்கள். இராணுவத்தினர் தமிழர்களை எப்படிப் பார்க்கிறார்கள் என்பதற்கு இது ஓர் எடுத்துக்காட்டாக இருக்கிறது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இராணுவம் பாதுகாப்பு அமைச்சுக்குக்கீழ் இருக்கிறது. பாதுகாப்பு அமைச்சு சனாதிபதி அவர்களுக்குக்கீழ் இருக்கிறது. ஏன், இந்த விடயம் தொடர்பாக சனாதிபதி அவர்களோ அல்லது அவருடைய ஊடகப் பிரிவோ எந்தவித கருத்தையும் முன்வைக்கவில்லை? காரணம், ஜனாதிபதி அவர்களுடைய

[ගරු චාල්ස් නිර්මලනාදන් මහතා]

முழுமையான சிந்தனையும் அப்படியாகத்தான் இருக்கிறது. 2009ஆம் ஆண்டுக்கு முன்னர் நடைபெற்ற யுத்தத்தின்போது, தமிழர்கள் இனரீதியாக மிகக் கொடூரமாக அழிக்கப் பட்டார்கள்.

அப்போது, அதிகளவான கடன்களைப் பெற்று இராணுவ அதிகாரிகளும் அவர்களுடைய குடும்பத்தினரும் சுகபோகங் களை அனுபவித்தார்கள். இன்று என்ன நடந்திருக்கிறது? அந்தக் கடன்சுமைகள்தான் இலங்கை மக்களை வீதிகளில் வரிசையில் நிற்க வைத்திருக்கிறது.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. නියමිත කාලය අවසානයි.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

இலங்கை அரசாங்கமானது, 2010ஆம் ஆண்டு முதல் 2022ஆம் ஆண்டுவரையான காலப்பகுதியில் பாதுகாப்பு அமைச்சுக்கு 3,790,800 மில்லியன் ரூபாயை வரவு செலவுத்திட்டத்தின்மூலம் ஒதுக்கியிருக்கிறது. இலங்கை ஒரு தீவாகும். அப்படியிருக்கும்போது, 2009ஆம் ஆண்டு யுத்தம் முடிவுக்குக் கொண்டுவரப்பட்ட பிற்பாடு, பாதுகாப்பு அமைச்சுக்கு ஒதுக்கப்பட்ட இவ்வளவு தொகைப் பணமும் எங்கே போனது? யார் அதை அனுபவித்தார்கள்? அதன் விளைவாகத்தான் இன்று மக்கள் வீதியில் வரிசையில் நிற்கிறார்கள். ஆட்சியாளர்கள் தாமாகவே உணர்ந்து தங்களைத் திருத்திக்கொள்ள வேண்டும். இல்லாவிட்டால், இலங்கை மக்கள் இதனைவிட மோசமான ஒரு நிலைக்குத் தள்ளப்படுவார்கள். ஒரு கிலோகிராம் அரிசிக்காக அடிப்பட்டு இறக்கக்கூடிய ஒரு சூழ்நிலை உருவாகும். இந்த ஆட்சியாளர் களுடைய நிருவாகமும் இன ரீதியான செயற்பாடுகளுமே இவ்வாறான சூழ்நிலைக்குக் காரணம் என்பதை நான் இங்கு பதிவுசெய்து, விடைபெறுகிறேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (ආචාර්ය) සරත් වීරසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.29]

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පෙර කථා කළ චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීවරයා කිව්වා, සිංහල ජනතාවට උතුරේ පදිංචි වෙන්න අයිතියක් නැහැ කියලා.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
මම එහෙම කිව්වේ නැහැ.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
ඇයි, තමුන්නාන්සේ කිව්වේ?

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
අසත්‍ය කියන්න එපා.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
"පදිංචි කරවනවා. ඒක වැරදියි" කියලා නේ, තමුන්නාන්සේ දැන් කිව්වේ.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
මම කිව්වේ,- *[බාධා කිරීමක්]* සිංහල ජනතාවට- *[බාධා කිරීමක්]* නැහැ කියලා. නිකම් අසත්‍ය කියන්න එපා.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
නැහැ. තමුන්නාන්සේ දැන් කිව්වා, "සිංහල ජනතාව පදිංචි කරවනවා. ඒක වැරදියි" කියලා. දෙමළ ජනතාවට මේ රටේ ඕනෑ තැනක පදිංචි වෙන්න පුළුවන් නම්, සිංහල ජනතාවටත් ඕනෑ තැනක පදිංචි වෙන්න පුළුවන්. ඒ නිසා ජාති භේදය, ජාතිවාදය ඇති කරන කථා කියන්න එපා. තමුන්නාන්සේ ඒක දැනගන්න. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව ඉවර වුණාට පස්සේ එතුමාට කථා කරන්න කියන්න. *[බාධා කිරීම්]*

ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ දැනගන්න, දෙමළ ජනතාව සියයට 52ක් ඉන්නේ සිංහල ජනතාව සමඟයි කියන එක. *[බාධා කිරීමක්]* දෙමළ ජනතාව සියයට 52ක් ඉන්නේ සිංහල ජනතාව සමඟයි. ඒ සමඟිය නැති කරන්න හදන්න එපා.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
ඔබතුමා එහෙම කියන්න එපා.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
මේ රටේ ඕනෑ තැනක පදිංචි වෙන්න දෙමළ ජනතාවට පුළුවන් නම්, සිංහල ජනතාවටත් ඕනෑ තැනක පදිංචි වෙන්න පුළුවන්. ඔබතුමා ඒක දැනගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත කැබිනට් මණ්ඩලයේදී අනුමත වුණා අපි දැක්කා. ඒ අය කියනවා, ඒ තුළින් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නැවත වතාවක් බලාත්මක කරනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ හිටියත් මම මේ කාරණය කියන්න ඕනෑ. ඔබතුමා දන්නවා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට මේ පාර්ලිමේන්තුවෙන් මම පමණයි විරුද්ධ වුණේ කියලා. එහෙම නම්, විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතෙන්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

නැවත ගෙනෙනවා නම්, ඒකටත් මුලින්ම විරුද්ධ වෙන්නේ මමයි කියන එක මේ අවස්ථාවේදී ඔබතුමාට කියන්න ඕනෑ. ජනාධිපතිවරයාගේ බලතල අගමැතිට දෙනවාට මම විරුද්ධයි. ඒ ඇයි? ජනාධිපති කියන්නේ, සමස්ත රටේම ජනතාව විසින් පත් කරගනු ලබන විධායක බලය හිමි තැනැත්තා. එතකොට ජනතාවගේ පරමාධිපත්‍ය බලය අනුව ලැබුණු බලතල ජනතාවගෙන් අහන්නේ නැතිව අගමැතිට ලබා දෙන්න ජනාධිපතිවරයාට බැහැ. ඒකට ජනමත විචාරණයක් අවශ්‍යමයි. ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒ සඳහා වෙනම පනත් කෙටුම්පතක් ගෙනැවිත් සම්මත කර ගන්න පුළුවන්. අපටත් ඒකට සහාය දෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් කාරණය මෙයයි. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වන තාක්කල් විධායක ජනාධිපති ක්‍රමය තිබෙන්න ඕනෑ. මීට සුළු වේලාවකට පෙර මේ ගරු සභාවේ මතු වූ කාරණා අපි දැක්කා. උතුර පළාත නියෝජනය කරන දේශපාලනඥයෝ සිංහල ජනතාව උතුරේ පදිංචි වෙනවාට විරුද්ධයි. එවැනි තත්ත්වයක් තිබියදී ජනාධිපතිවරයාගේ විධායක බලතල අඩු කළොත්, පළාත් සභා නවයේ ඉන්න ආණ්ඩුකාරවරුන්ගේ බලය හැල්ලු වෙනවා. එහෙම වුණොත් ඔවුන්ට පුළුවන් වෙනවා, ස්වාධීන පළාත් සභා නවයක් ඇති කරන්න. එතකොට රට ෆෙඩරල් වෙනවා. ඇත්ත වශයෙන්ම ඒ නිසායි මම විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට විරුද්ධ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී අපේ මුළු ශක්තියම යොදවන්න ඕනෑ රට වැටී තිබෙන ආර්ථික අර්බුදයෙන් ගොඩ ගන්නයි. ජනතාවට සෙත සලසන්න ඔවුන්ට සහන ලබා දෙන්නේ කොහොමද, ඔවුන්ට පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, ගෑස් ලබා දෙන්නේ කොහොමද කියන එක ගැන බලන්නයි අපේ කාලය මිඩංගු කරන්න ඕනෑ. එහෙම නැතිව, මේ ව්‍යවස්ථා සංශෝධනවලට නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනෙන්න ජනාධිපතිට ජන වරමක් නැහැ. ජනාධිපතිතුමාට ජන වරමක් - mandate එකක් - තිබෙන්නේ, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙන්න. එතුමා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීම සඳහා අපේ ව්‍යවස්ථාව පිළිබඳ හසළ දැනුමක් තිබෙන ජනාධිපති නීතිඥ මනෝහර ද සිල්වා මහත්මයා ඇතුළු කණ්ඩායමක් පත් කළා. ඔවුන් අවුරුදු දෙකක් ඒ පිළිබඳව අධ්‍යයනය කරලා, දැන් ඒ වාර්තාව සකස් කරලා අවසානයි. ඒ වාර්තාව මහා නායක හිමිවරුන්ටත් භාර දී තිබෙනවා. ජනාධිපතිතුමාටත් භාර දී තිබෙනවා. අපි ගෙනෙනවා නම් ගෙනෙන්න ඕනෑ, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මිසක්, ව්‍යවස්ථා සංශෝධනයක් නොවෙයි. මේ කඩිමුඩියේ ගෙනෙන ව්‍යවස්ථා සංශෝධන ඇත්ත වශයෙන්ම සාර්ථක නැහැ කියලායි අපි කියන්නේ. මොකද, ඒකෙන් අද තිබෙන ආර්ථික අර්බුදය විසඳන්න කිසිම දායකත්වයක් ලැබෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමාන ආර්ථික අර්බුදයට හේතුව මොකක්ද කියලා අපි දන්නවා. කොරෝනා වසංගතය ප්‍රධාන වශයෙන්ම එයට හේතු වුණා. කොරෝනා වසංගතය නිසා අපට විදේශ විනිමය අහිමි වුණා. මොකද, විදේශ සංචාරකයෝ මේ රටට ආවේ නැති නිසා. ඊළඟට, මැද පෙරදිග වැඩ කරපු බොහෝ අය -ලක්ෂ දහයක් පමණ- ලංකාවට ආපු නිසා විදේශීය ප්‍රේෂණ අපට නැති වුණා. ඊට අමතරව තවත් බොහෝ හේතු තිබුණා. එකක් තමයි, රසායනික පොහොර භාවිතය තහනම් කිරීම. දෙවැනි එක, විශාල වශයෙන් බදු අඩු කිරීම. ඊළඟට, ස්ථිර විනිමය අනුපාතයක් පවත්වා ගැනීම, මුදල් අච්චු ගැසීම සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර - ISBs - අසීමිතව ලබා ගැනීම වැනි කාරණාත් ඊට හේතු වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වන කොටත්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වන කොටත් යම් යම් ප්‍රමාණයෙන් සිද්ධ වුණා. එහෙම නම් අද අපට අවශ්‍ය වෙන්නේ, system change එකක් නොවෙයි. ඇත්ත වශයෙන්ම අද අපට අවශ්‍ය වන්නේ, බලය අනවශ්‍ය ලෙස භාවිත කිරීම පාලනය කිරීමයි. ඒක තමයි සකස් කරන නව ව්‍යවස්ථාවෙන් අපි කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද රට වැටී තිබෙන තත්ත්වයෙන් පාඩම් ඉගෙන ගෙන, අපේ අය වැය පරතරය යම්කිසි සීමාවක් තුළ තියා ගන්න අවශ්‍ය කාරණාත් නව ව්‍යවස්ථාවකින් ගෙනෙන්න ඕනෑ. ඒකත් ව්‍යවස්ථාවකින්, එහෙම නැත්නම් සමහර නීතිවලින් පාලනය කරන්න ඕනෑ. එතකොට අපට පුළුවන් වනවා, රටේ වැය බර අඩු කරගන්න. ඒ වාගේම ආනයන හා අපනයන පරතරය සීමා කරන්නත් පුළුවන් වෙන්න ඕනෑ. ඒ සඳහාත් නීති ගෙනෙන්න ඕනෑ. එතකොට මොන රජයක් ආවත්, මොන ආණ්ඩුවක් පිහිටෙව්වත් ඒ නීතිවලින් බැහැරව යන්න බැහැ.

ඒ වාගේම මුදල් ණයට ගැනීමේදී දළ දේශීය නිෂ්පාදනයෙන් යම්කිසි ප්‍රතිශතයක් ඉක්මවා නොයන විධියට ණය ගැනීමට අවශ්‍ය නීති අපි ව්‍යවස්ථාවට ඇතුළු කරන්න ඕනෑ. ඒ වාගේම පාර්ලිමේන්තුවේ අනුමැතියකින් තොරව වෙනත් රජයන් සමඟ, වෙනත් සමාගම් සමඟ ගිවිසුම් සහ එකඟතාවලට අත්සන් නොකිරීමටත් ඉඩ නොදිය යුතුයි. පාර්ලිමේන්තුවේ එකඟතාවක් නැතිව එලෙස අත්සන් කිරීමට තිබෙන බලය ඇත්ත වශයෙන්ම නැති කරන්න ඕනෑ.

ඊළඟට, නිල නොවන, unsolicited කිසිම යෝජනාවක් පාර්ලිමේන්තුවේ අනුමැතියකින් තොරව සලකා බැලිය නොහැකි බවට ව්‍යවස්ථාවේ නීති තිබෙන්න ඕනෑ. තවද, කිසිම ජාතික සම්පතක් අත්සතු කළ නොහැකි ලෙස නීති සකස් වෙන්න ඕනෑ. මේවා තමයි ඇත්ත වශයෙන්ම අලුත් ව්‍යවස්ථාවක තිබෙන්න ඕනෑ නීති. මම හිතන හැටියට මේ සියල්ල අලුතින් ගෙනෙන්න යන ව්‍යවස්ථාවේ අඩංගුයි. නමුත්, විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතේ මේ කිසිවක් නැහැ. එහි තිබෙන්නේ, ජනාධිපතිගේ විධායක බලය අගමැතිට පැවරීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිළිබඳවයි. ඒ පිළිබඳවත් අපට කියන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිවරයා සතු විධායක බලය අවභාවිත - misuse - කරනවාද කියන එක බලන්න තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තිබෙන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ඉන්නවා, සාමාජිකයෝ දහදෙනෙක්. ප්‍රධානියා තමයි, ගරු කථානායකතුමා. එතුමාට ඡන්දයක් නැහැ. ඉතිරි නව දෙනා අතර, අගමැතිතුමා සහ විපක්ෂ නායකතුමා ඉන්නවා. ඒ දෙදෙනා පත් කරනවා සාමාජිකයන් පස්දෙනෙක්. ජනාධිපතිවරයා පත් කරනවා එක් සාමාජිකයෙක්. අනෙකුත් සුළු පක්ෂ නියෝජනය කරමින් එක් සාමාජිකයකු පත් වනවා. එහෙම නම් එතැන බහුතරය, එහෙම නැත්නම් ඡන්ද හතක්ම තිබෙන්නේ විපක්ෂ නායකයි, අගමැතියි අතරේ. දැන් විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ජනාධිපතිගේ බලය අපි දෙන්න යන්නේ කාටද? විපක්ෂ නායකටයි, අගමැතිටයි. විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන්ම අනුමත වුණොත් ජනාධිපතිවරයාගේ විධායක බලය දෙන්නේ සජිත් ප්‍රේමදාසටයි, රනිල් වික්‍රමසිංහටයි. අන්න ඒ නිසා තමයි ඇත්ත වශයෙන්ම විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට අපි විරුද්ධ වෙන්නේ.

[ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා]

දැන් අපට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි ඉන්ධන සහ ගෑස් ප්‍රශ්නය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාරේ යන කොට අපි දකිනවා, පෝලිම්. ඒවා දකිනකොට අපට ගොඩක් දුක හිතෙනවා. ඒ වාගේම අපට භය හිතෙනවා, මේ පීඩනය මොන වෙලාවේ පුපුරා යයි ද කියලා. ජනතාව ගෑස් නැතිව, ඉන්ධන නැතිව දවස් ගණනක් පෝලිමේ ඉන්නවා. ඒ දුකෙන් ඉන්න, අසහනයෙන් ඉන්න ජනතාව කුපිත කරන්නත්, වෛරය පතුරුවන්නත්, ක්‍රෝධය පතුරවන්නත්, සියලු කටයුතු කඩාකප්පල් කරන්නත් ගරු මනුෂ නානායක්කාර ඇමතිතුමා කිව්වා වාගේ, විවිධ කණ්ඩායම් උත්සාහ දරනවා.

දැන් වගා සංග්‍රාමයක් තිබෙනවා. වගා සංග්‍රාමයක් කරන එක හොඳයි. නමුත් එහි ප්‍රතිඵලයක් නැහැ, ඉන් ලැබෙන අස්වැන්න පාරිභෝගිකයා වෙත ප්‍රවාහනය කරන්න ඉන්ධන නැත්නම්. මාස තුනකට ඉස්සෙල්ලා මමත් කැබිනට් මණ්ඩලයට යෝජනා කළා, 'අපි රුසියාවෙන් ඉන්ධන ගන්න ඕනෑ' කියලා. මොකද, යුක්රේනය සහ රුසියාව අතර පවතින යුද්ධය නිසා යුරෝපීය රටවල් දැන් රුසියාවෙන් ඉන්ධන ආනයනය සම්බන්ධයෙන් තහනම් පනවා තිබෙනවා. එම නිසා ඒ රටෙන් අපට ලාභයට ඉන්ධන ලබා ගන්න පුළුවන්. Quadrilateral Security Dialogue - QSD - හෙවත් Quad කියන සංවිධානයේ සිටියදී ඇමෙරිකාවේ විරෝධය නොතකා රුසියාවෙන් ඉන්ධන මිල දී ගන්න ඉන්දියාවට පුළුවන් නම්, අපට රුසියාවෙන් ඉන්ධන ගන්න බැරි ඇයි කියාත් අපි ඇහුවා. නමුත් දැන් අපේ ගරු කංචන විජේසේකර ඇමතිතුමා ඉතාම හොඳින් විදුලිබල හා බලශක්ති විෂයය හසුරුවන බව අපි දන්නවා. එතුමා දැන් රුසියාවේ තෙල් සමාගම් සමඟ සාකච්ඡා කරනවා. අප දැන් බලන්න ඕනෑ ඩොලර් නොගෙවා ඉන්ධන ගන්නේ කොහොමද කියලායි. අපි දන්නවා ඉන්දියාව කරන දේ. ඉන්දියාව රුසියාවෙන් ඉන්ධන මිල දී ගන්නවා. ඉන්දියාවේ ආනයනකරුවන් ඉන්දියාවේ තිබෙන රුසියානු බැංකුවලට තමයි ඉන්දීය රුපියල් ගෙවන්නේ. එතකොට ඉන්දියාවේ තිබෙන රුසියානු බැංකු මොනවාද කරන්නේ? රුසියාවේ ඉන්න අපනයනකරුවන්ට ඒ රටින් රූබල් දෙනවා. ඒ වාගේ තත්ත්වයක් අපටත් ඇති කරගන්න පුළුවන් නම් හොඳයි. අපිත් තේ අපනයනය කරනවා; කුළු බඩු අපනයනය කරනවා. මේ ඩොලර් අර්බුදය හමුවේ අන්න ඒ වාගේ system එකක් අපටත් හදාගන්න පුළුවන් නම්, ඩොලර් නැතත් ඉන්ධන සහ ගෑස් වාගේම පොහොර ආදි දේවල් වුණත් ලංකාවේ රුපියල්වලින් මිල දී ගැනීමේ පහසුකම ඇති කරගන්න අපටත් පුළුවන් වනවා. ඒ සම්බන්ධයෙන් රුසියාවේ සමාගම් සමඟ, වෙළෙඳ හා මූල්‍ය විශේෂඥයන් - trade and finance experts - සමඟ සාකච්ඡා කර ඒ කටයුත්ත ඉතා හොඳින් කරන්න අපට පුළුවන් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා-චීන රබර්-සහල් ගිවිසුම ගැන අපි දන්නවා. Rubber-Rice Pact එකට ඒ දවස්වල බටහිර රටවල් මොන තරම් නම් විරුද්ධ වුණාද? එදා ලංකාවේ හිටපු දේශපාලන නායකයෝ එම රටවලට කිව්වා, "එහෙම නම් අපට හාල් ගේන්න තමුන්නාන්සේලා සල්ලි දෙන්න. සල්ලි දෙන්න බැරි නම් අපි මේ රබර්-සහල් ගිවිසුම - Rubber-Rice Pact එක- අත්සන් කරනවා" කියලා. ඒ වාගේම, අප රුසියාවෙන් ඉන්ධන ගන්න එකට ඇමෙරිකාව ඇතුළු බටහිර රටවල් කැමැති නැත්නම් අපි ඇමෙරිකාව ඇතුළු බටහිර රටවලට කියන්න ඕනෑ, "ඒ බඩු ගේන්න අපට ඩොලර් දෙන්න. ඩොලර් දෙන්න බැරි නම් අපේ වැඩ අපි කරනවා" කියලා. මොකද, අපේ විදේශ ප්‍රතිපත්තිය neutral. ඒ නිසා අපි ඒකෙන් සම්පූර්ණයෙන් ප්‍රයෝජන ගන්න ඕනෑ.

අපි IMF එකෙන් ණය ගන්න යනවා. නමුත් එහිදී අපි ඇත්ත වශයෙන්ම පරිස්සම් වෙන්න ඕනෑ. මොකද, ස්වාභාවික සම්පත්වලින් පිරි, සාක්ෂරතාවෙන් ඉහළ හයිටි රාජ්‍යය අද වන කොට දේශපාලන වශයෙන් අස්ථාවර වෙලා, ඒ රට කිසි දෙයක් නැතිව අරාජික වෙලා තිබෙන බව අපි දන්නවා. ඒ වාගේම තමයි, ආර්ජන්ටිනාව කියන රටත්. අද ඒ රට IMF එකට විරුද්ධව නඩු දමන්න ජාත්‍යන්තර අපරාධ අධිකරණයට - International Criminal Court එකට - ගිහින් තිබෙනවා. මොකද, IMF එකේ කොන්දේසි මත කටයුතු කරලා අද ආර්ජන්ටිනාවේ සියලු ආයතන පෞද්ගලීකරණය වෙලා තිබෙනවා; බැංකු පවා පෞද්ගලීකරණය වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

1973 සිට 1993 දක්වා වූ වසර 20ක කාලය තුළ IMF එක ණය දීලා පොලිය සමඟ අරගෙන තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් ට්‍රිලියන 1.5ක් - US Dollars 1.5 trillion. නමුත් ඇත්ත වශයෙන් ඔවුන් ණය වශයෙන් දී තිබෙන්නේ ඩොලර් බිලියන 400ක් පමණයි. එහෙම නම් ඉතිරි සියල්ල, එනම් US Dollars1.1 trillion ඔවුන්ගේ පොලිය. එහෙම නම්, බටහිර රටවල් අද සුඛිත මුදිත ජීවිත ගත කරන්නේ දුප්පත් ජනතාවගේ මුදල්වලින් කියන එකත් අපි දැනගන්න ඕනෑ. පෞද්ගලීකරණය සම්බන්ධයෙන් කොන්දේසි ඉදිරිපත් කර තිබෙනවා නම් රජය සියයට 55කට වඩා අයිතිය තියාගෙන, අවුරුදු 10කට පසු අදාළ ආයතනය ලාභ ලැබීමෙන් අනතුරුව නැවත වරක් රජයට පවරා ගන්නා පදනම මත එය කරන්න කියා අප ඉල්ලා සිටිනවා. IMF එක අපට කොන්දේසි පනවනවා නම් අප ඒවා හොඳින් අධ්‍යයනය කරලා, රටට පාඩුවක් නොවෙන්න, අපේ බාල පරම්පරාවට -මතු පරම්පරාවට- අපේ රටේ සම්පත් අහිමි නොවෙන්න පරිස්සමෙන් කටයුතු කරන්න ඕනෑ කියන එකත් මම මේ අවස්ථාවේදී කියා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.42]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

මේ වෙලාවේ සාකච්ඡා කරන ඉතා වැදගත් පනත් කෙටුම්පත ගැන යමක් කියන්න පෙර මා කාරණයක් කිව යුතුයි. මගේ සහෝදර මන්ත්‍රී ගරු ගෙවිඳු කුමාරතුංග මැතිතුමා යම් කාරණයක් ගැන වචන කීපයක් කියන්න සුළු වේලාවක් ඉල්ලා සිටියා. නමුත් ඒකට අවස්ථාව ලැබුණේ නැහැ.

ඒ නිසා එතුමා වෙනුවෙන් මා මේ කාරණය කිව යුතුයි. ඉංජිනේරුවන් හෝ වෙනත් පුද්ගලයෙකු හෝ ගරු කංචන විජේසේකර ඇමතිතුමාට වැරදි වාර්තාවක් දුන්නා නම්, ඒ ගැන සෝදිසි කරලා විමසුමක්, විපරමක් කරන්න ඕනෑ කියන එකයි ගරු ගෙවිඳු කුමාරතුංග මැතිතුමා කියන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක ඔබතුමාට මතක් කරන්න කියලා එතුමා මට කිව්වා.

පළමුව, මෙතැනදී කථා වුණු දේවල් ගැන වචන කීපයක් කියන්න මා කැමැතියි. කැබිනට් මණ්ඩලය මේ අර්බුදකාරී තත්ත්වය පාලනය කරන්න පියවර ගන්නවා කියා ගරු මනුෂ නානායක්කාර මැතිතුමා කිව්වා. නමුත් පියවර ගන්න ගන්න තත්ත්වය වඩා නරකයි. ඉතින්, මේකට හේතුව මොකක්ද? පියවර ගත්තා ද? එහෙම නැතනම් ඒ පියවරවල ප්‍රතිඵල නැද්ද? පියවරවල ප්‍රතිඵල නැත්තේ ඇයි ද? මේවා ගැන මොකවත් අපි දන්නේ නැහැ. ඊළඟට, එතුමා  කියනවා, "දැන් මේ තත්ත්වය යථා තත්ත්වයට පත් වේගෙන එනවා" කියලා. රට යථා තත්ත්වයට පත් වේගෙන එන බව එතුමා කියන්නේ, ඔළුවෙන් හිටගෙන බලා ද කියා මම අහන්න කැමැතියි. ආයතන දැන් යථා තත්ත්වයට පත් වේගෙන එනවා ලු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ආයතනවල සේවය කරන්න මිනිස්සු එන්නේ නැහැ. වැඩ කරන්නේ සතියට දවස් 4යි. එක්කෝ, ගෙදර ඉඳගෙන online තමයි වැඩ කරන්නේ. මේ විධියේ තත්ත්වයක් තමයි ආයතනවල තිබෙන්නේ. ඒ නිසා යථා තත්ත්වය ගැන කථා කිරීම විහිළුවක්.

මනුෂ නානායක්කාර ඇමතිතුමා කිව්වා, "කන්න නැතිව ඉන්න ගණන අපි දන්නේ නැහැ" කියලා. ඒ වාගේම එතුමා කිව්වා, "ඖෂධ නැතිව මැරෙන සංඛ්‍යාව දන්නේත් නැහැ" කියලා. ඉතින් ඒ සංඛ්‍යාව ගැනවත් තවම දන්නේ නැත්නම් මොන යථා තත්ත්වයක්ද? මැරෙන සංඛ්‍යාවවත් අඩු ගණනේ දැන ගත්තොත්, කළ යුත්තේ කුමක්ද, කොපමණකින්ද කියලා කියාගන්න පුළුවන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන කියමින් ජනාධිපතිවරයාගේ බලය ගැන ගරු සරත් වීරසේකර මන්ත්‍රීතුමා කිව්වා, ජනාධිපතිට බලතල තිබෙන්න ඕනෑ, අගමැතිට, විපක්ෂයට විතරක් බලතල තිබෙන්න ඕනෑ නැහැ කියලා. මේවා දෙස බලන්න නරකයි, දැනට ඉන්න පුද්ගලයන් ඇසුරින්. අපි මේවා බලන්න ඕනෑ, න්‍යායිකවයි. න්‍යායිකව බැලුවොත්, අප කියන්නේ තනි පුද්ගලයෙකුට මුළු රටින්ම ලබා ගන්නා ඡන්ද අනුව බලතල දෙනවාට වඩා මෙතැන ඉන්න 225දෙනාට බලතල දුන්නාම හරි කියන එකයි. අගමැතිවරයා ක්‍රියා කරන්නේ මෙතැන ඉන්න වැඩි දෙනාගේ කැමැත්තට අනුව නොවෙයි නම්, එතුමාගේ බලය නැති වෙනවා. අපි දැනට කරන්න හදන්නේ ජනාධිපතිවරයාගේ අසීමිත බලතල අඩු කරන්නයි; absolute power නැති කරන්නයි; මේ පාර්ලිමේන්තුව ප්‍රධාන බල කේන්ද්‍රය බවට පත් කරන්නයි. මේ වෙනුවෙන් ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා විශාල මෙහෙවරක් කරමින් අදාළ පනත් කෙටුම්පත ගෙන එමින් තිබෙනවා. ඒ ගැන එතුමාට අපේ ස්තුතිය පළ කළ යුතුයි. ජනාධිපතිතුමාගේ බලය හරියාකාරව ඉතිරි වෙන්නත් ඉඩ ඇරලා කටයුතු කරන්න ඕනෑ. මොකද, කලින් කිව්වා වාගේ ඒක වෙනස් කරන්නත් බැහැ, ජනමත විචාරණයකට යන්නේ නැතිව. ඒ නිසා කරන්න පුළුවන් ගණනට ඒවා කරලා සමබර කර තබා පාර්ලිමේන්තුවට වැඩි බලයක් ලබා දෙන්න, මහජන නියෝජිතයන්ගේ බලය වැඩි කරන්න කටයුතු කර තිබෙනවා.

මම තවත් කාරණයක් කිව යුතුයි. "Global Integrity Report" කියලා එකක් තිබෙනවා. ඒ "Global Integrity Report" එකේ කියනවා, 2009 ඉඳන් 2016 දක්වා ලංකාවෙන් අයථා පරිදි ඩොලර් බිලියන 45ක් පිට වෙලා තිබෙනවා කියලා. ඉතින් අයථා පරිදි පිට වන විශාල මුදල් සම්භාරය රටේ ඉතිරි කර ගත්තොත්, අපට ඩොලර් ප්‍රශ්නයක් එන්නේ නැහැ. මේ ඩොලර් ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ ඇයි? ජාවාරම්කාරයන්ට ඕනෑ හැටියට මේ රටේ තමන්ගේ කටයුතු කරගන්නට ඉඩ දීලා ආණ්ඩුවේ අය ඒවායේ පංගුකාරයන් වෙලා තිබීම නිසා තමයි ඒ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. ආණ්ඩුවේ අය ඒවායේ පංගු බෙදාගෙන තිබෙනවා. ඒ නිසායි මෙහෙම වෙලා තිබෙන්නේ. අපට ඕනෑ අවංකව සේවය කරන විධායකයක්; ඒ විධායකයේ අවංකභාවය ප්‍රශ්නයට ලක් වනවා නම් එය පරීක්ෂණයට ලක් කරන ක්‍රමවේදයක්. අපි දන්නවා, COPE එකට, COPA එකට අද තිබෙන බලය ගැන. ඒවා මීට වඩා -අදාළ ආයතන පිළිබඳව වගකිව යුතු ඇමතිවරුන් සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ සිදු කිරීම දක්වා- බලවත් කරන්න ඕනෑ.

අප ඉදිරි කාලයේදී එවැනි බලතල COPE එකට, COPA එකට ලබා දීමට ක්‍රියා කළ යුතුයි.

ඊළඟට මම කථා කරන්නම්, අද ඉදිරිපත් කර තිබෙන්නා වූ කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ගැන. ඒ තුළින් කරන්න යන්නේ මොකක්ද? කම්කරු විනිශ්චය සභාවල නඩු තීන්දු 16,000ක් විතර තවමත් ක්‍රියාත්මක නොවී තිබෙනවා. හේතුව, ඒවා ක්‍රියාත්මක කරන්නේ මහේස්ත්‍රාත් උසාවියෙන්. මහේස්ත්‍රාත් උසාවිවල නඩු වැඩියි. ඒ නිසා මේ නඩු යට යමින්, යට යමින් තිබෙනවා. ඒ නිසා අපේ කම්කරු විනිශ්චය සභාවේම විනිශ්චයකාරවරුන්ට ඒවා ක්‍රියාත්මක කිරීමට අතිරේක මහේස්ත්‍රාත් බලයක් දෙන එක තමයි මේ කරන්න යන්නේ. ඊට අදාළ වූ නීති-රීති, එයට අදාළ වන විවිධ අණ පනත් ගැන මෙහි උපලේඛනවල තිබෙනවා. මේක ඉතාම වැදගත් පනතක්. සේවකයන්ට යහපතක් වන මෙබඳු පනත් ගණනාවක් ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා කම්කරු අමාත්‍යවරයා විධියට සිටි කාල සීමාවේදී ගෙනාවා. එතුමා ඒ සම්බන්ධයෙන් බොහෝ මහන්සි වී කටයුතු කළා. මම ඒ ගැන දන්නවා. එතුමා කැබිනට් මණ්ඩලයට විවිධ අණ පනත් ඉදිරිපත් කරමින් ඒවා පිළිබඳව තීන්දු ගැනීමට පුළුවන් වන ආකාරයට කරුණු දැක්වීම් කළා. කම්කරු ඇමතිවරුන්ගේ ඉතිහාසයේ කම්කරු නීති-රීති ගෙන ඒම පිළිබඳව එතුමාගේ නම ඉතාම ප්‍රබලව සටහන් වෙනවා. මම ඇත්තටම එසේ කියන්නේ,  එතුමාත් එක්ක එකතුව මේ සම්බන්ධයෙන් කටයුතු කරපු නිසායි.

ඊළඟට, සේවා යෝජකයා -ආයෝජකයා- සහ සේවකයා අතර ප්‍රබලත්වය අතින් තිබෙන්නේ ලොකු පරතරයක්. සේවකයා දුබලයි. ආයෝජකයා ප්‍රබලයි. ඒ නිසා මේ මැදට කවුරු හරි මැදිහත් වෙන්න ඕනෑ, ඒ දෙක සමබර කරන්න. ඒ අනුව තමයි රජය මැදිහත්වෙලා තිබෙන්නේ. රජය මේ නීති ගෙනැල්ලා තිබෙන්නේ සේවකයා සම්බන්ධයෙන් සේවායෝජකයාගේ ක්‍රියා කලාපය සාධාරණ විය යුතුයි කියන පදනම මතයි. අපේ මනුෂ නානායක්කාර අලුත් කම්කරු ඇමතිතුමා දැන් කිව්වා, "මේ සමහර නීති  තිබුණාට ඒවායින් වැඩක් නැහැ. මොකද, ආයෝජකයෝ එන්නේ නැහැ" කියලා.  එදා, 1978දී ජේ.ආර්. ජයවර්ධන මහත්මයාත් මේකම කිව්වා. අද වන විට ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ neoliberal ක්‍රමයේ වගන්ති අපි එකින් එක කටුගාලා දාලා තිබෙනවා. එතුමා නියම කළා, කාර්මික වෙළෙඳ කලාපවල වෘත්තීය සමිති බැහැ කියලා.  අද ඒකත් අහෝසි වෙලා තිබෙනවා. වෘත්තීය සමිතිවල විරෝධයත්, අධිකරණයේ තීන්දුවත් උඩ අද ඒක අහෝසි වෙලා තිබෙනවා. ඒ නිසා මනුෂ නානායක්කාර ඇමතිතුමා කාලයට නොගැළපෙන කම්කරු ඇමතිවරයෙක් ලෙසටයි මට දැනෙන්නේ. එහෙම නැත්නම්, අද කම්කරු ඇමතිවරයා හැටියට එවා තිබෙන්නේ කම්කරු නීති පිළිබඳ අලුගෝසුවෙක්. මම එසේ කියන්නේ දැනුවත්ව, වුවමනාවෙන්මයි. මොකද, මේ කම්කරු නීති ආරක්ෂා කරන්නයි එතුමා ඉන්නේ. එතුමා කිව්වා, එතුමාට සේවා යෝජකයාත් බලාගන්න තිබෙනවා කියලා. නැහැ, එහෙම එකක් මේ කම්කරු නීතිවල නැහැ. කම්කරු නීතිවල හැම තැනම

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

තිබෙන්නේ සේවකයාගේ අයිතිය බලා ගැනීම පමණයි. එසේ බලා ගැනීමේදී සාධාරණ විනිශ්චයක් දීම පමණයි. සේවා යෝජකයා, ආයෝජකයා, කර්මාන්තයේ අයිතිකාරයා වෙනුවෙන් අපේ කම්කරු ඇමතිවරයා පෙනී සිටින්න ගියොත්, එහෙම නම් අපි අන්තිමට කරලා තිබෙන්නේ වැරදි කෙනාගේ අතට කඩුව දීමයි.

ඊළඟට, මේ neoliberal ප්‍රතිපත්තිය අනුව කම්කරු නීති හැදීමේ උත්සාහය මේ රටේ පරාජය වීම අපි කාගේත් සතුටට කරුණක්. අද වැටුප්වල විශාල බිඳ වැටීමක් තිබෙනවා. හේතුව, විශාල උද්ධමනයක් තිබෙනවා. උද්ධමනය ඉහළ යාම හා මේ වැටුප් බිඳ වැටීමේ අර්ථය ඒ කම්කරුවන්ගේ - සේවකයන්ගේ - ජීවන මට්ටමේ ඇතිවෙන විශාල බිඳ වැටීමයි. මෙන්න මේක නිසා තමයි අද රැකියා තිබෙන අයගේ දරු පවුල්වල පවා තරමක සා ගින්දරක් තිබෙන්නේ. ඒ නිසා අද මේ අයගේ වැටුප් වැඩි කිරීමක් ඉක්මනින්ම අවශ්‍යයි. රුපියල් 1,000ක දෛනික වැටුප තවම වතු කම්කරුවන්ට ලැබෙන්නේ නැහැ. ඇයි? සමාගම්කාරයෝ නඩුවක් දාලා තිබෙනවා. සමාගම්කාරයෝ නඩුව දාලා තිබෙන්නේ රජයේ ඉඩම් වෙනුවෙන්, ඒවායේ කළමනාකරණය කරන්නන් හැටියටයි. ඒ නඩුවේ තීන්දුව එනකල්, උසාවි පද්ධතියේ ක්‍රියාකාරිත්වය තුළ ඒවා පමා කර කර අවුරුදු ගණන් ගෙනයන්න පුළුවන්. උසාවිවල නඩු වැඩියි. ඒකට හේතුව එයයි. ඒක නිසා නීතියක් ගෙනැල්ලා හෝ රුපියල් දාහේ දෛනික වැටුප ඔවුන්ට ලැබෙන ක්‍රමයක් තිබෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෘත්තීය සමිතිවල සාමාජික මුදලක් තිබෙනවා. අපට මතක ඇති ඉතිහාසයේ ඉඳලා කළමනාකරණ සමාගම් විසින් ඒ සාමාජික මුදල සේවකයාගේ වැටුපෙන් අඩු කරලා එය වෘත්තීය සමිතිවලට යැවීම තමයි සිදු කළේ. ඒ කියන්නේ වෘත්තීය සමිති බිහිවුණු අවුරුදු සියයකට වැඩි කාලයක ඉඳලා එහෙම තමයි කළේ. නමුත් අද වෙන කොට ඒකත් නවත්වලා තිබෙනවා. ඒක නිසා අද සාමාජික මුදල් හොයා ගන්න සේවකයා ළඟට යන්න සිදුවෙලා තිබෙනවා. එය ප්‍රායෝගිකව කරන්න බැරි දෙයක්. ඒක නිසා වෘත්තීය සමිතිවල ක්‍රියාකාරිත්වය ඇනහිටලා තිබෙනවා. මේ පිළිබඳවත් මැදිහත් වීමට ආණ්ඩුවට පුළුවන්කම තිබෙනවා. ගරු මනුෂ නානායක්කාර නව කම්කරු ඇමතිතුමනි, මේ කාරණා සටහන් කරගන්න කියලා මම ඉල්ලා සිටිනවා. මේ කාරණාවල දී, එතුමා වෘත්තීය සමිති පැත්තේද ඉන්නේ, එහෙම නැත්නම් කළමනාකරණ පාර්ශ්වයේ පැත්තේද ඉන්නේ කියලා තීන්දුවක් ගත යුතුව තිබෙනවා.

මුල ඉඳලා බලන කොට ලංකාවේ කම්කරු නීති ක්‍රම ක්‍රමයෙන් ප්‍රබල වෙලා තිබෙනවා. එලෙස ප්‍රබල වෙලා තිබෙන්නේ, කම්කරුවාගේ ආරක්ෂාව වෙනුවෙන්. එහෙම නැතිව, කම්කරුවා - සේවකයා- දැනට භුක්තිවිඳින අයිතිවාසිකම් ඉවත් කිරීමට, අඩු කිරීමට කිසිම කම්කරු නීතියක් ගෙනැල්ලා නැහැ. මේක ආයෝජකයාට හොඳ ද, මේක අයිතිකාරයාට හොඳ ද කියලා හිතන ඇමතිවරු කම්කරු අමාත්‍යාංශයට පැමිණීම මේ රටේ ඉතිහාසයට ලොකු ශාපයක්.

ජාත්‍යන්තර කම්කරු සංවිධානය - ILO එක - පවා යම් වර්ග කිරීමක් කරලා තිබෙනවා. සමහර නිෂ්පාදන නින්දිත නිෂ්පාදන හැටියට නම් කරලා තිබෙනවා. මොකද ඒවා දාඩිය මහන්සිය වගුරන කම්කරුවන්ට අයිතිවාසිකම් අඩුවෙන් ලබාදෙන ආයතන නිසා. එබඳු ආයතන, එබඳු රටවල් ශීලාචාර බවින් තොර නින්දිත ආයතන හා රටවල් බවට නම් කර තිබෙනවා. ඒක නිසා අපි මතක තියාගන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. ජාත්‍යන්තර කම්කරු සංවිධානය - ILO එක - මේ වෙනකොට ලංකාව ගැන ලොකු ඇගයීමක් කරලා තිබෙනවා. සෞඛ්‍ය පිළිබඳව අපේ රටට ලොකු ඇගයීමක් තිබෙනවා. අධ්‍යාපනය - literacy එක - පිළිබඳ අපට ලොකු ඇගයීමක් තිබෙනවා. මේවා තමයි පසුගිය අවුරුදු 70 ගණනක ඉතිහාසයේ වටිනාකම් හැටියට අපට ඉතුරු වෙච්ච දේවල්.

පාරේ විශාල ඝෝෂාවක් කරන කට්ටියක් ඉන්නවා. ඒ ඝෝෂාව කරන කට්ටිය කියනවා, මේ පාර්ලිමේන්තුවෙන් වැඩක් නැහැ කියලා. නමුත් අද අපි සම්මත කරන පනත තුළින් කරන්නේ, මේ රටේ හිර වෙලා තිබෙන 16,000ක් නඩු ඒ තත්ත්වයෙන් මුදා ගෙන ඒ නඩුවල තීන්දු ඉක්මනින් ලබා දීමට අවශ්‍ය කරන නීතිය ගෙනෙන එකයි. මම හිතනවා, මේ නීතිය සම්මත වුවාට පසු 16,000ක් පමණ වූ හිරවෙලා තිබෙන නඩු හය මාසයක්, එක අවුරුද්දක් ඇතුළත විසඳලා ක්‍රියාත්මක කරලා ඉවර කරන්න පුළුවන් කියලා. මේ රටේ කම්කරුවන්ගේ ජීවිත නඟා සිටුවන්නයි මෙබඳු නීති ගෙන එන්නේ. මේ වාගේ ගෙන එන ලද නීති සමුදායක් තිබෙනවා. ඒවා ඔක්කෝම මේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරපු නීති. පාර්ලිමේන්තුවේ අපි කරන්නේ කථා කරන එක තමයි. නමුත් කථා කරලා අවසානයේ අපි අණපනත් සම්මත කරනවා. ඒ අණපනත්වලින් තමයි රටේ අයිතිවාසිකම් තීන්දු වෙලා ක්‍රියාත්මක වෙන්නේ. මේ කිසිවක් ගැන නොදන්න, TV එකේ දර්ශන විතරක් බලාගෙන ඉන්න, ඒවා දැකලා ඒවායෙන් පමණක් තීන්දු ගන්න ඒ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

දැන ගත යුතු ඉතිහාසයකුත්, වටිනාකමකුත් මේ පාර්ලිමේන්තුවට තිබෙන බව කියමින් මගේ කථාව මෙයින් හමාර කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා**
(மாண்புமிகு (கலாநிதி) நாலக்க கொடஹேவா)
(The Hon. (Dr.) Nalaka Godahewa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශාන්ත බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சாந்த பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. SHANTHA BANDARA *took the Chair.*

[අ.භා. 1.58]

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகுபிரேம்நாத்சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ සමහර මන්ත්‍රීවරු, ඒ වාගේම මගේ වයසටත් වඩා වැඩි කාලයක් මේ පාර්ලිමේන්තුවේ ගත කළ මැති ඇමතිවරු මේ පාර්ලිමේන්තුව කථා පෙට්ටියක් කියලා කියන්න අද උදෑසන උත්සාහ කළා. විශේෂයෙන්ම මම ඒ අයගෙන් අහන්න කැමැතියි, එවැනි ප්‍රකාශයක් කළේ මේ පාර්ලිමේන්තුවේ ක්‍රියාකාරිත්වය, පාර්ලිමේන්තුවේ වැදගත්කම දන්නේ නැති නිසාද, එහෙම නැත්නම් ඒක දැනගෙන වෙනත් මතවාදයක් සමාජය තුළ නිර්මාණය කිරීම සඳහාද කියලා. පැහැදිලිව මේ පාර්ලිමේන්තුවේ - ව්‍යවස්ථාදායකයේ- සාමාජිකයකු හැටියට අපේ කාර්ය භාරය වන්නේ මනුෂ්‍ය චර්යා වෙනස් වනකොට ඒ වෙනස් වීම්වලට අනුකූලව අණ පනත් සැකසීමයි. ඒ සඳහා අද උදෑසන අපි රැස් වුණු වෙලාවේ, අපි දැකපු විධියට සමහර මන්ත්‍රීවරුන්ගේ අවශ්‍යතාව වුණේ අද සවස් වරුවේ රූපවාහිනී ප්‍රවෘත්තිවලට තමන්ගේ මතවාද ඉදිරිපත් කිරීම පමණයි. මේ අණ පනත් ගැන සාකච්ඡාව කරන්න මේ වෙනකොට මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු ඉන්න ඕනෑ. අද කෑ ගහපු ඒ මන්ත්‍රීවරුන්ට ව්‍යවස්ථාදායකයේ කාර්යය සහ විධායකයේ කාර්යය මාරු වෙලා තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු දොලවත්ත මන්ත්‍රීතුමනි, ඔබතුමා එකඟ නම් මට තත්පරයක් දෙන්න.

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)

කියන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

තමන්ගේ බිරිඳට දරුවන් නැහැ කියලා රට මිදුලට ගිහිල්ලා බුදියා ගන්න පුරුෂයෝ වාගේ තමයි අද එළියට බැහැලා ගියේ.

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉතාම නිවැරැදියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මම විශේෂයෙන්ම කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ව්‍යවස්ථාදායකය වහන්න ඕනෑ, ව්‍යවස්ථාදායකය කථා පෙට්ටියක් වැනි දේවල් කියන්නේ මේ පාර්ලිමේන්තුවට ඇවිත් පර්මිට් හත, අට ගත්ත මිනිස්සු; ඇමතිකම් ගත්ත මිනිස්සු. මේක ලජ්ජාවට කාරණයක්. ව්‍යවස්ථාදායකය කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ නිර්මල ස්ථානය.

අද සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත සහ අපරාධ නඩු විධාන සංග්‍රහය ( සංශෝධන) පනත් කෙටුම්පත මේ ගරු සභාවේදී සම්මත වුණා. දැන් කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව, දැන් අපි කථා කරන්නේ කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත හරහා අද සැකකරුවකුට අපරාධ අධිකරණයක පවත්වන නඩුකරයක තීන්දුවේ සහතික පිටපතක් නොමිලයේම ලබා ගැනීමේ හැකියාව නිර්මාණය කරලා තිබෙනවා. මේවා වෙන්න ඕනෑ වෙනස්කම්. සමහර විනිශ්චය ආසනවල ඉන්න මහෙස්ත්‍රාත්වරු, මහාධිකරණ විනිශ්චයකාරවරු සමහර වෙලාවට ඒ අයට ඒ අයිතිය ලබා දෙන්නේ නැහැ, තමන්ට ඕනෑ ඕනෑ විධියට ඒ වාර්තා හංගාගෙන තියාගෙන ඉන්නවා. ඒ සහතික පිටපත් නොමිලයේ ලබා දෙන්න කියලායි මේ නීතිය සම්මත කර තිබෙන්නේ. ඉතින්, මේ නීති සම්මත කරන තැන කොහොමද කථා පෙට්ටියක් වෙන්නේ?

ඊළඟට, අද සම්මත කළ සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත තුළින් මොනවාද සිදු වෙලා තිබෙන වෙනස්කම්? සමහර හිමිකම් ඔප්පුවල, අයිතිය සම්බන්ධයෙන් දෙපාර්ශ්වය හබ කරන්නේ නැති වෙලාවලට ශ්‍රේෂ්ඨාධිකරණයේ සමහර තීන්දු නිසා අදාළ කාරණාව නැවත වතාවක් උසාවියේ ඔප්පු කිරීමේ අවශ්‍යතාව නිර්මාණය වෙලා තිබුණා. මේ නිසා විශාල කාලයක් මිඩංගු වෙනවා. මේක වළක්වන්න තමයි, ඒ සංශෝධනය ගෙනැල්ලා සම්මත කළේ. ඉතින්, මේ නීති සම්මත කරන තැන කොහොමද කථා පෙට්ටියක් වෙන්නේ? ඒ නිසා විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, මෙවැනි දේවල් කීම කනගාටුවට කාරණයක් බව.

මම හිතන විධියට අද සජිත් ප්‍රේමදාස මහත්මයා ඇතුළු විපක්ෂයේ කණ්ඩායමක් එළියට ගියේ විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඒ අයට ඕනෑ විධියට කර ගන්න දැරූ උත්සාහය ඒ ගොල්ලන්ගෙන් ගිලිහී ගිහින් තිබෙන නිසා. විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් අපේ ප්‍රධානම ඉල්ලීම වුණේ අපි කාටත් එකඟ වෙන්න පුළුවන් විධියට, ජන මත විචාරණයකට යන්නේ නැතිව, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් යම් වැරැද්දක් කළා නම්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට නැවත යමු කියන එකයි. ඒ වෙනස්කම් ටික, ඒ නිර්ණායක ටික තමයි අප හමුවේ තිබුණේ. එදා අපි විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඡන්දය දුන්නේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒමේ අරමුණින්. හැබැයි, අද අපට ඒක ප්‍රායෝගිකව කරන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා අපි මොකක්ද කරන්න ඕනෑ? අපි විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේන්න ඕනෑ. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිසා අපේ කොමිෂන් සභාවල තිබුණු ස්වාධීනත්වය අයින් වුණා. ඒ කොමිෂන් සභාවල ස්වාධීනත්වය නැවත අපි ඇති කරන්න ඕනෑ. ඒ වාගේම, ද්විත්ව පුරවැසිභාවය සම්බන්ධයෙන් ඇති වූ ප්‍රතිපාදන අහෝසි කරලා මේ රටට අවශ්‍ය ප්‍රතිපාදන පමණක් අපි ලබා දෙන්න ඕනෑ. අපි ඔක්කෝම එකතු වෙලා මේ දේවල් නිර්මාණය කර ගන්න හැකියාව තිබියදී විපක්ෂය අද මේ මොකක්ද කරන්නේ?

සජිත් ප්‍රේමදාස මහත්තයලා කරන්න බැරි දේවල් කිව්වා. මේ වෙලාවේ ඡන්දයක් පවත්වනවා තබා, මිනිසුන්ට ජීවත් වෙන්නවත් හැකියාවක් නැහැ; එවැනි වටපිටාවක් නැහැ. හැබැයි, ජන මත විචාරණයකට යෑමේ අවශ්‍යතාවට කරුණු කියන තත්ත්වයක් තමයි අද නිර්මාණය වෙලා තිබෙන්නේ. මා මුලින් මතු කළ ස්වාධීන කොමිෂන් සභා ඇති කිරීම, ද්විත්ව පුරවැසිභාවය අහෝසි කිරීම කියන විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එක් කළ යුතු සාධනීය කාරණා සම්බන්ධයෙන් මේ ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකු හැටියට මා පැහැදිලිව මගේ සහයෝගය ලබා දෙනවා කියන එකත් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

අද දවසේ දමිළ ජන වර්ගය නියෝජනය කරන මන්ත්‍රීවරු දිගින් දිගටම කාරණා ගණනාවක් කිව්වා. ජීවත් වීම සම්බන්ධව කිව්වා. ජන සංහාරයක් කළා කියන කාරණය කිව්වා. අපි ඒ

[ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා]

මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, ජාත්‍යන්තරයට ඔය වාගේ කරුණු කියන එක දෙයියන්ගේ නාමයෙන් නවත්වන්න කියලා. අපි ඉගෙන ගත් වටපිටාව තුළ දමිළ සහෝදරවරු සහ අපි එකට ජීවත් වුණා. අතීතයේදී යම් ආකාරයක අප්‍රසන්න වාතාවරණයක් තිබෙන්න ඇති. එම අතීතය තුළ තිබුණු අප්‍රසන්න වාතාවරණවලට අපි යනවා නම්, එළාර - දුටුගැමුණු මහා යුද්ධය දක්වා අපි යන්න ඕනෑ. ඒ නිසා මේ කියන කාරණා අමතක කරන්න. දේවස්ථාන, පල්ලි කියන මේ දේවල් සියල්ලම තිබෙන්නේ මිනිසුන්ගේ අධම අදහස් නැති කරලා මිනිසුන්ගේ සිත් නිවන්නයි. පල්ලියක්, කෝවිලක්, පන්සලක් හැදෙනවා නම්, ඒකයි විය යුත්තේ. බෞද්ධයෝ හැටියට අපි කිසිම වෙලාවක කොළඹ හැදෙන කෝවිලකට, කොළඹ හැදෙන පල්ලියකට විරුද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා කරුණාකර ඒ සහජීවනය ඇති කිරීමට ඒ අයගේ උදව් දෙන්න කියන කාරණය මේ අවස්ථාවේ මම මතක් කරන්න කැමැතියි.

අපි දන්නවා, පුරාවිද්‍යා නටබුන් හමු වුණාම, ඒවා තිබෙන්නේ කොහේද, කොතැනද කියන එක අවශ්‍ය වෙන්නේ නැති බව. ඒවා කොතැන තිබුණත් -දකුණේ වුණත්, උතුරේ වුණත්- පුරාවිද්‍යා ආඥා පනතට අයත් වුණාම ඒවා අල්ලන්නවත් කාටවත් අවසර දෙන්නේ නැහැ. එහෙම තත්ත්වයක් නිර්මාණය වෙලා ඇති. ඒ දේවල් සම්බන්ධයෙන් ඉවසීමෙන් කටයුතු කරන්න අපට සිද්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම තව ටික වෙලාවකින් සම්මත කිරීමට නියමිතයි, කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත. අපි දන්නවා, අද මහෙස්ත්‍රාත් අධිකරණ, දිසා අධිකරණ සහ කම්කරු විනිශ්චය සභා - LTs - තිබෙන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර වෙලාවට කම්කරු විනිශ්චය සභා උදේ 9.30ට පටන් ගෙන උදේ 11.30 පමණ වන විට නඩු කටයුතු අවසන් කරනවා. හැබැයි, කම්කරු විනිශ්චය සභාවේ විභාග කළ යුතු සමහර කාරණා මහෙස්ත්‍රාත් අධිකරණයට ගියාම පුදුම විධියේ කාල සීමාවක් ඒ සඳහා ගත වෙනවා. එතකොට මිනිසුන්ගේ කාලය නිකරුණේ වැය වෙනවා. ඒක සේවා යෝජකයාටත් පොදුයි, කම්කරුවාටත් පොදුයි. ඒ නිසා මේ යුක්තිය පසිඳලීම, නීතිය ක්‍රියාත්මක කිරීම නිසි ආකාරයට නිසි වෙලාවට සිද්ධ වුණේ නැත්නම් ඒ දෙපාර්ශ්වයම අගතියට පත් වෙනවා. ඒ නිසා මම හිතන විධියට සේවා යෝජකයාගේ පැත්තෙන් බලනකොට, ඔහු යටතේ සේවය කරන කම්කරුවා, එහෙම නැත්නම් සේවකයා ඔහුට විරුද්ධව නඩුවක් දමා තිබෙන වෙලාවක, ඒ නඩුව ඉක්මනට අහනවා නම්, ඒක සේවා යෝජකයාට හොඳයි, ඔවුන්ට ඒක පහසුවක් වනවා. අනෙක් පැත්තෙන්, සහනය බලාපොරොත්තුවෙන් ඉන්නා කම්කරුවාටත් ඉතාම කඩිනමින් සහනයක් ලැබෙනවා නම්, ඒක ඒ අයටත් පහසුවක් වනවා.

මම හිතන විධියට අද මේ ඉදිරිපත් කර තිබෙන කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත තුළ පසුගිය කාලය පුරාම දෙපැත්තට දෝලනය වුණු කාරණා පිළිබඳව සඳහන් වනවා. මම අවංකව කියන්න ඕනෑ, සමහර වෙලාවට අපේ මහෙස්ත්‍රාත්වරුත් කැමැති නැහැ, මේ බලය කම්කරු විනිශ්චය සභාවල සභාපතිවරුන්ට දෙන්න. හැබැයි, කොහොම වුණත් අද ඒ තීරණය අරගෙන තිබෙනවා. මම හිතනවා, මේ තීරණය අපේ මහෙස්ත්‍රාත්තුමන්ලාටත් පහසුවක් කියලා. මොකද, ඒවායේ නඩු කන්දරාවක් තිබෙනවා. අද පැහැදිලිව තිබෙන විවේචනයක් තමයි, නඩුවලට ගතවන කාලය වැඩියි කියන එක. හැබැයි, මේ නඩු රෝලෙන් යම් නඩු ප්‍රමාණයක් කම්කරු විනිශ්චය සභාවලට යොමු වීම තුළ යම් ආකාරයේ සහනයක් මහෙස්ත්‍රාත්වරුන්ටත් ලැබෙනවා.

ඒ එක්කම, කම්කරු විනිශ්චය සභාවල සභාපතිවරු, ඒ කියන්නේ අතිරේක මහෙස්ත්‍රාත්වරු ඇතුළු ඒ සියලු කාර්ය මණ්ඩල, ඒ තිබෙන ආයතන ඇතුළු කම්කරු විනිශ්චය සභා වෙනුවෙන් වැය වී තිබෙන රාජ්‍ය සම්පත් අපට ඉතාම ප්‍රශස්ත ලෙස ප්‍රායෝගිකව යොදා ගෙන මේ රටේ මිනිසුන්ගේ දුක් අඳෝනා විසඳන්නත් මේ නිසා හැකියාව ලැබෙනවා. ඒ නිසා අද ගෙනෙන මේ කාරණය සාධනීය කාරණයක්. සේවා යෝජකගේ පැත්තෙන් ගත්තත්, කම්කරුවා පැත්තෙන් ගත්තත් මෙය ඉතාම සාධනීය තත්ත්වයක්.

ඊළඟට, මේ කාරණය සම්බන්ධවත් මමත් යෝජනාවක් ඉදිරිපත් කරන්න කැමැතියි. මෙයත් විය යුතු සංශෝධනයක්. මොකද, යම් කම්කරු විනිශ්චය සභාවක් තුළින් ලබා දෙන්නා වූ විනිශ්චය -තීරණය, ඒ අදාළ නඩු තීන්දුව- සම්බන්ධව සමහර වෙලාවට ඇපෑලක් -අභියාචනයක්- ඉදිරිපත් කරනවා. නමුත්, පළාත්බද මහාධිකරණ විනිශ්චයකාරවරුන්ට තිබෙන වැඩ කටයුතු ප්‍රමාණය අධික බව අපි දන්නවා. එතකොට ඒ විනිශ්චයකාරවරුන්ගේ නඩු ප්‍රමාණය තවත් වැඩිවනවා. ඒ නිසා අඩුම තරමේ කම්කරු විනිශ්චය සභාවලට අදාළ නඩු කාරණා විතරක් අහන පළාත්බද මහාධිකරණ හතක් වාගේ ලංකාව පුරා පිහිටුවන්න පුළුවන් නම්, ඒ අයටත් යම් පහසුවක් ලැබෙනවා. එය ඉතාම සාධනීය තත්ත්වයක්. ඒ නිසා මම පැහැදිලිව මේ අවස්ථාවේ එම යෝජනාව කරන්න කැමැතියි. මේ මේ කාරණා සාකච්ඡා කර එවැනි සාධනීය තත්ත්වයක්, වෙනස්වීමක් කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනතට ඉදිරියේදී ගේන්න පුළුවන් නම්, අපට තවදුරටත් මේ ප්‍රශ්න අවම කරමින් ඉදිරියට යන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නැවත වතාවක් අවධාරණය කරනවා, ප්‍රජාතන්ත්‍රවාදයේ මුදුන්මල්කඩ තමයි - ව්‍යවස්ථාදායකය, නීති අණපනත් හදන ස්ථානය, නීති වෙනස් කළ යුතුයි කියා යෝජනා කරන ස්ථානය, නව අණපනත් සකස් වෙන්න ඕනෑ කොහොමද කියා යෝජනා කරන ස්ථානය- මේ පාර්ලිමේන්තුව. නීතිය සමහර වෙලාවට අපේ මනුෂ්‍ය චර්යාවලට ඉදිරියෙන් තිබෙනවා. සමහර වෙලාවට නීතිය මනුෂ්‍ය චර්යාවලට බොහොම පිටුපසින් තිබෙනවා. අඩු තරමින් මේ තිබෙන වෙනස්කම යම් ප්‍රශස්ත මට්ටමක තබා ගන්න පුළුවන් කියන කතිකාව ඇති කරන්න පුළුවන්, මේ පාර්ලිමේන්තුව තුළ තිබෙන මේ සන්දර්භය තුළ; මේ සාකච්ඡාව තුළ; මේ විවාදය තුළ. මේ පාර්ලිමේන්තුව තුළ විධායකයේ කාර්යභාරය සිද්ධ වන්නේ නැහැ. හැබැයි, නීති අණපනත් වෙනස් වෙන්න ඕනෑ කොහොමද කියන කාරණය ගැන සාකච්ඡා කරලා, ඒ නීති අණපනත් සම්මත කිරීමේ ක්‍රියාවලිය තමයි පාර්ලිමේන්තුව තුළ සිද්ධ වන්නේ. හැබැයි, අවුරුදු ගණනක් තිස්සේ, දශක ගණනක් තිස්සේ පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරුන්ට, හිටපු ඇමතිවරුන්ට, විපක්ෂ නායකවරයා ඇතුළු මේ රටේ අනාගතය භාර ගන්න බලාගෙන ඉන්න අයට මේ යථාර්ථය තේරෙන්නේ නැති එක ගැන අපි විශාල වශයෙන් කනගාටු වෙනවා. ඒක තමයි අපට තිබෙන ප්‍රශ්නය. මේ දිහා බලාගෙන ඉන්න මේ රටේ ජනතාවට කියන්න ඕනෑ, මේ පාර්ලිමේන්තුව තුළ සිද්ධ වන කාර්යය අඩු ලුහුඬුවට දමලා කථා කරන්න එපා කියලා. වෙනස් වන මනුෂ්‍ය චර්යාවට ඔබින පරිදි නීති අණපනත් සැදීමේ කාර්යය මේ පාර්ලිමේන්තුව තුළ අපි ඉතාම කඩිනමින් කරගෙන යනවා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට තමයි අද මේවා සිද්ධ වන්නේ. අද දින සම්මත වූ අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත, සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත සහ දැන් විවාදයට ලක් වන කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත මනුෂ්‍ය චර්යා තවදුරටත් ප්‍රශස්ත මට්ටමට ගෙන යන්න, මිනිසුන්ගේ ජීවන ප්‍රයත්න ඉදිරියට ගෙන යන්න මුල් වන අණපනත් බව සඳහන් කරමින්, මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජයරත්න හේරත් මැතිතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.10]

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, ඉතාම කාලෝචිත කරුණු ගණනාවක් තමයි අද විවාදයට ලක් වන්නේ. කම්කරු විනිශ්චය සභාවලට මෙතෙක් නොලැබුණු බලතල අද මේ කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සම්මත කිරීමෙන් ලබා දෙන්න තීන්දු කර තිබෙනවා. කලින් කථා කළ අපේ සහෝදර මන්ත්‍රීතුමා කිව්වා වාගේම, නිශ්චිත බේරුමක් සඳහා යන්න තැනක් නැති නිසා කම්කරු ආරවුල් සම්බන්ධ නඩුවලින් හතරෙන් තුනක් විතර අද විභාග වන්නේ මහෙස්ත්‍රාත් අධිකරණයේ. මේ පනත මඟින් අතිරේක මහෙස්ත්‍රාත්වරයෙකුගේ බලතල කම්කරු විනිශ්චය සභා සභාපතිවරයෙකුට ලබා දීම නිසා ඒ නඩු කටයුතු පමා වීම, ගොඩ ගැසීම සහ මිනිසුන්ගේ කාලය නිකරුණේ ගත වීම කියන සියලු කාරණාවලට විසඳුම් ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා මේ පනත් කෙටුම්පත ඉතාම වැදගත් වෙනවා.

ලෝක කම්කරු ප්‍රඥප්තියත් එක්ක එකඟ වන අපේ රටේ අද වන විට කම්කරු නීති රීති හුඟක් හඳුන්වා දීලා තිබෙනවා. මේ පනත තුළින් එක පැත්තකින් කම්කරුවාගේ අයිතිවාසිකම් සුරක්ෂිත වනවා. සමහර අවස්ථාවලදී අපේ කම්කරු අණපනත්වල ස්වරූපය දැකපු සමහර විදේශීය ආයෝජකයන් අපේ රටේ මුදල් ආයෝජනය කිරීමට පොඩි මැළිකමක් දැක්වූ අවස්ථාත් තිබෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නය දිහා තුලනාත්මකව බලලා, කම්කරුවාත් අපහසුතාවට ලක් නොකර, අපේ ආර්ථිකය ශක්තිමත් කර ගන්න විදේශීය ආයෝජකයන්ටත් මේ රටේ අවශ්‍ය පසුබිම නිර්මාණය කරන වැඩ පිළිවෙළකට යන්න අපට සිද්ධ වෙනවා. ඒ නිසා දීර්ඝ කාලයක් තිස්සේ තිබුණු අතපසුවීමක් නිවැරදි කරන්න අද පුළුවන්කමක් ලැබීම ගැන අපි වඩාත් සතුටු වෙනවා.

අද උදැසන ඉඳලාම, විවිධ දේශපාලන මතවාද, ගත්ත තීන්දු තීරණ පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ බරපතළ සංවාදයකට ලක් වුණා. ලංකා දේශපාලන ඉතිහාසයේ මෙතෙක් නොවූ සහ මින් මත්තටවත් නොවෙයි කියා අපි බලාපොරොත්තු වන ඉතාම ගැඹුරු අඩියක -ආගාධයක- තමයි අද වන කොට අපේ රට තිබෙන්නේ. අපේ රටේ මිනිසුන් තුළ බලාපොරොත්තුවක් තිබෙනවා, පාර්ලිමේන්තුව මේ ප්‍රශ්නයට විසඳුම් දෙයි කියලා. පසුගිය කාලය මුළුල්ලේම පාර්ලිමේන්තුව හැසිරුණු විධිය නිසා අද පාර්ලිමේන්තුවේ ඉන්න දෙසිය විසිපස්දෙනා පිළිබඳවම මිනිසුන්ගේ විශ්වාසයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද වනකොට ඇති වෙලා තිබෙන දැඩි ආර්ථික අර්බුදයට එකතු වුණු දේශපාලන අර්බුදය අද සමස්ත රට සිසාරා ගිහිල්ලා අවසානයි.

අද මිනිහා නොමිනිහා වෙලා, මේ රටේ මිනිස්සු ඉතාම ආවේගශීලිව තමයි කටයුතු කරන්නේ. මෙය, එදා වේල පිරිමහගෙන දවස ගෙවාගන්නේ කොහොමද කියලා අපේ රටේ බහුතරයක් ජනතාව බරපතළ අර්බුදයක ඉන්න වෙලාවක්. මේ සම්බන්ධයෙන් බලනකොට, අපි ඉතිහාසයේ ගත්ත බොහෝ තීන්දු තීරණ වැරැදියි කියන එක අද අපට පසක් වෙනවා වාගේම, මෙය ඒක පසක් කර ගන්න ඕනෑ වෙලාවක්. කිසිම ඉවක් බවක් නැතුව අපි විවිධ ක්‍රම යටතේ විදේශවලින් ණයට මුදල් අරගෙන ඇවිල්ලා ඒ මුදල් කිසිම නිෂ්පාදනයක්, උත්පාදනයක්, එහෙම නැත්නම් පැහැදිලි ආයෝජනයක් නැති, සල්ලි වළලා දමන වැඩවලට යෙදවීම නිසා ලෝකය හමුවේ අපි බරපතළ ණයකාරයෝ බවට පත්වෙලා ඉවරයි. අද අපේ රට ණය ගෙවන්න බැරි රටක්, බංකොලොත් රටක් බවට ලෝකය පිළිගෙන ඉවරයි, ප්‍රකාශයට පත් කරලා ඉවරයි. ශ්‍රේණිගත කිරීම්වලින් අපි බරපතළ පහළ අඩියකට තල්ලු වෙලා ඉවරයි. ඒ හින්දා අපි අඳුරට ශාප කරන්නේ නැතුව කටයුතු කරන්න ඕනෑ. දැන් වෙච්ච දේ ඉවරයි. මේ ප්‍රශ්නයෙන් අපි ගොඩ එන්නේ කොහොමද කියන එක පිළිබඳව සිතීමට මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට වගකීමක් තිබෙනවා.

පසුගිය දවස්වල මේ රටේ ඇති වුණු අවාසනාවන්ත සිද්ධිදාමය දිහා බැලුවාම, ඒවා නැවත මේ රටේ නොවිය යුතුයි. ගෙවල් ගිනිබත් කරලා, අපේ මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කළ මන්ත්‍රීවරයෙක් අපරාදේ අමානුෂික විධියට මරලා දාලා, ඉතාම කලහකාරී තත්ත්වයක් මේ රට තුළ ගොඩනැඟුවා. මිනිසුන්ට නිතැතින්ම ඇති වන ආවේග පිළිබඳව අපි යම් සමාවක් දුන්නත්, ඉතාම සැලසුම් සහගතව මේ වැඩ පිළිවෙළ ගොනු කරපු, දියත් කරපු ඇතැම් ස්ථාන සහ වැඩ පිළිබඳව අද රටේ ජනතාවටත් යම් අවබෝධයක් තිබෙනවා. එම නිසා මේ වෙලාවේ අපි ඉතාම වග කීමෙන් මේ ප්‍රශ්නය කළමනාකරණය කර ගන්න ඕනෑය කියන එක තමයි අපට ඉතාම වගකීමෙන් කියන්න තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! Will an Hon. Member propose the Hon. (Dr.) Suren Raghavan to the Chair?

**ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) கோகிலா குணவர்தன)
(The Hon. (Mrs.) Kokila Gunawardene)

Sir, I propose that the Hon. (Dr.) Suren Raghavan do now take the Chair.

**ගරු අසංක නවරත්න මහතා**
(மாண்புமிகு அசங்க நவரத்ன)
(The Hon. Asanka Navarathna)

***විසින් ස්ථිර කරන ලදී***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ශාන්ත බණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சாந்த பண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SHANTHA BANDARA *left the Chair and* THE HON. (DR.) SUREN RAGHAVAN *took the Chair.*

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දවස්වල ඇති වුණු ආර්ථික අර්බුදයත් එක්ක එකතු වුණු දේශපාලන අර්බුදය පාර්ලිමේන්තුව සිසාරා ගිහිල්ලා අවසානයේ අපේ අගමැතිතුමාට ඉල්ලා අස්වෙන්න සිද්ධ වුණා. ඉන් ඇති වුණු පුරප්පාඩුවට

[ගරු ජයරත්න හේරත් මහතා]

විපක්ෂයට ආරාධනා කිරීමෙන් පසු ලැබුණු ප්‍රතිචාර පිළිබඳව අද පක්ෂ විපක්ෂ දෙපාර්ශ්වයම ඉතාම හොඳ සංවාදයක යෙදුණු නිසා තමුන්නාන්සේලාට ඒ පිළිබඳව කරුණු අනාවරණ කර ගන්න පුළුවන් වුණා. ඒ කොයි හැටි වෙතත්, අවසානයේ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ අගමැතිවරයා විධියට දිවුරුම් දුන්නා. එතුමාට පහර ගැසීමවත්, එතුමා හෙළා දැකීමවත්, එහෙම නැත්නම් ඒක අසුබවාදීව දැකීමවත් නොවෙයි අපි මේ වෙලාවේ කරන්න ඕනෑ. රටේ මිනිස්සු දිහා බලලා මේ රජය පවත්වාගෙන යන්න එතුමාට අවශ්‍ය සහයෝගයක් දෙන එකයි කරන්න ඕනෑ. ඒ සඳහා එතුමාට නිශ්චිත කාල සීමාවක් -කාල රාමුවක්- දෙන්න වෙනවා. එහෙම කරලා තමයි මේ කටයුත්ත කරන්න වෙන්නේ. එම නිසා අපි මේ වෙලාවේ පෞද්ගලිකව අපේ පක්ෂවල තිබෙන න්‍යාය පත්‍ර කරපින්නාගෙන ඒවා එකිනෙක ගළපන්න උත්සාහ කළොත් -ඒවා ක්‍රියාත්මක කළොත්- මේ රටේ මිනිස්සු සොහොන් පිටියට තමයි තල්ලුවෙලා යන්නේ.

ඉතිහාසය ගත්තාම පසුගිය කාලය මුළුල්ලේ හැම දාම අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කළේ, එක්කෝ එක් එක් පුද්ගලයන් ඉලක්ක කරගෙන ඔවුන්ගේ අභිමතාර්ථ ඉෂ්ට කර ගන්නයි. එහෙම නැත්නම් සමහර දේශපාලන පක්ෂ ප්‍රවර්ධනය වෙනුවෙන් සහ ඔවුන්ගේ පෞද්ගලික අභිලාෂ වෙනුවෙන් අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළා. ඒ හින්දා එයින් ඇති වුණු ප්‍රතිඵල ඉතාම අනර්ථකාරී විධියට මේ සමාජයට විඳදරාගන්න සිද්ධ වුණා. ඒ සියල්ලටම විසඳුමක් විධියට මේ රටේ සමස්ත ජනතාව ඉල්ලුවා, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන නොගැළපීම් සහ නීතියේ ආධිපත්‍යය පිළිබඳව තිබෙන ගැටලු තත්ත්වය ඉවත් කරන්න කියලා. ඒ වාගේම ජාත්‍යන්තරය අපේ රට පිළිබඳව බලන ආකාරය පිළිබඳවත්, අපට තිබෙන පිළිගැනීම පිළිබඳවත් නිරන්තරයෙන්ම සාකච්ඡාවට භාජන වූ නිසා සහ ඒ පිළිබඳ මතවාදයක් රට තුළ ගොඩනැඟුණු නිසා අපට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකට යන්න සිද්ධ වුණා.

විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් තම තමන්ගේ යෝජනා ක්‍රියාත්මක කරගන්න යම් යම් උදවිය සිහින දැක්කා. නමුත්, ඒ පනත් කෙටුම්පත ඊයේ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කළා. ළඟදීම එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. මේ වෙලාවේ එය ප්‍රතික්ෂේප කිරීම නොවෙයි වැදගත් වෙන්නේ. බුද්ධිමත් මහජන නියෝජිතයෝ විධියට අපේ වගකීම වෙන්නේ, විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සාධනීය කරුණු ටික ඉතා හොඳින් අධ්‍යයනය කර එයට සහයෝගය ලබා දීමයි. එහෙම නැතිව, අපට තිබෙන අඩුපාඩු ගැන කථා කර විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපි ප්‍රතික්ෂේප කළොත්, ආර්ථික සහ දේශපාලන අර්බුදයෙන් දැවෙන පෙළෙන ජනතාව ඉතා නරක තැනකට, ගව් ගණනක් එහාට තල්ලු කරනවා කියලායි මම හිතන්නේ. ඒ වාගේම අපි ගෝත්‍රික මට්ටමට වැටෙනවා. ඒ නිසා විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අපි සියලුදෙනාම සහයෝගය ලබා දිය යුතුයි කියන එක මම මේ අවස්ථාවේ විශේෂයෙන්ම මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා බොහොම හයියෙන් කියනවා ඉක්මනටම පාර්ලිමේන්තු මැතිවරණයක් පවත්වන්න, පාර්ලිමේන්තුව විසුරුවා හරින්න කියලා. එතුමන්ලාගෙන් මම අහන්න කැමැතියි, පාර්ලිමේන්තු මැතිවරණයක් පවත්වන්න තරම් සුදුසු වාතාවරණයක් දැන් මේ රටේ තිබෙනවාද කියලා. අද මිනිස්සු ඉන්නේ ගෑස් පෝලිමේ; ඉන්ධන පෝලිමේ. මිනිස්සු තමන්ගේ දූ දරුවන් නඩත්තු කරන්න මහත් පරිශ්‍රමයක් දරනවා. ඉතින්, ඒ මිනිස්සුන්ට ඡන්දයකට අවශ්‍ය මානසික තත්ත්වය මේ වෙලාවේ ගොඩ නැඟිලා නැහැ කියලායි මම හිතන්නේ. මැතිවරණයක් පැවැත්වීමට අවශ්‍ය කරන ආර්ථික ශක්තියකුත් අපට නැහැ; ඒකට අවශ්‍ය අමු ද්‍රව්‍යත් අපි ළඟ නැහැ. ඒ නිසා මේ වේලාවේ ඡන්දයක් පවත්වන්න කියලා කවුරු හරි කථා කරනවා නම්, ඒක මොළේ අමාරුවක් වෙන්නට ඕනෑ. දැනට තිබෙන තත්ත්වය අපි කොහොම හරි යම් තත්ත්වයක් දක්වා යහපත් කර ගෙන, මේ රට සන්සුන් කර, පවතින පෝලිම් ටික නැති කර, මේ රටේ මිනිස්සුන්ට නිරවුල් මනසකින් ඡන්ද පොළට යන්න පුළුවන් ආකාරයේ පරිසරයක් ගොඩ නඟා දීලා ඡන්දයක් පැවැත්විය යුතුයි. එහෙම නැතුව, විකෘති වෙච්ච මානසිකත්වයක් යටතේ පාර්ලිමේන්තු ඡන්දයක් පවත්වන්නට ගියොත්, මම හිතන විධියට මීටත් වැඩිය නරක තැනකට මේ පාර්ලිමේන්තුව ඇද වැටෙන එක අපට වළක්වන්න බැරි වෙයි. ඒ නිසා ඒ වැඩ පිළිවෙළ සඳහා සැලකිය යුතු කාල පරිච්ඡේදයක් අපි ලබා දිය යුතුයි. අපේ ආණ්ඩුව -ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ- පවතින ආර්ථික සහ දේශපාලන අර්බුදයට සියයට සියයක් වග කියන්නට ඕනෑ. කිසිම වග විභාගයක් නැතිව අත්තනෝමතිකව ගත් සමහර වැරදි, දරදඬු, අකාරුණික තීන්දු නිසා තමයි අපේ රට මේ තත්ත්වයට පත් වුණේ. මේ තත්ත්වයට පත් වෙන්නට කලින් මේ රටේ තිබ්බ සියලු රජයන් අඩු වැඩි වශයෙන් ඒ වැඩ පිළිවෙළට -අපේ රට නරක තැනකට තල්ලු කරන්න- අවශ්‍ය සහයෝගය ලබා දුන්නා. ඒ නිසා සියලුම දේශපාලන පක්ෂ මේ තත්ත්වයට අනිවාර්යයෙන් වග කිවයුතු වාගේම, පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයෝත් එයට වග කියන්නට ඕනෑ. අවාසනාවකට, ඒ වැඩ පිළිවෙළේ සමාජිකය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ මතට වැටුණා විතරක් නොවෙයි, ඒ හරහා ඇති වෙච්ච අනර්ථකාරී තත්ත්වය තුළ අද අපි මහත් ව්‍යසනයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි ස්වයං විවේචනයක් කර ගෙන මැදහත් සිතින් මේ ප්‍රශ්නය දිහා බලමින් එයට උත්තර හොයනවා මිසක්, එක එක්කෙනාට ඇඟිල්ල දිගු කර, එක එක්කෙනාට බැණ අඬ ගසා, වහසිබස් දොඩවා, කයිවාරු ගහලා මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්කමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට අවුරුද්දකට, එකහමාරකට කලින් අපේ රජයටත් අපි නිරන්තරයෙන්ම කථා කර කිව්වා, මේ තත්ත්වය තුළ අපට යන්න පුළුවන් දුර අඩුවෙයි කියලා. නමුත්, රජය කරවපු අපේ ඇතැම් නායකයෝ ඒක සත පහකට, තුට්ටුවකට ගණන් ගත්තේ නැහැ. අවසානයේ අපට සිද්ධ වුණා, මේ ප්‍රශ්නය කෙරෙහි මහජනතාවගේ අවධානය යොමු කරවන්න. ඒ නිසා අපි එළියට ආවා. නමුත්, ඒකෙන් අදහස් වෙන්නේ නැහැ, මේ රටේ මිනිස්සුන්ට අනර්ථයක් කරන තැනක අපි ඉන්නවා කියලා. ඒ නිසා මේ රජයට මේ වැඩ පිළිවෙළ සමනය කරන්න අවශ්‍ය සහයෝගය අපි ලබා දෙනවා කියලා නැවතත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු උදයන කිරිඳිගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.20]

**ගරු උදයන කිරිඳිගොඩ මහතා**
(மாண்புமிகு உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ ක්ෂේත්‍රයටත්, ඒ වාගේම කම්කරු නීතිය තුළටත් විශේෂ සංශෝධන කීපයක් ගෙන ඒම සම්බන්ධයෙන් කථා කරන්න මටත් අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ රටේ නීතිය ක්‍රියාත්මක වීමේ ප්‍රමාදය සම්බන්ධයෙන් අපි හැම දාම කථා කරනවා. ඒක හැම දාම අපේ රටේ ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබුණා. මම පසුගිය සතියේ මහනුවර අධිකරණයක ඉන්නකොට දැක්කා, එක නඩුවක් ජනවාරි මාසයට කල්යනවා; තවත් නඩුවක ඊළඟ දිනය පෙබරවාරි මාසයට කල්යනවා.

රටේ ආර්ථික ප්‍රශ්න, ගැටලු මේ සියල්ලම තිබෙනකොට, මෙසේ නඩු කල් යාම ජනතාවට විශාල ප්‍රශ්නයක්. එය නඩු කියන්නන්ට විශාල ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. මා පළමුවෙන්ම අපේ හිටපු මුදල් අමාත්‍ය ජනාධිපති නීතිඥ අලි සබ්රි මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා අධිකරණ අමාත්‍යවරයා විධියට වැඩ භාරගත්තාට පස්සේ විශේෂ කමිටු පහක් පත් කර අධිකරණ ක්ෂේත්‍රයේ ඇති විය යුතු සංශෝධන සම්බන්ධව විශාල අවධානයක් යොමු කළා. ඒ තුළින් තමයි මේ නඩු කල් යාම සම්බන්ධයෙන් තිබෙන්නා වූ අඩු පාඩු මොනවාද කියා හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන, සංශෝධන සහ අලුත් නීති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අවකාශය මේ පාර්ලිමේන්තුවට ලැබුණේ. ඒ වාගේම වර්තමාන අධිකරණ අමාත්‍ය ජනාධිපති නීතිඥ විජයදාස රාජපක්ෂ මැතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. මොකද, අපි දැකපු දෙයක් තමයි, ආණ්ඩුවක් මාරුවෙනකොට, අමාත්‍යවරයා මාරු වෙනකොට, රාජ්‍ය අමාත්‍යවරයා මාරු වෙනකොට කලින් තිබුණු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නේ නැහැ කියන කාරණය. එහෙම වුණාම කලින් තිබුණු දේවල් අමතක කරලා අලුත් දේවල් ක්‍රියාත්මක කරන්න උත්සාහ කරනවා. හැබැයි, ඒකෙන් රටට වන විනාශය දකින්නේ නැහැ. නමුත්, වර්තමාන අධිකරණ අමාත්‍යවරයා ඒ සංකල්පයෙන් බැහැරව ගොස් ඒ ප්‍රතිපත්තිය තුළ ම ක්‍රියාත්මක වෙමින් මේ රටේ අධිකරණ ක්ෂේත්‍රයට වැදගත් සංශෝධන ගෙන ඒම සඳහා සිය දායකත්වය දැක්වීම අපි අගය කළ යුතුයි.

අද මේ ගරු සභාවට සිවිල් නඩු විධාන සංග්‍රහය පනත් කෙටුම්පතට අදාළව සංශෝධනයක් ඉදිරිපත් කළා. මේ රටේ අධිකරණවල නඩු විභාග කිරීමේදී විත්ති පක්ෂයත්, පැමිණිලි පක්ෂයත් විසින් පිළිගන්නා ලද යම්කිසි ලේඛනයක් ගැන හබ නොකළ යුතුයි යන්න පසුගිය කාලයේ නඩු තීන්දු කිහිපයකින් තර්කයට බඳුන් වෙලා තිබුණා. මේ ගැටලුකාරී තත්ත්වය නිරාකරණය කර ගැනීම සඳහා තමයි අද එම සංශෝධනය ඉදිරිපත් කළේ. ඒ අනුව, නඩුවේ විරුද්ධ පාර්ශ්වය සහ පැමිණිලිකාර පාර්ශ්වය එකඟතාවට පත් වෙනවා නම්, අදාළ ඔප්පුව සම්බන්ධයෙන් නැවත නොතාරිස්වරු සහ සාක්ෂිකාරයෝ කැඳවා අනවශ්‍ය විධියට අධිකරණයේ කාලය වැය කිරීමේ අවශ්‍යතාවක් මතු වන්නේ නැහැ.

අද කම්කරුවන් සම්බන්ධයෙන් වූ නඩු 16,000ක් පමණ මහෙස්ත්‍රාත් අධිකරණයේ ගොනුවෙලා තිබෙනවා. කම්කරු විනිශ්චය සභාවල කාලය ඒ සඳහා යොදා ගැනීම වෙනුවෙන් වන වැදගත් පනත් කෙටුම්පතක් මේ මොහොතේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. මේවායෙන් සිදු වන්නේ යුක්තිය ඉටු කර ගැනීම සඳහා ජනතාවට අනවශ්‍ය ලෙස කාලය වැය කිරීමට සිදුවීම අඩු කර ගැනීමයි. මම මුලින්ම කිව්වා වාගේ ආර්ථික තත්ත්වය එක්ක පීඩාවට පත්වෙලා ඉන්න, ඒ වාගේම මේ සමාජ අර්බුද හමුවේ පීඩාවට පත්වෙලා ජනතාවට -නඩු කියන්නන්ට- මේ මඟින් විශේෂ සහනයක් ලැබෙනවා

අපි දන්නවා, වර්තමාන දේශපාලන අර්බුදය, සමාජ අර්බුදය සහ ආර්ථික අර්බුදය ගැන කථා නොකර කිසිම දෙයක් සම්බන්ධයෙන් අපට කථා කරන්න හැකියාවක් නැති බව. අපි කථාවක් අහලා තිබෙනවා, පොඩි කාලයේ බල්ලා ගැන රචනාවක් ලියද්දී මැක්කා ගැන ලියාගෙන ගිය හැටි. ඒ වාගේ, අදත් කථා කරද්දී අපට ආර්ථික අර්බුදය, සමාජ අර්බුදය සහ දේශපාලන අර්බුදය ගැන කථා කරන්නටම සිදු වෙනවා. අපි දේශපාලන අර්බුදය එක් ආකාරයකින් විග්‍රහ කළොත්, එය අවුරුදු ගණනක් තිස්සේ ආපු අර්බුදයක් එකතු වීමක ප්‍රතිඵලයක් විධියට දක්වන්න පුළුවන්. මේ ගැන තර්ක විතර්ක තිබෙන්නට පුළුවන්. හැබැයි, ඒ එක්කම මේ පාර්ලිමේන්තුවේ සිටින අපි 225දෙනාම මේ අර්බුදයේ වර්තමාන භාරකරුවන් විධියට චූදිතයන් වෙලා සිටින අවස්ථාවක්, මේක. මේ විශාල ආර්ථික අර්බුදය ගැන විග්‍රහ කිරීමේදී, ලොකු ප්‍රපාතයක් හරහා මහා විශාල ගලක් පහළට පෙරළිලා එන අවස්ථාවක් විධියට විග්‍රහ කරන්නට මම කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගල පෙරළී පෙරළී පහළට ගියොත්, ඒක පහළටම එනකොට විශාල විනාශයක් සිදු කරමින් වටපිටාවේ තිබෙන ගස්, ගල්, ගොඩනැඟිලි සියල්ලම දෙදරවාගෙන තමයි යන්නේ. හැබැයි, මුල් අවස්ථාවේ ම මේ ගල නවත්වාගන්න අපි ඔක්කෝටම එකතු වෙලා ශක්තිය යොදන්න පුළුවන් නම්, ටික කාලයකින් මේක නැවතත් තිබුණු තැනටම ගෙනයන්න හැකියාව ලැබෙයි කියා මා සිතනවා. ඒ සඳහා තමයි පසුගිය අප්‍රේල් මාසයේ මේ පාර්ලිමේන්තුව තුළ අනවශ්‍ය සංවාද, විසංවාද ක්‍රියාත්මක වෙද්දී අපි දහදෙනෙක් එකතු වෙලා ඉල්ලීමක් කළේ, "අපි සර්ව පාක්ෂික ආණ්ඩුවකට යමු. සියලුදෙනා ම එකතු වෙලා මේ ආර්ථික අර්බුදය අපේ කර මතින් අරගෙන ගිහිල්ලා ආර්ථික අර්බුදයෙන් රට ගොඩගැනීමේ මාවතට පිවිසෙමු" කියලා. ඒ සම්බන්ධයෙන් අද උදේත් තර්ක විතර්ක කළා. ඇත්තටම ඒක කනගාටුදායක තත්ත්වයක්.

මේක, අපි ඇතුළු මිලියන 22ක ජනතාව අද මුහුණපාන මේ කනගාටුදායක, අර්බුදකාරී තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා යන ගමනක පියවරක් විය යුතුයි. මෙතැනදී තර්ක විතර්ක කරන්න අවශ්‍ය නැහැ. අපි සියලුදෙනා එක්කාසු වෙලා කටයුතු කිරීමයි කළ යුත්තේ.

ඉදිරියටත් අපට බලාපොරොත්තු විය හැකි ඉන්ධන අර්බුදය, ගෑස් අර්බුදය, ඖෂධ හා ආහාර අර්බුදය විසඳා ගන්න නම් විදේශයන්ගෙන් මිලදී ගැනීම් සඳහා අවශ්‍ය වන ඩොලර් ප්‍රමාණය සුරක්ෂිත කර ගැනීමට අවශ්‍ය වනවා. ලංකාවට ඩොලර් ලැබෙන මාර්ග ඉතා සීමාසහිතයි; විදේශ විනිමය ලැබෙන මාර්ග ඉතා සීමාසහිතයි. මේ ආදායම් මාර්ග අපි වර්ධනය කළ යුතුයි වාගේම වර්තමානයේ රටට විදේශ විනිමය ලැබීමට ඇති බාධා ඉවත් කළ යුතුයි. මේ වර්ජන, තර්ජන, මර්දන, අරගළ යනාදී සියල්ලේම සාධනීය ලක්ෂණ තිබෙනවා වාගේම, ඒවා තුළින් රටට එක ඩො ලරයක් හෝ ඒම ප්‍රමාද වනවා නම් අපේ දෙමව්පියන්ට, අපේ අහිංසක ජනතාවට තමයි රෝහලෙන් ගන්න තිබෙන බෙහෙත් පෙත්ත පවා ගන්න නොහැකි වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද එක්තරා පුවත් පතක මුල් පිටුවේ පළ වී තිබුණා, "මහනුවර ප්‍රදේශයේ ඉන්ධන හල් පාතාලයේ ග්‍රහණයට හසු වෙලා" යනුවෙන්. මේ ඉන්ධන අර්බුදයත් එක්ක මේ රටේ මිනිස්සු විශාල වශයෙන් ඉන්ධන හල් අසල එක්රොක් වෙද්දී, පාතාල කණ්ඩායම්, මැර කණ්ඩායම් යම් යම් ඉන්ධන හල්වලට ගොස් ඔවුන්ගේ බලය පාවිච්චි කරමින් තමන්ට අවශ්‍ය දේ කරනවා කියා දැන ගන්න ලැබී තිබෙනවා. රටේ ආරක්ෂක අංශ මැදිහත් වෙලා මේ වෙනුවෙන් විශේෂ පියවරක් ගත යුතුයි. මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියටයි මා මේ කාරණය කියන්නේ. ඒ පුවත්පත් වාර්තාවේ සඳහන් තොරතුරු සත්‍ය නම් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමේ වග කීම තිබෙනවා.

අපි පසුගිය කාල පරිච්ඡේදය තුළම කථා කළේ විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳවයි. සමහරු අහනවා, "ආර්ථික අර්බුදයක් තිබියදී දේශපාලන ප්‍රතිසංස්කරණ කුමට ද?" කියලා. හැබැයි, මේ රට දේශපාලනිකව ස්ථාවර කරන්න ඕනෑ. ඒ

[ගරු උදයන කිරිඳිගොඩ මහතා]

ස්ථාවර කිරීමත් එක්කම අන්තර්ජාතික විශ්වාසය දිනා ගන්න ඕනෑ. අන්තර්ජාතික විශ්වාසය දිනා ගන්න නම් සමාජය ස්ථාවර කරන්න ඕනෑ. මේ සියල්ල එකම චක්‍රයක් විධියටයි ක්‍රියාත්මක වෙන්නේ. මේ කැරකෙන චක්‍රය එක තැනක හෝ නැවතුණොත් මුළු රටම නැවතත් මේ තිබෙන අර්බුදයේ පතුලටම කිඳා බහින බවත් මම කියන්න ඕනෑ.

මෙය, මේ රටේ දේශපාලන, ආර්ථික අර්බුදය හමුවේ ජනතාව ඉතා පීඩාවට පත් වෙලා ඉන්න අවස්ථාවක්; ජනතාව තමන්ගේ පීඩනය සුළු අත්වැරැද්දකදී පවා වැරදි ආකාරයකට මුදා හරින අවස්ථාවක්. ඒ නිසා මේ අර්බුද විසඳීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් තිබිය යුතුයි. මේ සඳහා ආණ්ඩුව ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ මොකක්ද කියන එක ගැන ජනතාව දැනුවත් විය යුතුයි; මේ පාර්ලිමේන්තුව දැනුවත් විය යුතුයි. එසේ නොමැතිව යම් යම් අවස්ථාවල යම් යම් තීන්දු තීරණ ගත්තාට ඒවා සමාජගත වෙන්නේ නැහැ; සමාජයට අවශ්‍ය පණිවිඩය යන්නේ නැහැ; සමාජයට අවශ්‍ය විශ්වාසය ලැබෙන්නේ නැහැ. සමාජයට විශ්වාසය ලැබීමත් එක්කමයි මේ අරගළයත් එක්ක සැබැඳුණු අර්බුදකාරී තත්ත්වය යම් පමණකට හෝ අඩු කිරීමට හැකියාව තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු උදයන කිරිඳිගොඩ මහතා**
(மாண்புமிகு உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද මේ අරගළය ගැන කථා කළොත්, මේ අරගළයේ සාධනීය ලක්ෂණ තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ අරගළය තුළින් මේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න පුළුවන් වෙලා තිබෙනවා. හැබැයි, මේ අරගළයේ කොටස් දෙකක් ඉන්නවා. එක් කොටසක් තමයි ස්වයත්තව තමන්ට දැනුණු වේදනාව, පීඩනය හේතුකොට ගෙන අරගළයට ආපු පිරිස. තවත් පිරිසක් ඉන්නවා දේශපාලනයෙන් ඔද්දල් වෙලා, දේශපාලන අරමුණු ඔස්සේ, ඒ උත්තේජනය ඔස්සේ ක්‍රියාත්මක වන. මේ තත්ත්වය අපි මැනවින් හඳුනා ගන්න ඕනෑ. මේ රටේ සුවහසක් වූ ජනතාවගේ හෙට දවස සුරක්ෂිත කිරීම සඳහා පවත්නා වූ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ, ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ මේ රට ඉස්සරහට යා යුතුයි. ඒ සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ පිළිබඳ හොඳ අවබෝධයක්, දැනුමක්, තේරුමක් තිබෙන අරගළයේ නායකයෝ මේ රට ඉස්සරහට ගෙන යාම සඳහා අවශ්‍ය දායකත්වය දැක්වීමෙන් තමයි අනාගතයේ දී මේ රට ඉස්සරහට ගෙන යන්න පුළුවන් system change එක කරන්න පුළුවන් වෙන්නේ.

ප්‍රකෝපකාරී ක්‍රියා තුළින්, අනවශ්‍ය ලෙස උද්දාමයට පත් වූ හැඟීම් තුළින් ආරක්ෂක අංශ සහ වෙනත් අය සමඟ ගැටුම් ඇති කරගෙන මේ අරගළය ජයග්‍රහණය කරන්න යනවාට වඩා, සාමකාමීව තමන්ගේ අරමුණු ඉස්සරහට ගෙන යාම සඳහා අවශ්‍ය ශක්තිය, ධෛර්යය දෙන්න ඔවුන්ට හැකියාව තිබෙනවා කියා මා විශ්වාස කරනවා.

මේ පාර්ලිමේන්තුව තුළ අපි කථා කරන ආකාරය, අපි කරන දේවල් දිහා ජනතාව හැම දාම බලාගෙන ඉන්නවා. අපට සමහර වෙලාවට මෙන්න මේක අමතක වෙනවා. උදේ ඉඳලා රූපවාහිනිය දිහා බලාගෙන, පාර්ලිමේන්තුවේ මොකක්ද වෙන්නේ කියන එක ගැන මනා අවබෝධයකින් යුතුව විමසීමෙන් බලාගෙන ඉන්න පිරිසක් මේ රටේ බිහි වෙලා තිබෙනවා. ඒ නිසා අපි හැම දාම කියනවා වාගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විනයගරුක හැසිරීම තුළින් ජනතාවට මේ මන්ත්‍රීවරු 225දෙනා ගැනම විශ්වාසය ජනිත කිරීම වැදගත් වෙනවා. ඒ නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විධියට අපට තිබෙන සමාජීය වගකීම මොකක්ද කියන එක අවබෝධ කරගෙන හැසිරුණොත් හෙට දවසේ මේ පාර්ලිමේන්තුව කෙරෙහි ජනතාවට විශ්වාසයක් ගොඩනැඟේවි. ඒ සඳහා අවශ්‍ය වන දායකත්වය ලබා දෙන්න කියන ඉල්ලීම කරමින්, මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.33]

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදේ වරුවේ මේ පාර්ලිමේන්තුවට ඉතාම වැදගත් නීති සංශෝධන දෙකක් ඉදිරිපත් කළා. විශේෂයෙන් අද අපරාධ නඩු විධාන සංග්‍රහය පනතට සංශෝධනයක් ගෙනාවා. ඒක ඉතාම වැදගත් සංශෝධනයක්. අපේ ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් තමයි එය ඉදිරිපත් කළේ. ඒ වාගේම මා හිතවත් අපේ කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය, මනූෂ නානායක්කාර මැතිතුමාත් ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා.

ඇත්තෙන්ම මේ පාර්ලිමේන්තුව තුළ උදේ ඇති වුණු ඒ සංවාදවලදී පාර්ලිමේන්තුවෙන් මොකක්ද කෙරෙන්නේ කියන කාරණය පිළිබඳව මතක් කිරීමක් කළා. දැන් අපි කථා කරන කම්කරුවන් සම්බන්ධ පනත් කෙටුම්පත ගත්තොත්, එය ඉතාම වැදගත් පනත් කෙටුම්පතක්. දැනටත් කම්කරු නඩු විශාල ප්‍රමාණයක් හිරවෙලා තිබෙනවා, විභාග කරගන්න බැරිව. ඒ පවුල් විශාල වශයෙන් අසරණ තත්ත්වයට පත් වෙලායි තිබෙන්නේ. ඒවාට ක්ෂණිකව විසඳුම් ලබාගත හැකි ක්‍රමවේදයක් තමයි අද ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පත හරහා සිදු වෙන්නේ. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ අපි ගත කරන කාලය තුළ අපේ රටේ නීති පද්ධතියේ පැහැදිලි වෙනස්කම් ඇති කරන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. පාර්ලිමේන්තුව - ව්‍යවස්ථාදායකය, නීති සම්පාදනය කරන තැන- හැටියට ඒ කාර්ය භාරය තමයි මේ ඉෂ්ට කරමින් සිටින්නේ.

මේ පාර්ලිමේන්තුවේ ඉඳගෙන තෙල් නැව් order කරන්න බැහැ. පාර්ලිමේන්තුව කියන්නේ ටෙන්ඩර් පටිපාටියට අදාළ වැඩකටයුතු කරන තැනක් නොවෙයි. ඒ නිසා අපේ රටේ ව්‍යවස්ථාදායකය තුළ කෙරෙන්නේ මොකක්ද කියන කාරණය පිළිබඳ වැරදි මතවාද රටට කියන්න යාම තුළින් තමයි සමාජය තුළ වැරදි මතයක් ගොඩ නැඟිලා තිබෙන්නේ. තමන්ගේ දේශපාලන ස්ථාවරත්වය ගොඩ නඟා ගන්න, තමන්ගේ පෞද්ගලික දේශපාලන පෞරුෂය ගොඩ නඟා ගන්න, එහෙම නැත්නම් ඉදිරි කාලය තුළදී ආණ්ඩු බලය ලබා ගැනීමේ අභිලාෂයෙන් විවිධ වැරදි දේවල් සමාජගත කරන්න යාම නිසා

තමයි "මේ මන්ත්‍රීවරු 225දෙනාම වැඩක් නැහැ, පාර්ලිමේන්තුව වැඩක් නැහැ" කියලා සාමාන්‍ය ජනතාව තුළ මතයක් ඇති වෙලා තිබෙන්නේ. පාර්ලිමේන්තුවේ ක්‍රියාදාමය, වැඩ පිළිවෙළ, කාර්ය භාරය මොකක්ද කියන එක හරියට පැහැදිලි කරගන්නේ නැතිව කථා කරන්න ගිහිල්ලා තමයි ඒ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ.

මේ රටේ ප්‍රශ්න විශාල ප්‍රමාණයක් තිබෙනවා. අද අපි කවුරුත් දන්නවා, මහජනතාව ඉන්ධන නැතිව, ගෑස් නැතිව පෝලිම්වල දුක් විඳින බව. අපි මහජන නියෝජිතයෝ හැටියට, ජනතාවත් එක්ක සම්පව කටයුතු කරන අය හැටියට, කටයුතු කරපු අය හැටියට ජනතාව විඳින දුක් වේදනා දැක්කාම අපටත් මානසිකව විශාල පීඩනයක් ඇති වෙනවා. අපි මේ ප්‍රශ්න විසඳන්න ඕනෑ. මේ රටේ මෙවැනි තත්ත්වයක් ඇති වුණේ අවුරුදු ගණනාවකට පසුවයි. මම අහලා තිබෙන විධියට 1953 දී මෙවැනි බරපතළ අර්බුද ගණනාවකට අපේ රටට මුහුණ දෙන්න සිදු වුණා. ඉන් පස්සේ මෙවැනි දැවැන්ත අර්බුදයකට මුහුණ දෙන අවස්ථාව මෙයයි. ඒ අතරතුර කාලයේත් ප්‍රශ්න ඇති වුණු බව ඇත්ත. කොටි ත්‍රස්තවාදය තිබුණා; තව ප්‍රශ්න ඇති වුණා. නමුත්, මේ වාගේ දැවැන්ත අර්බුදයකට අපට මුහුණ දෙන්න සිද්ධ වෙච්ච අවස්ථාව තමයි, මේ අවස්ථාව. මේ වාගේ දැවැන්ත අර්බුදයක රට ගිලෙන වෙලාවේ මේ පාර්ලිමේන්තුවේ සිටින සියලු දේශපාලන පක්ෂවලට එකට එකතු වෙලා වැඩ කරන්න බැරි නම් මොකක්ද අපේ දේශපාලනය? මේ සමහර අය මහජනතාව වෙනුවෙන් පෙනී සිටිනවා කිව්වාට කවුරු වෙනුවෙන්ද පෙනී සිටින්නේ? මහජනතාව දුක් විඳිනවාය කියමින් මෙතැනට ඇවිත් අපට අඬන්න පුළුවන්. හැබැයි, අඬලා, කෑගහලා, බෙරිහන් දෙනවාට වඩා අපි සාමූහික කැප කිරීමක් කරන්න අවශ්‍ය වෙලාවක්, මේක. නමුත් බොහෝ දෙනා ඒ කැප කිරීම කරන්නේ නැහැ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඔය සිටින බොහෝ අයට වඩා මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ආදරෙයි. අදටත් ආදරෙයි. හැබැයි, මේ අර්බුදයෙන් මේ රට ගොඩ ගැනීම සඳහා යම් දායකත්වයක් දිය යුතු නිසා තමයි මේ වෙලාවේ මේ තීන්දු, තීරණ අරගෙන කටයුතු කරන්නේ. ඒ නිසා ගරු විපක්ෂ නායකතුමා ඇතුළු අනෙකුත් පක්ෂ නායකයන්ට මම යෝජනා කරනවා, මේ අර්බුදයෙන් ජනතාව මුදා ගැනීම සඳහා අපි මාස තුනක්වත් එක කණ්ඩායමක් විධියට වැඩ කරමු කියලා. ඒ සඳහා එකතු වෙන්න කියලා මම එතුමන්ලාට ආරාධනා කරනවා. ඊට පසුව අපි පක්ෂ දේශපාලනය කරමු. අපේ පෞද්ගලික දේශපාලනය අපට ඊට පසුව කරන්න පුළුවන්. අපි මේ වෙලාවේ එතැනට එන්නේ නැතිව සිටිය යුතුයි. බලය ලබා ගැනීමේ අරමුණින් වෙනත් කාර්ය භාරවල නිරත වීම, තමන් ඊළඟට පාර්ලිමේන්තුවට එන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව විතරක් හිතලා කටයුතු කිරීම සුදුසු නැහැ කියන එක මම මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි.

විශේෂයෙන්, අද අපේ රටේ කම්කරු පන්තියේ විශාල පිරිසක් කම්කරු වෘත්තියේ යෙදෙමින් රටේ ජාතික අර්ථිකයට විශාල ශක්තියක් ලබා දෙන බව අපි දන්නවා. අද බරපතළ ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා, මේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්. ඒ ව්‍යාපාර පන්තිය කඩා වැටුණොත් අපේ රටේ ආර්ථිකයට දැවැන්ත පහරක් වදිනවා. එක් ව්‍යාපාරිකයකු වටා කම්කරුවන් විශාල පිරිසක්, නැත්නම් වැඩ කරන පන්තිය විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ අයට අද නොයෙකුත් ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. අපි ඒ පිළිබඳව මුදල් අමාත්‍යතුමා වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවධානය යොමු කරවනවා.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් ආරක්ෂා කර ගැනීමේ වැඩ පිළිවෙළ අපි අනිවාර්යයෙන්ම කළ යුතුව තිබෙනවා. විශේෂයෙන්ම බැංකු පද්ධතිය මඟින් ලබා දිය යුතු සහන ලබා දීලා ඒ පන්තිය ආරක්ෂා කරන්න කටයුතු කරන්න ඕනෑ.

අනෙක් අතට, අපේ රටට අද තිබෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි විදේශ විනිමය ප්‍රශ්නය. අපි දන්නවා, එක පැත්තකින් සංචාරක කර්මාන්තය හරහාත්, තවත් පැත්තකින් අපනයන හරහාත්, තවත් පැත්තකින් විවිධ ආයෝජන හරහාත් අපට විදේශ විනිමය ලැබෙන බව. ඒවාටත් වඩා -වැඩියෙන්ම- විදේශ විනිමය අපට ලැබෙන්නේ අපේ විදේශගත ශ්‍රමිකයන්ගෙන් ලැබෙන ශක්තිය තුළින්. ඒ නිසා විදේශගත ශ්‍රමිකයන් අපට ලබා දෙන ශක්තිය අගය කරනවා වාගේම රජය පැත්තෙන් ඔවුන්ට ලබා දිය යුතු පහසුකම් අපි ලබා දෙන්න ඕනෑ.

අපේ ගරු මනූෂ නානායක්කාර මැතිතුමා හොඳ දැක්මක් තිබෙන තරුණ නායකයෙක්. එතුමාත් මා වාගේම තමන්ගේ පෞද්ගලික දේශපාලනය පැත්තකින් තබා රට වෙනුවෙන් තීරණ ගත් කෙනෙක්. අද එතුමා අපේ විදේශගත ශ්‍රමිකයන්ගේ වගකීමත් භාරගෙන තිබෙන නිසා මා එතුමාට යෝජනා කරන්නේ, විශේෂයෙන්ම විදේශගත ශ්‍රමිකයන්ට ලබා දෙන පහසුකම් වැඩි කරමු කියලායි. මොකද, ඒ ජනතාව තමන්ගේ පවුලේ සාමාජිකයන් අත් හැරලා -තමන්ගේ බිරිඳගෙන් ඈත් වෙලා, තමන්ගේ දරුවන්ගෙන් ඈත් වෙලා- ගිහින්, සමාජ ප්‍රශ්න ගණනාවකට මුහුණ දීලා, විදේශ රටවලට ගිහින් දුක් විඳලා, මහන්සියෙන් උපයන ඩොලරයට සාමාන්‍ය ඩොලරයක වටිනාකමට වඩා වැඩි වටිනාකමක් අපි අනිවාර්යයෙන් ලබා දෙන්න ඕනෑ. ඔවුන්ට ලබා දෙන පහසුකම් අපි වැඩි කරන්න ඕනෑ. ඒ වාගේම ඔවුන් යම්කිසි භාණ්ඩයක් මේ රටට ගෙන එන්න සූදානම් වෙනවා නම්, ඒ සඳහා වෙනත් අයට ලබා නොදෙන වැඩි පහසුකමක් අපි ඔවුන්ට ලබා දෙන්න ඕනෑ. ගරු කම්කරු අමාත්‍යතුමනි, මා නම් හැම වෙලාවේම යෝජනා කරන්නේ, විදේශගත ශ්‍රමිකයන් අපේ රටට එවන ඩොලරයකට සාමාන්‍යයෙන් ගෙවන මුදලට වඩා වැඩි මුදලක් සේවා ඇගැයීමක් හැටියට සලකා අපි ඔවුන්ට දෙන්න ඕනෑ කියලායි. සාමාන්‍යයෙන් ඩොලරයකට ගෙවන්නේ රුපියල් 365ක් නම්, ඔවුන් මහන්සි වෙලා, කැප කිරීම් කරලා, අපේ රටට එවන ඩොලරයකට තව රුපියල් 10ක් දිරි දීමනාවක් හැටියට ගෙව්වත් පාඩුවක් නැහැ. මොකද, මේ රටේ තිබෙන ඩොලර් ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා ඔවුන් කරන කැප කිරීම වාගේම ඔවුන් ලබා දෙන ශක්තිය අපි අගය කරන්න ඕනෑ. මා විශේෂයෙන්ම ඒ පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා.

විවිධ රටවල ව්‍යාපාර කරන, ඒ වාගේම ශ්‍රමිකයන් හැටියට කටයුතු කරන අපේ ආදරණීය දෙමවුපියන්, සහෝදර සහෝදරියන් ඇතුළු සියලුදෙනාගෙනුත් මා ඉල්ලීමක් කරන්න කැමැතියි. මේ වෙලාවේ අපේ රට අර්බුදකාරී තත්ත්වයකයි තිබෙන්නේ. අපට අද තිබෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි, ඩොලර් හිඟය. ඒ නිසා, තමන් දහඩිය මහන්සියෙන් උපයන මුදල වෙනත් මාර්ගවලින් එවන්නේ නැතිව, ඒවා රට වෙනුවෙන් අපේ සාමාන්‍ය බැංකු පද්ධතිය හරහා එවලා ගෞරවාන්විත, ආඩම්බරකාර ශ්‍රමිකයකු බවට පත් වෙන්න කියලා අපි මේ වෙලාවේ ඒ සියලු දෙනාට ගෞරවයෙන් ආරාධනා කරනවා. නමුත්, විවිධ දේශපාලන පක්ෂ, විවිධ අය තම දේශපාලන අරමුණු මුදුන් පත් කරගැනීම සඳහා "උඹලා එවන ඩොලරය හොරකම් කරනවා. ඒ නිසා මේ රටට ඩොලර් එවන්න එපා" ආදි වශයෙන් වැරැදි මතවාද ගෙන ගිහින්, අද එතැනත් දේශපාලන වට පිටාවක් නිර්මාණය කර තිබෙන බව අපි දන්නවා. අපි මේ වෙලාවේ ඒ පිළිබඳව කනගාටු වෙනවා. විදේශගත අපේ ගෞරවනීය ශ්‍රමිකයන්ගෙන් අපි ඉල්ලා සිටිනවා, විශේෂයෙන්ම රටට අත්‍යවශ්‍ය මේ වෙලාවේ ඔබේ යුතුකම, වගකීම ඉටු කරලා ඔබ ගෞරවාන්විත ශ්‍රී ලාංකික පුරවැසියකු බවට පත් වෙන්න කියලා. මා ඒ ගෞරවනීය ඉල්ලීම මේ වෙලාවේදී කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය මේකයි. ඔබතුමාත් ආචාර්යවරයෙක්; ඉගෙන ගත් කෙනෙක්. අපි මේ

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

කාරණය සංවාදයට බඳුන් කරන්න ඕනෑ. 2010 ඉඳලා පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මා කියනවා, ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනවා මිස මේ මන්ත්‍රීවරුන් 225දෙනාට රටේ ආර්ථික තත්ත්වය පිළිබඳව පැහැදිලි කරන වැඩ මුළුවක්, සාකච්ඡාවක් මහ බැංකුවේ අධිපතිවරයා විසින් කිසිම අවස්ථාවක පවත්වා නැති බව. මහ බැංකුවේ අධිපතිවරයා වශයෙන් සිටි අය voice cut දෙන විට නම් කිව්වේ, "කිසි ප්‍රශ්නයක් නැහැ. ඩොලර් තිබෙනවා. ආර්ථිකය හොඳයි" කියලා. අපට ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙන්න පුළුවන් සීමාවක් තිබෙනවා. නමුත් මේ මන්ත්‍රීවරුන් සියලුදෙනා මේ රටට ආදරය කරන අය. ඇත්තටම මේ තත්ත්වයන් පිළිබඳව අප මීට කලින් දැනුවත් වුණා නම්, අපට තිබෙන අත් දැකීම් එක්ක සියලුදෙනා කැප කිරීම් කරලා, අපේ යෝජනා ඉදිරිපත් කරලා, ඒ වෙනුවෙන් ඉලක්කගත වැඩ පිළිවෙළට යන්න අපට හැකියාව තිබුණා. හැබැයි, මේ සම්බන්ධයෙන් තීන්දු ගන්නා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා, මුදල් මණ්ඩලයේ සාමාජිකයන්, මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා ඇතුළු නිලධාරින් ඉගෙන ගත් අය නොවෙයිද? කථාවක් තිබෙනවා නේ, "ගල් බනිස්" කිව්වාට ඒවායේ ගල් නැහැ, "මාළු බනිස්" කිව්වාට ඒවායේ මාළු නැහැ, "කිඹුලා බනිස්" කිව්වාට ඒවායේ කිඹුලෙකු නැහැ කියලා. එසේම, ආර්ථිකය ගැන දන්නා විශේෂඥයන්ට ආර්ථිකය හසුරුවන්න බැහැ වාගෙයි. මට තේරෙන්නේ එහෙමයි. ඒ අයට මේ අර්බුදය ගැන කලින්ම කියන්න තිබුණා. මොකද, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයාව සිටි ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මැතිතුමා මහත් විද්වතෙක්; උගතෙක්; ආචාර්ය උපාධි කීපයක්ම ලැබූ ආර්ථිකය පිළිබඳ විශේෂඥයෙක්.

ඊළඟට එම තනතුරට පත් වුණු මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මැතිතුමාත් ආර්ථිකය පිළිබඳ විශේෂඥයෙක්; ඒ වාගේම, දැනුමින් ඉතාම ඉහළ මට්ටමේ කෙනෙක්. ඒ වාගේමයි අජිත් නිවාඩ් කබ්රාල් මහත්මයාත්. එතුමාත් දැනුම අතින් සහ ආර්ථිකය පිළිබඳ විශාල පරිචයක් තිබෙන කෙනෙක්. ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන් සිටින අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මැතිතුමා පිළිබඳව අපට විශාල විශ්වාසයක් ගොඩ නැඟිලා තිබෙනවා. මා දන්නා පරිදි අතිගරු ජනාධිපතිතුමා නන්දලාල් වීරසිංහ මැතිතුමාගේ සේවා කාලය දීර්ඝ කරන්න තම අනුමැතිය ලබා දෙන්න තීරණය කර තිබෙනවා. මම ඒ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒක ඉතාම හොඳ තීරණයක්. අපි විශ්වාස කරනවා, නන්දලාල් වීරසිංහ මැතිතුමා මේ රටේ ආර්ථිකයේ පැහැදිලි හැරවුම් ලක්ෂ්‍යයක් සනිටුහන් කරන්න පුළුවන් නායකයෙකු බවට පත් වෙයි කියලා. මම ඉහතින් කියපු හැම කෙනාම උගත් අය. මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා ගත්තත් එහෙමයි. මෙතෙක් හිටපු ඒ නිලධාරින් සියලු දෙනා ආචාර්ය උපාධි, මහාචාර්ය උපාධි ගත්තු, ආර්ථිකය පිළිබඳව දැවැන්ත අවබෝධයක් තිබුණු කණ්ඩායමක්. එහෙම නම්, ඒ කණ්ඩායම මේ අර්බුදකාරී තත්ත්වය හරියාකාරව අපට එළි දැක්වූයේ නැත්තේ ඇයි කියන ප්‍රශ්නය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපට තිබෙනවා. පාර්ලිමේන්තුවේ සභාගත කළ ඇතැම් මහ බැංකු වාර්තා අරගෙන ගිහින් අපි විවිධ තැන්වල, විවිධ සංවාදවලට යොමු වෙලා තිබෙනවා. හැබැයි, පසුව බැලුවාම ඒ මහ බැංකු වාර්තාවල තිබුණු කරුණු අතර අසත්‍ය තොරතුරුත් වාර්තා කර තිබෙන බව පෙනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කියන්න යන කාරණය මම මීට කලිනුත් පාර්ලිමේන්තුවේදී කිව්වා. ඔබතුමා මඟින් ගරු කථානායකතුමාටත්, මුදල් ඇමතිවරයා හැටියට කටයුතු කරන ගරු අග්‍රාමාත්‍යතුමාටත් මම යෝජනා කරනවා, මාස තුනකට සැරයක්වත් -වියදම් කරන්නේ නැතිව- මහ බැංකු අධිපතිතුමායි, මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමායි මේ පාර්ලිමේන්තුවට ගෙන්වා රටේ ආර්ථිකයේ ඇත්ත තත්ත්වය ගැන අපට කියන වැඩ පිළිවෙළක් හදන්න කියලා. ඒ ගැන අපිත් එක්ක සාකච්ඡාවක් කරන්න කියන්න. ඒ පිළිබඳව අපව දැනුවත් කරනවා වාගේම, විධිමත් සංවාදයක් ගොඩ නැඟීමත් කළ යුතුව තිබෙනවා. මාස තුනකට වතාවක් බැරි නම්, මාස හයකට වතාවක් හෝ එය කරන්න. මේ පාර්ලිමේන්තුවේ ඒ සඳහා ඕනෑ තරම් ඉඩ කඩ තිබෙනවා. වියදම් කරන්නේ නැතිව, උත්සව පවත්වන්නේ නැතිව ඒ කාරණය පිළිබඳව පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225දෙනාම දැනුවත් කරන්න.

ඊළඟ, කාරණය මෙයයි. මම අද උදේත් මේක මතක් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපට පොත් කට්ටල රාශියක් ලබා දෙනවා. මේවා සමාන්‍යයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. හැබැයි, මන්ත්‍රීවරු 224 දෙනාටම ලබා දී තිබෙන මේ පොත් කට්ටල ආදිය එකතු කළාට පස්සේ 10x10 කාමරයක් සම්පූර්ණයෙන් පුරවන්න පුළුවන්. නමුත් මා කියන්නේ, අපි අථ්‍යා සන්නිවේදන ක්‍රම පාවිච්චි කරමු කියලා. අපට පුළුවන් ඒ සඳහා නවීන තාක්ෂණය භාවිත කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් එක විනාඩියක් ලබා දෙන්න.

සමහර මන්ත්‍රීවරුන්ට සමහර වාර්තා ඕනෑ නැති වෙන්න පුළුවන්. හැබැයි, අදාළ ගැසට් නිවේදනයක් නම් අනිවාර්යයෙන් table කරන්න ඕනෑ; පනත් කෙටුම්පත් table කරන්න ඕනෑ. ඒවා එහෙම කළාට ප්‍රශ්නයක් නැහැ. නමුත්, මේ අතිවිශාල පොත් ප්‍රමාණය CDs ලෙස හෝ මන්ත්‍රීවරුන්ට ලබා ගත හැකි වෙනත් ක්‍රමයක් පාවිච්චි කරලා ලබා දුන්නොත් මේ සිදු වන අතිවිශාල කඩදාසි නාස්තිය වළක්වා ගන්න අපට පුළුවන්. අද කඩදාසි පිළිබඳ විශාල ප්‍රශ්නයක් තිබෙන නිසා, එම නාස්තියත් අවම කරගැනීම කෙරෙහි අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ යෝජනා දෙක, අප නිතරම සාකච්ඡා කළ යෝජනා. මගේ දැනුම අනුව, ද්‍රව්‍යමය වශයෙන් මුද්‍රණය කර නිකුත් කරන මේ දැනුම ඉදිරි කාලයේදී පාර්ලිමේන්තු වෙබ් අඩවියෙනුත්, වෙනත් ක්‍රමවලිනුත් මුද්‍රිත නොවන ආකාරයට, එනම් මෘදු ආකාරයට බාගත කර ගන්නට පුළුවන් වන විධියේ කටයුත්තක් සිදු කරමින් පවතිනවා.

මීළඟට, ගරු නිමල් පියතිස්ස මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)
මට විනාඩි 15ක් තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මට දී තිබෙන ලේඛනය අනුව ඔබතුමාට විනාඩි 10 යි තිබෙන්නේ.

[අ.භා. 2.47]

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොහොතේ පැවැත්වෙන්නේ ශ්‍රමිකයන්ට අදාළ කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයයි. ඒ කටයුත්ත භාරව ඉන්න නවක අමාත්‍යතුමා මේ විවාදය හරහා උත්සාහ ගන්නවා, ශ්‍රමිකයන්ට අදාළ අභියෝගවලට ගැළපෙන ආකාරයට යම් යම් සංශෝධන කර ගැනීමට. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා, එය විවාදයට ගන්නා මේ මොහොතේ අප කැමැති වුණත්, අකැමැති වුණත් අපට සිදු වෙලා තිබෙනවා, මේ රට තුළ මතු වෙලා තිබෙන ව්‍යාකූල තත්ත්වයත් එක්ක ගළපමින් මේ විෂයයට අදාළ කරුණු ඉදිරිපත් කරන්න.

පාර්ලිමේන්තුව කියන්නේ, අණ පනත් සංශෝධනය කරන, අණ පනත් සම්මත කරන ස්ථානය බව අපි දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පාර්ලිමේන්තුව කියන්නේ ජාතික සැලසුම් සම්පාදනය කරන, නීති-රීති සකස් කරන, සම්මත කරන, ප්‍රතිපත්ති සම්පාදනය කරන ස්ථානය. අපි ප්‍රාථමික අධ්‍යාපනයෙන් ද්විතියික අධ්‍යාපනයට යනකොට අපේ රටේ පාර්ලිමේන්තුව සම්බන්ධව අපි ඉගෙන ගත්තේ එහෙමයි. අපි දේශපාලන විද්‍යාව කරනකොට ලෝකයේ විවිධ රටවල දේශපාලන ස්වභාවයන්, විවිධ දේශපාලන ක්‍රම පිළිබඳව ඉගෙන ගත්තා. අපේ රටේ ඉතිහාසය සහ අපේ රටේ දේශපාලනය පිළිබඳව ඉගෙන ගනිද්දි අපි පාර්ලිමේන්තුව පිළිබඳව අවබෝධ කර ගත්තේ ඒ විධියට. හැබැයි, මම අර ඉස්සෙල්ලා කියපු විෂයගත කරුණු පිළිබඳව බැලුවොත්, අපි මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න ආවාට, මේ රටේ අනාගතය වෙනුවෙන් විද්වත් සාකච්ඡා හරහා ඔය කියන ආකාරයටම කටයුතු සිද්ධ වෙනවාද, ඒ ආකාරයෙන්ම කටයුතු සිද්ධ වෙන්න අවශ්‍ය කරන ප්‍රඥාව -බුද්ධිය- , උගත්කම, අත්දැකීම්, ප්‍රායෝගික අත්දැකීම් තිබෙන අයමද ඉතිහාසය පුරාවට මේ පාර්ලිමේන්තුව නියෝජනය කළේ කියන එක වත්මන් සමාජය හමුවේ ප්‍රශ්නාර්ථයක් විධියට තිබෙනවා. ඒ වාගේම මේ පාර්ලිමේන්තුව හරහා සමාජය ප්‍රතිනිර්මාණය කිරීම; සමාජය අනාගතයට ගැළපෙන විධියට පරිවර්තනය වීම අපේක්ෂා කරනවා; එය අපේක්ෂා කළා. හැබැයි දීර්ඝ කාලයක් තිස්සේ මේ උත්තරීතර සභාව පාවිච්චි වුණේ අර මම කියපු කරුණුවලට වඩා, මේ රටේ ඇති හැකි අයගේ වාණිජ වුවමනා වෙනුවෙන්. ඒ වාණිජ වුවමනා පෙරදැරි කරගෙන තමයි මේ රටේ මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන අති බහුතරයක් ඉතිහාසය පුරාවටම කටයුතු කර තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් පවතින අභියෝගයට ගැළපෙන විධියට ශ්‍රමිකයන්ට අදාළව නවීකරණය වෙන්න ඕනෑ ගොඩක් දේවල් තිබෙන බව අපි දන්නවා. රාජ්‍ය පාලනය, දේශපාලනය විතරක් නොවෙයි, කෘෂිකර්මාන්තයේ ඉඳලා, අධ්‍යාපනයේ ඉඳලා, රාජ්‍ය සේවකයාගේ ඉඳලා මුළු මහත් රටේම විෂයගත සියලු දේවල් රටට උචිත විධියට, මහ පොළොවට උචිත විධියට, රටේ අනාගත පරම්පරාවට උචිත විධියට ප්‍රතිනිර්මාණය වෙන්න ඕනෑ; පරිවර්තනය වෙන්න ඕනෑ. අද මේ රටේ මේ දැවැන්ත අර්බුදය නිර්මාණය වෙන්න බලපෑවේ ඉතිහාසය පුරාවටම අපි ඒ බලාපොරොත්තු වෙච්ච ප්‍රබුද්ධයන් -ප්‍රඥාව තිබුණු අය-, නිවැරදි විධියට දේශපාලනය ඇඟේ තිබිච්ච අය වෙනුවට වෙනත් අය දේශපාලනයට පැමිණීමයි. බොහෝ අය දේශපාලනය කළේ, වාණිජ වුවමනා වෙනුවෙන්. ඒ වාණිජ වුවමනා වෙනුවෙන් දේශපාලනයට ආපු අය නිසා අපි ලබපු අවාසනාවන්ත අත්දැකීම් කොච්චර තිබෙනවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කිව්වේ පනත් සංශෝධනය කරන, නව පනත් සම්මත කරන, නීතිරීති සම්මත කරන, ප්‍රතිපත්ති සම්පාදනය කරන, ජාතික වැඩ පිළිවෙළ සම්පාදනය කරන ආයතනය ගැනයි. ඉතිහාසය පුරාවටම ආණ්ඩු එනවා, යනවා. හැබැයි කොයි ආණ්ඩුව ආවත්, ඇමතිකම්වල අඛණ්ඩව සිටින අයත් ඉන්නවා. ඒ නිසා අපි ආපස්සට හැරිලා බලලා ඒ අයගෙන් විමසුවොත්, -ප්‍රශ්න කළොත්- ඒ අයගෙන් මේ සමාජයට අත්පත් වෙලා තිබෙන ඵලදායක යෙදවුම මොකක්ද කියලා, එහෙම එකක් ගැන අපිට දැනගන්න ලැබෙන්නේ නැහැ. හැබැයි ඔවුන්ගේ පෞද්ගලික ජීවිත විතරක් නොවෙයි, ඔවුන්ගේ හත්මුතු පරම්පරාවම ගොඩ ගියා, අපිට වැරදුණා. ඒ අය රජ වුණා, අපිට වැරදුණා. මේ ආකාරයේ අමිහිරි අත්දැකීම් අද මුළුමහත් සමාජය පුරාම තිබෙනවා. වසර 74ක කාල පරිච්ඡේදයක් පුරා විවිධ නායකයන් විසින් අපේ රට පාලනය කළා. ඒ වාගේම, විවිධ ආණ්ඩු බිහි වුණා. කොයි ආණ්ඩුව ආවත් අඛණ්ඩව ඇමතිකම් දරන අයත් සිටිනවා. මේ ඔක්කොම එකට එකතු වෙලා කරලා තිබෙන්නේ මේ රට යහ මඟට අරගෙන යන එක නොවෙයි; මේ රටේ ආර්ථිකය හදපු එක නොවෙයි; මේ රටේ ජාතික සැලසුම් හදපු එක නොවෙයි; මේ රටේ අණපනත් නිවැරදි ලෙස සම්මත කර ගැනීම නොවෙයි; මේ රටට ගැළපෙන ප්‍රතිපත්ති සම්පාදනය කර ගැනීම නොවෙයි.

ඒ නිසා තමයි අද මුළුමහත් සමාජයේ දැවැන්ත කඩා වැටීමක් තිබෙන්නේ; කලකිරීමක් නිර්මාණය වෙලා තිබෙන්නේ. කාලාන්තරයක් තිස්සේ පවතින මේ වැරදි ආර්ථික ක්‍රමය - ලිබරල් පන්නයේ ආර්ථික ක්‍රමය- නිසා, විවෘත ආර්ථිකය නිසා, මුළුමහත් සමාජ ක්‍රියාවලිය බිඳ වැටුණා. දේශීය නිෂ්පාදනය ඇනහිටින තත්ත්වයට පත් වුණා. මේ මහ පොළොවේ ඕනෑම තැනකට බීජයක් විසි කළොත් ඒක පැළවෙලා, වැඩිලා, ඒ අස්වැන්න රටේ ජනතාවට ප්‍රයෝජනයට ගන්න පුළුවන් විධියට; පරිභෝජනයට ගන්න පුළුවන් විධියට එය වර්ධනය වෙනවා. ඒ සඳහා අවශ්‍ය කරන පාරිසරික සාධක මේ මහ පොළොව මත තිබෙනවා. මේ මහ පොළොවේ හැදෙන්නේ නැති දෙයක් නැහැ. මේ රටේ ජනතාව විතරක් නොවෙයි, වෙනත් විවිධ රටවල පුරවැසියන් පවා ජීවත් කරවන්න පුළුවන් මහ පොළොවක් තිබෙන රටක්, මේක. ඒ නිසායි අතීතයේදී, "පෙරදිග ධාන්‍යාගාරය", "පෙරදිග ලෝකයේ බබළන මුතු ඇටය" කියලා ලංකාවට කිව්වේ. හැබැයි, මෙවැනි දැවැන්ත, සංකීර්ණ අර්බුදයකට රට පත් කිරීම පිළිබඳව, ඒ අභිමානවත් ශ්‍රී ලංකා භූමියේ 1948 නිදහසින් පසු නිර්මාණය වෙච්ච හැම ආණ්ඩුවක්ම වග කියන්න ඕනෑ. හැබැයි, ඒ අතරේ හොඳ අය ඉන්නවා; හොඳ වැඩ කරපු අය ඉන්නවා; යමක් කරන්න උත්සාහ ගත් අය ඉන්නවා. අතීතයේ - විශේෂයෙන්ම 1977ට කලින් - සංවෘත ආර්ථික ක්‍රමයක් තිබුණු බව අපි දන්නවා. ඒ ක්‍රියාන්විතය ඇතුළේ සිටි යම්කිසි ආදර්ශවත් දේශපාලන චරිත අපි දකිනවා. එතැනින් පසුවත් අපි එවැනි අය නොදකිනවාම නොවෙයි. කලාතුරකින් අපි එවැනි අය දකිනවා. මේ පාර්ලිමේන්තුවේ සිටින ඔක්කෝම හොරු නොවෙයි; 225දෙනාම හොරු නොවෙයි. ඔක්කොම එහෙමයි කියනවාට අපි විරුද්ධයි. අපිත් ප්‍රාදේශීය සභාව නියෝජනය කරලා, පළාත් සභාව නියෝජනය කරලා, පළාත් සභා ඇමති ධුර නියෝජනය කරලා තමයි පාර්ලිමේන්තුවට ආවේ. දීර්ඝ කාලයක් තිස්සේ බිම් මට්ටමේ සිට විවිධ විධියේ අත් දැකීම්, සමාජ අත් දැකීම් අපි ලබා තිබෙනවා. ගොවියා ජීවත් වෙන්නේ කොහොමද, ධීවරයා ජීවත් වෙන්නේ කොහොමද, ශ්‍රමිකයා ජීවත් වෙන්නේ කොහොමද, කම්කරුවා ජීවත් වෙන්නේ කොහොමද, වෙනත් විවිධ තලයේ විවිධ තරාතිරම්වල අය ජීවත් වෙන්නේ කොහොමද

[ගරු නිමල් පියතිස්ස මහතා]

කියන එක පිළිබඳව තැපැල් මාර්ගිකව නොවෙයි, සජීවී ලෙස ප්‍රායෝගිකව අත් දැකපු මහජන නියෝජිතයන්, අපි. අපි ප්‍රාදේශීය සභාවල, පළාත් සභාවල, පළාත් සභා ඇමති ධුරවල ඉඳලා තිබෙනවා. ඒ කිසිම දවසක අපි අපේ දේශපාලන චරිතය කිලිටි කරගත්තේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි. නමුත්, ඔබතුමාට තව විනාඩි දෙකක් වැඩිපුර දෙනවා.

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු උද්දික ප්‍රේමරත්න මන්ත්‍රීතුමාගේ කාලයත් මට ගන්න කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි.

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විධියේ විවිධ අත් දැකීම් අරගෙන තමයි අපි පාර්ලිමේන්තුවට ආවේ. අපි විටෙක විපක්ෂයේත්, විටෙක ආණ්ඩුවේත් සිටියා. හැබැයි, අපි ආණ්ඩුවේ සිටියත් ආදර්ශවත් විධියට කටයුතු කර තිබෙනවා. විපක්ෂයේ සිටියත් විපක්ෂයේ කාර්ය භාරය ඉෂ්ට කර තිබෙනවා. කොතැන සිටියත් අපි ජනතාවගේ ඇස්වලට වැලි ගහලා නැහැ. ඇමතිකම මත බලය පාවා දීම් කර නැහැ. අපේ මුළු දේශපාලන ඉතිහාසයම අපි කිලිටි කරගෙන නැහැ. ඒ වාගේම අපි කිසිම තැනක දේශපාලන වශයෙන් කළු පැල්ලම් ගා ගෙන නැහැ. මේ පාර්ලිමේන්තුව තුළ එහෙම හොඳ චරිත ඉන්නවා. එහෙම වැදගත් චරිත මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. මම මීට පෙර කිව්වා වාගේ, හද්දා පිටිසර ඇත ගොවි ගම්මාන, ගැමි ගම්මාන නියෝජනය කරමින් ආ මන්ත්‍රීවරුන් විශාල පිරිසක් අද මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. මම කියපු විධියට, විවිධ වාණිජ ව්‍යවමනාවන් වෙනුවෙන්, විවිධ ලාභ ලැබීම්, බලය, තනතුරු අපේක්ෂාවෙන් ආපු අය නම් විවිධ විධියේ අගතිගාමී කටයුතුවල නිරත වෙලා සිටින බව අපි දන්නවා. සමහර අය සම්බන්ධයෙන් අපේත් එහෙම විවේචන තිබෙනවා. නමුත්, පාර්ලිමේන්තුව ඇතුළේ සිටින 225දෙනාටම තමයි මහජනයා චෝදනා එල්ල කරන්නේ.

නමුත්, ඒ 225දෙනා වෙන් කළොත් මා කලින් කියපු ආකාරයට blacklist වෙච්ච චරිත, එහෙම නැත්නම් කළු චරිත මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඒ අය තමයි, මේ රටේ සිදුවන විනාශයට වැඩියෙන්ම වග කියන්න ඕනෑ. හැබැයි, ඒ අය ප්‍රසිද්ධියේ ඒ වගකීම බාර ගත්තේ නැති වුණාට, ඒ අයට සොබා දහමින් දඬුවම් ලැබෙනවා. ඒ නිසා මොන පම්පෝරිය, මොන කයිවාරුව ගැහුවත් අපි බලන්නේ යෙදවුම හා ඵලදායක ප්‍රතිචාරය පිළිබඳවයි. ඒ වාගේම අපි බලන්නේ එහි input එක සහ output එක පිළිබඳවයි. යොදවා තිබෙන යෙදවුමට සාපේක්ෂව හෝ නිරපේක්ෂව මේ රටේ මහ ජනයා ලබා ගත් ප්‍රතිඵල ගැන කථා කළොත්, ගත වෙච්ච මුළු කාලය පුරාවට දක්නට තිබෙන්නේ ඉතා අවාසනාවන්ත තත්ත්වයක්. කෙසේ වෙතත්, අපි කැමැති වුණත්, අකැමති වුණත් ඉතිහාසය පුරාවට දේශපාලන වශයෙන් අපෙන් වෙච්ච අඩුපාඩුකම් පිළිබඳව දැන් අපට ආපස්සට හැරිලා බලන්න සිදු වෙලා තිබෙනවා.

මේ වනකොට ජනතාවට සතුටු වෙන්න පුළුවන් තත්ත්වයක් මේ රට තුළ නැති බව අපි දන්නවා. 1934, 1935 වාගේ අවුරුදු වනකොට මේ රට තුළ ලංකා සමසමාජ පක්ෂය තිබුණා. හැබැයි, අද වනකොට දේශපාලන පක්ෂ සියයකට වඩා තිබෙනවා කියා මා හිතනවා. ඒවා තුළින් මේ රටේ ජනතාවගේ ආර්ථිකය හදලා අනාගත පරම්පරාව සුරක්ෂිත කරනවා වෙනුවට වෙච්ච දේ මොකක්ද? බලය මත පදනම් වෙලා විවිධ විධියට ජාතිවාදී පක්ෂ, ආගම්වාදී පක්ෂ, පවුල්වාදී පක්ෂ හැදුණා. රටට නොගැළපෙන අන්දමින්, රටට බරක් ඇති වන විධියට මහ පොළොව නුහුලන ආකාරයේ කටයුතු ගොඩක් ඒ මඟින් සිදු වෙලා තිබෙනවා. වාණිජ ව්‍යවමනා වෙනුවෙන් වැරැදි ආර්ථික ක්‍රමයක් පවත්වාගෙන ඇවිල්ලා, ඒ තුළින් හම්බ කර ගත් මුදල් කාබාසිනියා කළ අය අද වනකොට, හතර ගාතෙන් ඇද වැටුණු, අරාජික, අර්බුදයෙන් අර්බුදයට පත්වූ, පතුලක් නොපෙනෙන අගාධයකට වේගයෙන් ඇද වැටෙන තත්ත්වයක් මේ රට තුළ නිර්මාණය කර තිබෙනවා.

අද වනකොට අපේ සමාජය ව්‍යාකූල වෙලා තිබෙනවා. අද අපේ සමාජය තුළ අසහනය නිර්මාණය වෙලා තිබෙන්නේ ගත වෙච්ච කාලය පුරාවට ආණ්ඩු නියෝජනය කරපු නායකයන්ගේ අපරිමිත බල තණ්හාව, අවස්ථාවාදීකම සහ ආත්මාර්ථකාමීත්වය මතයි කියන එක විශේෂයෙන් මේ පාර්ලිමේන්තුවේදී -උත්තරීතර සභාවේදී- අපි නිර්භයව කියනවා. අද ගොවි ජනතාව පොහොර ටික නැතිව වැලපෙනවා. මා නියෝජනය කරන නුවරඑළිය දිස්ත්‍රික්කයේ වාගේම මුළු රටේම ගොවි ජනතාව අද හුල්ලමින් ඉන්නේ. ඒ අයගේ මුළුමහත් ජීවිතයම කඩා වැටෙන ආකාරයේ අසහනයක් දැන් නිර්මාණය වෙලා තිබෙනවා. අද ඉන්ධන ටික ගන්න බැරිව ජනතාව පෝලිම්වල දවස් තුන හතර ඉන්නවා. එම නිසා ඔවුන්ගේ දෛනික කටයුතු අකර්මණ්‍ය වෙලා තිබෙනවා. හෝටල් ටික වැහිලා නම්, සංචාරක කර්මාන්තය වාගේම තේ අපනයනයත් බිඳ වැටිලා නම්, අපනයන භෝග කටයුතු අකර්මණ්‍ය වෙලා තිබෙනවා නම්, අපේ ඇඟලුම් ක්ෂේත්‍ර සම්පූර්ණයෙන් පණ අදිමින් තිබෙනවා නම්, විවිධ කර්මාන්තවල නිෂ්පාදන ක්‍රියාවලි ඇනහිට තිබෙනවා නම්, කෘෂි නිෂ්පාදන කටයුතු ඇනහිට තිබෙනවා නම්, ගත වෙච්ච කාලය තුළ සිදු වූ දේවල්වලට අපි වග කියන්න ඕනෑ නැද්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලය තුළ ඇති වූ මේ සියලු තත්ත්ව එක්ක අපි මේ වනකොට ඉතා අසාර්ථක රාජ්‍යයක් බවට පත්වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ගත වෙච්ච මුළුමහත් කාලය පුරාවට හැම මොහොතකම දෙස්-විදෙස් සතුරු බලවේග මේ රටේ භූමිය ඇතුළු විවිධ සම්පත් ඩැහැ ගනිමින් -කොල්ල කමින්- මේ රට යටත් කර ගන්න ඉව අල්ලමින් හිටියා. විටෙක එක රටක කොලනියක්, තවත් විටෙක තවත් රටක කොලනියක් බවට අපේ රට පත් කර ගන්න විශේෂයෙන්ම බටහිර රටවල් ඇතුළු සතුරු රාජ්‍යයන් හැම විටකම කටයුතු කළා. මේ රට ගොඩ නඟනවා වෙනුවට, මේ රට ප්‍රපාතයෙන් ප්‍රපාතයට ඇද වට්ටන්න තමයි ඔවුන් දිගින් දිගටම කටයුතු කළේ. අපේ රට දුර්වල වෙලා තිබෙන මේ මොහොතේ දෙස්-විදෙස් විවිධ බලවේග අපේ පුංචි රටට විරුද්ධව දැවැන්ත කුමන්ත්‍රණ සිදු කරනවා.

අද අපේ රටේ ඇති වී තිබෙන මේ අරගළය පිළිබඳව අපට සතුටු වෙන්න පුළුවන් තත්ත්වයක් වාගේම අසතුටු විය හැකි තත්ත්වයකුත් තිබෙනවා. සද්භාවයෙන් මේ කටයුත්තට මැදිහත් වෙමින් අවංකව වේදනාව ප්‍රකාශයට පත් කරන අය වාගේම, බොර දියේ මාළු බාන, විසම, සර්පයන් මෙන් කටයුතු කරන

සංවිධාන සහ පුද්ගලයනුත් මේ ක්‍රියාන්විතය තුළ ඉන්නවා. මොකද, මේ තුළ NGOs තිබෙනවා. ඒ වාගේම දෙස්-විදෙස් සතුරු බලවේග පවා මේ තුළ ක්‍රියාත්මක වනවා. මේ දුර්වලකම පාවිච්චි කරලා, ඒ අයගේ කොලනියක්, පිළිකන්නක් බවට මේ රට පත් කර ගන්න අද ඒ අය බලනවා. එවැනි ක්‍රියාවලියකුත් මේ ක්‍රියාන්විතය තුළ දියත් වනවා.

දැන හෝ නොදැන මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සමහර මන්ත්‍රීවරුනුත් ඒවාට දායක වෙලා තිබෙනවා. ඒ නිසා අද ඇති වෙච්ච මෙන්න මේ අවාසනාවන්ත තත්ත්වය ඇතුළේ දිගින් දිගටම අපට අත් දකින්න සිද්ධ වෙලා තිබෙන්නේ අපට නොගැළපෙන, අපට දරා ගන්න බැරි සිද්ධි සමුදායක්. මේ සියලු කාරණා එක්ක බැලුවාම, විවෘත ආර්ථික ක්‍රියාවලිය ඇතුළේ පසුගිය වකවානුව පුරාවට මේ රට තුළම නිෂ්පාදනය කර ගන්න පුළුවන් බොහෝ දේවල් පිට රටින් ගෙන්වීම අපි නතර කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපේ රටේ ජනතාව -පුරවැසියෝ- අතරින් කිසිම කෙනකු කුසගින්නේ මියැදෙන්න ඕනෑ නැහැ. මොකද, අපි පරිභෝජනයට ගන්නා සියලු දේවල් රට තුළම නිෂ්පාදනය කර ගැනීමේ හැකියාව අපට තිබෙනවා. ඒත් අද අපි විවිධ රටවලින් හාල්, පරිප්පු, වියළි මිරිස් ඇතුළු අත්‍යවශ්‍ය දේවල් ටික එනකම් මඟ බලාගෙන ඉන්න තත්ත්වයකට ඇද වැටිලා තිබෙනවා. අද ඉන්ධන නැතුව ගැටලු ගොඩකට, බාධක ගොඩකට මුළු මහත් සමාජයම ඇද වැටිලා තිබෙනවා.

රට තුළ මේ වාතාවරණය ඇතිවීමට 2019දී ඇති වෙච්ච කොවිඩ් තත්ත්වයත් ප්‍රබලව බලපෑවා. අපි ආණ්ඩුවක් නිර්මාණය කළාම ඒ ආණ්ඩුවේ නායකයාගේ ඉඳලා අමාත්‍ය මණ්ඩලය දක්වාම පරිණත වෙන්න ඕනෑ; දක්ෂ වෙන්න ඕනෑ. මොකද, අනාගත අනතුර වේලාසනින් දකින්න පුළුවන් වන්නේ එතකොටයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ බහුතරයක් අනාගත අනතුර වේලාසනින් දැක්කේ නැහැ. නමුත්, මේ අමාත්‍ය මණ්ඩලය තුළ ඒ අනාගත අනතුර පැහැදිලිව දැකපු පිරිසකුත් හිටියා. අපි දන්නවා, ගරු විමල් වීරවංශ මැතිතුමා, ගරු උදය ගම්මන්පිල මැතිතුමා, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා මේ අමාත්‍ය මණ්ඩලයේ සිටිමින් මේ යන ගමන වෙනස් කරන්න, මේ යන වැරැදි ගමන් මඟ වෙනස් කරලා රටට හිතකර විධියට ආණ්ඩුව හදා ගන්න විශාල වශයෙන් උත්සාහ ගත් බව. ඒ, අනාගත අනතුර වේලාසනින් දැකපු නායකයෝ. හැබැයි, ඒ නායකයෝ ඉදිරිපත් කරපු කරුණු තුට්ටුවකටවත් මායිම් කළේ නැහැ. අරගළයට ඔය කණ්ඩායම එන්න කලින් මුලදී මේ ආණ්ඩුව ඇතුළේ බරපතළ අභ්‍යන්තර අරගළයක් කරපු නායකයෝ ගැන තමයි මම දැන් කිව්වේ. නමුත්, එතුමන්ලාට ඇහුම්කන් දුන්නේ නැහැ වාගේම ඒවා ගණන් ගත්තේ නැති එකේ ප්‍රතිඵල අපි ඔක්කෝම -මුළු මහත් සමාජයම- දැන් එකට බුක්ති විඳිනවා. මට ඇහුණා, අද උදෑසන අපේ එක්තරා ඇමතිවරයෙක් කිව්වා, යම්කිසි කාරණයක් මත 2015දීත් මෙහෙම කළා, ආණ්ඩු බිඳ වැට්ටුවා කියලා. එහෙම කියලා ගරු විමල් වීරවංශ මැතිතුමාට තමයි එතුමා ඇඟිල්ල දිගු කළේ. එදාත් එතුමා ආර්ථික ඝාතකයෝ ගැන සඳහන් කළ බව කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ආර්ථික ඝාතකයෝ ගැන එදාත් අපි කිව්වා; අදත් කියනවා; හෙටත් කියනවා. 2012දී මහින්ද රාජපක්ෂ මැතිතුමා වටේ හිටියේ අඟේ ඉඳන් කන කාපු ඇමතිවරු. එදා කුමන්ත්‍රණයක් දියත් වුණා. ඒ කුමන්ත්‍රණය ගැන විමල් වීරවංශ මැතිතුමා කිව්වා. නමුත්, එතුමාට ඇහුම්කන් දුන්නේ නැහැ. වැරැදි පාරක ගමන් කරන්න පටන් ගත්තා. අපි එදා දැන ගත්තා, රටත් නැතිවෙලා, අපිත් නැතිවෙලා, අපේ අනාගතයත් නැතිවෙනවා කියලා. එදා ඒ දේවල් මහින්ද රාජපක්ෂ මැතිතුමාට කිව්වත්, එතුමා ඒවාට ඇහුම්කන් දුන්නේ නැති නිසා අපි සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගණයේ දැවැන්ත සමුළුවක් තියලා ඒ හරහා කරුණු 11ක් අරගෙන ගියා, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ළඟට. ඒත් ඒ කුමන්ත්‍රණය ආපස්සට හරවලා, රටට හිතකර විධියට ප්‍රතිනිර්මාණය කරන්න, පරිවර්තනය කරන්න අපි සමත් වුණේ නැහැ. එහි ප්‍රතිඵලයක් හැටියට 2015දී ඒ ආණ්ඩුවේ බිඳ වැටීම සහ යහ පාලනයේ නිර්මාණය සිදු වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වතාවේත් මහින්ද රාජපක්ෂ මැතිතුමා ආණ්ඩුව හදපු දවසේ ඉඳලා ගරු විමල් වීරවංශ මැතිතුමාත්, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාත්, ගරු උදය ගම්මන්පිල මැතිතුමාත් පොහොට්ටුව නියෝජනය කරන මේ රටට ආදරය කරන තවත් මැති ඇමතිවරු පිරිසකුත් සමඟ මේ ගමන් මඟ නිවැරැදි කරගෙන, නිරවුල් කරගෙන යන්න උත්සාහ ගත්තා. නමුත්, අලුයම ලූ කෙළ පිඩක් සේ ඒවා ප්‍රතික්ෂේප කළා. දෙස් විදෙස් න්‍යාය පත්‍රවලට ගොදුරු වෙච්ච නායකයෝ ඒ කටයුත්ත කරගෙන යන්න දෙන්නේ නැතිව, හිතාමතා මේ රට ප්‍රපාතයට ඇද වැට්ටුවා කියලා තමයි මට කියන්න තිබෙන්නේ. විශේෂයෙන්, අද දින සම්මත වන මේ පනත්, මේ අභියෝගවලට ගැළපෙන ආකාරයට සංශෝධනය විය යුතුයි කියන කාරණය මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩී.බී. හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.07]

**ගරු ඩී.බී. හේරත් මහතා**
(மாண்புமிகு டீ.பீ. ஹேரத்)
(The Hon. D.B. Herath)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද උදේ අපේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඇමති ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා පනත් කෙටුම්පත් දෙකක් මේ ගරු සභාවට ඉදිරිපත් කරලා ඒවා සම්මත වුණා. කම්කරු හා විදේශ රැකියා ඇමති ගරු මනූෂ නානායක්කාර මැතිතුමාත් දැන් තවත් පනත් කෙටුම්පතක් මෙම ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා.

රටේ අධිකරණ පද්ධතිය පිළිබඳ අත්දැකීම් සමුදායක් තිබෙන ඇමතිවරයෙක් විසින් වින්දිත තත්ත්වයට පත්වන ජනතාවට අධිකරණ තුළින් ඉක්මන් විසඳුම් ලබාදීමේ අභිලාෂයෙන් ඉදිරිපත් කරපු යෝජනා සම්බන්ධයෙන් අපි විජයදාස රාජපක්ෂ ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඇත්තටම මේ යෝජනා කාලෝචිතයි. අපි හැම කෙනෙක්ම ඒවාට එකඟ වෙනවා. ඒ වාගේම, කම්කරු ඇමතිතුමාත් සංශෝධන සහිත යෝජනාවලියක් ඉදිරිපත් කළා. ඒ හැම එකකම අඩංගුවෙලා තිබුණේ මේ රටේ කම්කරුවන් මුහුණදෙන ගැටලුවලට විසඳුම් ලබාදීමට නීති පද්ධතිය කොහොමද සකස් වෙන්න ඕනෑ කියන කාරණාවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමානයේ අපි දකින දෙයක් තිබෙනවා. ඒ තමයි, මේ රටේ විද්වතුන්, උගතුන්, බුද්ධිමතුන් එක පැත්තක ඉඳලා ඔවුන්ගේ අදහස්, මතවාද ප්‍රකාශ කරන බව. ඒ වාගේම, ප්‍රජාතන්ත්‍රවාදීව පාර්ලිමේන්තුවට ඇවිල්ලා අපිත් විවිධ අදහස් ඉදිරිපත් කරනවා. ඒ සමහර කාරණා එකට එක ගැටෙනවා. සමහර කාරණා සමපාත වෙනවා. මේ සියලු කාරණා තුළින් අපි බලාපොරොත්තු වන්නේ විශේෂයෙන්ම මේ රටේ ජනතාවගේ සුබසිද්ධියයි. අපි වසර 2500ක ඉතිහාසයක් පිළිබඳව පුන පුනා කථා කරන ජාතියක්. ඉතිහාසයේ විවිධ කඩඉම් පසු

[ගරු ඩී.බී. හේරත් මහතා]

කරමින් විවිධ ගැටලුවලට මුහුණදීලා ආපු ගමන් මග පිළිබඳව ඉතිහාසය කියවනකොට අපට හොඳට තේරෙනවා. විදේශීය ආක්‍රමණවලින් අපේ රට නිදහස ලබලා අවුරුදු 74ක් තිස්සේ මහජනතාවගේ නියෝජිතයන් මේ රට පාලනය කර තිබෙනවා. ප්‍රතිපත්ති සම්පාදකයන් හැටියට පාර්ලිමේන්තුවට ඔවුන් ඉදිරිපත් කරපු කරුණු කාරණා මහ පොළොවේ ක්‍රියාත්මක කරන්නට නිලධාරි පෙළැන්තිය කටයුතු කරනවා. රටේ ප්‍රතිපත්ති හදන මහජන නියෝජිතයන් සහ ඒවා ක්‍රියාත්මක කරන නිලධාරීන් කියන පාර්ශ්ව දෙකම ගත්ත ක්‍රියා මාර්ග නිසා අද අපි අසාර්ථක රාජ්‍යයක් හැටියට ලෝකය හඳුන්වන්න පටන්ගෙන තිබෙනවා. ඒකට හේතුව විශේෂයෙන්ම රටේ පවතින ආර්ථික ගැටලුවයි. අද අපි රටක් හැටියට සංචිත හිඟය, විදේශ විනිමය හිඟය, ඩොලර් හිඟය ආදී ප්‍රධාන ප්‍රශ්න රැසක ගිලුණු රටක් බවට පත්වෙලා තිබෙනවා. එහි ප්‍රතිඵලයක් හැටියට අද අපට අත්‍යවශ්‍ය ඉන්ධන ටිකවත් ලැබෙන්නේ නැහැ. එහි ප්‍රතිඵලයක් විධියට සමාජය අද විපරීත වෙලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් දෙන්න, ඔවුන්ගේ වුවමනා ඉටු කරන්නට අද මේ පාලන තන්ත්‍රය අපොහොසත්වෙලා තිබෙනවා. මේක අපි පිළිගන්න ඕනෑ. ඒ කාරණාව පිළිගෙන විතරක් බැහැ. ප්‍රතිපත්ති සම්පාදකයන් හැටියට අපි මේ ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙන්නත් ඕනෑ.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපි දැන් ආණ්ඩු පක්ෂය නියෝජනය කරනවා. තවත් මන්ත්‍රීවරු කොටසක් විපක්ෂය නියෝජනය කරනවා. මතවාදී ගැටුම් රාශියක් එක්ක මේ පාර්ලිමේන්තුව උණුසුම් වෙනවා. මෙයින් මහජනතාවට ලැබෙන ප්‍රතිඵලය මොකක්ද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? මෙයින් මහජනතාවට ප්‍රතිඵලයක් තිබෙනවා ද කියන කාරණාව අද අභියෝගයට ලක්වෙලා. ඒ හින්දා තමයි සමාජය තුළ කථා කරන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225දෙනාම එළවා දමන්න ඕනෑ කියලා. එතැන එක්කෙනෙකුටවත් සමාව දීම පිළිබඳව කථා කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවට ආපු අවුරුදු එකහමාරක, දෙකක කාලයක් වයස අලුත් මන්ත්‍රීවරුත් අර 225දෙනාගේ ගොඩටම වැටෙනවා. ඒ වාගේම, මහජන දේපළ අබමල් රේණුවකින්වත් වැරදි විධියට පරිහරණය නොකරපු අයත් ඒ ගොඩට වැටෙනවා. මේක මහා පාප කර්මයක් ද කියලා මට හිතෙනවා. පාර්ලිමේන්තුව නියෝජනය කරන්න ආපු අපි අද විඳවන්නේ ඒ මහා පාප කර්මයද කියලා මට බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මේකට වග කිව යුත්තෝ අපි නොවෙයි. මේ රටේ මහ ජනතාවත් වග කිව යුත්තෝ නොවෙයි. නමුත් මේ පාලන ක්‍රමය තුළින් මේ සමාජයේ, මේ මහ පොළොවේ රෝපණය කරපු මතවාදය, වැරදි ප්‍රතිපත්ති අද මහජනතාවට ඉවසන්න බැහැ. ඒ නිසා තමයි අපි වූදිතයන් බවට පත් කරලා තිබෙන්නේ. මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, මූලාසනයේ ඉන්න ඔබතුමාත්, මේ පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීවරු බහුතරයකුත් වැරදි කරපු අය නොවෙයි කියන කාරණය. අපි මහජන දේපොළ වැරදි විධියට පරිහරණය කරපු අය නොවෙයි. නමුත්, ඒ හැම කෙනෙක්ම ද වූදිතයන්ගේ ගොඩට වැටිලා තිබෙනවා. මේ කාරණාව තමයි මේ පාර්ලිමේන්තුව තුළ සැලකිල්ලට ගන්න ඕනෑ වැදගත්ම කාරණාව කියලා මම අවධාරණයට ලක් කරන්න කැමැතියි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225දෙනා ගැන කථා කරනකොට ආණ්ඩු පක්ෂයේ ද, විපක්ෂයේ ද කියලා ගළපන්නේ නැහැ. ඒ හින්දා මෙතැනදී විපක්ෂ නායකතුමාට වගකීමක් තිබෙනවා. පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන අපට පමණක් නොවෙයි, මේ මහජන මතය ප්‍රායෝගිකව වෙනස් කරන්න අපි හැම දෙනාටම වගකීමක් තිබෙනවා. ඒක ප්‍රායෝගිකව වෙනස් කරන්න ගන්න ඕනෑ ක්‍රියා මාර්ගය මොකක්ද? ඒ සම්බන්ධ අතීත අත්දැකීම් අපට තිබෙනවා.

රටට ආදරය කරපු නායකයෝ ගත්ත ක්‍රියාමාර්ග, පසුගිය කාල වකවානුව තුළ මේ රටේ නායකයෝ ගත්ත වැරැදි තීන්දු සහ මහජන දේපළ හරියට කළමනාකරණය කළාද කියන කාරණා අප සැලකිල්ලට ගන්නට අවශ්‍යයි. වර්තමානයේ පාර්ලිමේන්තුව කටයුතු කරන්නේ කොහොමද කියලා මහජනතාවට දැනගන්න පුළුවන් වන විධියට විනිවිදභාවයකින් යුක්තව කටයුතු කරන්න අවශ්‍යයි.

අද අපි කම්කරුවන් ගැන කථා කරනවා. අපට විදේශ විනිමය අරගෙන එන්නේ මේ රටේ මහජනතාව විදේශ රටවලට ගිහිල්ලා සේවය කරලා. සමහර අම්මලා තමන්ගේ දරුවන් ගෙදර දාලා විදේශ රැකියාවලට යනවා. පුංචි වයසේ ඉන්න දරුවෝ දාලා යනවා. ඔවුන් ගැන හිතලා පමණක් නොවෙයි, රට ගැනත් හිතලා ඔවුන් විදේශගත වෙනවා. සමහර ශ්‍රමිකයන් විදේශ රටවලට ගිහිල්ලා මේ රට වෙනුවෙන් සේවය කරලා අපේ රටට විදේශ විනිමය එවනවා. මෙතෙක් තිබුණු ආණ්ඩු ඒ විදේශ ශ්‍රමිකයන් අපට ලබා දෙන වටිනාකමට වටිනාකමක් එකතු කළාද කියන එක පිළිබඳ බරපතළ ප්‍රශ්නයක් අද තිබෙනවා. ඒක නිසා විදේශ රටවල සේවය කරන අය විශාල වශයෙන් අපට මුදල් ප්‍රතිපාදන එවන කොට -ඩොලර් එවන කොට- ඔවුන්ට යම්කිසි විධියක ආර්ථික වටිනාකමක් දෙන්න රජය කටයුතු කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් ඔවුන්ට vehicle permit එකක් දෙන්න, ඔවුන්ගේ දරුවෙකු ඉස්කෝලයකට ඇතුළත් කරනකොට පහසුකම් දෙන්න, සමාජයේ ජීවත් වෙනකොට ඔවුන්ට වටිනාකමක් දෙන්න කටයුතු කරන්න අවශ්‍යයි. ඒ කාරණා පිළිබඳව රජයේ අවධානය යොමු වෙන්න ඕනෑය කියන කාරණාව විශේෂයෙන් මම මතක් කරන්න කැමැතියි.

රටක් හැටියට ගත්තාම අද අපට විදේශ විනිමය හිඟයට මුහුණ දෙන්න බැහැ. එහෙම වුණේ, අවුරුදු 74ක් මේ රට පාලනය කරපු පාලකයන් විසින් ගත්තු වැරැදි තීන්දු නිසායි. සමහර සංවර්ධන යෝජනා ක්‍රම තිබුණා, ඒවායේ වියදම අපට දරන්න බැහැ. අපි අධිවේගී පාරවල් පිළිබඳව උදන් ඇනුවා. නමුත් ඒ වෙනුවෙන් වියදම් කරන විශාල මුදල් ප්‍රමාණය -විදේශ විනිමය ප්‍රමාණය- විශාල බරක් බවට පරිවර්තනය වුණා. ඒ විතරක් නොවෙයි, අපට ඔරොත්තු දෙන්නේ නැති සමහර ඉදිකිරීම් තිබෙනවා. විදේශ විනිමය විශාල වශයෙන් යොදවපු ව්‍යාපෘති තිබුණා. අපි මෙන්න මේ කාරණාව සැලකිල්ලට ගන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට විදේශ විනිමය හිඟවීමට ඒ කාරණා බලපෑවා.

අත්‍යවශ්‍ය කාරණාවලට ප්‍රමුඛතාව දෙන්න අපි කටයුතු කරලා තිබුණේ නැහැ. සමහර තැන්වල ප්‍රමුඛතාව දුන්නේ පෞද්ගලික න්‍යාය පත්‍රවලට, නැත්නම් දේශපාලන අරමුණුවලට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජනතාවගේ ඡන්ද ලබාගන්නේ කොහොමද, තමන්ගේ ප්‍රතිරූපය ගොඩනඟන්නේ කොහොමද කියන කාරණාවට මූලිකත්වය දීලා තමයි මහජන මුදල් සහ විදේශ විනිමය සමහර තැන්වලදී භාවිත කරලා තිබෙන්නේ. ඒක නිසා අපි මේ වෙලාවේදී කියවන්න ඕනෑ, අපි ගත්තු වැරැදි තීන්දු මොනවාද කියලා. ඒ තීන්දු - තීරණවලට මේ රටේ ජනතාව වගකිව යුතු නැහැ. ඔවුන් මේ කාරණාත් එක්ක පීඩනයට ලක්විය යුතු නැහැ. මේක ඉතිහාසයේ කඩඉමක්. මහජනතාව මහ පාරට බැහැලා උද්ඝෝෂණ කරනවා. අතිවිශාල පිරිසක් එදිනෙදා ජීවිත ගත කරන්න අවශ්‍ය කටයුතු කරගන්න තෙල් පෝලිමේ ඉන්නවා. දරුවා ඉස්කෝලයට යවන්න, රෝගියා ඉස්පිරිතාලෙට අරගෙන යන්න ඇම්බියුලන්ස් එකට තෙල් ටිකක් ගන්න බලාගෙන ඉන්නවා. මේ වාගේ ගැටලු රාශියක් තිබෙනවා. අපි මේ ඒ කාරණා හරියට තේරුම් ගන්න ඕනෑ.

පෝලිම්වල ඉන්න ඒ අහිංසක ජනතාවගේ උදහසට අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලක් වෙලා තිබෙනවා. ඇයි ඒ? අපි

නිවැරැදි ප්‍රතිපත්තිමය තීන්දු ගත්තේ නැහැ. ප්‍රතිපත්තිමය තීන්දු අරගෙන මේ වාගේ කාරණා කලින් දැකලා ඒවාට විසඳුමක් ලබා දෙන්න අපි කටයුතු කළේ නැහැ. මේ වාගේ තත්ත්වයක් තුළ කංචන විජේසේකර විදුලිබල සහ බලශක්ති ඇමතිතුමා ජනාධිපතිතුමාගේ උපදෙස් අරගෙන, අගමැතිතුමාත් එක්ක එකතු වෙලා, තිබෙන ඩොලර් ප්‍රමාණය නිවැරැදිව පරිශීලනය කරලා අපේ රටට ඕනෑ කරන ඉන්ධන ටික ගෙනෙන්න ඉතාම ක්‍රමානුකූලව කටයුතු කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමතිතුමා අමාත්‍යාංශයේ මැදිහත් වීම හරහා ඉන්ධන බෙදන්න කටයුතු කළත් සමහර ඉන්ධනහල් ක්‍රමානුකූලව ඒවා බෙදන්නේ නැහැ. සමහර අය ඉන්ධන අරගෙන ගිහිල්ලා ගෙවල්වල ගබඩා කරනවා. මේ තත්ත්වය හරියට තේරුම් ගන්න අවශ්‍යයි. මහජනතාව මේ වෙලාවේ ඉතාම කල්පනාකාරිව තව කෙනෙකුට හිරිහැරයක් නොවන විධියට තමන්ට අවශ්‍ය ඉන්ධන පමණක් භාවිත කළොත් මේ තත්ත්වය නිවැරැදිව පාලනය කරන්න පුළුවන් කියලා මා විශ්වාස කරනවා. පසුගිය කාලයේ රටට ඕනෑ වුණු ඉන්ධන ප්‍රමාණය කොච්චරක්ද? නමුත් අද ඊට වඩා වැඩියෙන් පෙට්‍රල් ෂෙඩ්වලට ඉන්ධන අරගෙන යනවා. මහජනතාව පෝලිමේ ඉඳලා ඉන්ධන අරගෙන ඒවා ගබඩා කර ගන්නවා. මේ තත්ත්වය තුළ මේ රටේ එක්තරා පිරිසක් විසින් තවත් පිරිසකට අසාධාරණයක් කරනවාය කියන එක අපි මතක් කරලා දෙන්න ඕනෑ.

ඒ නිසා මේ සඳහා යම් ක්‍රමයක් හදන්න ඕනෑ. මේ තත්ත්වය නිසා මේ රටේ කම්කරු ශ්‍රමය නිරපරාදේ අද මහ පාරේ මිඩංගු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නියෝජනය කරන පොල් ත්‍රිකෝණයට අයත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල් නිෂ්පාදන ක්‍රියාවලියේදී ඒ කර්මාන්තයට පාවිච්චි කරන යාන වාහනවලට අද ඉන්ධන ප්‍රශ්නය බලපා තිබෙනවා. ඒ නිසා එම කර්මාන්තයට අවශ්‍ය ඉන්ධන ටික ලබා දීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා මම විශේෂයෙන්ම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා. අපි දන්නවා අපට විදේශ විනිමය උපයා ගන්න, ඕනෑම වෙලාවක පොල් නිෂ්පාදන විදේශ රටවලට යවන්න පුළුවන් බව. ඒ තුළින් අපේ රටට විදේශ විනිමය අරගෙන එන්න පුළුවන්. ඒ හින්දා ඒ ප්‍රවාහන ගැටලු විසඳන්න කටයුතු කළොත් අපට පුළුවන් වෙයි ඒ ආශ්‍රිත නිෂ්පාදන කටයුතුවලට සම්බන්ධ වෙන කම්කරුවන්ගේ සේවය නිසි විධියට ලබා ගන්න. ඒ වාගේම, රටට විදේශ විනිමය අරගෙන එන්න පොල් ආශ්‍රිත නිෂ්පාදන විදේශවලට යවන්නත් අපට පුළුවන් වෙනවා. විශේෂයෙන් මේ වෙලාවේදී මම ඒ කාරණය මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ අවුරුදු 73ක පමණ දේශපාලන ක්‍රියාවලිය මහ ජනතාව ඉස්සරහා උදහසට ලක් වෙලා තිබෙන වෙලාවක, අභියෝගයට ලක් වෙලා තිබෙන වෙලාවක කොහොමද මේ රටේ ප්‍රශ්න විසඳන්නේ? පාර්ලිමේන්තුව තුළින් පමණක් මේක කරන්න බැහැ කියලා මහ ජනතාව විශ්වාස කරනවා ඇති. ලෝකයේ දියුණු වෙන රටවල් දිහා බැලුවාම පෙනෙනවා, ඒ රටවල තීන්දු තීරණ ගන්නේ මහජන නියෝජිතයන් පමණක් නොවන බව. මහජන සහභාගිත්ව සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරලා ජනතාවගේ අදහස් අරගෙන, රටේ ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙන අත්දැකීම් විදේශ රටවල් දිහා බලපුවාම අපට පෙනෙනවා. ඒ ආදර්ශය අපිත් අරගෙන පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ-විපක්ෂ මහජන නියෝජිතයන් පමණක් නොව අත්දැකීම් සමුදායක් තිබෙන මේ රටේ උගතුන්, බුද්ධිමතුන්, වියතුන් සහ රටේ මහ ජනතාව එකට එකතු කරගෙන දේශපාලන භේදයෙන් තොරව එක වේදිකාවක ඉඳගෙන, -එක වට රවුමක ඉඳගෙන, එකට වාඩි වෙලා- අපට මේ ප්‍රශ්න ගැන සාකච්ඡා කරන්න පුළුවන්. ඒ විධියට හැමෝම එකතු වෙලා මේ රටේ දැවෙන ප්‍රශ්න දෙස දේශපාලන කෝණයකින් තොරව, යථාර්ථවාදීව බලලා, සාකච්ඡා කරලා ඒවාට විසඳුම් ලබා දෙන්න කටයුතු කළොත් මේ රටේ මහ ජනතාව අද මුහුණ දෙන ප්‍රශ්නවලට කඩිනම් විසඳුම් ලබා දෙන්න පුළුවන් වේවි කියා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උගතෙක්, බුද්ධිමතෙක්, විද්වතෙක් හැටියට ජාත්‍යන්තරය දැකපු ඔබතුමා මෙන්න මේ කාරණයට මාත් එක්ක එකඟ වෙයි. අද අපේ රටේ දරුවෙක් විශ්වවිද්‍යාලයෙන් පිට වෙනකොට වයස අවුරුදු 28ක්, 30ක් වෙනවා. ලෝකයේ දියුණු රටවල තරුණයන් වයස අවුරුදු 20ක්, 22ක් යනකොට උපාධියක් අරගෙන ඒ රටට වැඩදායී පුද්ගලයෙක් බවට පරිවර්තනය වෙනවා නම්, වයස අවුරුදු 24ක් වෙනකොට consultant කෙනෙක් හැටියට වෛද්‍යවරු එංගලන්තයෙන් බිහි වෙනවා නම්, ඇයි අපටත් එවැනි අය බිහි කරන්න බැරි? මේ රට හදන වැඩ පිළිවෙළට යනකොට අපි ඒ කාරණයත් සැලකිල්ලට ගන්න ඕනෑ. අනාගත පරපුරේ තරුණ ශ්‍රමය පාසල් පද්ධතිය තුළ, විශ්වවිද්‍යාලය තුළ නිරපරාදේ රස්තියාදු වෙන එක නවත්වලා ඒ අය මේ රටේ ශ්‍රමිකයෝ බවට පරිවර්තනය කරන්න, මේ අධ්‍යාපන ක්‍රමය නිවැරදි කරන්න ඔබතුමන්ලා වැනි අයගේ උපදෙස් ලබා ගන්න ඕනෑ කියන කාරණයත් මතක් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගාමිණී වලේබොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.21]

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ අපේ නව කම්කරු අමාත්‍ය ගරු මනූෂ නානායක්කාර මැතිතුමාට සුබ පතමින්ම අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න මා කැමැතියි. කම්කරු විනිශ්චය සභා බල ගන්වමින්, රටේ කම්කරු ජනතාව මුහුණ දෙන නොයෙකුත් කාර්මික ආරවුල් හා ඒ සබැඳි ගැටලුවලට දිගු කාලයක්, අසාමාන්‍ය කාලයක් ගත වෙන්නේ නැතිව විසඳුම් ලබා දෙන්න පුළුවන් ක්‍රමවේදයක් සැකසීමට අද මේ පනත් කෙටුම්පත ගෙනැවිත් තිබීම පිළිබඳව අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. අද අපි මේ පනත් කෙටුම්පත් ගැන කථා කරනකොට, මේ සංශෝධන මේ පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්නකොට රටේ නිර්මාණය වෙලා තිබෙන තත්ත්වයත් අපට අමතක කරන්න බැහැ.

කම්කරු විනිශ්චය සභාවලට යොමු කර තිබෙන ප්‍රශ්න හා සමාන -කම්කරු විනිශ්චය සභාවලට යොමු විය යුතු- දසදහස් ගණනක ප්‍රශ්න සමුදායකින් අපේ රටේ ජනතාව පෙළෙන වෙලාවක තමයි අපි අද මේ කාර්මික ආරවුල් පනතට සංශෝධන ගෙනැත් මීට කලින් කම්කරු විනිශ්චය සභාවලට බලතල ලබා දීලා විසඳුම් ලබා ගන්න තිබුණු ප්‍රශ්නවලට ඉක්මනින් විසඳුම් ලබා ගන්න උත්සාහ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට අද වනවිට රටේ ජනතාවගෙන් භාගයකට ආසන්න සංඛ්‍යාවක් කම්කරුවන් බවට පත් වෙලා හමාරයි. අපි කම්කරුවන් පිළිබඳව කථා

[ගරු ගාමිණී වලේබොඩ මහතා]

කළොත්, දෛනික වැටුපට වැඩ කරන සියලු දෙනා විතරක් නොවෙයි, මධ්‍යම පන්තිය නියෝජනය කරන, -මධ්‍යම පන්තියේ ඉහළ cadre එක වෙන්න පුළුවන්, පහළ cadre එක වෙන්න පුළුවන්- අපි සුදු කරපටි රැකියා විධියට සැලකූ සහ සලකමින් සිටින විශාල පිරිසක් අද වනවිට කම්කරුවන් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ රටේ ජනතාව - ගෝල් ෆේස් පිට්ටනියේ අරගළ කරන අය, මේ පිළිබඳව විශ්ලේෂණය කරන අය- මේ රටේ නිර්මාණය වුණු මේ ව්‍යසනයට පාර්ලිමේන්තුව වග කිව යුතුයි කියන එක තමයි හැම තැනම හඬ නඟා කියමින් ඉන්නේ. මට කලින් කථා කළ අපේ ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාම වාගේ පෙන්නුම් කරන්න උත්සාහ කළ කාරණාවත් මේකම තමයි. පාර්ලිමේන්තුව මේ අර්බුදයට වග කියන්න ඕනෑය කියලා ඒ අය කියනවා.

අපි පාර්ලිමේන්තුවේදී අදහස්, යෝජනා ඉදිරිපත් කරලා වාද-විවාද කරන්නේ, ආණ්ඩුව නියෝජනය කරන මැති-ඇමතිවරුන්ට තොරතුරු ඉදිරිපත් කරන්නේ, මේ තොරතුරු එකතු කරගෙන ගිහිල්ලා කැබිනට් මණ්ඩලයේදී සාකච්ඡා කරලා, පක්ෂ නායක රැස්වීම්වලදී සාකච්ඡා කරලා ව්‍යවස්ථාදායකයෙන් ආපු කරුණු විධියට විධායකය සමඟ සාකච්ඡා කරලා, ඒවා නීති, අණපනත් බවට පත් කරලා රටේ ජනතාවගේ ප්‍රශ්න විසඳීමට සුබවාදීව ගනු ලබන ප්‍රවේශයන්ට යෙදවුම් විධියට භාවිත කරන්නයි. මම නවක මන්ත්‍රීවරයෙක් විධියට පාර්ලිමේන්තුවට ආපු දවසේ ඉඳලා මේ වෙනකම් අදහස්, යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. නමුත් අවාසනාවක මහත! අපි ඉදිරිපත් කළ යෝජනාවලට, අදහස්වලට, අපි ලබා දුන් සැලසුම්වලට කුමන ආකාරයේ සැලකිල්ලක්ද ලැබුණේ කියන එක සම්බන්ධයෙන් ඉතාම කනගාටුදායක තත්ත්වයක් තිබෙන්නේ.

මට මතකයි, ජනාධිපතිතුමා ඉදිරියේදී අපි ඇතැම් සුබවාදී යෝජනා ඉදිරිපත් කරන විට, ඒ වෙලාවේ හිටපු ජනාධිපති ලේකම්වරයා අපට කථා කරන්න දෙන්නේ නැතිව අපට බැණලා එතැනින් පන්නා ගත්ත හැටි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (DR.) SUREN RAGHAVAN *left the Chair, and* THE HON. DEPUTY SPEAKER *took the Chair.*

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එවැනි තත්ත්වයක් තුළ තමයි මේ රටේ පොදු මහජනතාව අපට චෝදනා කරමින් ඉන්නේ. එම චෝදනාවලින් අපට මිදෙන්න පුළුවන්කමක් නැතිවා වෙන්න පුළුවන්. නමුත් ඉදිරියේදීත් ඒ චෝදනාවලට පිළිතුරු දෙමින් ඉන්නවාට වඩා, අද මේ රටේ ජනතාව මුහුණ දී තිබෙන ප්‍රශ්නවලට විසඳුම් දීමට රජයේ අවධානය යොමු වෙන්න ඕනෑය කියන කාරණාව අපි අවධාරණය කරන්න කැමැතියි.

බදු සංශෝධනය කරලා ගරු අග්‍රාමාත්‍යතුමා බිලියන 127ක්, 2022 වර්ෂයට එකතු කරගන්න උත්සාහ කරනවා. නමුත් ලංකාවේ බදු වංචාව, බදු මාෆියාව හරහා පැහැර හරින බදු ප්‍රමාණය විතරක් එකතු කළොත්, මේ කියන මාස හයට බිලියන 200ක්, 250ක් විතර එකතු කරගන්න පුළුවන් කියලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරින් කියනවා. මම මේ කාරණය මේ සභාවේ ඉදිරිපත් කරන හතරවැනි අවස්ථාව, මේක. ආණ්ඩුවේ මුදල් අමාත්‍යතුමා, අගමැතිතුමා ඉන්නවා. කැබිනට් මණ්ඩලය ඉන්නවා. කෝ, කවුද මේ පිළිබඳව කථා කරලා ඇහුවේ? අඩු ගණනේ, "මොකක්ද, මන්ත්‍රීතුමනි, කියන්නේ? කොහොමද, මේක එකතු කරගන්නේ?" කියලාවත් ඇහුවේ නැහැ. මේකයි යථාර්ථය. හැබැයි, මන්ත්‍රීවරුන්ට චෝදනා කරනවා, "අදහස් ඉදිරිපත් කරන්නේ නැහැ. මේ විධියයි, මෙහෙමයි-මෙහෙමයි." කියලා.

කෙසේ වෙතත්, මේ පනත් කෙටුම්පතට ඉතා හොඳ සංශෝධන ටිකක් අපේ අමාත්‍යවරයා ගෙනැවිත් තිබෙන බව සැලකිල්ලෙන් බැලුවාම අපට පෙනී යනවා. හැබැයි, අවාසනාවක මහත! අද රට මුහුණ දීලා තිබෙන ප්‍රශ්නවලට විසඳුම් සෙවීම සඳහා, විදේශ විනිමය ගැටලුවට විසඳුම් සෙවීම සඳහා අපි එකඟ වුණත්, නැති වුණත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ, ඒ සංවිධානයේ පිහිට, සහාය ලබා ගන්න තිබෙන අවස්ථාවේ, ඔවුන් සමඟ සාකච්ඡා කරන අවස්ථාවේ විපක්ෂය ඇතුළු අපේ පාර්ලිමේන්තුවට හැකියාවක් නැතිව ගියා, "අපි සමගියෙන් මේ ප්‍රශ්න විසඳනවා" කියන එක ඔවුන්ට හා ලෝකයට ප්‍රදර්ශනය කරන්න.

අද අපි ජාත්‍යන්තරයට දීලා තිබෙන පණිවුඩය තමයි ජාත්‍යන්තරය මේ රටේ ප්‍රශ්න විසඳන්න ඉදිරිපත් වනවාට අපි කැමැති නැහැ කියන එක. ඒක තමයි අද මේ පාර්ලිමේන්තුවෙන් රටට දීපු පණිවුඩය. අකැමැත්තෙන් වුවත් අපි ඒක ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ වාගේම අපි ඒ ගැන බොහොම කනගාටු වෙනවා. අපි මේ රටේ ජනතාවගේ ඡන්දයෙන් පත් වෙලා ආවේ. අපි ඉන්නේ විපක්ෂයේ වෙන්න පුළුවන්, ආණ්ඩු පක්ෂයේ වෙන්න පුළුවන්. හැබැයි, අපට ඡන්දය දීපු ජනතාව මේ වෙලාවේ දැවී දැවී ඉන්න ප්‍රශ්නවලට විසඳුම් හොයන්න යම් ප්‍රමාණයකින් හෝ දායකත්වය සපයන්න සහ ඇත්ත කථා කරන්න අපට වගකීමක් තිබෙනවා.

කම්කරු විෂය භාර ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ අවධානයට යොමු කළ යුතු ගැටලු දෙකක් තිබෙනවා. රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වාගේම ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයා විධියටයි මා මේ කියන්නේ. අද ලංකාවේ ලක්ෂ දෙකකට අධික කම්කරු ජනතාවක් මැණික් කර්මාන්තයේ නිරත වෙලා ඉන්නවා. ලංකාවේ තිබෙන කිසිම කම්කරු නීතියකින් මැණික් කර්මාන්තයේ නිරත වෙලා ඉන්න කම්කරුවන්ට පැන නඟින්නා වූ ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා වන්නේ නැහැ; ආවරණය වන්නේ නැහැ; ඔවුන්ට සිදු වන අසාධාරණකම් පිළිබඳව සාකච්ඡා වන්නේ නැහැ; ආවරණය වන්නේ නැහැ. මේ පිළිබඳව අවස්ථා ගණනාවකදී මා කරුණු ඉදිරිපත් කළා. මැණික් කර්මාන්තයේ නිරත වෙලා ඉන්න කම්කරුවන් වෙනත් අයගේ ඉඩම්වල තමයි පතල් කපන්නේ; මැණික් ගැරීම සිදු කරන්නේ. ඒ ගොල්ලන් ගරා ගන්නා මැණික් ගල් -ඉතා විශාල වටිනාකම් සහිත මැණික් ගල් වුණත්- අඩු මිලට මිලදී ගන්නා අවස්ථා තිබෙනවා; හොරකම් කරන අවස්ථා තිබෙනවා. මැණික් කර්මාන්තයේ නිරත වෙලා ඉන්න කම්කරුවන්ට හදිසියේ තුවාලයක් වුණොත්, අතක් පයක් නැති වුණොත්, ජීවිතය අහිමි වුණොත්, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියෙන් ලබා දෙන ඉතා සොච්චම් රක්ෂණ මුදලක් හැරුණු විට කිසිම වන්දියක් ලබා ගන්න පුළුවන් විධියේ ආවරණයක්, පිහිටක් ලැබෙන විධියේ නීතියක් නිර්මාණය වෙලා නැහැ. මා ඉල්ලා සිටිනවා, කරුණාකර ඒ පිළිබඳව අවධානය යොමු කරලා, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ මැදිහත්වීම මත ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍ය දේශගුණික තත්ත්වයේදී පතල් කම්කරුවන් 75,000ක් පමණ උදේ අටේ ඉඳලා හවස හතර වෙනකල් අඩි දහයක්, දොළහක්, විස්සක්, තිහක්, සමහර විට අඩි සියයක් පොළොව යට ඉඳලා තමයි මැණික් ටික ගොඩට ගෙනෙන්නේ. එහෙම ගෙනෙන මැණික්වලින් මාසයකට ලංකාවට ඩොලර් මිලියන තිහකට අධික ප්‍රමාණයක් ලැබෙනවා. හැබැයි, අද පතල් කම්කරුවන්ට ඕනෑ කරන ඩීසල් ටික ගන්න විධියක් නැහැ; පෙට්‍රල් ටික ගන්න විධියක් නැහැ; මෝටර් ටික කැඩුණාම හදා ගන්න අමතර කොටස් ටික ගන්න විධියක් නැහැ. මම මේ කාරණයට අදාළව යෝජනාවක් ඉදිරිපත් කළා. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියට ඩොලර් තිබෙනවා. ඒ අයට පුළුවන් ඩොලර්වලින් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට මුදල් බැඳලා, මධ්‍යම ගමනාගමන මණ්ඩලයට අයත් හෝ මැණික් ගරන ඒ ඒ දිස්ත්‍රික්කවල තිබෙන වෙනත් පෙට්‍රල් ෂෙඩ් කිහිපයක් හෝ වෙන් කරලා, ඒ කම්කරුවන්ට ඕනෑ කරන ඉන්ධන ටික ලබා දෙන්න. මා මේ පිළිබඳව ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට කිව්වා, සභාපතිතුමාට කිව්වා. ඒ වාගේම කර්මාන්ත ඇමතිතුමාටත් කිව්වා. අවාසනාවට තවම එය ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ පිළිබඳත් මා මේ ගරු සභාවේ අවධානය යොමු කරවනවා.

කුඩා තේ වතු ක්ෂේත්‍රය පිළිබඳවත් මට කරුණු කිහිපයක් කියන්න තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. රත්නපුර දිස්ත්‍රික්කයේ තමයි ලංකාවේ වැඩිම කුඩා තේ වතු ප්‍රමාණයක් තිබෙන්නේ. කුඩා තේ වතුවලින් ජීවත් වන පවුල් ලක්ෂ විස්සක් පමණ ලංකාවේ ඉන්නවා. ඒ සියලුදෙනා අද අගතියට පත් වෙලා තිබෙනවා. ඒ අයට අවශ්‍ය යටිතල පහසුකම් නැහැ. පොහොර ටික සපයා ගන්න විධියක් නැහැ. දලු කඩන කවරය හොයා ගන්න විධියක් නැහැ. කූඩ හොයා ගන්න විධියක් නැහැ. කර්මාන්තයට ඕනෑ කරන උපකරණ කිසිවක් නැහැ. හැබැයි, ලංකාවට වැඩිම ඩොලර් ආදායමක් ලබා දෙන කර්මාන්තයේ නිරත වන්නේ ඒ කම්කරු ජනතාවයි. ඒ ගොල්ලන් තමයි ඒ ඩොලර් ටික හොයලා දෙන්නේ. ඒ නිසා ඒ අයට අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන්න ඕනෑ. මේ අවස්ථාවේදී විෂය භාර ගරු ඇමතිතුමා සභාවේ සිටියා නම් මා සතුටු වෙනවා. මා එතුමාට ලිඛිතවත් මේ පිළිබඳව දැනුම් දීලා තිබෙනවා.

ඊළඟට මා මෙම ගරු සභාවේ අවධානය යොමු කරවනවා මෙන්න මේ කාරණයට. රත්නපුර දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, අනෙකුත් දිස්ත්‍රික්කවලත් මේ ප්‍රශ්නය තිබෙනවා. වැව්ලි සමාගම්වලට පවරා දීපු, මිලියන ගණනක් වටිනා ඉඩම් අක්කර ප්‍රමාණයක් මුඩු බිම් විධියට අත් හැර දමා තිබෙනවා. රජය කියනවා, කෘෂිකර්ම ඇමතිතුමා කියනවා, අගමැතිතුමා කියනවා, ජනමාධ්‍යවලින් කියනවා, "ආහාර හිඟයක් එනවා, ආහාර නියඟයක් එනවා, නමුත් ආහාර සුරක්ෂිතතාවක් නැහැ" කියලා. හැබැයි, ගම්වල ජනතාව, කෘෂිකාර්මික සංවිධාන, ගොවි සංවිධාන වගා කරන්න ඉඩම් නැතිව ඉන්නවා. මම පාර්ලිමේන්තුවට ආපු දවසේ ඉඳලා මේ සම්බන්ධයෙන් ඉල්ලීම් කර තිබෙනවා. ඒ ඉඩම්වල ලේඛන ගෙනැල්ලා දුන්නා. ඒ ඉඩම් පිහිටි ස්ථාන පිළිබඳව දැනුම් දුන්නා. ඒ ඉඩම් පිළිබඳව සම්පූර්ණ තොරතුරු ගෙනැල්ලා දුන්නා. ඒ මිනිසුන්ට ඒ ඉඩම්වල අල, බතල, මඤ්ඤොක්කා ටිකක් සිටුවා ගන්න තාවකාලික පදනමෙන් අවසර දෙන්න කියා ඉල්ලා සිටියා. හැබැයි, රජය ඒ ගැන ගත්ත තීන්දුවක් නැහැ. ඒ දිස්ත්‍රික්කවල ජනතාව අපිව පාර්ලිමේන්තුවට එව්වේ, මේ ප්‍රශ්න ගැන කථා කරන්නයි. මෙන්න අපට කරන්න පුළුවන් දේ. අපි මේවා ගෙනැල්ලා පෙන්වා දෙනවා. කෝටිපති ව්‍යාපාරිකයෝ බදු වංචා කිරීම කියන කාරණයේ ඉඳලා ගමේ අහිංසක මිනිහාගේ ප්‍රශ්න විසඳීම දක්වා වූ තොරතුරු අපි ගෙනැල්ලා දුන්නා; ගෙනැල්ලා දෙමින් ඉන්නවා. නමුත් ඒවාට සවන් දෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා සූදානම් වනවා මට ලැබී තිබෙන වේලාව අවසන් බව කියන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
අවසාන වශයෙන්, ගරු ඇමතිතුමාට මම සුබ පතනවා. මේ කටයුතු සාර්ථකව කර ගන්න එතුමාට හැකි වේවා කියලා මා ප්‍රාර්ථනා කරනවා.

අද ජනමාධ්‍ය ක්ෂේත්‍රය ගත්තොත්, ජනමාධ්‍ය නියෝජිතයන් කම්කරුවන් බවට පත් කරලා තිබෙන්නේ. ටෙලිනාට්‍ය ක්ෂේත්‍රය ගත්තත් එහෙමයි. ලංකාව පුරා විහිදී සිටින සියලු ජනමාධ්‍ය සහෝදරවරු, මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා වාර්තා කරන ජනමාධ්‍ය සහෝදරවරු ශ්‍රමිකයන් බවට පත් කරලා තිබෙන්නේ; කම්කරුවන් බවට පත් කරලා තිබෙන්නේ. ඔවුන් පත්තරේට ලිපියක් ලිව්වාම එයින් පළවෙන කොටසට යම් ගණනක් තමයි මාධ්‍ය ආයතනවලින් ඔහුට ගෙවන්නේ. රූපවාහිනියේ, විද්‍යුත් නාලිකාවල විකාශනය වන කොටසට අනුපාතිකව යම් ගණනක් තමයි ඔවුන්ට ගෙවන්නේ. මේවා අපි මෙතැන සාකච්ඡා කරලා ඔවුන්ට සාධාරණය ඉෂ්ට කරන සභාවක් බවට මේ සභාව පත් කරගන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම තමයි අපට කරන්න පුළුවන්. ආණ්ඩු පක්ෂයට, කැබිනට් මණ්ඩලයට, විධායකයට තමයි අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරලා මෙම ගැටලු විසඳන්න පුළුවන්. ඒ සඳහා අපි උපරිම සහාය ලබා දෙනවා, කිසිම ආකාරයකින් කකුලෙන් ඇදීමක් කරන්නේ නැහැ. හැබැයි, මේ පීඩනය ජනතාවට තවදුරටත් විඳ දරාගන්න පුළුවන් මට්ටමක් තිබෙනවාද කියන ගැටලුව ඔබට පාරට බැස්සාම පෙනෙනවා. එම නිසා අපි කථා පැවැත්වීමට පමණක් සීමා නොකර, මේ ගැටලුවට විසඳුම් දෙන කැබිනට් මණ්ඩලයක් පත් කරගෙන, ඉදිරි කටයුතු කළ යුතු වනවා. අග්‍රාමාත්‍යතුමා අද උදේ ඉඳලාම මේ ගරු සභාවේ නැහැ. එම නිසා මේවා පුහු කථා බවට පත් වෙන්න ඉඩකුත් තිබෙනවා. මේවායින් ප්‍රයෝජනයක් නොගන්නා තත්ත්වයක් ඇති වෙන්නත් ඉඩ තිබෙනවා. ඒක තමයි අපි මේ අවුරුදු දෙක තුළම දැක්කේ. මම ප්‍රාර්ථනා කරනවා, නැවතත් එසේ නොවේවා කියලා. අපි මේ ඉදිරිපත් කරන කරුණු පිළිබඳව අවධානය යොමු කරලා ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් දෙන්න මේ කරුණු උපයෝගි කරගන්නය කියා ඉල්ලා සිටිමින්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.35]

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු අධිකරණ ඇමතිතුමා විසින් අද සිවිල් නඩු විධාන සංග්‍රහය සහ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතට සංශෝධන ගෙනාවා. ඒ වාගේම කම්කරු හා විදේශ රැකියා ඇමතිතුමා කාර්මික ආරවුල්

[ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා]

(විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ගෙනැවිත් සමස්තයක් හැටියට මේ රටේ ආර්ථික ශක්තිය වැඩි කරන්න ලොකු පිටුවහලක් ලබා දී තිබෙනවාය කියන කාරණයත් අපි කියන්න ඕනෑ.

විශේෂයෙන් අද උදෑසන ඉදිරිපත් කළ සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පතින් ගෙනැවිත් තිබෙන කාරණා අනුව ඉතාම කඩිනම් සිවිල් නඩු විභාගයකට යන්න අවස්ථාව ලබා දී තිබෙනවා. මේ රටේ නඩු කියන පාර්ශ්වයට ඒ මඟින් ලොකු සහනයක් ලැබෙනවාය කියන කාරණය අපි කියන්න ඕනෑ. ඒ වාගේම අපරාධ නඩු විධාන සංග්‍රහයට ගෙනැවිත් තිබෙන සංශෝධනයත් ඉතා වැදගත්. අපි දන්නවා වෙනදා නම් නඩු කටයුත්තක සහතික පිටපතක් ගන්න ගියාම විත්තිකරුවාට යම් මුදලක් ගෙවන්න සිදු වෙනවා. ඒවා බැහැර කරලා අද මේ සංශෝධන ගෙනැවිත් තිබෙනවා.

ගරු අධිකරණ ඇමතිතුමා දැන් මේ සභාවේ ඉන්නවා නම්, වැදගත් කාරණයක් පිළිබඳව එතුමාගේ අවධානය යොමු කරවන්න මම කැමැතියි. විශේෂයෙන්ම අද නඩු කටයුතු ප්‍රමාද වෙන්න තව හේතුවක් තමයි, නඩුවට අදාළ සාක්ෂි සටහන් ගන්න ප්‍රමාද වීම. අපි දන්නවා, සමහර වෙලාවට නඩුව යන අතරවාරයේ එම නඩුවේ සාක්ෂි සටහන් ඊළඟ නඩු වාරයට කලින් අරගෙන නීතිඥවරු නඩුවට සූදානම් වෙන්න ඕනෑ බව. හැබැයි, සමහර අවස්ථාවල නඩු දිනයටවත් එම සාක්ෂි සටහන් ගන්න හම්බ වෙන්නේ නැහැ. එම නිසා අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙන් හෝ සිවිල් නඩු විධාන සංග්‍රහය යටතේ ඒ සංශෝධනය ව්‍යවස්ථාපිතව ගෙනැල්ලා, නඩු දිනයට සතියකට පෙරාතුව එම සටහන් දෙන්නය කියන්න පුළුවන් නම්, එය වඩාත් වටිනවාය කියන කාරණයත් මා කියන්න ඕනෑ.

හිටපු අධිකරණ අමාත්‍ය, ගරු අලි සබ්රි මැතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. එතුමා අධිකරණ පද්ධතිය ශක්තිමත් කරන්න ලොකු වැඩ කොටසක් කළා. නීති ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා විවිධ කමිටු යොදවමින් එතුමා විශාල වැඩ කොටසක් කළා. වර්තමාන ගරු අධිකරණ ඇමතිතුමා එම වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙන යනවා. ඒ සම්බන්ධයෙන් අපි එතුමාටත් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊළඟට, ගරු කම්කරු හා විදේශ රැකියා ඇමතිතුමා අද ඉතාම හොඳ විධිවිධානයක් මේ ගරු සභාවේ අනුමැතියට ඉදිරිපත් කර තිබෙනවා. ඒ පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වෙනවා වාගේම, අපේ දිස්ත්‍රික්කයේ සහෝදර මන්ත්‍රීවරයෙක් හැටියට අපි එතුමාට සුබ පතනවා. ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා තමයි මේ කටයුත්තට නායකත්වය ලබා දුන්නේ. එතුමා කාලයක් අධිකරණ ඇමතිවරයා හැටියට කටයුතු කළා. මම එම අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍යවරයා හැටියට කටයුතු කළා. ඒ කාලයේ මේ සම්බන්ධයෙන් කම්කරු විනිශ්චය සභාවල සභාපතිවරුන්ගේ ලොකු දුක්ගැනවිල්ලක් තිබුණා.

හිටපු කම්කරු අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා අදාළ සියලුදෙනා සමඟ සාකච්ඡා කරලා කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත හැදුවාට පසුව, වර්තමාන කම්කරු ඇමතිතුමා ඒ කටයුත්ත තවත් ඉදිරියට ගෙනැවිත් එම පනත් කෙටුම්පත අද මේ ගරු සභාවේ දෙවන වර කියවීමේ විවාදයට යොමු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පනත් කෙටුම්පතින් බලාපොරොත්තු වන්නේ මොකක්ද? මා දන්නා විධියට මේ රටේ කම්කරු විනිශ්චය සභා 37ක් පමණ තිබෙනවා. කාර්මික ආරවුල් පනතට අදාළව ඉතාම සුළු නඩු ප්‍රමාණයක් තමයි ඒ කම්කරු විනිශ්චය සභා 37හිම අහන්නේ. කම්කරුවන්ට බලපාන අනෙකුත් අණ පනත්වලට අදාළ නඩු බොහොමයක් අහන්නේ මහේස්ත්‍රාත් අධිකරණවල. ඒකට පිළියමක් වශයෙන්, මට මතක විධියට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් 2018 වර්ෂයේදී පමණ ගැසට් නිවේදනයක් මඟින් කම්කරු විනිශ්චය සභාවල සභාපතිවරුන්ටත් ඒ නඩු අහන්න බලය ලබා දුන්නා. ඒ, 2018.07.16 දිනැති, අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 419 සහ 419 (අ) යටතේයි. ඒ චක්‍රලේඛ හරහා කම්කරු විනිශ්චය සභාවල සභාපතිවරුන්ට බලය ලැබුණාට පසුව ඔවුන් ඉතාම හොඳින් ඒ කටයුත්ත කරගෙන ගියා. අනලස්ව, ඉතාම ක්‍රමවත් ආකාරයට, කම්කරුවන්ගේ නඩු පිළිබඳව ලොකු වගකීමකින් යුක්තව ඔවුන් ඒ කටයුත්ත කරගෙන ගියා. හැබැයි, ඒ අතරවාරයේ අධිකරණ සේවා කොමිෂන් සභාව ඒ ගැසට්වුව නැවත කැඳවා තිබෙනවා. ඒ නිසා නැවතත් පැරැණි තත්ත්වයටම ගියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතේ තිබෙන වැදගත්කම තමයි, එදා නීතියක කොහේවත් සඳහන් නොවෙච්ච කාරණය -චක්‍රලේඛයක් හරහා පමණක් එකී බලය ලබා දීම- අද මේ උත්තරීතර සභාව විසින් පනත් කෙටුම්පතක් මඟින් සම්මත කරලා රටේ නීතියක් බවට පත් කිරීම. ඒ නිසා මෙය ඉතාම හොඳ කටයුත්තක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කටයුත්ත කිරීම නිසා වන යහපත ගැනත් මා මෙහිදී කියන්න ඕනෑ. කම්කරු ජනතාව බරපතළ මූල්‍ය ප්‍රශ්නවලින් පෙළෙන අය බව අපි දන්නවා. ඔවුන් යම් වන්දි මුදලක් ලබා ගන්න ගියාම ඒ වන්දි මුදල ලබා ගන්න අවුරුදු ගණනක් ගත වුණොත්, ඔවුන්ට ඒ වන්දි මුදල ලැබෙන එකෙන් ප්‍රයෝජනයක් නැහැ. නමුත්, අද මේ පනත් කෙටුම්පත සම්මත වීමත් සමඟ නඩු කටයුතු ප්‍රමාද වීම වළකිනවා. ඒක ඉතාම හොඳ කාරණයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිරන්තරයෙන්ම මේ නඩු අහන්නේ කම්කරු නීති පිළිබඳව ලොකු දැනුමක් තිබෙන කණ්ඩායමක්. මම මහේස්ත්‍රාත්වරුන්ගේ දැනුම සම්බන්ධයෙන් අඩු තක්සේරුවකින් කථා කරනවා නොවෙයි. නමුත්, කම්කරු නීති පිළිබඳව කම්කරු විනිශ්චය සභාවල සභාපතිවරුන්ට ඉතාම හොඳ පරිචයක් තිබෙනවා. ඒ නිසා ඒ අය හරහාම -ඒ අය ලවාම- කම්කරුවන්ගේ ප්‍රශ්නවලට විසඳුම් ලබා දීමේ හැකියාව මෙමඟින් ලැබෙනවා. ඒ අයත් සම මට්ටමේ අධිකරණ නිලධාරින්. කිසිම මහේස්ත්‍රාත්වරයෙකුට මේක හිත් තැවුලක් ඇති විය යුතු කාරණයක් නොවෙයි. කම්කරු විනිශ්චය සභාවල සභාපතිවරුන් පත් කරන්නේත් අධිකරණ සේවා කොමිෂන් සභාව මඟින්. ඒ අයත් අධිකරණ සේවා නිලධාරින්. ඒ නිසා ඒ සම්බන්ධයෙන් කිසිවකු රජය සමඟ හෝ කම්කරු අමාත්‍යතුමා සමඟ හෝ කිසිම චකිතයක් හෝ හිත් අමනාපයක් ඇති කර ගැනීම අවශ්‍ය නැහැ. මොකද, ඒ අය සම මට්ටමේ නිලධාරින්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මා මීට පෙරත් කිව්වා වාගේ, කම්කරු විනිශ්චය සභාවල මේ වන කොටත් ඉතාම අඩු නඩු ප්‍රමාණයක් පමණයි තිබෙන්නේ. මේ රටේ කම්කරු විනිශ්චය සභා 37ක් තිබෙනවා. මා දන්නා විධියට ඒ 37න් 20ක පමණ තිබෙන්නේ නඩු 100කටත් වඩා අඩු ප්‍රමාණයක්. මා හිතන විධියට, කම්කරු විනිශ්චය සභා සභාපතිතුමා සමහර දිනවල උදේ 11.00, 11.30 වනකොට

තමන්ගේ රාජකාරිය කරලා අවසන්. ඒ නිසා ඒ අයට කරන්න වැඩක් නැහැ. හැබැයි, ඒ අයට වැටුප් ගෙවන්න ඕනෑ; දීමනා ගෙවන්න ඕනෑ; ඒ ගොඩනැඟිලිවලට අදාළ බදු මුදල් ගෙවන්න ඕනෑ. ඒ සියලු දේවල් සඳහා රජය මුදල් වැය කරන්න ඕනෑ. එහෙම මුදල් වැය කළත්, මහෙස්ත්‍රාත් අධිකරණවල නඩු අහන කොට කම්කරුවන්ගේ ප්‍රශ්න එහෙමම ඉතිරි වෙනවා. හැබැයි මේ කටයුත්ත නිසා ඒ කටයුත්ත ඉතාම ඉක්මනින් කෙරෙනවා. සාමාන්‍යයෙන් කම්කරු විනිශ්චය සභාවක සභාපතිවරයෙකුට තමන්ගේ එදිනෙදා රාජකාරියට අමතරව තව දින 1/2ක් පමණ මේ කටයුත්ත සඳහා යොදවන්න වෙයි. මේ කටයුත්ත සඳහා අමතර වියදමක් යන්නේත් නැහැ. එක නඩුවක් වැඩිපුර වාර ගණනක් විභාග කරන්නත් පුළුවන්. ඒ වාගේම විශේෂිත නඩුවලට ලොකු අවධානයක් යොමු කරලා මේ කටයුත්ත කරගෙන යන්න පුළුවන්. එසේ කටයුතු කිරීම නිසා සිදු වන්නේ වාසියක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පිළිගන්නවා අද අපේ රටට විදේශ ආයෝජකයන් එන්නේ නැති බව. විදේශ ආයෝජකයන් නොපැමිණෙන්න මූලික කාරණයක් තමයි, අපේ රටේ අධිකරණ පද්ධතියේ තිබෙන යම් යම් ගැටලු. එකක් තමයි, නඩුවක සාධාරණ විනිශ්චයක් ලබා ගැනීමට විශාල කාලයක් ගත වීම. අපි දන්නවා, ගරු අලි සබ්රි හිටපු අධිකරණ ඇමතිතුමා කමිටු ගණනාවක් පත් කරලා එම කමිටු මඟින් මේ වනකොට යම් යම් නිර්දේශ ලබා දී තිබෙන බව. වාණිජ මහාධිකරණයක් වෙනම තිබෙනවා. කම්කරු නඩුවලට අදාළ අභියාචනා සම්බන්ධව කටයුතු කිරීමට වෙනම කම්කරු මහාධිකරණයක් පිහිටුවීමට නිර්දේශ කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනට තිබෙන ප්‍රශ්නය තමයි කම්කරු විනිශ්චය සභාවල සභාපතිවරුන්ට උසස්වීමක් නොලැබීම. ඒ අයගේ සම්පූර්ණ සේවා කාලය කම්කරු විනිශ්චය සභාවෙන්ම අවසන් වෙනවා. මේ අවස්ථාවේදී ගරු කම්කරු ඇමතිතුමා මේ ගරු සභාවේ සිටින නිසා මම එතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. කරුණාකර, මේ කාරණය ගරු අධිකරණ ඇමතිතුමාගේත්, ගරු අග්‍ර විනිශ්චයකාරතුමාගේත්, අධිකරණ සේවා කොමිෂන් සභාවේත් අවධානයට යොමු කර, කම්කරු විනිශ්චය සභාවල සිටින සභාපතිවරුන්ට මහාධිකරණ විනිශ්චයකාරවරුන් වශයෙන් පත් වීමට අවස්ථාවක් ලබා දෙන්න, ගරු ඇමතිතුමනි. මොකද, කම්කරු විනිශ්චය සභාවල ඉන්නේ ඉතාම හොඳ පරිචයක් තිබෙන, දීර්ඝ කාලීන අත් දැකීම් තිබෙන සභාපතිවරු.

ඊයේ පෙරේදා අපි මහාධිකරණ විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව වැඩි කළා. අද මූලික ප්‍රශ්නයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කම්කරු විනිශ්චය සභාව ලබා දෙන නියෝගයක් සම්බන්ධයෙන් වුණත් අභියාචනයක් කරන්න ඕනෑ මහාධිකරණයටයි. නමුත්, දැන් මහාධිකරණවල සිටින සමහර විනිශ්චයකාරවරුන්ට කම්කරු නීති, අණ පනත් පිළිබඳව යම් යම් ගැටලු තිබෙනවා කියා මා හිතනවා. මේ ගැන මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගෙන් ඇහුවත් කමක් නැහැ. මොකද, ඒ අය නිරන්තරයෙන් ඒ විෂයය සමඟ ගැටෙන අවස්ථා අඩුයි. ඒ නිසා කම්කරු විනිශ්චය සභාවල සභාපතිවරුන්ට මහාධිකරණ විනිශ්චයකාර තනතුරු සඳහා පත් වෙන්න අවස්ථාවක් ලබා දෙනවා නම් ඒ අයගේ හැකියාවෙන්, දැනුමෙන් මේ රටට ලොකු වැඩක් කරන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා.

මේ කියූ කරුණු සම්බන්ධයෙන් මේ ගරු සභාවේ අවධානය යොමු කරන්න කියලා මා බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. රටක් හැටියට අද අප ඉන්න තැන ගැන අපට සන්තෝෂ වෙන්න පුළුවන්කමක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ, ගරු අගමැතිතුමා ඇතුළු පක්ෂ විපක්ෂ සියලුදෙනා ඒක රාශි වෙලා, අද ඉදිරිපත් කරන අණ පනත් සම්බන්ධ කරගෙන මේ රට ශක්තිමත්ව ඉස්සරහට ගෙන ගිහින්, රටක්, ජාතියක් හැටියට ශක්තිමත්ව ඉස්සරහට යැමේ වග කීම අපට තිබෙනවා කියන කාරණය බොහොම ගෞරවයෙන් සිහිපත් කරමින්, ඒ සඳහා පාර්ලිමේන්තුවේ සිටින අපි 225දෙනා ම එකා වාගේ සහෝදරාත්මකව කටයුතු කරමු කියන ගෞරවනීය ඉල්ලීමත් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු උද්දික ප්‍රේමරත්න මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු මනුෂ නානායක්කාර අමාත්‍යතුමා.

[අ.භා. 3.46]

**ගරු මනුෂ නානායක්කාර මහතා (කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார - தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சர்)
(The Hon. Manusha Nanayakkara- Minister of Labour and Minister of Foreign Employment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත පිළිබඳව අදහස් දක්වන ලද සියලු ගරු මන්ත්‍රීතුමන්ලාට අපේ ස්තුතිය පුද කරනවා. විශේෂයෙන්ම ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමාත්, ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මන්ත්‍රීතුමාත් මතක් කළා මෙතැනින් පසුවත් -කම්කරු විනිශ්චය සභාවලින් පසු- ඉදිරියට යන කාරණාවලදී ඉදිරි නීතිමය කටයුතු සඳහා පළාත්බද මහාධිකරණ පිහිටුවීමේ ඇති වැදගත්කම පිළිබඳව. අපි ඒ පිළිබඳව ගරු අධිකරණ අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කිරීමට සහ එතුමාගේ අවධානය ඒ කෙරෙහි යොමු කරවීමට බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මැතිතුමා මතක් කළ කම්කරු විනිශ්චය සභාවල සභාපතිවරුන්ගේ උසස්වීම් සම්බන්ධ කාරණාව ගැනත් ඉදිරියේදී අපි අධිකරණ අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා. ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා වාගේම ගරු ජයරත්න හේරත් මන්ත්‍රීතුමාත් මතක් කළා, ආයෝජකයන්ට හිතකර වන විධියට, පහසු වන විධියට නීති සකස් කළ යුතුයි කියන කාරණාව. අපේ ගරු ගාමිණී වලේබොඩ මැතිතුමාත් අදහස් රාශියක් දැක්වූවා. මම මූලික වශයෙන්ම කියන්න ඕනෑ, කම්කරු අමාත්‍යාංශය විධියට අපි කම්කරුවා වෙනුවෙන් පෙනී සිටින බව; කම්කරුවා ආරක්ෂා කිරීම වෙනුවෙන් පෙනී සිටින බව. හැබැයි, කම්කරුවා ආරක්ෂා කර ගන්න කියා ආයෝජකයා, එහෙම නැත්නම් ව්‍යවසායකයා විනාශ කර දමන තැනට වැඩ කටයුතු කරන්න බැහැ. පරණ විධියට හිතලා මේ රට තවදුරටත් ආපස්සට ගෙන යන්න අපට බැහැ. මම ඒ පිළිබඳව ඉදිරියේදී කථා කරනවා. එතැනදීත් මම ඒ ගැන වැඩිදුර පැහැදිලි කරන්නම්.

අපේ ගරු ගාමිණී වලේබොඩ මැතිතුමා සඳහන් කළා මැණික් කර්මාන්තය සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය පිළිබඳව. පෞද්ගලිකව ඒ කර්මාන්තය ගැන තොරතුරු අධ්‍යයනය කර තිබෙන කෙනෙකු හැටියට මමත් සිතනවා, මැණික් කර්මාන්තය සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන මේ තත්ත්වය හමුවේ එම කර්මාන්තයේ නිරත අය ආරක්ෂා කරගැනීමට යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි කියලා.

දැනට ඔවුන් පඩි පාලක සභාව යටතේ පාලනය වුණත්, සේවා සේවක සබඳතාවක් හැටියට ඔවුන් මෙහි ලියා පදිංචිවීමක් සිදු

[ගරු මනූෂ නානායක්කාර මහතා]

නොවන නිසා සේවා නියුක්තියක් වශයෙන් කම්කරු අණපනත් මඟින් ආවරණය වීමක් සිද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා ඔවුන් ආවරණය කර ගන්න කියපු එක එතුමා මතක් කරපු කාරණාවක්. ඒ විධියට, අනියම් ක්‍රම යටතේ වැඩ කටයුතු කරන අය - සෘජු කම්කරුවන් වශයෙන් වැඩ නොකරන අය- සහ ස්වාධීනව වැඩ කටයුතු කරන කම්කරුවන් වෙනුවෙන් ආරක්ෂාවක් සපයන්නේ කොහොමද, ඒ අයට සපයන්නේ කොයි වාගේ ආරක්ෂාවක් ද, ලෙඩක් දුකක් ඇති වුණාම කොයි වාගේ සහනයක් ද ලබා දෙන්නේ කියන කාරණා පිළිබඳව පසුගිය දවසක "ශ්‍රම වාසනා අරමුදල" සම්බන්ධයෙන් පැවැති සාකච්ඡාවේ දී අපි කථා කළා. මේ ශ්‍රමිකයන් ආරක්ෂා කරන්න, ඒ අය වෙනුවෙන් සුබසාධනයන් සලසන්න කටයුතු කරද්දී, ඒ අය වෙනුවෙන් යම් කිසි රක්ෂණ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි කියන කාරණාව සම්බන්ධයෙන් මේ වන විට අපේ අවධානය යොමු වී තිබෙන බවත් මම මතක් කරන්න කැමැතියි.

මාධ්‍ය ආයතන පිළිබඳවත්, මාධ්‍යවේදීන් පිළිබඳවත් කථා කරමින් අපේ ගරු ගාමිණී වලේබොඩ මැතිතුමා කිව්වා, ඒ අය කම්කරුවෙකුගේ තත්ත්වයට පත් වෙලා තිබෙනවා කියලා. නැහැ, ආයතනයක ප්‍රධාන විධායක නිලධාරියාත් කම්කරුවෙක් තමයි. එතකොට, අපේ මාධ්‍ය ආයතනවල සේවය කරන අය, රක්ෂණ ක්ෂේත්‍රයේ සේවය කරන අය, අනියම් පදනම්වලින් සහ කොමිස් පදනම්වලින් සේවය කරන සියලු දෙනාම සේවකයින්. ඒ අයත් කම්කරුවන් වශයෙන් තමයි සැලකෙන්නේ. හැබැයි, අපි ඒ සියලු දෙනා ආරක්ෂා කර ගැනීම සඳහා කටයුතු කරනවා. ඒ ඒ ක්ෂේත්‍ර පිළිබඳව සුවිශේෂී වශයෙන් කල්පනා කර අනාගතයේ දී නීති රීති සකස් කළ යුතුයි කියන කාරණයත් අපේ අවධානයට ලක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා සඳහන් කළා, "කම්කරුවන් වෙනුවෙන් අලුගෝසු නීති හැදීම තමයි දැන් වෙන්නේ. ජේ.ආර්. ජයවර්ධන මහත්මයාත් ඔහොම කියා ගෙන තමයි ආවේ" කියලා. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා 1977 දී අගමැති පදවියට පත්වෙලා මේ රටට විවෘත ආර්ථික ක්‍රමය ගෙනාවා. රටේ ආර්ථිකයේ අලුත් වෙනසක් නිර්මාණය කරන්න එතුමා කටයුතු කළා. එහි අඩු පාඩු තිබෙනවා තමයි. මේ වෙලාවේ රට වැටිලා තිබෙන තත්ත්වය අනුව මේ රට ගොඩනඟන්න ආයෝජකයන් රටට ගෙන්වා ගැනීමේ අවශ්‍යතාව ඉතා තදින් දැනෙනවා. ඒ වාගේම රටේ තිබෙන කර්මාන්තශාලා ටික ඉතාම වේගයෙන් කඩාගෙන වැටෙනවා. මහා පරිමාණ කර්මාන්තශාලා, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තශාලා යන සියල්ල ඉතා වේගයෙන් කඩාගෙන වැටෙනවා. ඒ කර්මාන්තශාලා කඩාගෙන වැටුණොත් පළමුවෙන්ම අලාභය, පාඩුව සිද්ධ වෙන්නේ කර්මාන්තකරුවාට. අපේ කම්කරුවාට තමයි එයින් හානි සිදු වන්නේ, කම්කරුවාට තමයි රස්සාව නැති වෙන්නේ. කර්මාන්ත කඩාගෙන වැටිලා කම්කරුවාට රස්සාව නැති වුණාම, ඒ නැති වෙච්ච රස්සාව වෙනුවෙන් වන්දි ලබා ගන්නේ කොහොමද? මේ රටින් ඒ කර්මාන්ත අකුළාගෙන ගිහිල්ලා නම් අපි ඒ කම්කරුවාට සෙත සලසන්නේ කොහොමද? එහෙම නම් කම්කරු අමාත්‍යාංශය හැටියට අපි සේව්‍ය සේවක දෙපාර්ශ්වය කෙරෙහිම අවධානය යොමු කරන්න ඕනෑ.

අපේ වාසුදේව නානායක්කාර මැතිතුමා බොහොම පැරණි කම්කරු නායකයෙක්. ඒ පැරණි තැන ඉඳගෙන නම් මේ අලුත් ලෝකය ගැන හිතන්න බැහැ කියන එකයි මට එතුමාට කියන්න තිබෙන්නේ. අපි එතුමාට ගරු කරනවා. එතුමා ඇහුවා, "සතියේ දවස් හතරයි වැඩ කරන්නේ. ඉතින්, රට යථා තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ කොහේද?" කියලා. රට යථා තත්ත්වයට පත් කර ගන්න තමයි මේ වැඩ පිළිවෙළ හදන්නේ. එතුමා ඇහුවා, "කෝ වැඩ පිළිවෙළ?" කියලා. මේක තමයි වැඩ පිළිවෙළ. කොරෝනා වසංගතය කාලයේ දවස් තුනක් අපේ කාර්යාල වැඩ කළා. රාජ්‍ය සේවයේ අතිරික්තයක් තිබෙනවාය කියනවා. එහෙම නම්, දවස් හතරකින් වැඩ කරන්න බැරි ඇයි? වැඩ කරන්න පුළුවන් නේ. ඒ නිසා තමයි දවස් හතරක් ඇතුළත උපරිම කාර්යක්ෂමතාවෙන් යුතුව සියලු දෙනා වැඩ කරන්නේ. මේ මිනිස්සු වැඩ කරන්නේ ජාතික යුතුකමක් හැටියටයි. ඒකට අගෞරව කරන්න එපා; හිනා වෙන්න එපා. ඒක හරි වැරදියි. ඒක අර, පරණ වාමාංශික කුහක ගතියයි කියන එක මට කියන්න සිද්ධ වෙනවා. ඒ කියන්නේ වාමාංශික අය කුහකයි කියන එක නොවෙයි. එය ඇතැම් අයගේ තිබෙන ගතියක්. මේ කම්කරු නීති හදලා තිබෙන්නේ කම්කරුවා ආරක්ෂා කරන්න. අපි ඒක පිළිගන්නවා. කම්කරුවා ආරක්ෂා කිරීම වෙනුවෙන් අපි අදත්, හෙටත් පෙනී ඉන්නවා. හැබැයි, කම්කරුවා රැක ගන්න ගමන්ම අපි අනෙක් පාර්ශ්වයත් රැක ගත යුතුයි. එතැනට පයින් ගහලා, තලා පෙළන තැනට කථා කරන්න අපට බැහැ. අපි තැලෙන, පැගෙන, පොඩිවෙන පන්තියේ මිනිස්සු විධියට අපට ඒ ගැන කථා කරන්න අයිතියක් තිබෙනවා. හැබැයි, එතුමා කම්කරුවන් නියෝජනය කරමින්, කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටියාට අපි ඉතින් එතුමාගේ පැටිකිරිය ගැන දන්නවා නේ. ඒ නිසා මම ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ. මොකද, එතුමා කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටියාට, කම්කරු විෂය සම්බන්ධව කථා කළාට, මට තේරෙන විධියට "කථාව දෝලාවෙන් ගමන පයින්" කියනවා වාගේ, කියන එකේ අනෙක් පැත්ත තමයි එතුමා කරන්නේ. කොහොම වුණත් අපි අලුත් විධියට හිතලා නව ලෝකයට ගැළපෙන පරිදි කටයුතු කළ යුතුයි. මේ රටේ කර්මාන්ත වැඩි කරන්න, මේ රටට පැමිණෙන ආයෝජකයන් සංඛ්‍යාව වැඩි කරන්න, ආයෝජන ප්‍රමාණය වැඩි කර ගන්න අපි කටයුතු කළ යුතුයි. ඒ වාගේම අපේ වැඩි පිරිසකට රැකියා ලබා දෙන්නත්, ඒ ලබා දෙන රැකියාවල ගුණාත්මකභාවය වැඩි කරන්නත් කටයුතු කරන්න ඕනෑ. හැමදාමත් පාර කොටන තැන, අව්වේ, වැස්සේ ඉන්න කම්කරුවන් නොවෙයි අපි බිහි කරන්න ඕනෑ.

IT ක්ෂේත්‍රයට, එහෙම නැත්නම් තාක්ෂණ ලෝකයට කම්කරුවන් බිහි කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් තමයි අපි ක්‍රියාත්මක කරන්නේ. එතැනටයි අපි නීති හදන්න ඕනෑ. එතැනටයි අපි නීති-රීති වෙනස් කරන්න ඕනෑ. ඒ නීති-රීති වෙනස් කර ගන්න ඕනෑ. කාන්තාවන්ට, පිරිමින්ට කියලා වෙනම නීති හදාගෙන, වෙනස්කම් - discrimination - ඇති කරගෙන හදපු නීති වෙනස් කරන්න තිබෙනවා. වැඩ කිරීමේ දී, රෑ, දවල් කියලා නීති-රීති දාගෙන හිර කරපුවා වෙනස් කරන්න තිබෙනවා. ඒවා වෙනස් කරගෙන ස්ත්‍රී, පුරුෂ භේදයකින් තොරව සියලුදෙනාට එක හා සමානව ඕනෑ වෙලාවක වැඩ කළ හැකි, වැඩ කරන සමාජයක්, වැඩ ලෝකයක් බිහි කරන්න තිබෙනවා; නිර්මාණය කරන්න තිබෙනවා. ඒ වෙනුවෙන් අපි කැප වෙනවා කියන එක මම මතක් කරනවා. ඒ අලුත් ලෝකය ගොඩනඟන්න, අපේ ශ්‍රමිකයාගේ දරුවන්ට වෘත්තීය පුහුණුව ලබා දෙන්න, ඒ අයව ඉහළ තත්ත්වයකට ගෙන එන්න 'ශ්‍රම වාසනා' අරමුදල හරහා අපි වැඩ කටයුතු කරනවා.

මේ දවස්වල කම්කරුවන් ජීවත් වෙන්නේ අමාරුවෙන් බව හැමෝම කථා කරනවා. ඒක සියයට සියයක් ඇත්ත. අපි ඒ කථාව පිළිගන්නවා. කම්කරුවන්ට කෑම, බීම සපයා ගැනීම අමාරුයි. වාහනයට තෙල් ටික ගහගන්න බැහැ. එවැනි ප්‍රශ්න රාශියක් තිබෙනවා. කම්කරුවන් වෙනුවෙන් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප යම් කිසි ප්‍රමාණයකින් වැඩි කරන්න මේ වෙනකොට අපි සාකච්ඡා පවත්වලා තිබෙනවා. ඉදිරියේ දී ඒ

නිශ්චිත අවම වැටුප -අවම කම්කරු වැටුප, පෞද්ගලික ක්ෂේත්‍රයේ අවම වැටුප- වර්ධනය කරලා; දැනෙන ප්‍රමාණයකින් වැඩි කරලා එම සංශෝධන පාර්ලිමේන්තුවට ගෙන එන්නට අපි බලාපොරොත්තු වෙනවා.

ඊට අමතරව, වතු කම්කරුවන්ගේ පැත්තෙන් විශේෂ ඉල්ලීම් ගණනාවක් මේ වනවිට ඉදිරිපත් වෙමින් පවතිනවා. වතු කම්කරුවන් ඉතාම අපහසුතාවෙන් ජීවත් වන්නේ. ඒ අයගේ ඉල්ලීම් සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය පදනම සහ සම්මුතීන් පිළිබඳ අදාළ ආයතන සමඟ සාකච්ඡා පවත්වා වතු කම්කරුවාටත් දැනෙන වැටුප් වර්ධකයක් ලබා දිය යුතුයි කියන තැන අපි - කම්කරු අමාත්‍යාංශය- සිටිනවා. ඒ තමයි, කම්කරුවා වෙනුවෙන් අපේ පෙනී සිටීම. ඒ අය ආරක්ෂා කරනවා කියන එක අපි මතක් කරලා දෙනවා.

වගා කිරීමට ඉඩම් ලබා දීම පිළිබඳව කැබිනට් මණ්ඩලයේ දී කථා කළාද කියලාත් අද ඇහුවා. අපේ ප්‍රවාහන අමාත්‍යතුමා භාරයේ තිබෙන ඉඩම් රාශියක් වගා කිරීම සඳහා ලබා දීමට ඊයේ කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබුණා. ඒ වාගේම වතු සමාගම් ආශ්‍රිතව තිබෙන ඉඩම් විශාල ප්‍රමාණයකුත්, නාගරික සංවර්ධන අධිකාරිය භාරයේ තිබෙන ඉඩම් රාශියකුත් වගා කටයුතු සඳහා තාවකාලික පදනමින් ලබා දෙන්න කැබිනට් මණ්ඩලය තීරණය කළා. ඒ වාගේම වගා කරන්න හැකි තරම් ඉඩ කඩ ලබා දෙන්න ඕනෑය කියන කාරණාව සම්බන්ධයෙනුත් අවධානය යොමු වුණා.

අපි මුලින් සඳහන් කළ, විදෙස්ගත ශ්‍රමිකයන්ගේ වයස් සීමාව පිළිබඳ කාරණය අද දවසේ කථා බහට ලක් වුණා. ගෘහ සේවය සඳහා යොදවන කාන්තාවන්ගේ වයස් සීමාව පිළිබඳව යම් සංශෝධනයක් අපි ඉදිරිපත් කළා. ඒ පිළිබඳව මේ වනවිට මාධ්‍ය තුළ යම් කථා බහක් ඇති වී තිබෙන නිසා මම ඒ ගැන පිළිතුරක් ලබා දෙන්න ඕනෑ. විදේශ මාධ්‍යයක සඳහන් කරලා තිබුණා, රටේ දූප්පත්කම වැඩි වෙච්ච නිසා අපි අඩු වයස් කාන්තාවන් පිටරට යවනවා කියලා. නමුත් ඇත්ත කථාව මේකයි. 2013 අවුරුද්දේ සවුදි අරාබියට වයස අවුරුදු 25ට වැඩි, අනෙක් මැදපෙරදිග රටවලට වයස අවුරුදු 23ට වැඩි සහ ලෝකයේ අනෙක් රටවලට වයස අවුරුදු 21ට වැඩි ලෙස වයස් සීමාව දමන්න ඉස්සෙල්ලා අපේ රටේ වයස අවුරුදු 21ට වැඩි සියලුදෙනා විදේශගත වුණා. හැබැයි, ඒ අවස්ථාවේ ඇති වුණු එක් හුදෙකලා සිද්ධියක් නිසා මේ නීතිය ක්‍රියාත්මක කළා. ඒ සිද්ධියට පාදක වෙච්ච කාරණාව ගැන සොයා බැලුවාම, වයස අවුරුදු 16ක ළමයෙක් තමයි ගෘහ සේවය සඳහා විදේශගත වෙලා තිබුණේ. වයස අවුරුදු 16ක ළමයා එසේ යවා තිබුණේ වංචනික ලෙසයි. ඒ වංචාව නවත්වනවා වෙනුවට මුළු රටටම නීතියක් දැම්මා. මේ නීතිය නිසා එක පැත්තකින් අපි කාන්තාවන්ට අගතියක් සිද්ධ කළා. කාන්තාවන්ගේ මානව අයිතිවාසිකම්වලට අපි අගතියක් සිද්ධ කළා. ඒ වාගේම අපි රටවල් විධියට නම් කරලා සවුදි අරාබියට වයස අවුරුදු 25ට වැඩි, අනෙක් මැදි පෙරදිග රටවලට වයස අවුරුදු 23ට වැඩි සහ ලෝකයේ අනෙක් රටවලට වයස අවුරුදු 21ට වැඩි කියලා නීතියක් දැම්මා. මොකක්ද ඒ ඇති කරපු විෂමතාව? මේ අපේම රටේ මිනිස්සු නම් කොයි විධියටද එහෙම විෂම ලෙස සලකන්නේ? ගත්ත වැරැදි තීන්දුවක්, වැරැදි ප්‍රතිපත්තියක් නිවැරදි කිරීම සඳහා තමයි එහෙම කළේ.

මම මෙන්න මේ කාරණයත් විශේෂයෙන්ම කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ අය නීත්‍යනුකූල මාර්ගයෙන් විදේශගත වුණාම ඒ අයට රක්ෂණයක් ලැබෙනවා; ඒ අයට වගකීමක් ලබෙනවා. ඒ අයට විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ආරක්ෂාව ලැබෙනවා. වයස අවුරුදු 25ට අඩු අය, වයස අවුරුදු 23ට අඩු අය විශාල සංඛ්‍යාවක් මේ රටේ ගුවන් තොටුපළ හරහා visit visa අරගෙන නොයෙක්, නොයෙක් මාර්ගවලින් විදේශගත වෙනවා. ඒ අය ගිහින් ඒ රටවල සේවය කරනවා. ඒ අය අනතුරුවලට ලක් වෙන අවස්ථා තිබෙනවා. නමුත්, විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ඒ අය පිළිබඳ වගකීමක් නැහැ; ඒ අය සමඟ සම්බන්ධ වීමක් නැහැ. ඒ අය නැවත ගෙන්වා ගැනීමට මුදලක් නැහැ. ඒ අය නැවත ගෙන්වා ගැනීමට රක්ෂණයක් නැහැ. ඒ අයට ලෙඩක් දුකක් වුණාම ඒකට උපකාර කරන්න, මරණයක් සිදු වුණාම ඒකට වියදම් කරන්න ක්‍රමවේදයක් නැහැ.

යම් යම් තැන්වලට අනීතිකව සල්ලි බෙදලා, මාෆියාවන්ට යටවෙලා ක්‍රියාත්මක වුණු මේ ක්‍රමය නිවැරැදි කරලා, නීත්‍යනුකූල ක්‍රමවේදයකට විදේශගත කිරීම තමයි මෙහිදී කළේ. එහිදීත් විදේශගතවන කාන්තාවට වැඩි ආරක්ෂාවක් ලැබුණා මිසක්, එතෙක් තිබුණු ආරක්ෂාවේ කිසිම අඩුවක් සිද්ධ වුණේ නැහැ. මේක මේ ආර්ථික අර්බුදය නිසා ගත් තීන්දුවක් නොවෙයි. 2013 අවුරුද්දේ සිදු වුණු වැරැද්දක්, මේක. හිටපු ඇමතිවරු මේක නිවැරැදි කරන්න 2015, 2017, 2018 අවුරුදුවල දිගින්-දිගටම උත්සාහ කළා. මම මේ විෂය භාර නියෝජ්‍ය ඇමතිවරයා විධියට සිටිද්දි විටින්-විට අවස්ථා ගණනාවකදී මේ කටයුත්ත කරන්න උත්සාහ කළත්, ඒ සඳහා අවස්ථාවක් ලැබුණේ නැහැ. නමුත්, මෙවර ඒ සඳහා අවස්ථාව ලැබී තිබෙනවා. මෙය සුවිශේෂී වශයෙන් ආර්ථික ප්‍රශ්නයක් විසඳීම වෙනුවෙන් කරපු දෙයක් නොවෙයි.

ආරක්ෂාව ගැන කථා කරනකොට ඇතැම් අය කියනවා, C 190 සම්මුතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා. දැනට අපි පාර්ලිමේන්තුවේ තිබෙන විශේෂ කාරක සභාවකට ඒ පිළිබඳව වැඩිදුරටත් සාකච්ඡා කරන්න භාර දීලා තිබෙනවා. මොකද, මේ සම්මුතිය අත්සන් කළාට පමණක් මදි. හිංසනය සහ වධහිංසා වැළැක්වීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය ක්‍රියාත්මක කරන්න පුළුවන් පරිසරය අපේ රට තුළ තිබෙනවාද, අපේ රටේ නීති පද්ධතියට ඒක absorb කර ගන්න පුළුවන්ද කියන කරුණු පිළිබඳව සොයා බලන්න අපි ඒ විශේෂ කාරක සභාවට භාර දීලා තිබෙනවා. එතැනින් තීන්දුවක් ලැබුණු පසු අපට ඒ සම්බන්ධයෙනුත් ඉදිරියට යන්න පුළුවන්.

ඊට අමතරව, විදේශ සේවා නියුක්ති කාර්යාංශය විධියට අපේ ශ්‍රමිකයන් සම්බන්ධව තිබෙන නීති-රීති ලිහිල් කරනවා වාගේම ඒ අය ආරක්ෂා කරන වැඩ පිළිවෙළකුත්, ඒ අය නැවත ලංකාවට ගෙන්වා ගැනීමට සහ ඒ අය නැවත මෙහි රැකියාගත කිරීම සඳහා වැඩ පිළිවෙළකුත් අපි ක්‍රියාත්මක කර තිබෙන බවත් මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි.

මෙම පනත් කෙටුම්පත පිළිබඳව අදහස් දැක්වූ, මේ සම්බන්ධයෙන් විවේචන ඉදිරිපත් කළ සියලුදෙනාට අපේ ස්තූතිය පිරිනමනවා. ඒ වාගේම, මේ වැදගත් නීතිය සකස් කරන්න උදව් වුණු සියලුදෙනාටත් අපේ ස්තූතිය පළ කරනවා. අපේ මොහාන් පී. ද සිල්වා මැතිතුමා කිව්වා, මේ නීතිය ගෙනාවාය කියලා මහෙස්ත්‍රාත්තුමන්ලාට කිසිම හිත් වේදනාවක් ඇති වෙන්නේ නැහැ කියලා. ඒක ඇත්ත. මේ තුළින් අධිකරණ පද්ධතියට, අපේ ගරු මහෙස්ත්‍රාත්තුමන්ලාට කිසිදු ආකාරයක අගතියක් වන්නේ නැහැ. එහෙම නැත්නම්, ඒ අය පිළිබඳව අඩු සැලකිල්ලක් දැක්වීමක් නොවෙයි, මේ තුළින් කරන්නේ. අපේ කම්කරුවන්ගේ, අපේ වින්දිතයන්ගේ නඩු විසඳාගන්න බැරිව ඔවුන් අවුරුදු ගණන් ළ තැවෙනවා. ඒ අයගේ නඩු කටයුතු ඉක්මන් කර ගැනීම සඳහා වූ සමගාමී බලයක් ලබා දීම පමණයි මේ තුළින් කරන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තූතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*

*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***

***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු මනූෂ නානායක්කාර මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*

*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு மனுஷ நாணாயக்கார]*

*Resolved:*

*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Manusha Nanayakkara.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***

***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*

*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*

*[*THE HON. DEPUTY SPEAKER *in the Chair.]*

***1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 1 ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- (කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා, අතිරේක මහෙස්ත්‍රාත්වරයකු ලෙස සලකනු ලබන බව)

## வாசகம் 2.- (தொழில் நியாய சபையின் தலைவர் மேலதிக நீதிவானொருவராகக் கருதப்படுதல்)

CLAUSE 2.- (*President of the labour tribunal to be deemed as an Additional Magistrate*)

**ගරු මනූෂ නානායක්කාර මහතා**

(மாண்புமிகு மனுஷ நாணாயக்கார)

(The Hon. Manusha Nanayakkara)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ, 13 වන පේළියේ සිට 18 වන පේළිය දක්වා ඇති පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'1 වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රඥප්තීන් හා ඊට ආනුෂංගික විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා (131 වන අධිකාරය වූ) කාර්මික ආරවුල් පනතේ 31අ වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ සෑම කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් ම ලිඛිත නීති මගින් පවරන ලද බලතල සහ කාර්යයන්ට අමතරව මහේස්ත්‍රාත්වරයකු වෙත පවරන ලද බලතල ද ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.' "

(2) "1 වන පිටුවේ, 19 වන සහ 20 වන පේළි ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(2) මේ පනතේ කාර්ය සඳහා, ඉහත සඳහන් කරන ලද කම්කරු විනිශ්චය අධිකාරයක අධිකරණ බලය, (3) වන උපවගන්තියේ' "

(3) "2 වන පිටුවේ, 2 වන පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'විනිශ්චය අධිකාරයක අධිකරණ බලය, එම' "

(4) "2 වන පිටුවේ, 6 වන සහ 7 වන පේළි ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(4) සැක දුරු කිරීම සඳහා, නිශ්චිත ප්‍රඥප්තීන් හි නිශ්චිතව දක්වා ඇති මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වන බලතල හැර වෙනත් යම් බලතල, II වන උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 2, as amended, ordered to stand part of the Bill.*

## 3 වන වගන්තිය.- (1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ සහ (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ විධිවිධාන අදාළ වීම)

## வாசகம் 3.- (1979ஆம் ஆண்டின் 15ஆம் இலக்க, குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவைச் சட்டம் மற்றும் (14ஆம் அத்தியாயமான) சான்றுக் கட்டளைச் சட்டத்தின் ஏற்பாடுகளின் ஏற்புடைமை)

CLAUSE 3.- (*Applicability of the provisions of Code of Criminal Procedure Act, No. 15 of 1979 and Evidence Ordinance (Chapter 14)*)

**ගරු මනූෂ නානායක්කාර මහතා**

(மாண்புமிகு மனுஷ நாணாயக்கார)

(The Hon. Manusha Nanayakkara)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "2 වන පිටුවේ, 11 වන සහ 12 වන පේළි ඉවත් කර පහත දැක්වෙන පේළි ආදේශ කරන්න:

'3. (1) II වන උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වන ලද කම්කරු විනිශ්චය අධිකාරයක සභාපතිවරයා, යම්' "

(2) "2 වන පිටුවේ, 22 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන පේළි ඇතුළත් කරන්න:

'(2) මේ පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වන ලද කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා නිසි ලෙස පත්කරන ලද රෙජිස්ට්‍රාර්වරයකු සහ ආනුෂංගික කාර්ය මණ්ඩලයක් සිටිය යුතු ය. ;' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 3, as amended, ordered to stand part of the Bill.*

***4 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*4ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 4, ordered to stand part of the Bill.*

## I වන උපලේඛනය
அட்டவணை I
SCHEDULE I

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"4 වන පිටුවේ, I වන උපලේඛනයේ 49 වන අයිතමය ඉවත් කරන්න."

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***I වන උපලේඛනය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*அட்டவணை I திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Schedule I, as amended, ordered to stand part of the Bill.*

***II වන උපලේඛනය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*அட்டவணை II சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Schedule II, ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சட்டமாகு வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Enacting Clause ordered to stand part of the Bill.*

## දීර්ඝ නාමය
விரிவுப் பெயர்
LONG TITLE

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"දීර්ඝ නාමය ඉවත් කර පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කරන්න:

'නිශ්චිත ප්‍රඥප්තිවල විධිවිධාන යටතේ සියලුම බලාත්මක කිරීමේ කාර්ය පටිපාටි සහ අපරාධ නඩු ඇසීම, විභාග කිරීම, තීරණය කිරීම සහ අවසන් කිරීම සඳහා කම්කරු විනිශ්චය අධිකාර බලාත්මක කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විශේෂ විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.' "

"1 වන පිටුවේ, දීර්ඝ නාමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***දීර්ඝ නාමය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***
*விரிவுப் பெயர் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Long Title, as amended, ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා හා මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## කල්තැබීමේ ප්‍රශ්න
ஒத்திவைப்பு வினாக்கள்
ADJOURNMENT QUESTIONS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 1, ගරු දිලිප් වෙදආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 2, ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය.

**ගරු මංජුලා දිසානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க)
(The Hon.(Mrs.) Manjula Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මෙම ප්‍රශ්නය යොමු කරන්නේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා වෙතයි.

[ගරු මංජුලා දිසානායක මහත්මිය]

ඉන්ධන මිල ඉහළ යාමත් සමඟ ජනතාව වැඩි වශයෙන් පොදු ප්‍රවාහනය වෙත යොමු වෙමින් පවතී. නමුත්, එම ප්‍රවාහන මාධ්‍ය තුළ විවිධාකාර ගැටලු නිරීක්ෂණය වේ.

(1) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සහ පෞද්ගලික බස් රථවල ගාස්තු ඉහළ දැමීමත් සමඟ ජනතාවට දැරිය නොහැකි මට්ටමේ වියදමක් පැටවී තිබේ. මේ සඳහා යම් විසඳුමක් ලබා දීමට රජයේ අවධානය යොමු වී තිබේද? තිබේ නම්, එම පියවර මොනවාද?

(2) පෞද්ගලික බස් රථ, පාසල් වෑන් රථ, කාර්ය මණ්ඩල ප්‍රවාහන බස් රථ සඳහා නොකඩවා ඉන්ධන ලබා දීමට ක්‍රමවත් වැඩ පිළිවෙළක් තිබේද?

(3) අඩු වියදම් ප්‍රවාහන මාධ්‍යයක් ලෙස දුම්රිය වෙත ජනතාව යොමු වුවත්, ප්‍රමාණවත් දුම්රිය නොමැතිකමින් ජනතාව ඉතා අපහසුවට පත් වීම දක්නට තිබේ. මෙම තත්ත්වය කඩිනමින් විසඳීමට ක්‍රියා මාර්ග ගෙන තිබේද? තිබේ නම්, ඒ මොනවාද?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමිය බස් ගාස්තු සංශෝධනය සම්බන්ධයෙන් ඉතා වැදගත්, කාලීන ප්‍රශ්නයක් ඉදිරිපත් කර තිබෙනවා.

අපේ රටේ ඉතිහාසය ගත්තාම, ඉන්ධන මිල විශාල ලෙස ඉහළ යෑමේ අර්බුදයට දැන් අපි මුහුණ දෙන බව ඔබතුමාත් දන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ වන විට අසාමාන්‍ය ලෙස ඉන්ධන මිල ඉහළ ගොස් තිබෙනවා. එයට එක් හේතුවක් තමයි, ලෝක වෙළෙඳ පොළේ අද පවතින තත්ත්වය. ඒ තත්ත්වය තුළ ඉන්ධන මිල විශාල ලෙස වැඩි වෙලා තිබෙනවා. ඊළඟ හේතුව, රුපියල අවප්‍රමාණය වීම. රුපියල අවප්‍රමාණය වීම සමඟ රුපියල් 205ක් ගෙවපු ඩොලරයට රුපියල් 360ක් ගෙවීමට සිදු වෙලා තිබෙනවා. ඒ නිසා ආනයනවල රුපියල් පිරිවැය විශාල ලෙස වැඩිවෙලා තිබෙනවා.

ඒ සහනය සැලසීමේ අරමුණින් බස් ගාස්තු සංශෝධනයට ඉන්ධන ගැළපුමක් පමණයි කරලා තිබෙන්නේ. එතුමිය තවදුරටත් අහනවා, වාර ප්‍රවේශපත්‍ර සඳහා ලබාදෙන සහන ගාස්තු ගැන. ඒවා එලෙසින්ම ලබා දෙනවා. විශ්වවිද්‍යාල හා සාමාන්‍ය මගීන් සඳහා ගාස්තුවෙන් සියයට 35කුත්, පාසල් සිසුන් සඳහා ගාස්තුවෙන් සියයට 7ක ප්‍රමාණයක් පමණයි ඒ සඳහා අය කරන්නේ. ඒ නිසා ඒ වැඩිවන ගාස්තුවේදීත් ලබා දුන්න සහනාධාර ප්‍රමාණය එලෙසින්ම පවත්වාගෙන යනවා.

ගරු මන්ත්‍රීතුමිය විසින් අසන ලද දෙවැනි ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

ඔව්. විදුලිබල සහ බලශක්ති අමාත්‍ය ගරු කංචන විජේසේකර මැතිතුමාත්, අපේ අමාත්‍යාංශයත් සාකච්ඡා කරලා ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළ බස් රථවලට, ඒ කියන්නේ SLTB බස් රථ, පෞද්ගලික බස් රථ, පාසල් වෑන් රථ, සංචාරක බස් රථ කියන ප්‍රවාහන ක්ෂේත්‍රයේ සියලු බස්රථවලට SLTB ඩිපෝ 91ක් මඟින් ඩීසල් ලබාදීම සඳහා කටයුතු යොදලා තිබෙනවා. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විශාල දුෂ්කරතා යටතේ තමයි මේ අතිරේක කාර්ය භාරය භාරගෙන තිබෙන්නේ. ඔවුන් රාත්‍රී කාලයේත් මේ කටයුත්ත කරනවා.

ඒ වාගේම, මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ අලුත් ඉන්ධන පිරවුම්හලක් ආරම්භ කරලා තිබෙනවා. කොළඹ බැස්ටියන් මාවත බස්රථ අංගනයේ නව ඉන්ධන පිරවුම්හලක් ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ නිසා පළාත් නවයෙහි තිබෙන SLTB ඩිපෝ තුළ මේ බස් රථ සඳහා අවශ්‍ය ඉන්ධන ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා තිබෙනවා.

මෙහිදී මම පෞද්ගලික අංශයෙනුත් කරුණාවෙන් ඉල්ලීමක් කරනවා. අතිරේක කාර්ය භාරයක් විධියට පෞද්ගලික අංශයේ බස්රථවලටත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ මඟින් ඉන්ධන ලබාදීමේදී පෞද්ගලික අංශය විසින් සීටීබී සේවකයන් සමඟ සහෝදරත්වයෙන්, සහජීවනයෙන් මේ කටයුත්ත කරගත යුතු වෙනවා. අනෙක් ප්‍රදේශවලදී වාගේ වෙනත් පෞද්ගලික වාහන යනාදියටත් මේ අවස්ථාව ලබාගන්න ගියොත් එතැනදී ගැටුමක් ඇති වෙන්න පුළුවන්. ඒ නිසා ගැටුම් අවම වෙන ආකාරයට සහෝදරත්වයෙන්, සහජීවනයෙන් මේ අමාරුවෙන් බෙදා හරින ඩීසල් ලබා ගන්න කියලා මම පෞද්ගලික අංශයට ආරාධනා කරනවා.

ගරු මන්ත්‍රීතුමිය විසින් අසන ලද තුන්වැනි ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

අඩු වියදම් ප්‍රවාහන මාධ්‍යයක් ලෙස දුම්රිය ප්‍රමාණය වැඩි කිරීමට අපි මේ දිනවල විශාල වශයෙන් ප්‍රමාණාත්මක, ව්‍යුහාත්මක, ගුණාත්මක වෙනස්කම් රාශියක් කරන්න දිගින් දිගටම සාකච්ඡා පවත්වමින් සමහර ප්‍රායෝගික දේවල් කරමින් ඉන්නවා. දැනට අපි දුම්රියවල මැදිරි සංඛ්‍යාව වැඩි කරලා මගීන් ප්‍රවාහනයට වැඩි ඉඩ ප්‍රස්ථා ලබාදීමට කටයුතු කිරීම එක ක්‍රමයක්.

දෙවනුව, නව දුම්රිය කිහිපයක් ආරම්භ කරලා තිබෙනවා. රාජකාරි කටයුතු සඳහා පැමිණෙන කැලණි මිටියාවතේ අයට කැලණිවැලි දුම්රිය මාර්ගයට පාන්දර 6.20ට අලුතින් දුම්රියක් එකතු කළා. මෙතෙක් කල් ඒ මාර්ගයේ ධාවනය වුණේ දුම්රිය 8යි. දැන් දුම්රිය 9ක් ධාවනය කිරීමට අලුතින් කටයුතු යොදලා තිබෙනවා. විනාඩි 15කට පමණ වරක් පමණයි කැලණිවැලි මාර්ගයේ දුම්රිය ධාවනය කරන්න පුළුවන්. ඒ බාධකය මඟ හරවා ගන්න නම් අපි විනාඩි 5කට වරක් දුම්රියක් ධාවනය කරන්න පුළුවන් වෙන ආකාරයට සංඥා ක්‍රමය, සිග්නල්, වෙනස් කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරලා, ආසියානු සංවර්ධන බැංකුවෙන් විශේෂ ආධාරයක් හරි ලබාගෙන මේ සිග්නල් පද්ධතිය නවීකරණය කළොත්, අවිස්සාවේල්ල සිට කොළඹට විනාඩි 5කට වරක් දුම්රියක් ධාවනය කරන්න අප උත්සාහයක් දරනවා.

ඊළඟට, දකුණු පළාතේ දුම්රිය මාර්ගයත්, විදුලි දුම්රිය ප්‍රමාණයත් වර්ධනය කර ගැනීම සඳහා තිබෙන අඩු පාඩු සකස් කර ගන්න උත්සාහ දරනවා. අපි යාපනයට "ජැෆ්නා නයිට් එක්ස්ප්‍රස්" කියලා අලුත් දුම්රියක් පටන් ගත්තා. එය සම්පූර්ණයෙන් සුඛෝපභෝගී, සම්පූර්ණයෙන් වායු සමීකරණය කළ දුම්රියක්. සිකුරාදා දිනවල රාත්‍රී 10.00ට ගල්කිස්ස දුම්රිය ස්ථානයෙන් පිටත් වෙලා පාන්දර 5.30ට කන්කසන්තුරය දුම්රිය ස්ථානයට ළඟා වෙනවා. ඊළඟට, සෙනසුරාදා එම දුම්රිය කන්කසන්තුරය දුම්රිය ස්ථානයේ නතර කර තිබිලා ඉරිදා රාත්‍රී 10.00ට යාපනයෙන් ගමන් ආරම්භ කරලා කොළඹ කොටුව දුම්රිය ස්ථානයට පාන්දර 5.00ට පැමිණෙනවා. එක මගියෙකුගෙන් රුපියල් 2,800ක ගාස්තුවක් යටතේ තමයි ඒ දුම්රිය ආරම්භ කළේ. ඒ දුම්රිය යන මුල් අවස්ථාවේදී අපට පාඩුයි. මොකද, මගීන් 520ම පිරිලා තිබුණේ නැහැ. ඒ එක ගමන් වාරයකට ඉන්ධන සඳහා රුපියල් ලක්ෂ 13ක් වියදම් වෙනවා. ඒ නිසා රුපියල් 2,800ක ගාස්තුවක් නියම කිරීමෙන් පාඩුවක් සිද්ධ වෙනවා. උතුර-දකුණ යා කරන පාලමක් ලෙසත්, මගීන් අතර

ජනප්‍රිය සති අන්ත සේවාවක් ලෙසත් මෙම දුම්රිය සේවාව අඛණ්ඩව පවත්වාගෙන යෑමට මම අද උපදෙස් දුන්නා. රුපියල් 3,000ක ගාස්තුවකට ගියොත් මෙය අඛණ්ඩව පවත්වාගෙන යා හැකි, ලාභ පාඩු රහිත දුම්රියක් බවට පත් වෙනවා. ඒ නිසා වඩා ආරක්ෂා සහිතව, හොඳ සනීපදායක නින්දකුත් සහිතව, කොළඹ වැඩ කරන අපේ සහෝදර දමිළ ජනතාවට සති අන්තයේ රාත්‍රියේ කොළඹින් පිටත් වෙලා, තමන්ගේ ගම්මානවලට ගිහිල්ලා, පසුව ආ වැඩට පැමිණෙන්න පුළුවන් විධියට මේ දුම්රිය සකස් කරලා තිබෙනවා. යාපනයේ සිට කන්කසන්තුරය දක්වාත් රාජකාරි දුම්රියක් ආරම්භ කිරීම පිළිබඳ මම මේ දිනවල සාකච්ඡා කරමින් සිටිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහනුවර සිට ශීඝ්‍රගාමී දුම්රියක් පටන් ගත්තා. ඒ වාගේම මහනුවරින් මෙහාට එන තවත් එවැනි දුම්රියකුත් ලබා ගැනීමට කටයුතු කරනවා.

පසුගිය දා සති අන්ත පුවත් පතකට වෘත්තීය සමිති විසින් විවිධ චෝදනා රාශියක් එල්ල කර තිබුණු ආකාරය මම දැක්කා. එහිදී දුම්රිය සේවාව මීට වඩා කාර්යක්ෂම කරන්න ඔවුන් සතුව වැඩ පිළිවෙළක් තිබෙන බව ඒ පුවත් පතට දන්වලා තිබුණා. මම කිව්වා, පුවත් පතට දන්වන්න අවශ්‍ය නැහැ කියලා. අපි කැමැතියි, ඕනෑම පාර්ශ්වයක් දෙන හොඳ යෝජනා තිබෙනවා නම් ඒවා කාර්යක්ෂමව ක්‍රියාත්මක කරන්න. මම ලේකම්වරයාට උපදෙස් දුන්නා, මේ සතිය තුළ එ් අදාළ වෘත්තීය සමිති නායකයන් කැඳවන්න. අපි එකතු වෙලා මේ රටේ ජනතාවට දුම්රිය සේවාව ලබා දෙන්න ඕනෑ. දැනට ක්‍රියාත්මක වන දුම්රිය සේවයෙන් දිනකට මිලියන 25ක් අලාභ පිට තමයි පවත්වාගෙන යන්නේ. අපි එකතු වෙලා පොදු ප්‍රවාහනය දියුණු කිරීම සඳහා දුම්රිය සේවාව දියුණු කරගන්න කටයුතු කරන්න ඕනෑ.

අපේ යදාමිණී ගුණවර්ධන මන්ත්‍රීතුමා ගරු සභාවේ සිටින වෙලාවේ මේ කාරණයත් මා සඳහන් කරන්න ඕනෑ. පසුගිය කාලයේ කැලණිවැලි දුම්රිය මාර්ගයට තිබූ විදුලි දුම්රිය යෝජනා ක්‍රමය නවතා තිබුණා. මම ලේකම්තුමාට නැවත උපදෙස් දුන්නා, කොයි ලෝකයෙන් හෝ මුදල් සොයාගෙන, මේ රටේ ඉතා විශාල ප්‍රවාහන පරිවර්තනයක් කරන්න පුළුවන් වන ආකාරයට කැලණි මිටියාවත දුම්රිය මාර්ගයේ විදුලි දුම්රිය යෝජනා ක්‍රමය කෙසේ හෝ ක්‍රියාත්මක කරන්න කියලා. අතිගරු ජනාධිපතිතුමාත් එය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ අවසරයක් ලබා දුන් බවත් මම මේ වෙලාවේ මතක් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා.

ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

## අර්බුදකාරී තත්ත්වය තුළ අධ්‍යාපනයට ඇති බාධා ඉවත් කිරීම
## நெருக்கடியான சூழ்நிலையில் கல்விக்கான தடைகளை நீக்குதல்
## REMOVAL OF OBSTACLES TO EDUCATION DURING CRISIS SITUATION

[අ.භා. 4.17]

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාස්කු දින ප්‍රහාරය, කොවිඩ් වසංගතය සහ ආර්ථික අර්බුදය වැනි කරුණු කේන්ද්‍රකොට ගනිමින් 2019 වර්ෂයේ සිට අඛණ්ඩවම ශ්‍රී ලාංකිකයන් මුහුණ දෙන සමාජ-දේශපාලන ව්‍යසනයෙන් දිගු කාලීනව දැඩිම හානිය සිදුව ඇත්තේ ශ්‍රී ලාංකීය දූ පුතුන්ගේ අධ්‍යාපනයට බව මේ සභාවේ විශ්වාසයයි.

ඉගෙනුම අහිමි වීම මෙන්ම කාලය අහිමි වීම නිසා අපේක්ෂාභංග වූ මෙන්ම මානසික ආතතිය උත්සන්න වූ පාසල් දරුවන් මෙන්ම විශ්වවිද්‍යාල දරුවන් වෙත වඩාත් සංවේදීව විසඳුම් සෙවීම වැඩිහිටි වගකීම වේ.

පෙර පාසල් -පූර්ව ළමා විය- බිළිඳුන් පවා මෙම අර්බුදයේ වින්දිතයින් බවට පත්වී සිටී.

මෙවැනි පසුබිමක ප්‍රතිපත්ති සම්පාදකයන් ලෙස අපගේද, පුරවැසියන්ගේද ප්‍රමුඛ වගකීම විය යුත්තේ කුමන ව්‍යසනකාරී පසුබිමක් තුළ හෝ දරුවන්ගේ අධ්‍යාපනයට ඇති බාධා ඉවත් කිරීම සඳහා සියලු සාම්ප්‍රදායික බෙදීම් පසෙක ලා එක්ව කටයුතු කිරීම මේ සභාවේ අත්හැරිය නොහැකි වගකීම බැවි යෝජනා කරමි."

ඒ අනුව, දරුවන්ගේ අධ්‍යාපනයට ඍජුව බලපෑම් කළ හැකි සියලු සාධක සුබවාදීව කළමනාකරණය කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ සමඟ එක්ව ඔබතුමන්ගේ මාර්ගෝපදේශකත්වයෙන් පාර්ලිමේන්තුවේ සියලු පක්ෂ නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් විශේෂ කාරක සභාවක් පත්කොට ජාතියේ දූ දරුවන්ගේ අනාගතය නිරවුල් කිරීමට දායක වන්නැයි මා කාරුණිකව ඉල්ලා සිටිමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් ආදරණීය පියෙක් බව මා පෞද්ගලිකව දන්නවා. ඒ නිසා මේ සභාව කල් තැබීමේ යෝජනාව ඔබතුමා මෙම ගරු සභාවේ මූලාසනය දරන වෙලාවක ඉදිරිපත් කරන්න ලැබීම සතුටක්.

2020 මාර්තු මස කොවිඩ් පළමු රැල්ලට පාසල් වහපු දිනයේ පටන් වසර දෙකකුත් මාස තුනකට වැඩි කාලයක් මේ වනවිට ගත වෙමින් තිබෙනවා. මේ කාල සීමාව තුළදී තරම් දරුවන්ට අධ්‍යාපනයට නොකඩවා බාධක පැමිණි කිසිම කාල සීමාවක් නිදහසින් පසු ගෙවුණු වසර හැත්තෑහතර තුළ තිබුණා යැයි මා විශ්වාස කරන්නේ නැහැ.

පසුගිය සතියේ COPA එක හමුවේ කරුණු දක්වමින් අධ්‍යාපන ලේකම්වරයා පැවසූ පරිදි, 2020 වසර අවසානය වනවිට අපේ රටේ දරුවන්ට ඔවුන්ගේ පාසල් අධ්‍යයන කාලයෙන් සියයට 58ක්ද, 2021 වසරේ අගෝස්තු වනවිට පාසල් අධ්‍යයන කාලයෙන් සියයට 88ක්ද අහිමි වී තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. තවදුරටත් අධ්‍යාපන ලේකම්වරයා පැවසූ පරිදි ඊටත් වඩා අවාසනාවන්ත විධියට දරුවන්ගේ අධ්‍යයන කාලය අහිමි වීමේ අවදානමකට වර්තමානය වනවිට අපි මුහුණ පා සිටිනවා. වසංගත තත්ත්වය මුළු ලෝකයටම එක හා සමාන නොවුවත්, අඩු වැඩි වශයෙන් දරුණු බලපෑම් එල්ල කළත්, සංවර්ධිත රටවල් තම දරුවන්ගේ අධ්‍යාපනය අඛණ්ඩව පවත්වාගෙන යෑමට තිබුණු බාධා හැකි තරම් අවම කර ගන්නට සමත් වුණා. නමුත් අප රට වැනි දියුණු වෙමින් පවතින රටක ස්වභාවයෙන්ම පවතින අධ්‍යාපන විෂමතාව, මෙවැනි අභියෝගාත්මක අවකාශයක් තුළ වඩාත් පුළුල් වීමේ අවාසනාවන්ත තත්ත්වයට අප මුහුණ දුන්නා. උදාහරණයක් ලෙස ගත්තොත්, කොවිඩ් පළමු රැල්ලට අපි මුහුණ දෙන විට අපේ රටේ අධ්‍යාපනය පමණක් නොව උසස් අධ්‍යාපනය, දුරස්ථ අධ්‍යයන, online අධ්‍යාපන හෝ ස්වයං අධ්‍යයන සඳහා කිසිම සූදානමක් හෝ කිසිම පසුබිමක් රජය පැත්තෙන් නිර්මාණය වී තිබුණේ නැහැ. ඒ වාගේම online අධ්‍යාපනයද වරප්‍රසාදයක් තරමට දරුවන්ගෙන් යම් ප්‍රතිශතයකට පමණක් සීමාවී තිබුණා. එයට යම් පිළියමක් ලෙස මා අධ්‍යාපන අමාත්‍ය ධුරය දැරූ කුඩා කාල සීමාව

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

තුළදී ශ්‍රී ලංකාවේ ඉතා වේගයෙන්ම ක්‍රියාත්මක වුණු ව්‍යාපෘතියක් ලෙස "ගුරු ගෙදර" නමින් ද්විභාෂික අධ්‍යාපනික නාළිකාවක් හඳුන්වා දෙන්න අපට හැකි වුණා පමණක් නොවෙයි, ඒ හරහා පාඩම් 2,000කට අධික ප්‍රමාණයක් විකාශය කරන්නත් අපි සමත් වුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ විතරක් නොවෙයි, ඉතිහාසයේ පළමුවැනි වතාවට අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශන බලපත්‍ර අපි ලබා ගත්තා. එම විකාශන බලපත්‍ර මේ දක්වා ප්‍රයෝජනයට නොගත්තත් එය මතු අනාගතයේදී හෝ ප්‍රයෝජනයට ගත යුතුයි කියා අපි යෝජනා කරනවා. රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන සහ මාධ්‍ය ආයතනද ඇතුළුව මැදිහත් වෙමින් දරුවන්ගේ විෂය නිර්දේශය සහ විභාග අනුබද්ධ අධ්‍යාපනය ලබා දීමට විවිධ ව්‍යාපෘති web එක හරහා වාගේම රූපවාහිනිය හරහා ලබා දෙන්න ඉදිරිපත් වුණා පමණක් නොව රටේ මූලිකම අවශ්‍යතාව සපුරාලීමටද උත්සාහ කළා. ඒ වාගේ එකක් තමයි "DP Education" කියන්නේ. ඒ වෙනුවෙන් කටයුතු කළ සියලු දෙනාට මගේ ගෞරවාදර ස්තුතිය පිරිනමන අතරම තමන්ට හැකි පමණින් දරුවන්ට online සහ දුරස්ථ අධ්‍යාපන හරහා උගන්වන්න උත්සාහ කළ මුළු රටේම අතිබහුතරයක් වූ ගුරුවර-ගුරුවරියන්ට මෙන්ම ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයා දුන්නු විදුහල්පතිවරුන්ටද මා මේ අවස්ථාවේදී හිස නමා ආචාර කරනවා.

අප අමතක නොකළ යුතු වැදගත්ම කරුණ වන්නේ ඒ සියලුම කරුණු දරුවන්ගේ විෂය නිර්දේශ සහ විභාගවලට පමණක් අදාළ වීමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත්, පාසල් අධ්‍යාපනය යනු හුදෙක් විෂය නිර්දේශ, විභාගවලින් ගොඩාක් එහාට ගිය සංකල්පයක්. මා කැමැතියි, මේ මාතෘකාව පෙර පාසල් දරුවන්ගෙන් පටන් ගන්න. පෙර පාසල්, ප්‍රාථමික පාසල් මුල් අවධිය තමයි දරුවන්ගේ මුල් ළමා විය සංවර්ධනයට වැදගත්ම දායකත්වය දක්වන්නේ. මේ කාලයේ තමයි දරුවන් තම මුළු ජීවිතයටම වැදගත් වන සංකල්ප හඳුනාගෙන ඒවාට අනුගත වන්නේ. මේ වන විට මිලියන ගණනක පෙර පාසල් සහ ප්‍රාථමික පාසල් දරු දැරියන්ට එම වැදගත් අධ්‍යයන කාල සීමාව අහිමි වී තිබෙනවා. තව දශකයකින් දෙකකින් ඔවුන් වැඩිහිටි පුරවැසියන් ලෙස සමාජයට එක්වන විට, එ් මුල් ළමා වියේ වුණු අඩුපාඩුව කොතරම් දුරට ඔවුන්ගේ ජීවිතවලට, සමාජයට, පොදුවේ රටට බලපායි ද කියන කරුණ ගැන අපට නිශ්චිත නිගමනයකටවත් එන්නට බැහැ. මා කැමැතියි, එක අවාසනාවන්ත උදාහරණයක් ඔබ හමුවේ තබන්න. මෙවනදා ජනවාරි මුල තම පාසල් ජීවිතයේ අලුත් වාරය ආරම්භ කරන දරුවන්ට සිදුවුණේ මේ වසරේ අප්‍රේල් අන්තිම තම නව පාසල් වාරය අරඹන්න, නැත්නම් අලුත් පන්තියකට යන්නයි. එහෙම වෙලාත් ඔවුන්ට සුමානයක් එක දිගට අලුත් පන්තියට යන්නට වාසනාවක් තිබුණා ද? මා මේ කිසිම පාර්ශ්වයකට ඇඟිල්ල දිගු කරනවා නොවෙයි. ඉතාම අභාග්‍ය සම්පන්න කරුණක් ඔබට මතක් කළා පමණයි.

දෙවැනි කාරණය, සියලු පාසල්වල අඩු වැඩි වශයෙන් hidden curriculum එකක්, නැතහොත් සැඟවුණු විෂය නිර්දේශයන් තිබෙනවා. පාසල් ජීවිතයේ වැදගත්ම අංගයක් ඒ හරහා නිර්මාණය වනවා. දරුවන් ජීවිතයට අවශ්‍ය පෞරුෂය, නායකත්වය, රසාස්වාදය, රසිකත්වය, රුචිකත්වය, විචිත්‍රත්වය මෙන්ම අපි වැනි බහු සංස්කෘතික, බහු ජාතික, බහු ආගමික රටක superpower එක වන විවිධත්වයට ද අවශ්‍ය පසුබිම ලැබෙන්නේ ඒ හරහායි. පාසල් දොරටුව වැසී යාමෙන් අපේ එක් පරම්පරාවකට අහිමි වන, රටට අහිමි වන එම ජීව ගුණය මනින්නට මිම්මක්වත් සිතාගන්නට අපහසුයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

තෙවැනි කාරණය මෙයයි. සෑම දුවෙකුටම, පුතෙකුටම පාසල් කාලය තුළ පමණක් සීමා වුණු, පාසල් කාලය තුළ පමණක් කළ හැකි, ළමා කාලය තුළදී සාක්ෂාත් කරගත හැකි, ළමා කාලයේදී පමණක් අත්විඳිය හැකි අසිරිමත් විෂය බාහිර අත්දැකීම් රාශියක් තිබෙනවා: තම පාසලේ ක්‍රිකට් කණ්ඩායමේ නායකයා වීම, big match එකට නායකත්වය දීම, කවීක කණ්ඩායමේ නායකයා වීම, දැනුම මිනුම කණ්ඩායමට සහභාගි වීම, සමස්ත ලංකා පාසල් සාහිත්‍ය තරගාවලියේ ගද්‍ය හා පද්‍ය ශූරතාව දිනා ගැනීම, පාසල් නාට්‍ය හා ගායනා තරගවලට තම විදුහල නියෝජනය කිරීම, නිවාසාන්තර ක්‍රීඩා උළෙල සඳහා සහභාගි වීම, තම නිවාසයේ නායකත්වය දැරීම, cadettingවලට Hermann Loos ශූරතාව සඳහා රන්ටැඹේ යාම, සුගතදාස ක්‍රීඩාංගණයේ ජවන හා පිටිය තරගයකට පාසල නියෝජනය කිරීම, අධ්‍යාපන චාරිකාව - school trip එක - යැම කියන මේ සියල්ල පාසල් කාලයේ සෑම දරුවෙකුගේම සිහින. ඔවුන්ගේ එම සිහින අද හොරු අරගෙන ගිහින් තිබෙනවා. යළි කවදාවත් තම ජීවිතයේ ලබාගත නොහැකි අත් දැකීම් සමූහයක් ඔවුන්ට අහිමි වෙලා තිබෙනවා. එහි අවාසනාවන්ත ප්‍රතිඵලය මොකක්ද? මා සඳහන් කළ එම විෂය බාහිර ක්‍රියාකාරකම් හරහා තමයි ඔවුන් ජීවිතයට අවශ්‍ය කණ්ඩායම් හැඟීම, එකමුතුකම, එකට වැඩ කිරීම, පරාර්ථකාමිත්වය වැනි ගුණාංග පෝෂණය කර ගන්නේ. අපේ වැඩිහිටියන්ගේ ජනප්‍රිය මතයක් තමයි වර්තමාන පරපුර ආත්මාර්ථකාමීයි කියන එක. එහෙම හිතන්න එපා. පරාර්ථකාමිත්වය ගොඩනගන පාසල් ජීවිතයක් අහිමිවීම හරහා අනාගතයේ සමාජයට බිහිවිය හැකි වැඩිහිටි පරම්පරාව කොහොම වෙයි ද කියලා හිතන්න. ඔවුන්ගේ මනුදම් ප්‍රශ්නකාරී විය හැකියි. නමුත් ඒ කිසිවක් ඒ අසරණ දරුවන්ගේ වරද නොවෙයි. මේ වෙලාවේ දරුවන් ගැන කථා කරද්දී මා විශ්වාස කරනවා, මේ මොහොතේත් මුළු රටම බබළවන එක් පාසල් දරුවෙක් ගැන සඳහනක් නොකළොත් එය විශාල අඩුපාඩුවක් ය කියලා. ඒ තමයි දැනට පැවැත්වෙන ඕස්ට්‍රේලියා ක්‍රිකට් කණ්ඩායමේ ශ්‍රී ලංකා තරග සංචාරය තුළ අප රටට පායා ආ දීප්තිමත් තාරකාවක් වන දුනිත් වෙල්ලාලගේ පුතා. මොරටුව ශාන්ත සෙබස්තියන් සහ කොළඹ ශාන්ත ජෝසප් යන විද්‍යාලවලින් බිහිකළ රටටම ආඩම්බර විය හැකි මේ අවුරුදු 19 හිරිමල් යෞවනයා, බලාපොරොත්තු කඩා බිඳ වැටී නෂ්ටාවශේෂ වූ රටකට ලැබුණු අසිරිමත් නැවුම් පැතුමක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා අනාවැකියක් කියනවා, 2031 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියට ශ්‍රී ලංකාවට නායකත්වය ලබා දෙන්නේ තවමත් ඉස්කෝලේ යන මෙන්න මේ පුතා වෙන්න පුළුවන්. අපි ඔහුට සුබ පතමු.

නැවතත් මා දරුවන්ගේ අධ්‍යාපන ගැටලු දෙසට හැරෙන්නම්. කොවිඩ්-19 වසංගතයට මුළු ලොවක්ම යටපත් වුණු වෙලාවේ එයට නිසි ප්‍රතිචාරයක් දැක්වීමට දියුණුතම රටවල් පවා අපොහොසත් වූ වෙලාවේ අපේ රටට, දරුවන්ට අහිමි වූ දේ ගැන අපට යම් සාධාරණීකරණයක් සැපයිය හැකි නමුදු පසුගිය මාස 9ක කාලසීමාව අපි නිරෝගී ජාතියක් ලෙස ගත කළේ එන්නත්කරණයේ සාර්ථකත්වයෙන්. ඒ නිසාම අපට ඒ වසංගත මාරයාගෙන් මිදෙන්න පුළුවන් වුණා. අප නිරෝගී වී දැන් මාස 9ක් ගත වුණත් අපේ අවාසනාවට එම කාලසීමාව තුළවත් දරුවන්ට නිසි ලෙස පාසල් විවෘත කර තබන්න අපි අපොහොසත් වුණා. මාස තුනක් දිග්ගැස්සුණු ගුරු-විදුහල්පති වැටුප් අර්බුදය, ආර්ථික අර්බුදය හරහා ඇති වුණු ප්‍රවාහන ගැටලු, විරෝධතා සහ අරගළ හරහා නිර්මාණය වුණු සමාජ අස්ථාවරභාවය කියන මේ සියලු දේවල්වල අවසාන ඵලය වුණේ වසංගතය පහව ගියත් දරුවන්ගේ ජීවිතය සාමාන්‍යකරණයට ලක්වීම තව තවත් ප්‍රමාද වීමයි. මෙය ඉතාම කනගාටුදායකයි. අපි සියලු වැඩිහිටියෝ මෙහි විත්තිකරුවෝ. කිසිම කෙනකුට සර්ව පාක්ෂිකව, නිර්පාක්ෂිකව හෝ ස්වාධීනව මේ චෝදනාවෙන් මිදෙන්න බැහැ. ලෝක

සම්මතයට අනුව මිනිසාගේ මූලික අවශ්‍යතා ලෙස ආහාර, ඇඳුම්, නිවාස යන්න අනුපිළිවෙළින් හැඳින්වෙන නමුදු, මා හොඳින්ම දන්නවා, අපේ රටේ නම් අති බහුතරයකගේ මූලික අවශ්‍යතාව වන්නේ අධ්‍යාපනය බව.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කර ඇති කාලය නම් අවසානයි.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මට තව විනාඩි දෙකක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ නිසායි දෙමාපියන් තමන්ගේ කුසට අහරක් නොගෙන, ආහාර සීමා කරමින්, දරුවන්ගේ කුස පමණක් පුරවා ඔවුන්ට අධ්‍යාපනය ලබා දෙන්නේ. ඒ නිසායි රැකියාවට යන අම්මලා, තාත්තලා පවා අලුත් සාරියක්, අලුත් ඇඳුමක් වසරකට වරක්වත් මිලදී නොගෙන ඒ මුදලුත් ඉතිරි කරමින් තම දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් යොදවන්නේ. මෙවැනි ජනතාවක්, මෙවැනි දෙමාපියන් දසලක්ෂ ගණනක් වෙනුවෙන් සංවේදී වෙන්න බැරි ප්‍රතිපත්ති සම්පාදකයන්ගෙන් අපේ රටට ඇති ඵලය කුමක්ද කියා ඔවුන් කල්පනා කරනවා ඇති. අන්න ඒ නිසායි මා සහෝදර ඔබ හමුවේ බැගෑපත්ව මේ ඉල්ලීම කරන්නේ. අවාසනාවට, මා මෙවැනි ඉල්ලීමක් කරන මුල් අවස්ථාව මෙය නොවෙයි. දේශපාලකයන්, ක්‍රියාකාරිකයන්, වෘත්තීයවේදීන්, නිලධාරින්, වැඩිහිටියන් ඇතුළු එකී මෙකී නොකී සියලු දෙනාගේ වගකීම් විරහිත ක්‍රියාපටිපාටිය සහ හැසිරීම් රටාවල ආදීනව වැඩියෙන්ම බලපාන්නේත්, ඒවායේ අයහපත් ප්‍රතිඵලවලින් වැඩිම හානියක් සිදුවන්නේත් මේ රටේ මිලියන ගණනක් වූ අසරණ දූලා, පුතාලාට බව අමතක කරන්න එපා. මෙතැන සිටින මන්ත්‍රීවරු 225 දෙනාටම දරුවන් ඇතත්, නැතත් දාරක ප්‍රේමය කියන උදාර හැඟීම ඔවුන්ට ආගන්තුක දෙයක් යැයි මා විශ්වාස කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අපි දරුවන්ට ප්‍රමුඛත්වය දෙමු. එසේ නම් මා යෝජනා කර සිටිනවා, "සර්ව පාක්ෂික" යන වචනයට සැබෑ අරුතක් දෙමින්, සියලු පාර්ශ්ව නියෝජනය වන පරිදි පාර්ලිමේන්තු සභිකයන්ගෙන් කමිටුවක් පත් කරගෙන, ජාතියේ දරුවන් පෙළෙන ගැටලුවලට ඉතාම කඩිනමින් සාධනීය විසඳුම් සොයන්න එකතු වෙමු කියලා. දරුවන්ගේ අධ්‍යාපනයේ සැබෑ ගැටලු පැහැදිලිව හඳුනාගෙන, ප්‍රමුඛතා පිළිවෙළකට සකස් කරගෙන ඒවාට ප්‍රායෝගික විසඳුම් ඉතාම ඉක්මනින් ඉදිරිපත් කරන්න අපි පැය 24ම, දවස් 7ක්ම වුණත් වෙහෙසෙන්න අදිටන් කර ගනිමු. අපි රටේම දරුවන්ට පොරොන්දු වෙමු, ජූලි මාසයේ තෙවැනි සතිය වන විට අපි ඔවුන්ගේ පීඩනය සමනය කරන විසඳුම් ඉදිරිපත් කරන බවට. හොඳින් මතක තබා ගන්න, දරුවන්ට දෙන පොරොන්දු කඩ කිරීම, ඔවුන්ගේ සිත් බිඳීම දෙවැනි වන්නේ ආනන්තරිය පාප කර්මයන්ට පමණක් බව. "දරුවන්ට අධ්‍යාපනයෙන් ඉවත්වීමට ඉඩ දෙන්න එපා" කියන ඉල්ලීම අපි පක්ෂ භේදයෙන් තොරව හැම දෙනාගේම පොදු ඉල්ලීම බවට පත් කර ගනිමු. එයද සිත්හි තබාගෙන ඒ වෙනුවෙන් පෙරට එන්න මා සහෝදර ඔබ සැමට ආරාධනා කරනවා. මාගේ හිත මිත්‍ර සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් දරුවන්ට අදාළ ගැටලු පිළිබඳව සංවේදී වෙමින්, අප හා එක්ව ඊට අවශ්‍ය විසඳුම් කඩිනමින් ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කරාවි; එතුමා විශේෂ කාරක සභාවක් පත් කරලා, හැමදෙනාගේම සහයෝගය ලබා ගෙන කටයුතු කරාවි කියා විශ්වාස කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
යෝජනාව ස්ථිර කිරීම, ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.32]

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේ ගෙනෙන ලද යෝජනාව මා ස්ථිර කරනවා. නිදහස් අධ්‍යාපනයෙන් ඵල ලැබූ කෙනෙකු හැටියට මෙවැනි යෝජනාවක් ස්ථිර කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මා ප්‍රථමයෙන්ම සතුටු වෙනවා. අපි අසා තිබෙනවා, දැනුම කියන්නේ රටක ප්‍රාග්ධනය බව. රටවල පවතින යුද්ධය නිසා, නොයෙක් අරගළ නිසා මිනිසුන්ගේ දැනුම, ආකල්ප වෙනස් වෙන්න පුළුවන්.

1971 කැරැල්ල නිසා අපේ රටේ තරුණයෝ දහස් ගණනක් මිය ගියා. ඒ තුළ විශාල වශයෙන් හිස් තැනක් ඇති වුණා. 1988-89 කාලයේ තරුණයෝ දහස් ගණන් මිය ගියා. ඒ තුළ බුද්ධි ප්‍රබෝධයේ විශාල හිස් තැනක් නිර්මාණය වුණා. ඉතින්, යුද්ධයකට එහා ගිය, විප්ලවයකට එහා ගිය කොරෝනා වැනි වසංගත තත්ත්වයන්, මේ ඇති වන අනෙකුත් තත්ත්වයන් නිසා ඊළඟ දශක දෙක වනකොට සමාජයට විශාල වශයෙන් බලපෑම් ඇති කරන තත්ත්වයක් නිර්මාණය වෙන්න පුළුවන්. ඒ නිසා එවැනි අනතුරක් දැක, ඒ අනතුරට පිළියම් යෙදීමේ අරමුණින් මේ පාර්ලිමේන්තුව තුළ අපි මේ කතිකාව ආරම්භ කිරීම සුදුසුයි කියන එක මා මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පසුගිය අවස්ථා ගණනාවකදී විශ්වාස කළා, අධ්‍යාපන කටයුතු සාර්ථකව කරගෙන යන්න online ක්‍රමය තුළින් යම් ආකාරයක පිටුවහලක් ලබා ගන්න පුළුවන් කියලා. කොරෝනා සමයේ ගුරුවරු, අපේ දරුවන් නිවාසවල ඉඳගෙන ඒ කියන අධ්‍යාපන ක්‍රමයට ගියා. හැබැයි, අධ්‍යාපන අමාත්‍යාංශයෙන්ම ලද තොරතුරුවලට අනුව අපි දන්නවා online අධ්‍යාපන ක්‍රමය සාර්ථක වෙලා තිබෙන්නේ සියයට 40කටයි කියලා. මොකද, ඒ සඳහා විශාල බාධා තිබෙනවා. ඇති හැකි අයට, -යමක් කමක් තිබෙන අයට- දියුණුවක් තිබෙන ප්‍රදේශවලට online අධ්‍යාපන ක්‍රමය සාර්ථක වුණත් දුෂ්කර පළාත්වලට ඒ අවස්ථාව නැහැ. එළදායී, සඵල තාක්ෂණයක් තිබෙනවා කියා අපි විශ්වාස කරන කොළඹ දිස්ත්‍රික්කයේ වුණත් අවිස්සාවේල්ල වාගේ ප්‍රදේශවල දරුවන්ට එම තාක්ෂණය උපයෝගී කරගන්න බැහැ.

ඉන්දියාවේ offline වැඩ කරන්න පුළුවන් BYJU'S වාගේ සමාගම් තිබෙනවා. ලංකාව තුළත් එවැනි offline සමාගම් හරහා SIM cards යොදාගෙන online නැති වුණත් offline හරහා වැඩ කරන්න පුළුවන් තත්ත්වයක් නිර්මාණය කරන්න පුළුවන් නම්, එවැනි නව නිර්මාණවලට යන්න පුළුවන් නම් වඩාත් සුදුසුයි කියන කාරණය මම කියන්න ඕනෑ. හැබැයි, මේකෙදි එක කාරණයක් කියන්න ඕනෑ. අපට පොතේ තිබෙන දැනුම ඔය කියන කාරණා හරහා දෙන්න පුළුවන්. නමුත් ඒ දරුවන්ට සමාජය තුළ ලැබෙන අත්දැකීම එවැනි ක්‍රම හරහා ලැබෙනවාද? ඒ අය ක්‍රීඩා කරනකොට ලබන අත්දැකීම, පන්ති කාමරය තුළ ලබන අත්දැකීම වාගේම සහෝදර-සහෝදරියන් එක්ක, තමන්ගේ යහළුවන් එක්ක හැසිරෙන්නේ කොහොමද, සමාජය තුළ වගකීමෙන් හැසිරෙන්නේ කොහොමද, පරාජයක් දරා ගන්නේ

[ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා]

කොහොමද, ජයග්‍රහණයේ සතුට අන් අය එක්ක බෙදා හදා ගන්නේ කොහොමද කියන කාරණා පිළිබඳ පළපුරුද්ද, හැකියාව, දැනුම නිර්මාණය කරන්න දුරස්ථ - online - අධ්‍යාපන ක්‍රමය යටතේ අපට පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ පාසල දකින කොට අපට අදටත් විශාල සතුටක් දැනෙනවා. අපට ඒ පාසලට නැවත යන්න බැරි එක ගැන දුකක් ඇති වෙනවා. නමුත් අද නොදැනුවත්වම අපේ දරුවෝ සියලුදෙනාටම අවුරුදු දෙක, තුනක කාලයක් නිතැතින්ම ඒ අයගේ අධ්‍යාපන කාලය, සුන්දර පාසල් ජීවිතය අහිමි වෙලා තිබෙනවා. එතැනින් එහාට පෙර පාසල් දරුවන්ටත් අද ඒ තත්ත්වයට මුහුණපාන්න වෙලා තිබෙනවා. තමන්ගේ අම්මාගෙන්, තාත්තාගෙන් පසුව හමුවන මුල් ගුරුවරයා මුණ ගැහිලා ඒ අධ්‍යාපනය ලබන්න තිබෙන අවස්ථාව නැති වෙලා තිබෙනවා. අනෙකුත් සම්පත්, අනෙකුත් බාහිර දේවල් අහිමි වීමෙන් වාගේම අධ්‍යාපනය නොලැබීම නිසා අහිමි වන දේවල් පිළිබඳවත් අපි යම් සාකච්ඡාවක් ඇති කරන්න ඕනෑ. විශේෂයෙන්ම අපේ දරුවන්ගේ දැස් පාදන ගුරු මෑණිවරුන්ගෙන්, පියවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකර තවදුරටත් දරුවා උකසට තියලා ගුරු වර්ජන වාගේ කාරණාවලට ඉදිරිපත් වෙන්න එපා කියලා.

පසුගිය කාලයේ ගුරු වර්ජන තිබූ අවස්ථාවල ඒ අදාළ වෘත්තිය සමිතිවලට හොරෙන් දරුවන්ට උගන්වපු ගුරු මෑණිවරු, පියවරු හිටියා. දරුවන්ගේ දැස් පාදන්න ඒ අවශ්‍ය පහසුකම් ලබා දෙන්න මුල් වුණු ගුරුවරු විශාල ප්‍රමාණයක් හිටියා. ඒ අයට මේ අවස්ථාවේ අපේ ආචාරය පුද කරන්න ඕනෑ. "අනාගතයේ දැනුම, ප්‍රාග්ධනයයි" කියලා දැනුමෙන් සන්නද්ධ රටක්, ඉදිරියේදී තාක්ෂණයෙන් ගොඩගන්න පුළුවන් රටක් නිර්මාණය කරන්න අපි පාර්ලිමේන්තුවක් හැටියට කටයුතු කළ යුතු වනවා. ඒ සඳහා මේ ඇති වී තිබෙන හිස්තැන -රික්තය- මඟ හරවා ගන්න අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා වන සාකච්ඡාව අද අපි ආරම්භ කරලා, දරුවාගේ අනාගත අභිවෘද්ධිය සකසන්න අවශ්‍ය පියවර ගත යුතුයි කියන කාරණය මම මේ අවස්ථාවේදී අවධාරණය කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ගුණපාල රත්නසේකර මැතිතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.37]

**ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා**
(மாண்புமிகு பீ.வை.ஜீ. ரத்னசேக்கர)
(The Hon B. Y. G. Rathnasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉතාම කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ ගැන මුලින්ම මගේ සතුට පළ කරනවා. 2020 අවුරුද්දේ ඉඳලා කොවිඩ් වසංගතයට මැදිවෙලා දරුවන්ට අධ්‍යාපනය අහිමි වුණා.

ඒ වාගේම, දැන් බලශක්ති අර්බුදය හේතු කොට ගෙන ප්‍රවාහන ගැටලුව ආදිය නිසාවෙන් දරුවන්ගේ අධ්‍යාපනය නැවතත් සම්පූර්ණයෙන් නවතින තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මේ පවතින අර්බුදය හේතුවෙන් ආර්ථිකයට වෙච්ච පාඩුව අපට ගණනය කළ හැකියි; විදේශ විනිමය අහිමි වුණු ප්‍රමාණය ගණනය කළ හැකියි; දේශීය වශයෙන් අපේ ආදායම අහිමි වුණු ප්‍රමාණය ගණනය කළ හැකියි. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපනය විනාශ වීමෙන් ඇති වුණු ව්‍යසනය, එහි පාඩුව, අලාභය අපට දැනෙන්න තවත් ටික කාලයක් යයි. ඒ වනකොට මේ රටේ බිහි වන ජනතාව මේ රටේ අනාගතය භාර ගන්න ඉන්න ජනතාවද කියන ගැටලුව අපට ඇති වනවා. එම නිසා මේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය හා සම්බන්ධ බාධා ඉවත් කිරීම පිණිස කඩිනමින් විසඳුම් ඉදිරිපත් කිරීම සඳහා විශේෂ කාරක සභාවක් පත් කිරීම අවශ්‍යයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Premajayantha -Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. PREMNATH C. DOLAWATTE *took the Chair.*

**ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා**
(மாண்புமிகு பீ.வை.ஜீ. ரத்னசேக்கர)
(The Hon B. Y. G. Rathnasekara)

එම කාරක සභාව ඉතාම ඉක්මනින් -දවසක්වත් කල් නොයවා - පත් කරලා ඉහත කී කාරණය සම්බන්ධයෙන් ගත හැකි විකල්ප ක්‍රියා මාර්ග මොනවාද යන්න ගැන දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා, දරුවන්ගේ අධ්‍යාපනය නඟා සිටුවීම සඳහා ඉක්මන් ක්‍රියා මාර්ගයක් ගත යුතුයි කියන කාරණය මමත් අවධාරණය කරනවා.

අද විශේෂයෙන්ම ප්‍රවාහන ගැටලු හේතුවෙන් ළමයින්ට පාසල් එන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. නමුත් අප මොන ක්‍රමයකට හෝ ළමයින්ට ඒ අවස්ථාව ලබා දිය යුතුයි. අපට තිබෙන විදේශ විනිමය හරහා ලබා ගන්නා ඉන්ධන ප්‍රමාණයෙන් ප්‍රමුඛතම අවශ්‍යතාවක් හැටියට සලකා පාසල් දරුවන්ට පාසල් ඒමටත්, විශේෂයෙන්ම පාසල්වල ඉගැන්වීම් කටයුතු කරන ගුරුවරුන්ට පාසල් ඒම සඳහා ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමටත් අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය කෙසේ හෝ සපයා පාසල් අධ්‍යාපන කටයුත්ත යාවත් කාලීන කිරීම, යථා තත්ත්වයට පත් කිරීම අත්‍යවශ්‍ය කරුණක් හැටියටයි මම මේ මොහොතේ දකින්නේ. වෙනදා වාගේ ළමයින්ට සාමාන්‍ය වාර ප්‍රවේශ පත්‍රයක් අරගෙන එන්න පුළුවන් SLTB මඟින් ක්‍රියාත්මක කරන පාසල් බස් රථ සේවය තව ටිකක් පුළුල් කළොත්, ඒ බස් රථයෙන්ම ගුරුවරුන්ටත්, ශිෂ්‍යයන්ටත් පාසලට ඒමේ හැකියාව ලැබෙනවා. මා හිතන විදියට, එම ක්‍රමය ගුරුවරුන්ට හා ශිෂ්‍යයන්ට පුරුදුයි. ඒ නිසා මම ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා

ලංකා ගමනාගමන මණ්ඩලයත් එක්ක සාකච්ඡා කරලා පාසල් බස් රථ සේවාව පුළුල් කරන්න කියලා. මම මේ කියන්නේ පාසල් වෑන් රථ සේවා ගැන නොවෙයි. මොකද, ඒවායින් ගෙන යන්න පුළුවන් පිරිස අඩුයි. එතකොට ඉන්ධන ප්‍රශ්නයත් එක්ක ගැටලුවක් එනවා. ඒ නිසා පාසල් බස් රථ සේවය ප්‍රමාණාත්මකව පුළුල් කර, බස් රථ සංඛ්‍යාව වැඩි කර, ඒවාට අවශ්‍ය ඉන්ධන ප්‍රමාණ සපයා දරුවන්ට අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව කල් යවන්නේ නැතිව, වහාම සැලසිය යුතුයි. දරුවන්ට සති දෙකක් පාසලට යා නොහැකි වන බවක් කියැවුණා. සති දෙකක් කල් යවන්නත් එපා. මොකද, මෙහි පාඩුව අධිකයි. මෙයින් මිල කළ නොහැකි, ගණන් බැලිය නොහැකි පාඩුවක් සිදු වෙනවා. මා කලිනුත් කිව්වා වාගේ, මේ පාඩුව මකා ගැනීම සඳහා හැකිතාක් ඉක්මනින් විශේෂ කාරක සභාවක් පත් කරලා ඉක්මන් තීන්දු අරගෙන, අධ්‍යාපන කටයුතු යථා තත්ත්වයට පත් කරන්න ගත හැකි සෑම ක්‍රියා මාර්ගයක්ම ගන්න කියා මා ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත යාපාබණ්ඩාර මැතිතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.40]

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ඉතාම කාලෝචිත යෝජනාවක් මෙම උත්තරීතර සභාවට ගෙන ඒමට කටයුතු කළ හිටපු අධ්‍යාපන අමාත්‍ය ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මේ අර්බුද ගණනාව හමුවේ අප අතරින් වියැකී යන, අත් හැරී යන මාතෘකාවක් පිළිබඳව සුවිශේෂ පණිවුඩයක් මේ සමාජයට සහ රජය වෙත ලබා දීමට ඔබතුමා ගත් උත්සාහය අපි අගය කරනවා.

පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් පසු අපේ දරුවන්ගේ අධ්‍යාපනය දැවැන්ත කඩා වැටීමකට ලක් වුණු බව අපි දන්නවා. ඒ වාගේම පසුගිය කොවිඩ් ව්‍යසනය හමුවේත් අපට සිද්ධ වුණා අතිශය අකමැත්ත සහිතව වුණත් දරුවන්ට අධ්‍යාපනය ලබා දීම අත් හැර දමන්නට. ඒ වාගේම තමයි මේ ආර්ථික අර්බුදය හමුවේත් දරුවන්ගේ අධ්‍යාපනය විශාල වශයෙන් අඩාළ වී යන තත්ත්වයකුයි තිබෙන්නේ.

මා විශ්වාස කරනවා අප හැමකෙනාම අද මේ පාර්ලිමේන්තුව තුළ සිටින්නේ අධ්‍යාපනයේ කිසියම් පරිච්ඡේදයක් කරා ළඟා වීම හේතු කොට ගෙනයි කියලා. ඒ වාගේම, මම විශ්වාස කරනවා නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිඵලයක් විධියට අපට විශ්වවිද්‍යාලවලට, උසස් අධ්‍යාපන ආයතනවලට පිවිසීමට හැකියාව ලැබුණේත් පාසල් අධ්‍යාපනය තුළ ලබා ගත් අත් දැකීම් සමුදාය හේතු කොට ගෙනයි කියලා. අද වනකොට දෙමාපියන්ට පුළුවන්කමක් නැහැ, තම දරුවා මෝටර් බයිසිකලයෙන් පාසල වෙත රැගෙන යෑමට; බස් රථයකින් පාසල වෙත රැගෙන යෑමට; ත්‍රිරෝද රථයකින් පාසල වෙත රැගෙන යෑමට. මේ ඉන්ධන අර්බුදය හමුවේ දරුවන්ගේ පාසල් අධ්‍යාපනය දැඩි ලෙස අඩාළ වී තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මුළුමහත් සමාජය තුළ අත් දැකීම් සමුදායක් ලබා ගැනීමේ අවස්ථාව අහිමි වන පාසල් දරුවන් පිළිබඳව සුවිශේෂී අවධානය යොමු විය යුතු බවයි මා ප්‍රකාශ කරන්නේ.

පවතින සමාජ, දේශපාලන හා ආර්ථික රටාව තුළ, දරුවන්ගේ වාගේම ගුරුවරුන්ගේ හා දෙමව්පියන්ගේ අතිශය කාර්ය බහුලත්වය මත අද දූ දරුවන් අධ්‍යාපනය ලබා ගැනීමට යොමු වෙලා තිබෙන්නේ අප මීට දශක තුනකට හතරකට කලින් අධ්‍යාපනය ලබා ගත් ක්‍රමයට නොවෙයි. මීට දශක හතරකට වාගේ කලින් වඩාත් ප්‍රචලිත ලෙස, ප්‍රබල ලෙස ග්‍රාමීය මට්ටම රට පුරා ව්‍යාප්ත වෙලා තිබුණු නිසාවෙන් කෙතේදී, කමතේදී දරුවාට විවිධ අත් දැකීම් ලබා ගැනීමට පුළුවන්කම ලැබුණා. නමුත්, එදා වාගේ ප්‍රායෝගික අත් දැකීම්වලට යොමු වෙන්න අද දරුවාට වාතාවරණයක් ඇත්තේ නැහැ. ඒ නිසා දරුවාට සමාජය පිළිබඳව අත් දැකීම් ලබා ගැනීමට පුළුවන් එකම තැන බවට පත් වෙලා තිබෙන්නේ පාසලයි. නමුත් මේ ආර්ථික අර්බුදය හමුවේ පාසල් අධ්‍යාපනය අපේ දරුවන් කෙරෙන් දැඩි ලෙස ඉවත් වෙලා යන නිසාවෙන් දරුවා පරිපූර්ණත්වයට පත් වන්නේ සැබෑ මනුෂ්‍යයෙකු ලෙසද කියන බේදනීය ප්‍රශ්නය අපේ සිත් තුළ හැම දාම බුර බුරා පැන නඟිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාසල් අධ්‍යාපනය ලබන දරුවන් තිදෙනෙකුගේ පියෙකු වශයෙන් මා කියනවා, මේ දරුවන් ලබන පීඩනය වැඩි බව සහ ඔවුන්ගේ අත් දැකීම් මඳ බව නිබඳවම අපට දැනෙන කාරණාවක් කියලා. මේ නිදහස් අධ්‍යාපනය තුළින්ම අධ්‍යාපනය ලබා ආචාර්ය උපාධි මට්ටමටත් එහාට ගිය - අධ්‍යාපනික වශයෙන් ඉහළට ආ- අමාත්‍යවරයෙකු තමයි නූතනයේ මේ රටේ අධ්‍යාපන අමාත්‍යවරයා විධියට කටයුතු කරන්නේ. ගරු සුසිල් ප්‍රේමජයන්ත අධ්‍යාපන අමාත්‍යතුමනි, මා විශ්වාස කරනවා, ඔබතුමාගේ දෑත මත නොව දෙවුර මතයි මේ සමාජ වගකීම පැටවී තිබෙන්නේ කියලා. ගරු දෙමව්පිය කණ්ඩායම්, ආදි ශිෂ්‍ය සංගම් -හැම පාසලකම ආදි ශිෂ්‍ය සංගම් ඇත්තේ නැහැ.- ආදි සියල්ල ඒකාබද්ධ කරගෙන දූ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් පෙරටත් වඩා කටයුතු කළ යුතුයි කියා මා විශ්වාස කරනවා. අපේ රටේ දූ දරුවන්ගේ අධ්‍යාපනය පුළුල් කිරීම වෙනුවෙන් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් හමුවේ මේ ප්‍රශ්න සමුච්චය -සියල්ල- එකට ගෙන සාකච්ඡා කර, දරුවන්ගේ අධ්‍යාපන ගැටලුවලට විසඳුම් ලබා දීම වෙනුවෙන් අපි නවමු මාවතකට යොමු වෙමු කියන අදහස ඉදිරිපත් කරමින්, මට කාලය ලබා දීම වෙනුවෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (මහාචාර්ය) චරිත හේරත් මන්ත්‍රීතුමා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.45]

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද දින සභාව කල්තබන අවස්ථාවේ කාලෝචිත මාතෘකාවක්, යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපේ හිටපු අධ්‍යාපන ඇමතිවරයකු වන ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමාට මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

[ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා]

රටක් අරාජික වෙන්න, ඒ වාගේම රටක් ආර්ථික හා සමාජයීය වශයෙන් පහළට යන්න යුද්ධයක් මුල් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් රටේ පවතින වැරැදි ආර්ථික හා දේශපාලන ප්‍රතිපත්ති මුල් වෙන්න පුළුවන්. මා හිතන විධියට රටක් අරාජික වීමට බලපාන අනෙක් ප්‍රධානම කාරණය තමයි ඒ රටේ දරුවන්ගේ අධ්‍යාපනය කඩා වැටීම. දරුවන්ට ලබා දෙන අධ්‍යාපනය කඩා වැටෙන කාලවලදීත් රටක් අරාජික වෙන්න තිබෙන ඉඩ කඩ -ඉඩ ප්‍රස්ථාව- වැඩියි. අප මුහුණ පෑ කොවිඩ් වසංගතය නිසා, නොයෙක් වෘත්තිය අරගළ නිසා, ඒ වාගේම අද වන කොට පවතින නොයෙක් ආර්ථික අපහසුතා නිසා දරුවන්ගේ අධ්‍යාපනය කඩා වැටී තිබෙනවා. එය ඉතාම දරුණු ලෙස දරුවන්ට බලපා තිබෙනවා.

අධ්‍යාපන කාර්යයේදී අපි online ක්‍රමයට දරුවන්ට අධ්‍යාපනය ලබා දෙනවා. නමුත් අපි දන්නවා, සාමාන්‍යයෙන් එම ක්‍රමයට අධ්‍යාපනය ලබා ගත හැක්කේ රටේ සිටින සියලු දරුවන්ගෙන් සියයට 50කට ආසන්න පිරිසකට පමණක් බව. එම තත්ත්වය මඟ හැරවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය නොයෙක් වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. අප විශ්වාස කරන විධියට, එම අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක වන්නේ ළමයින්ගේ විෂයය දැනුම වර්ධනය සඳහා පමණයි. ඒ විෂය දැනුම ලැබීමට අමතරව නායකත්වය සහිත, ශික්ෂණයක් සහිත ළමයෙකු බිහි වන්නේ, රටට වැඩදායී පුරවැසියෙකු බිහි කරන්න පුළුවන් වන්නේ පාසල තුළින් ලැබෙන අධ්‍යාපනයෙන් පමණයි. අධ්‍යාපනයට එහා ගිය ගුරු ගෝල සම්බන්ධතාව සහිත, නායකත්වයේ ලක්ෂණ, ගුණාංග සහිත දරුවෙකු බිහි කරගන්න පුළුවන් වන්නේ පාසල් අධ්‍යාපනය හරහා පමණයි. නිදහස් අධ්‍යාපනයෙන් උපරිම ඵල ලබා ගත් පුද්ගලයන් විධියට අප මේ රටේ පාසල් අධ්‍යාපනය හරහා ලබා ගත්තේ අධ්‍යාපනය පමණක් නොවෙයි. ක්‍රීඩාව හරහා, නායකත්වය, ශික්ෂණය, අන්‍ය මත ඉවසීම කියන ගුණාංග සියල්ල අපි පුරුදු පුහුණු වුණා. රටක් හදන්න නම්, පාසල් අධ්‍යාපනය ලබන අවුරුදු 13ක කාලයත් ඇති කියලායි මා හිතන්නේ.

ඒ වාගේම රටක් වැනසෙන්නත් පාසල් අධ්‍යාපනය නැති අවුරුදු පහක් ඇති. 2020දී නියමිත දවස් ගණනට වඩා සියයට 50ක් අඩුවෙන් තමයි අපේ දරුවන් ඉස්කෝලේ ගියේ. 2021දී ඒ තත්ත්වය ඊටත් වඩා උග්‍ර වුණා. මා හිතන විධියට, නියමිත දවස් ගණනට වඩා දරුවන් පාසල් නොයා හිටපු දවස් ගණන සියයට 80කට වැඩියි. ඒ වාගේම අදටත් දරුවන් පාසල් නොයන දවස් ගණන වැඩියි. මා හිතන විධියට මේ මාසයේ දීත් වැඩි දවස් ගණනක් පාසල් වසා දමා තිබෙනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් අපි ඉල්ලීමක් කරනවා, මේකට විසඳුම් සහිත නිසි වැඩ පිළිවෙළක් හදන්න, නිසි ක්‍රියාමාර්ගයකට එන්න කියලා. දරුවන්ගේ අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අධ්‍යාපනය ලබන කාල පරිච්ඡේද ගණන වැඩි කරන්න, ගරු ඇමතිතුමනි.

යුනිසෙෆ් සංවිධානය පවසන විධියට අද වනකොට ළමා මන්දපෝෂණය අතින් ලෝකයේ හත්වැනි තැනටත්, දකුණු ආසියාවේ දෙවැනි තැනටත් අපේ රට පත් වෙලා තිබෙනවා. ඒ ගැටලුව විසඳීමට පාසල් තුළින් යම් කිසි ක්‍රියාමාර්ගයක් ගන්න. අද වනකොට පවතින ආර්ථික ගැටලුවත් එක්ක පාසල්වල දිවා ආහාර ලබා දීමත් යම් කිසි මට්ටමකට අඩපණ වෙලා තිබෙනවා. අධ්‍යාපන ඇමතිතුමාට මා යෝජනා කරනවා, අධ්‍යාපනය ලබන කාල පරිච්ඡේද ගණන වැඩි කරනවා වාගේම පාසල් දරුවන්ට දිවා ආහාරය ලබා දීමේ වැඩ පිළිවෙළත් ඉතා ඉක්මනින් ක්‍රියාවට නංවන්න, ඒ සඳහා ක්‍රියාමාර්ග ගන්න කියලා. මොකද, මන්ද පෝෂණය සහ අධ්‍යාපනය අහිමි වීම කියන්නේ එකට යන කාරණා දෙකක්. සෞඛ්‍ය ගැටලු පැන නඟින්න පුළුවන්; මානසික ආතතිය වැඩි වෙන්න පුළුවන්. අද වනකොට මානසික රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරු ළඟට එන ළමයි සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. ඒක මේ රටට බලපාන අතිවිශාල ප්‍රශ්නයක්. ඒ නිසා පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව අප සියලුදෙනා එකතු වෙලා, අධ්‍යාපන බලධාරින් ඇතුළු සියලුදෙනා එකතු වෙලා මේ තත්ත්වයෙන් දරුවන් ගොඩගැනීම සඳහා ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. ඒ සඳහා හිටපු අධ්‍යාපන ඇමතිතුමා යෝජනා කළ විශේෂ කාරක සභාව ඉතා ඉක්මනින් මේ පාර්ලිමේන්තුව තුළ පිහිටුවන්න, සියලුදෙනාගේ අදහස් අරගෙන මේ ප්‍රශ්නයට ඉතා ඉක්මනින් විසඳුම් ලබා දෙන්න අධ්‍යාපන ඇමතිතුමාට හැකි වේවායි ප්‍රාර්ථනා කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.50]

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඩලස් අලහප්පෙරුම හිටපු අධ්‍යාපන අමාත්‍යතුමා අද ඉතාම කාලෝචිත, වැදගත් යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. නීති සෑදීම, මූල්‍ය පාලනය වාගේම වර්තමානයේ ජනතාව මුහුණ දෙන ප්‍රශ්නවලටත් පාර්ලිමේන්තුවෙන් කුමන ආකාරයක හෝ විසඳුමක් ලබා දෙයි කියලා අද ජනතාව බලාපොරොත්තු වෙනවා. අද රටේ තිබෙන ආර්ථික ප්‍රශ්නය වාගේම තවත් ප්‍රධාන ප්‍රශ්නයක් තමයි අධ්‍යාපන ක්ෂේත්‍රයට මුහුණ දීමට සිදුවෙලා තිබෙන අභියෝගය. පසුගිය කාල සීමාව තුළදී පෙර පාසලට යන්නේ නැතිව, පළමුවැනි පන්තියට යන්නේ නැතිව දෙවැනි පන්තියට යන්න දරුවන්ට සිදු වුණා. එක දවසක් හෝ පාසලට යන්නේ නැතුව ශිෂ්‍යත්ව විභාගය කරන්න සිදු වුණා. එකොළහේ පන්තියේ අධ්‍යාපනය ලබන්නේ නැතිව අපොස සාමාන්‍ය පෙළ විභාගයට ලියන්න සිදු වුණා. පාසල් ගිය අපට එදා මේ අත්දැකීමට මුහුණ දෙන්න සිදු වුණා නම්, කොපමණ අසරණ වෙයිද කියලා අමුතුවෙන් සඳහන් කරන්න අවශ්‍ය නැහැ. ඒ නිසා මේ යෝජනාව හුදෙක් යෝජනාවකට පමණක් සීමා කරන්නේ නැතිව, කලින් සඳහන් කළ පරිදි මේ ප්‍රශ්න ගැන සොයා බලන්න විශේෂ කාරක සභාවක් පත් කරලා, එම විශේෂ කාරක සභාවේ කටයුතුත් වාර්තාවකට පමණක් සීමා කරන්නේ නැතිව, ඒ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීම ඉතාම කාලෝචිතයි කියන එකයි මගේ පෞද්ගලික අදහස, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එය ක්‍රියාවට නැංවීම පාර්ලිමේන්තුව තුළින් ඉටු විය යුතු යුතුකමක්, වගකීමක් විධියටයි මා දකින්නේ.

සුනාමි ව්‍යසනය මෙන්ම, කොරෝනා වසංගතය පිළිබඳවත් අපි කථා කළා. කොරෝනා වසංගතය අපි බලාපොරොත්තු නොවූ දෙයක්. ඒක නිසා රට lock down කරන්න සිදු වුණා. ඒ අවස්ථාවේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ, පළාත් අධ්‍යාපන කාර්යාලවල, කලාප අධ්‍යාපන කාර්යාලවල කුමන ආකාරයක හෝ දායකත්වයකින් තොරව අපේ ගුරුවරුන් ස්වේච්ඡාවෙන් online අධ්‍යාපන ක්‍රියාවලිය කරගෙන ගියා.

ඒ සම්බන්ධයෙන් ඒ අයට අපේ ගෞරවය පිරිනමන්න ඕනෑ. විශේෂයෙන්ම පන්ති කාමරය තුළ ලබන අධ්‍යාපනය, අත්දැකීම් සම්භාරය ඒ ආකාරයෙන්ම දරුවෙකුට ලැබෙනවාය කියන තැන අපි නැහැ. නමුත්, සිදුවන හානිය අවම කර ගැනීම සඳහා එම ක්‍රියාවලිය ඉතාම වැදගත්. අපි ගිය සතියේ අධ්‍යාපන අමාත්‍යාංශය සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය රජයේ ගිණුම් පිළිබඳ කාරක

සභාවට ගෙන්වා මේ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. පාසල් පවත්වාගෙන යෑම තුළින් දරුවෙකුට ලබාදෙන අත්දැකීම් සියල්ල සියයට 100ක් ඒ හා සමානවම ලබා දෙන්න අපට පුළුවන්කම නැති වුණත්, දැනට උසස් අධ්‍යාපන පද්ධතියේ සහ පාසල් පද්ධතියේ ගොඩනැඟිලිවලට සල්ලි වෙන් කරන්නේ නැතිව දුරස්ථ අධ්‍යාපනය, විශේෂයෙන්ම online අධ්‍යාපනය වෙනුවෙන් එම ප්‍රතිපාදන මුදල් ලබා දීම ඉතාම කාලෝචිතයි. විශේෂයෙන්ම අද ලෝක බැංකුව උසස් අධ්‍යාපනයට සහ පාසල් පද්ධතියට මුදල් වෙන් කර තිබෙනවා. අපි එදා යෝජනා කළේ, එම මුදල් ගොඩනැඟිලි හදන්න යොදවන්න එපා කියලා. විශේෂයෙන්ම දුරස්ථ අධ්‍යාපන ක්‍රියාවලිය සහ online අධ්‍යාපන ක්‍රියාවලිය වෙනුවෙන් පන්ති කාමර සකස් කරන්න ඕනෑ වාගේම ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දෙන්නත් ඕනෑ. ඒ පිළිබඳවත් විශේෂ අවධානය යොමු කරන ලෙස අපි විශේෂයෙන් ඉල්ලා සිටිනවා. එම නිසා, මේ ගැන කථා කරලා පමණක් නිකම් ඉන්නේ නැතිව, මෙය ඉතාම කාලෝචිත යෝජනාවක් වශයෙන් සලකලා, මේ සම්බන්ධයෙන් වාර්තා සකස් කරලා, නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අපි සියලු දෙනාම ඒක රාශි වෙලා කටයුතු කරමු. එම යෝජනාව ඉදිරිපත් කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

පිළිතුරු කථාව, ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.54]

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சர்)

(The Hon. (Dr.) Susil Premajayantha - Minister of Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම මම ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා හිටපු අධ්‍යාපන අමාත්‍යවරයෙක්. ඒ වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් එතුමා විශාල උනන්දුවක් දක්වනවා. මෙම කල් තැබීමේ යෝජනාව මඟින් එතුමා ප්‍රධාන වශයෙන් යෝජනා කරනවා, සර්ව පාක්ෂික කමිටුවක් පිහිටුවලා අධ්‍යාපන ක්ෂේත්‍රයේ වර්තමානයත්, අනාගතයත් සැලසුම් කර ගන්නේ කෙසේද කියන කාරණය සාකච්ඡා කරන්න කියලා. එම යෝජනාවට මමත් ඉතාම කැමැතියි. ඒ සඳහා විශේෂ කාරක සභාවක් පත් කරන්නත් මම සහයෝගය ලබා දෙනවා. මොකද, මේ තිබෙන තත්ත්වයන් තුළ, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ කටයුතු reschedule කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. හැබැයි, ප්‍රතිසංස්කරණයක් අවශ්‍යයි. ඒ අවශ්‍යතාව අපට එක රැයකින් ඉටු කරන්න බැහැ. එය යම් නිශ්චිත කාල සීමාවක් තුළ කරන්න සිදු වෙනවා. රජයන් මාරුවෙන්න පුළුවන්, ඇමතිවරු මාරුවෙන්න පුළුවන්. නමුත්, පාර්ලිමේන්තුවේ සර්වපාක්ෂික කමිටුවක් හරහා අපි ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත්තොත්, රජයක් හෝ ඇමතිවරයෙක් වෙනස් වුණා කියලා එම ප්‍රතිපත්ති වෙනස් වෙන්නේ නැහැ, එය අඛණ්ඩව ඉදිරියට යනවා.

ඊළඟට, මම සංඛ්‍යා ලේඛන කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි. මම මෙවර අධ්‍යාපන අමාත්‍ය ධුරය භාර අරගෙන දැන් හරියටම මාසයක් වෙනවා. 2020 වර්ෂයේ දින 194ක් පාසල් පැවැත්විය යුතුව තිබුණා. නමුත්, ඒ දින 194න් බස්නාහිර පළාතේ පාසල් පවත්වලා තිබෙන්නේ දින 94යි. පිට පළාත්වල ඒ දින 194න් පාසල් පවත්වලා තිබෙන්නේ දින 117යි. ඒ අනුව, 2020 දී පිට පළාත්වල පාසල්වලට දින 77ක් අහිමි වෙලා තිබෙනවා. බස්නාහිර පළාතේ පාසල්වලට පාසල් දින 100ක් අහිමි වෙලා තිබෙනවා. එහෙම වුණේ, කොවිඩ් වසංගතය නිසා. ඊළඟට, පාසල් පැවැත්විය යුතුයි කියා දීර්ඝ කළ කාලයත් එක්ක 2021 වර්ෂයේදී බස්නාහිර පළාතේ පාසල් පැවැත්විය යුතු දින ගණන 229යි. නමුත්, එයින් පාසල් පවත්වලා තිබෙන්නේ දින 102යි. ඒ අනුව, දින 127ක් ඒ දරුවන්ට අහිමිවෙලා තිබෙනවා. 2021 වර්ෂයේ පිට පළාත්වල ඒ දින 229න් දින 143ක් පාසල් පවත්වා තිබෙනවා. ඒ අනුව ඒ දරුවන්ට දින 86ක් අහිමිවෙලා තිබෙනවා. මෙන්න මේ තත්ත්වය තුළ විවිධ සමාජ, ආර්ථික හේතූන් මත අපට තව දුරටත් පාසල් වසා තබන්න පුළුවන්කමක් නැහැ.

ගුරුවරුන්ට දීර්ඝ කාලයක් තිස්සේ තිබුණු ප්‍රශ්න පිළිබඳව අපි දන්නවා. ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති කමිටුව මඟින් ඒවාට සැහෙන විසඳුම් ලබා දී තිබෙනවා. අපි දන්නවා, ආර්ථිකයේ ඇති වී තිබෙන ප්‍රශ්න නිසා අද ප්‍රවාහන ගාස්තු වැඩිවෙලා තිබෙන බව, ජීවන වියදම වැඩිවෙලා තිබෙන බව. ඒ අතරට ඊයේ පෙරේදා ආපු ප්‍රශ්නය තමයි, ඉන්ධන හිඟකම නිසා ඇති වූ ප්‍රවාහන අපහසුතාව.

මම දැන් තවත් සංඛ්‍යා ලේඛනයක් ඉදිරිපත් කරන්නම්. පළාත් අමාත්‍යාංශය හැටියට පළාත් බලධාරීන් 9දෙනාම පසුගිය සෙනසුරාදා "Zoom" තාක්ෂණය ඔස්සේ සම්බන්ධ කරගෙන අපි තීන්දුවක් ගත්තා. ඒ අනුව, දුර පළාත්වල ඉඳලා දරුවෝ එන නිසාත්, නගරවල විශාල තදබදයක් තිබෙන නිසාත්, නගරවල පමණක් සමහර පාසල් නොපැවැත්වීමටත්, හැකි තැන්වල පාසල් පවත්වන්නත් පළාත් බලධාරීන්ට බලය දුන්නා. අද ග්‍රාමීය ප්‍රදේශවල වැඩි හරියක් ඉන්නේ උපකාරක පන්ති යන්න බැරි, online අධ්‍යාපනයට පහසුකම් නැති, ඉතාම අහිංසක දූ දරුවන් පිරිසක්.

එම නිසා අපි ඒ සියල්ල පිළිබඳව සලකා බැලිය යුතුයි. අපි ගත්ත තීන්දුව අනුව, ඊයේ දිනයේදී වයඹ පළාතේ ගුරුවරුන්ගේ පැමිණීම සියයට 72යි, සිසුන්ගේ පැමිණීම සියයට 63යි; සබරගමුව පළාතේ ගුරුවරුන්ගේ පැමිණීම සියයට 77යි, සිසුන්ගේ පැමිණීම සියයට 61යි; දකුණු පළාතේ ගුරුවරුන්ගේ පැමිණීම සියයට 60යි, සිසුන්ගේ පැමිණීම සියයට 51යි; උතුරු මැද පළාතේ ගුරුවරුන්ගේ පැමිණීම සියයට 62යි, සිසුන්ගේ පැමිණීම සියයට 58යි; මධ්‍යම පළාතේ ගුරුවරුන්ගේ පැමිණීම සියයට 51යි, සිසුන්ගේ පැමිණීම සියයට 48යි; නැඟෙනහිර පළාතේ ගුරුවරුන්ගේ පැමිණීම සියයට 72යි, සිසුන්ගේ පැමිණීම සියයට 62යි; උතුරු පළාතේ ගුරුවරුන්ගේ පැමිණීම සියයට 56යි, සිසුන්ගේ පැමිණීම සියයට 75යි. ඒ වාගේම ඌව පළාතේ තිබෙන පාසල් 898න්, 876ක්ම ඊයේ දිනයේදී විවෘත කර තිබෙනවා. බස්නාහිර පළාතේ ගුරුවරුන්ගේ පැමිණීම සියයට 68යි, සිසුන්ගේ පැමිණීම සියයට 71යි. ඒකෙන් පැහැදිලි වෙන්නේ, කුමන බාධක තිබුණත් දරුවන්ගේ අධ්‍යාපනය අඛණ්ඩව පවත්වාගෙන යන්න දෙමව්පියන් මෙන්ම ගුරුවරු, විදුහල්පතිවරු සූදානම් බවයි. ඒ නිසා එවැනි කැපවීමක් කරන විදුහල්පතිවරු, ගුරුවරු ඇතුළු සියලු පිරිසට අපේ ස්තුතිය පළ කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ තීන්දුව ගත්තේ සතියක කාලයකට. බලශක්ති අමාත්‍යාංශයෙන් ලැබුණු තොරතුරු අනුව සියලු දත්ත සමීක්ෂණය කර, විශ්ලේෂණය කර ඊළඟ සඳුදා සිට මීට වඩා සාර්ථකව පාසල් පවත්වා ගෙන යන්න අපට පුළුවන්කම ලැබෙයි කියා මම විශ්වාස කරනවා. ඒ සඳහා විකල්ප වැඩසටහන් තිබෙනවා. ඒ අනුව, නැණස නාළිකා 8ක් දැන් ක්‍රියාත්මක වෙනවා. ඒ අටෙන් නාළිකා අංක 122 සිට 129 දක්වා ප්‍රාථමික ශ්‍රේණිවලට channels දෙකක් සිංහල හා දමිළ මාධ්‍යයෙන් ඩයලොග් ටීවී ජාලය හරහා ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම 6 සහ 9 කියන මැද පන්ති සඳහාත් 10, 11, 12, 13 පන්ති වෙනුවෙනුත් අධ්‍යාපන වැඩසටහන් විකාශය වෙනවා. ඊට අමතරව ජාතික අධ්‍යාපන ආයතනයේ YouTube එක, e-thaksalawa කියන මේ හැම එකක් මඟිනුත්, නවීන තාක්ෂණික ක්‍රම මඟිනුත්, රූපවාහිනිය මඟිනුත් වැඩිදුරටත් අධ්‍යාපනය ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. මම කියන්නේ නැහැ, පන්ති කාමරය තරම් මේ ක්‍රම සාර්ථකයි කියලා.

[ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මෙතැනට එන්න කලින් අපේ නිලධාරින් සහ සියලුම විශ්වවිද්‍යාලවල මහාචාර්යවරු සම්බන්ධ කර ගෙන ඉදිරියට පැවැත්වීමට නියමිත උසස් පෙළ විභාගය ඉලක්ක කරගෙන උසස් පෙළ උගන්වන ගුරුවරුන්ට ප්‍රධාන විෂයයන් 16ක් සම්බන්ධයෙන් සැසි පවත්වා, ඒ හරහා දරුවන්ට විශේෂ පන්ති සහ පුනරීක්ෂණ වැඩසටහන් ඊළඟ මාස තුන තුළ ක්‍රියාත්මක කරන්න සැලසුම් කරලා තමයි මම ආවේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රාථමික අංශය කියන්නේ 1 සිට 5 දක්වා ශ්‍රේණි. හැබැයි, වැඩිපුරම ප්‍රශ්නය මතු වෙන්නේ 1, 2 ශ්‍රේණිවලට. 1, 2 ශ්‍රේණි අවසන් වෙනකොට ඒ දරුවන්ට සාක්ෂරතාව සහ සංඛ්‍යා -literacy and numeracy- පිළිබඳව අවබෝධය තිබෙන්න ඕනෑ. ප්‍රශ්නය තිබෙන්නේ, 2021 වර්ෂයේදී 1 සහ 2 ශ්‍රේණිවල හිටපු දරුවන්ට හරියට මේ අධ්‍යාපනික කටයුතු නොකෙරුණා නම්, 2022 වර්ෂයේදී 2 සහ 3 ශ්‍රේණිවලට එම දරුවන් යන්නේ කොහොමද කියන එක ගැන. ඒ නිසා අතිරේක වශයෙන් මුළු ප්‍රාථමිකයටම මේ හා සමාන වැඩසටහනක් ක්‍රියාත්මක කර, සැසි පවත්වා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා ගුරුවරු සූදානම්, විදුහල්පතිවරු සූදානම්. ඒකට දෙමව්පියෝත් ඉතා කැමැත්තෙන් සිටිනවා. අධ්‍යාපන ඇමතිවරයා හැටියට මගේ නම් කිසිම අපේක්ෂාවක් නැහැ, දවසක් හෝ පාසල් වසා දමන්න. නමුත්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් නිකුත් කර තිබෙන චක්‍රලේඛය අනුව දින කිහිපයකට හෝ යම් තීන්දුවක් ගන්න අපට සිදු වුණා. හැබැයි, මේ මහ හැරී යන දින ටික අගෝස්තු නිවාඩුව සහ දෙසැම්බර් නිවාඩුව කෙටි කර -මේ වර්ෂය අවසානවීමට මත්තෙන්- ලබා දෙන්නත් මම සූදානම්. ඒ වාගේම මැද පන්ති සඳහාත් අපි ඒ ආකාරයේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අධ්‍යාපන අමාත්‍යාංශය භාර ගන්නකොට ජනවාරි මාසයේ නිල ඇඳුම් බෙදීම පිළිබඳවවත් වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. ඒ සඳහා මම දැන් කටයුතු කරගෙන යනවා. ඒ වාගේම 2023 වර්ෂයට අවශ්‍ය පෙළ පොත් මුද්‍රණය සඳහා අවශ්‍ය කඩදාසි, මෙවලම්, තීන්ත අපි ගෙන්වා ගන්න ඕනෑ. ඒ අනුව, ඉන්දියානු ණය ක්‍රමය යටතේ ඩොලර් මිලියන 65ක් වටිනා printing materials ගෙන්වා ගැනීමට අවශ්‍ය මූලික වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කළා.

ප්‍රවාහනය පිළිබඳවත් මෙතුමන්ලා සඳහන් කළා. පාසල් දරුවන් ප්‍රවාහනය කරන වෑන් රථ හිමිකරුවන්ගේ සංගමයත් එක්ක මම සාකච්ඡාවක් පැවැත්වූවා. ඒ අනුව වාහන අංකය, රියැදුරුගේ හැඳුනුම්පත, අවශ්‍ය ඉන්ධන ලීටර් ප්‍රමාණය ආදී සියලු තොරතුරු ලංගම ඩිපෝවලට බෙදා හැරීමට කටයුතු කර තිබෙනවා. පසුගිය කාලයේත් ඒ කටයුත්ත යම් ප්‍රමාණයකින් සිද්ධ වුණා. දැන් ඒක වැඩි කරන්න කටයුතු කරනවා. ඒ වාගේම SLTB එකට අදාළ පාසල් බස් රථ සංඛ්‍යාවත් වැඩි කරන්න අවශ්‍ය කටයුතු අපි කර තිබෙනවා. කොළඹ ප්‍රදේශයේ නම් බස් රථ 20ක් පමණ වැඩි කර තිබෙනවා. අපි පොදු ප්‍රවාහනයත් ශක්තිමත් කරන්න ඕනෑ. ඒ අනුව, දුම්රිය සේවයත් නියමිත පරිදි ක්‍රියාත්මක කරන්න ඕනෑ. මේ කටයුතු කෙරෙහි සියලුදෙනාම දක්වන උනන්දුව ගැන මම ස්තුතිවන්ත වෙනවා.

අනෙක් කාරණය මෙයයි. යෝජිත විශේෂ කාරක සභාව තුළින් අපට පුළුවන්කම ලැබෙනවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව දැනට යෝජිත කෙටුම්පත පිළිබඳව තවදුරටත් සාකච්ඡා කර ඒ කටයුතු ඉදිරියට ගෙනයන්න. යෝජනා කර තිබෙන ආකාරය අනුව, අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් අවුරුද්දෙන් දෙකෙන් කරන්න බැහැ.

ලෝකයේ අංක එක මට්ටමේ තිබෙන ෆින්ලන්තයේ අධ්‍යාපන ප්‍රතිපත්තිය මම පරිශීලනය කළා. කොවිඩ් වසංගතයෙන් පසු ඉන්දියාව 2020 වර්ෂයට නව අධ්‍යාපන ප්‍රතිපත්තියක් හදලා තිබෙනවා, National Education Policy of India 2020 යනුවෙන්. ඒ වාගේම සිංගප්පූරුව හදලා තිබෙනවා, Education Policy of Singapore. මේ, STEM අධ්‍යාපනයත් එක්ක ආසියානු කලාපයේ ඉතාම ඉහළින් සිටින රටක්. තනතුරු මොකුත් නැතිව පොඩ්ඩක් පැත්තකට වෙලා සිටි කාලයේ මේ ප්‍රතිපත්ති තුනම මම පරිශීලනය කළා. ඔබතුමන්ලාටත් දෙන්නම්, මම හදපු කොළ 15ක් පමණ වූ එම note එක, ගරු මන්ත්‍රීතුමනි. එය සංසන්දනාත්මක සටහනක්. මොකද, අධ්‍යාපන විෂයය සම්බන්ධයෙන් කටයුතු කරනකොට මම හැම තිස්සේම නිලධාරින්ගෙන් උපදෙස් ගන්නවා, ආචාර්යවරුන්ගෙන් උපදෙස් ගන්නවා. හැබැයි, අපිත් මේ ක්ෂේත්‍රය ගැන යම් දැනුවත්වීමක් වෙලා තිබෙන්න ඕනෑ. ඒ ලබා ගත් දැනුම අනුව මම සොයා ගත්තා, ෆින්ලන්තයේ ප්‍රසිද්ධ පළමුවෙනි විභාගය තිබෙන්නේ වයස අවුරුදු 15දී නව වැනි ශ්‍රේණියේදී බව. නව වැනි ශ්‍රේණිය දක්වා සියලුම තක්සේරුකරණ කටයුතු සහ සමීක්ෂණ කටයුතු කරන්නේ පන්ති භාර ගුරුතුමිය හෝ ගුරුතුමා විසින්. හැබැයි, ගුරුවරයාට වග වීමක් -accountability එකක්- තිබෙනවා. මොකද, මුළු සමාජය ම ගුරුවරයා කෙරෙහි විශ්වාසය තබනවා. අන්න ඒකයි අපට ඕනෑ කරන්නේ. අපි ඒ විශ්වාසය පාසල තුළ ගොඩනහන්න ඕනෑ. ඒ අනුව, දැනුමෙන් සහ තාක්ෂණයෙන් අපි ගුරුවරයා සන්නද්ධ කරන්න ඕනෑ. ඒ සඳහා CR Centres තිබුණේ 82යි. මම දැන් ඒක 102ක් කරනවා. කලාප තිබෙන්නේ 99යි. දැන් ඒ ප්‍රමාණය 120ක් වෙනවා. පොකුරු පාසල් ටික දැන් mapping කරලා අවසානයි. ජනවාරි පළමුවැනි දා වෙනකොට සම්පූර්ණ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේ පරිපාලන ප්‍රතිසංස්කරණය - administrative reform- කිරීම සඳහා අවශ්‍ය සැලසුම් මා විසින් සිදු කරමින් තිබෙනවා.

සීමිත කාල සීමාවක් තුළ මම උසස් අධ්‍යාපනය පැත්ත බලන්නත් ඕනෑ, තාක්ෂණය ගැන බලන්නත් ඕනෑ. හැබැයි, සාමාන්‍ය අධ්‍යාපනය ඉතාම වැදගත්. ඒකට මම ප්‍රමුඛස්ථානය දීලා තිබෙනවා. අනික් ඒවා අත්හරිනවා නොවෙයි. ඉදිරි කාලය තුළ විශ්වවිද්‍යාල පද්ධතියේත් මීට සමගාමී ප්‍රතිසංස්කරණයක් සිදු වේවි. ඒ නිසා මේ විශේෂ කාරක සභාව තුළින් අපි සියලුදෙනාම යෝජිත අධ්‍යාපන ප්‍රතිපත්තියත්, දැනට හදලා තිබෙන ජාතික අධ්‍යාපන කොමිසමේ ප්‍රතිපත්තියත් පිළිබඳව අධ්‍යයනය කරනවා. ඒ තුළින් නූතනයේ තිබෙන අභියෝගවලට මුහුණ දෙනවා වාගේම අනාගත අභියෝගවලටත් සාර්ථකව මුහුණ දෙන්න පුළුවන් මානවයෙක් බිහි කරන්නේ කොහොමද කියා අපි සොයා බලනවා. හතරවැනි කාර්මික විප්ලවයට -Fourth Industrial Revolution එකට- මුහුණ දෙමින් ලෝකයත් සමඟ ඉස්සරහට යෑම සඳහා අපි අපේ මානව සම්පත -දරුවන්- සූදානම් කරමු කියා යෝජනා කරමින්, ඒ සඳහා ඔබතුමන්ලා සියලුදෙනාගේ සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලමින්, මේ යෝජනාවේ වැදගත්කම පිළිබඳව කථා කළ සියලු මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 5.05 ට, 2022 ජූනි 22වන බදාදා පූ.භා. 10.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 5.05 மணிக்கு பாராளுமன்றம், 2022 யூன் 22, புதன்கிழமை மு.ப. 10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 5.05 p.m. until 10.00 a.m. on Wednesday, 22nd June, 2022.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන
නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා
**හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.